ප්‍රථම මුද්‍රණය :- 2010 ජුනි

# සමනල වසන්තය

## ගයනා එස්. ලක්මාලි

ISBN 978 - 955 - 52472 - 0 - 7

කවර නිර්මාණය :- එස්. කුමාරි

පරිගණක අකුරුකරණය :- නිතිල බුක්ෂොප් හි
තනුජා ටී. හේවගේ

ප්‍රකාශනය :- ගයනා එස්. ලක්මාලි
නො. 891 / F,
ගැමුණු මාවත,
හෙයියන්තුඩුව.

මුද්‍රණය :- තරංජි ප්‍රින්ටර්ස්, මහරගම

(සමනල වසන්තය නවකතාව ඇසුරෙන් කෙරෙන ඕනම ප්‍රතිනිර්මාණයකදී හෝ උපුටා ගැනීමකදී කර්තෘ ගයනා එස්. ලක්මාලිගේ ලිඛිත අවසරය ලබාගත යුතුය.)



# සමනල වසන්තය

## ගයනා එස්. ලක්මාලි

ප්‍රථම මුද්‍රණය :- 2010 ජුනි

ගයනා එස්. ලක්මාලි
නො. 891 / F,
ගැමුණු මාවත,
හෙයියන්තුඩුව.
දුරකථන: 0717 514130
011 4920043

# සිංහල සාහිත්‍යයේ ප්‍රේමකතා රැල්ල.

බිලිඳකු ලෙස උපත ලබන අපි පියවරෙන් පියවර තබා අවසානයේ මහල්ලකු ලෙස ජිවිත සටන නිමාකරමු. ඒ පියවර අතරේ විවිධ දේ කියවන්නෙමු. හෝඩි පොතෙන් පටන්ගත් කියවීම ලොකු චිත්‍ර පිරුණු ලොකු අකුරු සහිත කුඩාම ළමා පොත්, කුඩා චිත්‍ර හා තරමක් ලොකු අකුරු සහිත ළමා පොත්, ළමා පොත් යොවුන් පොත් ආදී වශයෙන් ඒ ඒ වයසට ගැලපෙන පරිදි තෝරාගත් පොත් කියවන්නෙමු. ඉනික්බිති සරල තේමා රැගත් නවකතා කියවා සාහිත්‍යයේත් ජීවිතයේත්, ගැඹුර සහිත පොත් කියවීම දක්වා අපි ඉදිරියට යන්නෙමු.

කොහොමටත් අපි නවකතා වුවද කියවීම ආරම්භ කළ යුත්තේ සැහැල්ලු කියවීමක් සහිත පොත් වලිනි. මේවායේ ගැඹුරු ජීවන දර්ශනයක් නැතද, ආනන්දනීය කියවීමක් සහ කිසියම් ජීවන දර්ශනයක් ද සහිතය. බොහෝ විට මේ කෘතිවල තේමාව ප්‍රේමයයි.

ප්‍රේමය යනු අපේ හදවත් සසල කරවන සුන්දර ජීවන අත්දැකීමකි. සුඛ දුක්ඛ අත්දැකීම් පිරුණු ප්‍රේමය පිළිබඳව ලියන්නටත් කියවන්නටත් අප කවුරුත් කැමතිය. මීට දශක කීපයකට පෙර නම් ප්‍රේම පත්‍ර සාහිත්‍යයක්ද තිබිණි. එහෙත් අද පෙම්පත් සාහිත්‍යය මිලාන වී එස්.එම්.එස් සාහිත්‍යයක් ගොඩනැගී තිබේ. එහෙත් ප්‍රේම කතා සාහිත්‍යය නම් අද බොහෝ සේ ජනප්‍රියය. හේතුව මේ කතාවල ඇත්තේ ගීතවත් භාෂා රසයක් සහ සෞන්දර්යාත්මක ප්‍රේමණීය අත්දැකීම් වීමය. සැහැල්ලු කියවීමක් වීමය. ඔලුව කස කසා අමාරුවෙන් කියවිය යුතු ප්‍රහේලිකා මේ පොත් වල නොමැති වීමය. ඒ නිසාම මේ කෘති සමාජය තුළ ජනප්‍රිය වෙයි. එයට ජනප්‍රිය සාහිත්‍යය යයි සමහරු කියති.

කරුණාසේන ජයලත්ගේ ගොළු හදවත මේ ජනප්‍රිය ධාරාවේ ආරම්භක කෘතියකි. ඒ නිසාම රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන්



පවා පිදුම් ලැබුණු ගොළු හදවත යොවුන් දෙසිතක උපන් ප්‍රේමයක් පිළිබඳව කියැවෙන සුන්දර කෘතියකි. එහෙත් මෙහිද සමාජය පිළිබඳ කියැවීමක් තිබේ.

ඉනික්බිතිව ප්‍රේමය පදනම ගත් කුමාර කරුණාරත්න, එඩ්වඩ් මල්ලවආරච්චි, උපාලි වනිගසූරිය මේ ජනප්‍රිය ධාරාවේ ජනප්‍රිය නවකතා රැසක්ම රචනා කළහ. ඔවුන් ජනප්‍රිය ධාරා සාහිත්‍යයේ පතාක යෝධයන්ය. කවුරුන් කෙසේ කීවත් මේ නවකතා වලද සමාජයේ විවිධ ස්වභාවයන් තරුණයන්ගේ ජීවන ගැටළු ආර්ථික ප්‍රශ්න ආදිය ගැබ්ව තිබේ. මේ කෘති කිසිසේත්ම බොළඳ ප්‍රේමකතා නම් නොවේ.

ප්‍රේමය යනු මුළුමහත් ජීවිතයයි. ප්‍රේමය ඇතුළත් නොවූ සාහිත්‍ය කෘතියක් නැති තරම්ය. මාර්ටින් වික්‍රමසිංහගේ ගම්පෙරලියේ, මහාචාර්ය සරත්චන්ද්‍රගේ මළවුන්ගේ අවුරුදු දා නවකතාවේ සේම අන් සියළුම නවකතා වල පාහේ ප්‍රේමයක්ද තිබේ. එහෙත් ඒවා ලියද්දී ප්‍රේමය සැගවී වෙනත් දේ ඉස්මතු වේ. එහෙත් ජනප්‍රිය ධාරාවේ කෘතියක ප්‍රේමය ප්‍රධාන කියවීම වී අනෙකුත් කරුණු යම් පෙලෙහි දිවේ.

වෙනස එතනය. මේ නිසා මේ ජනප්‍රිය ධාරාවේ කෘති බොළඳ ප්‍රේමකතා සේ හංවඩු ගැසීම නොකළ යුත්තකි.

ප්‍රේමය සදාකාලිකය. ගීතය මෙන් හදවත අමතන නවකතා වලද මේ ප්‍රේමය විවිධ වෙසින් විවිධ ලෙසින් ගැබ්වනු ඇත.

ලංකාවේ පමණක් නොව සමස්ත ලෝකයේම ප්‍රේම කතා යනුවෙන් එක්තරා කෘති විශේෂයක් නිරතුරුවම ප්‍රකාශයට පත්වේ.

ගයනා එස්.ලක්මාලිගේ මෙම සමනල වසන්තය නවකතාවද ඇතුළුව ප්‍රේමකතා රැල්ලේ නවකතා විචාරයට ලක්කළ යුත්තේ සමස්ත සිංහල නවකතා මල්ලේ බහා නොව, සැහැල්ලු කියවීම් නැතහොත් ප්‍රේමකතා නම් වන වෙනත් මල්ලක බහාලමින් බව මම විශ්වාස කරමි.

චන්ද්‍රි කොඩිකාර
ප්‍රවීන ලේඛිකා

WWW.EXPRESSLANKA.TK 2

# සිංහල සාහිත්‍යයේ ප්‍රේමකතා රැල්ල.

බිලිඳකු ලෙස උපත ලබන අපි පියවරෙන් පියවර තබා අවසානයේ මහල්ලකු ලෙස ජීවිත සටන නිමාකරමු. ඒ පියවර අතරේ විවිධ දේ කියවන්නෙමු. හෝඩි පොතෙන් පටන්ගත් කියවීම ලොකු චිත්‍ර පිරුණු ලොකු අකුරු සහිත කුඩාම ළමා පොත්, කුඩා චිත්‍ර හා තරමක් ලොකු අකුරු සහිත ළමා පොත්, ළමා පොත් යොවුන් පොත් ආදී වශයෙන් ඒ ඒ වයසට ගැලපෙන පරිදි තෝරාගත් පොත් කියවන්නෙමු. ඉනික්බිති සරල තේමා රැගත් නවකතා කියවා සාහිත්‍යයේත් ජීවිතයේත්, ගැඹුර සහිත පොත් කියවීම දක්වා අපි ඉදිරියට යන්නෙමු.

කොහොමටත් අපි නවකතා වුවද කියවීම ආරම්භ කළ යුත්තේ සැහැල්ලු කියවීමක් සහිත පොත් වලිනි. මේවායේ ගැඹුරු ජීවන දර්ශනයක් නැතද, ආනන්දනීය කියවීමක් සහ කිසියම් ජීවන දර්ශනයක් ද සහිතය. බොහෝ විට මේ කෘතිවල තේමාව ප්‍රේමයයි.

ප්‍රේමය යනු අපේ හදවත් සසල කරවන සුන්දර ජීවන අත්දැකීමකි. සුඛ දුක්ඛ අත්දැකීම් පිරුණු ප්‍රේමය පිළිබඳව ලියන්නටත් කියවන්නටත් අප කවුරුත් කැමතිය. මීට දශක කීපයකට පෙර නම් ප්‍රේම පත්‍ර සාහිත්‍යයක්ද තිබිණි. එහෙත් අද පෙම්පත් සාහිත්‍යය මිලාන වී එස්.එම්.එස් සාහිත්‍යයක් ගොඩනැගී තිබේ. එහෙත් ප්‍රේම කතා සාහිත්‍යය නම් අද බොහෝ සේ ජනප්‍රියය. හේතුව මේ කතාවල ඇත්තේ ගීතවත් භාෂා රසයක් සහ සෞන්දර්යාත්මක ප්‍රේමණීය අත්දැකීම් වීමය. සැහැල්ලු කියවීමක් වීමය. ඔලුව කස කසා අමාරුවෙන් කියවිය යුතු ප්‍රහේලිකා මේ පොත් වල නොමැති වීමය. ඒ නිසාම මේ කෘති සමාජය තුළ ජනප්‍රිය වෙයි. එයට ජනප්‍රිය සාහිත්‍යය යයි සමහරු කියති.

කරුණාසේන ජයලත්ගේ ගොළු හදවත මේ ජනප්‍රිය ධාරාවේ ආරම්භක කෘතියකි. ඒ නිසාම රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පවා පිදුම් ලැබුණු ගොළු හදවත යොවුන් දෙසිතක උපන් ප්‍රේමයක් පිළිබඳව කියැවෙන සුන්දර කෘතියකි. එහෙත් මෙහිද සමාජය පිළිබඳ කියැවීමක් තිබේ.



ඉනික්බිතිව ප්‍රේමය පදනම ගත් කුමාර කරුණාරත්න, එඩ්වඩ් මල්ලවආරච්චි, උපාලි වනිගසූරිය මේ ජනප්‍රිය ධාරාවේ ජනප්‍රිය නවකතා රැසක්ම රචනා කළහ. ඔවුන් ජනප්‍රිය ධාරා සාහිත්‍යයේ පතාක යෝධයන්ය. කවුරුන් කෙසේ කීවත් මේ නවකතා වලද සමාජයේ විවිධ ස්වභාවයන් තරුණයන්ගේ ජීවන ගැටළු ආර්ථික ප්‍රශ්න ආදිය ගැබ්ව තිබේ. මේ කෘති කිසිසේත්ම බොළඳ ප්‍රේමකතා නම් නොවේ.

ප්‍රේමය යනු මුළුමහත් ජීවිතයයි. ප්‍රේමය ඇතුළත් නොවූ සාහිත්‍ය කෘතියක් නැති තරම්ය. මාර්ටින් වික්‍රමසිංහගේ ගම්පෙරලියේ, මහාචාර්ය සරත්චන්ද්‍රගේ මළවුන්ගේ අවුරුදු දා නවකතාවේ සේම අන් සියළුම නවකතා වල පාහේ ප්‍රේමයක්ද තිබේ. එහෙත් ඒවා ලියද්දී ප්‍රේමය සැගවී වෙනත් දේ ඉස්මතු වේ. එහෙත් ජනප්‍රිය ධාරාවේ කෘතියක ප්‍රේමය ප්‍රධාන කියවීම වී අනෙකුත් කරුණු යම් පෙලෙහි දිවේ.

වෙනස එතනය. මේ නිසා මේ ජනප්‍රිය ධාරාවේ කෘති බොළඳ ප්‍රේමකතා සේ හංවඩු ගැසීම නොකළ යුත්තකි.

ප්‍රේමය සදාකාලිකය. ගීතය මෙන් හදවත අමතන නවකතා වලද මේ ප්‍රේමය විවිධ වෙසින් විවිධ ලෙසින් ගැබ්වනු ඇත.

ලංකාවේ පමණක් නොව සමස්ත ලෝකයේම ප්‍රේම කතා යනුවෙන් එක්තරා කෘති විශේෂයක් නිරතුරුවම ප්‍රකාශයට පත්වේ.

ගයනා එස්.ලක්මාලිගේ මෙම සමනල වසන්තය නවකතාවද ඇතුළුව ප්‍රේමකතා රැල්ලේ නවකතා විචාරයට ලක්කළ යුත්තේ සමස්ත සිංහල නවකතා මල්ලේ බහා නොව, සැහැල්ලු කියවීම් නැතහොත් ප්‍රේමකතා නම් වන වෙනත් මල්ලක බහාලමින් බව මම විශ්වාස කරමි.

චන්දි කොඩිකාර

ප්‍රවීන ලේඛිකා

WWW.EXPRESSLANKA.TK 3

# සටහනක්

දහසක් දනන් ගැවසෙන මානයක වුව අසීමිත ලෙස තනිකම පාළුව මා සිත වටා වෙළෙන්නට විය. අවසර ලත් සැනින් කඩාවැටෙන්නට කදුළු බිදු නෙත් කෙවෙනි යට ගුලි ගැසී තිබිණි. නෙතට සිතට වැට කඩොළු බදිමින් මා පන්හිද සුරතට ගතිමි. ඒ දුක, තනිකම සිතින් තුරන්ව යනතුරු එක දිගට අකුරු කළෙමි. ඒ ප්‍රයත්නය අවසානයේ මටත් නොදැනීම සමනල වසන්තය මා අතින් බිහි විය.

ඉතින් මේ මා දුක දරාගත් ආකාරයයි. එය කොතෙක් දුරට සාර්ථක වුවාදැයි යන්න මා දන්නේ නැත. ලිපියකින් හෝ දුරකථන ඇමතුමකින් ඒ පිළිබඳව අදහස් දැක්වීම දයාබර පාඨක ඔබට බාර කරමි.

ගයනා එස්. ලක්මාලි
අංක: 891 / F,
ගැමුණු මාවත,
හෙයියන්තුඩුව.
0114920043
0717514130



SL-UNLIMITED.COM

01

නින්ද යන්නෙ නැතිකමට උදේම නැගිටලා ඉස්කෝලෙට ආවට මං ආවා වේලාසන වැඩියි කියලා හිතුනෙ පාළුවට ගිය පිට්ටනිය දකිද්දියි. අපේ සෙට් එකේ එකෙක් එනකල් පොත් ටිකත් ඩෙස්ක් එක උඩට දාලා මං කොරිඩෝවට ආවා. ඔන්න එතකොට විහඟයා එනවා හතරවටේට ඇන්ටනාව දාගෙන.

''මොකද මල්ලී උඹ සී.අයි.ඩී. ගේමකට බැහැලා වගේ උදේ පාන්දරම''

''මචං උඹ එද්දි තව කවුරුවත් ඇවිත් හිටියද?''

මූ පංතියට ගොඩ උනේ ප්‍රශ්නාර්ථෙකුත් දාගෙන.

''ඇයි බං තව කවුරුහරි හිටියනං මං පෙට්‍රල් පුච්චගෙන පාර දිහා බලන් ඉදියිද ''

මමත් තදයා වගේ තවත් ප්‍රශ්නෙකින්ම උත්තර දුන්නා.



WWW.EXPRESSLANKA.TK 4

'' හරි හරි බං, ඕකට ඉතිං වලිගෙ පාගගන්න ඕනෙ නැහැනෙ. එහෙනං උඹගැන වෙන්න ඇති කියන්න ඇත්තෙ. වරෙන් යං''

මූ මගේ අතින් ඇදගෙන ඔෆිස් රූම් පැත්තට යන්න හැදුවෙ. මමත් අත ගසලා දාලා බඩගින්නේ හිටපු නරියා කුකුළෙක් දිහා බලනවා වගේ විහඟයා දිහා බැලුවා.

'' මොකද උඹ කන්න වගේ මගේ දිහා බලන්නනේ? වරෙන් යන්න ''

බලපල්ලකො මූගෙ කතාව.හරියට යන තැනක් නොකියා මේ පාන්දර මාව තාත්තා වගේ ඇදගෙන යනවා මදිවට එනවා තව සද්දෙකුත් දාගෙන.

''උඹ සේරටම කලින් කියපං මාව කොහෙද මේ මරන්න ගෙනියන හරකා වගේ ඇදගෙන යන්නේ කියලා''

'' මචං මං එද්දි ප්‍රින්ස් දැකලා කිව්වා යාළුවත් අඬගහගෙන එයාගේ රූම් එකට එන්න කියලා''

ඌ ප්‍රින්ස් කියලා හැඳින්වූයේ අපේ ප්‍රින්සිපල්ව. අපි විතරක් නෙමෙයි ගොඩක් දෙනෙක් එයාව හැඳින්වූයේ අකුරු දෙකකින්. අපි ප්‍රින්ස් කිව්වේ කට්ටිය ගැවසෙන තැන් වලදි විතරයි. දැන් මෙතන ඉන්නේ අපි දෙන්නා විතරක් උනාට විහඟට හිතෙන්න ඇති මේ බුදුන් වඳින උදේ පාන්දර අකුරු දෙකකින් අමතන්න හොඳ නෑ කියලා. නැතුව උගේ තියන හැදිච්චකමකට නෙමෙයි.



SL-UNLIMITED.COM

'' අපිට එන්න කිව්වේ උඹ පෙරලපු බාල්දියක් ගැන කතා කරන්නද මං පෙරලපු එකක් ගැන කතා කරන්නද දන් නෑ. අපරාදේ අද යටට ෂෝට්වල් දෙකතුනක් ඇඳගෙන එන්න තිබුණා''

මං කිව්වේ පස්ස අතගාන ගමන්.

'' මට හිතෙන්නේ එහෙම අවුලක් වෙන එකක් නෑ. අද සර්ගෙ මූඩ් එක හොඳයි වගේ ''

මට එහෙම කිව්වට මොකද දැනටම මූගේ මූණත් තහඩුව ටිකක් ඇඳවෙලා.

'' මචං උඹ ඉස්සර වෙලා පලයං''

මූ දොර ළඟදි මාව ඉස්සරහට දානගමන් කිව්වා. ඌ තදයා වගේ මාවත් ඇදගෙන ආවට එද්දී තිබ්බ ගට දැන් බැහැලා. මං විහඟගේ අතත් අල්ලගෙන ප්‍රින්සිපල්ගෙ කාමරේ දොර තල්ලු කරා.

''ගුඩ් මෝනිං සර්''

අපිත් අර කරාටේ ක්‍රීඩකයෝ තරගෙ ආරම්භ කරද්දි වගේ දෙකට නැමිලා කිව්වා.

'' ආ ....... ගුඩ් මෝනිං, පුතාලා ඉඳගන්න''

පිස්සු පපඩම් කිව්වලු. වෙනදට සත්තු වත්තෙන් බාගෙකම නම් කියන අපේ සර් අද පුතාලා කියලා කතා කලා.විහඟයා



WWW.EXPRESSLANKA.TK 5

උගේ සාක්කුවේ තිබුණ හඩු ලේන්සුවත් අරගෙන ඇස් දෙකම පිහදලා සර් දිහා බැලුවෙ මේ එයාමද කියලා දැනගන්න. මොනවා උනත් සර්ට අපෙන් කරගන්න ලොකු වැඩක් තියන පාටයි.

" මං ඔයාලට එන්න කිව්වේ වැදගත් කාරණයක් ගැන කතා කරන්න. හෙට ඒ ලෙවෙල් වලට අලුතෙන් ළමයි ගන්නවා. ඒකටත් ඔයාලගෙ උදව් ඕනෙ. අනිත් ප්‍රධානම දේ තමයි හේෂාන් අනිද්දා උදේම උසස් පෙළ ළමයි හැමෝටම මීටින් එකක් ලෑස්ති කරන්න ඕනේ "

ඔය පැන්නේ බළලා මල්ලෙන් එළියට. ඒක සර් මගේ මූණ දිහා බලාගෙන කිව්වෙ මං ශිෂ්‍ය සමිතියේ සභාපති නිසා වෙන්න ඇති. එහෙනං අලුත් නැව එන්නයි හදන්නෙ. මොනවා උනත් ඒ නිව්ස් එක කණට මී පැණි වත්කලා වගේ. විහඟත් පැණි බේරෙන හිනාවක් දාලා මගේ දිහා බැලුවෙ ගිය පාර නැවට දීපු රැග් එක මතක් වෙලා විතරක්ම වෙන්න බෑ. මං දන්නවනේ සතා මොකාද කියලා.

" හැබැයි හේෂාන්, ඒ ළමයින්ට රැග් කරන්න දෙන්න එපා.ගිය පාරත් මට ඒ වගේ ආරංචි ආවා. මේක කැම්පස් එක නෙමෙයි "

පුදපු ගමන් කාපි යකා වගේ සර් ඒක මූණටම කිව්ව කැත. බබා හම්බවෙන්නත් කලින් නැති කරන්නයි මෙයා හදන්නේ. අනික ඉතිං රැග් කරන්න එපා කියලා අපි කාට කියන්නද ? ඒක කරන්නෙත් අපිමනේ.



SL-UNLIMITED.COM

ඉස්කෝලෙ ශිෂ්‍ය නායකයෝ උන අපි මොනාතරම් බාල්දි පෙරලුවත් වගකීමෙන් වැඩ කරනවා කියලා ප්‍රින්සිපල් දන්නවා. ඒ නිසා කවදාවත් අපේ බැජ් කට්ට ගැලවුනේ නෑ. ප්‍රින්සිපල්ගේ දේශනාවට සවන් දීලා අපි එද්දි අපේ සෙට් එකේ ඉතුරු ටිකත් ඇවිත්. පංතියට ගිය ගමන් විහඟයා කරේ ගුරු මේසේ උඩ තිබුණු මල් වාස් එක අනිත් පැත්ත පෙරළලා අරන් සභාව අමතපු එක.

" අසව් ...... අසව්..... අසව්......"

මූ යටි ගිරියෙන් බෙරිහන් දුන්නට කවුරුවත් අහන පාටක් නං පෙනුනෙ නැහැ.

" මෙන්න අපේ හැන්ඩි මල්ලිලාට නාග සලං නිව්ස් එකක්"

ඒක කියද්දි නං එකා දෙන්නා විහඟ දිහාට හැරුණා.

" හෙට උදෑසන උසස් පෙළ අලුත් නැව සෙන්ට්‍රල් වරායේ නැංගුරම් ලන බව නිසි බලධාරියා පවසන ලදි "

ඌට කතාවේ ඉතුරු ටික කියා ගන්න හම්බ උනේ නෑ අපේ ගැන්සිය කෑ ගහලා නටන්න ගත්තා. අපේ පරණ නංගිලාට ඉතිං සොරිම තමයි.

" මචං විහඟයෝ, උඹේ සුනඛ අසිපතට මොකද වෙන්නෙ එතකොට ?"

ෂෝටා ඒ ඇහුවෙ මහේෂා ගැන. ඒකි කට්ට කලුයි. සුදකට කියලා තියෙන්නේ හිනාවෙද්දි පේන දත් පේළිදෙක විතරයි.



WWW.EXPRESSLANKA.TK 6

ඉතිං අපේ කොල්ලෝ ටික දාපු නම තමයි ඒ. ඒක තුන් තේරවිල්ලක් විදිහට දාලා තියෙන්නේ මහේෂාව එක පාරටම චාටර් කරන එක හොද නැති නිසා. මොනවා උනත් සුනඛ අසිපත කියන්නේ බලු කඩුව කියලා දන්නෝ දනිති.

කොහොම හරි එදා ඉස්කෝලෙ ඇරිලා අපි ගියේ හෙට දහසක් බලාපොරොත්තු තියාගෙන අනේ අනිච්චං කියලා මේ සෙන්ට්‍රල් භූමියට ගොඩ වදින පුංචි ඇයො ටික පිළිගන්න ලොකු බැනර් එකකුත් මේන් ගේට් එක ළඟ දාලා ඉවර වෙලයි. වෙනදට දාහක් ලෙඩ හැදෙන අපේ ඒ ලෙවල් තදයෝ ටික හෙටනං ගංවතුර ගැලුවත් ඉස්කෝලෙ එන විත්තිය මට ෂුවර්.

මමත් සුපුරුදු විදිහටම විහඟයා එක්ක පාරට බැස්සේ හෙට දවස ගැන කතා කර කර. හැමදාම උදේට බස් එකේ ඉස්කෝලෙ එන මං හවස ගෙදර ගියේ විහඟගෙ බයිසිකල් කට්ටේ. ඌ හැමදාම ඒකෙ ඇවිත් ඉස්කෝලෙ ළඟ තියෙන කමියුනිකේෂන් එකේ පිටිපස්සේ ලෑලි මඩුවේ ඒක දාලා තමයි ඉස්කෝලෙට එන්නෙ. ඒක නියම බ්‍රෑන්ඩ් නිව් බඩුවක් නිසා මේ වෙනකල් කවුරුවත්ම උස්සලා නෑ.

* * * * * * *

ඔන්න ඉතිං උදේ පාන්දරම නැගිටපු මම වෙනදට වඩා හොඳට ඇඳුමත් මැදලා ලෑස්ති උනේ ටිකක් කලින් යන්නයි. අවුරුද්දෙ දවස් 365 න් හොදම දවස අද දවස කියලා හිතලා මම නමෝ විත්තියෙන් දකුණු කකුල පෙරට තියලා එළියට බහිද්දිම විහඟයා දොරකඩ.



SL-UNLIMITED.COM

වෙනදට කෙලින්ම ඉස්කෝලෙට යන මූ අද මේ පැත්තට පා වෙලා ආවේ ඇයි කියලා අහන්න හිටියත් මට උගේ සැබෑ වෙනස දැකලා ඒ ප්‍රශ්නෙත් අමතක වෙලා ගියා. පොර ජෙල් ගාලා කොණ්ඩෙ උඩට පීරලා ඇඳුම හොඳට මැදලා විතරක් නෙමේ කිරි ටොයිස් වගේ සපත්තු දෙකකුත් දාලා. මූ නං ෂුවර් එකට පෝය දවසෙ කළුතර බෝධිය පැත්තෙවත් ගිහින් තියෙන පාටයි.

" මොකෝ බං බයවෙලා වගේ ? මං හරියට රිතික් රෝෂන් වගේ නේද? "

මූ කමිස කොලර් එකත් උස්සලා මගෙන් ඇහුවා.

" පුහ්..... රිතික් දන්නවනං කිචි කවාගෙන මැරෙනවා. ඒක නෙමේ මොකෝ අද මේ පැත්තෙ?"

" නෑ බං මට හිතුනා අද උඹ බස් එකේ ගිහින් ඇඳුම් තලාගෙන, දාඩියපෙරාගෙන එන එක හරි නෑ කියලා. ඉතිං මං මගේ රථයෙන් උඹව කැන්දන් යන්න ආවා"

අම්මද බොල කිව්වලු. මූත් හරියට බුදුවෙන්න වෙටින් ලිස්ට් එකේ ඉන්න ගානට කතාව. ඒ තරං සත්ව කරුණාව.

" අඩෝ මේ, බස් එකේ ගියොත් වෙන්නේ ඇඳුම් තැලෙන එකයි දාඩිය දාන එකයි විතරයි, ඒ වගේද උදේ පාන්දර මේකෙ



WWW.EXPRESSLANKA.TK 7

නැගලා ගියොත් ඔය කියපු දෙකට අමතරව මජං ගාගෙන , තල්ලු කරගෙන, පිටගැස්ම හදාගෙන...."

" ඇති ඇති මං යනවා. උඹ වරෙං බස් එකේ. හැබැයි මල්ලි හවසටත් මං නෑ හරි "

විහඟයාට තද උනා වගේ පෙන්නුවට ඌට තද වෙන්නෙ නෑ කියලා මං අත්දැකීමෙන් දන්නවා. මොකද මූ අවුරුදු ගානක්ම මගේ බඩ බැඳගෙන ඉන්න අතීසාර මිත්‍රයනෙ. ඉතිං මං මිනිහව තවත් බයිට් එකට ගන්නෙ නැතුව බයිසිකලේ පොල්ලෙ ඉඳගත්තා.

ඉස්කෝලෙ ගාවින් බහිද්දි පශ්චාත් භාගය තිබුණෙ දත් ගලවන්න ඉන්ජෙක්ෂන් ගහපු ගානට. කොටින්ම කියනවානං නෑ වගේ.

අද නං සෙන්ට්‍රල් එක හරියට පේරාදෙණිය මල් වත්ත වගේ . අළුත් කොල්ලෝ කෙල්ලෝ විතරක් නෙමෙයි උන්ගේ අම්මලා තාත්තලා පාට පාටින් දිලිසි දිලිසි තැන් තැන්වල. විහඟගෙ කටත් පන්සලේ පිං කැටේ වගේ නොන්ස් ටොප් ඇරිලා.

" මචං ඔය ලේන්සුව අරන් නිකට හරිය පිහද ගනිං"

" ඇයි රන්දූ මොනවද ?"

මූ කලබල උන පාරට අත් දෙකෙන්ම කට වටේ පිහිනවා.



SL-UNLIMITED . COM

" නෑ මචං, පැණි පෙරෙනවා "

මං ඒක කිව්වෙ ටිකක් විතර ඈත් වෙලා.

" රන්දූ උඹට මං......."

කියාගෙන මූ මගේ පස්සෙන් එළවගෙන ආවා.

ගුරුවරු සේරම හේෂාන් කියලා කථා කලාට යාළුවො හැමෝම මට කිව්වෙ රන්දූ කියලා. ඒකට හේතුව තමයි මගේ නම හේෂාන් රන්දුල උන එක. කොහොමහරි මූ මගේ නමත් කියාගෙන පස්සෙන් එන නිසා මං ග්‍රවුන්ඩ් එක පැත්තට දුවන්න හැදුවා. හැබැයි අහක බලාගෙන ගිය මං නතර උනේ කාගෙද ඇගේ දඩස් ගාලා හැප්පෙද්දියි. මං බයෙන් වගේ හැරිලා බැලුවෙ මාව හැප්පුනේ කලු මහත ඇන්ටි කෙනෙක්ගෙ ඇඟේද දන්නේ නැති නිසා.

හත්වලාමයි......... මලක් වගේ සුදු කෙල්ලෙක්. හරියට නිකං රාණි මුකර්ජි වගේ. විහඟයත් ඉඳලා ඉඳලා කරේ කියලාවත් කර ගන්න බැරි වැඩක්. ඒත් ඉතිං මමත් විහඟ වගේ ඇඹලයා වෙලා බැහැනෙ.

" අයි ඇම් වෙරි සොරි නංගී "

මට ඩීසන්ට් පිටම කිව්වා. ඒකි මගේ මූණ දිහා බලලා මල් මල් හිනාවක් දැම්මා. වචන දාහකට වඩා ඒක වටිනවා.



WWW.EXPRESSLANKA.TK 8

මොනවා උනත් විහඟයගේ මූණේ ඊරිසියාව දෝරෙ ගලනවා. මං ආයෙත් අර සුදු කෙල්ල දිහා බලලා විහඟයවත් ඇදගෙන පංතියට ආවා. අද පංතියේ කොල්ලො සේරම කලින් ඇවිත්. ඒ මදිවට එක එකා ළඟින් එක එක සුවඳවල් එනවා. අපේ කට්ටිය ගෙදර අක්කලා අයියලාගේ සුවඳ කුප්පි ටිකට ගේම දීලා තියෙන පාටයි.

අලුත් ළමයි බාරගන්න වැඩ වලට වෙන් කරලා තිබුණෙ මේන් හෝල් එක. ඊයේ ප්‍රින්සිපල් සර් කිව්ව නිසා මමයි විහඟයයි, ෂෝටායි, නිරෝධයි කට්ටියම ඒ පැත්තට ගියා. ළමයි සීයට අනූවක් විතර බයෙන් වගේ හිටිය
ත් ටික දෙනෙක් හිටියෙ තදයෝ වගේ. බලමුකෝ මල්ලිලා පස්සේ හැප්පෙමු කියලා හිතලා අපි ඇතුළටම ගියා. ඒ වෙද්දිත් ප්‍රින්සිපල් සර් ඇවිත් හිටියේ. මෑන් මොනවා උනත් වෙලාවට වැඩ. අපිත් ඒ හරියට ගිහින් වැඩ වලට හොට දැම්මා. නන්දනී මිස් දිග මේසෙක වාඩිවෙලා පොතක ලිය ලිය ඇප්ලිකේෂන් භාර ගන්නවා. විහඟත් එතනම ඉදගෙන වැඩ පටන් ගත්තා.

මමයි ෂෝටායි සෙට් උනේ ඒ ඇප්ලිකේෂන් ටික සෙක්ෂන් වලට බෙදන්න. අපි ඒවා සෙක්ෂන් වලට වෙන් කරපු ෆයිල් ඇතුලෙන් දාද්දි සමහර ළමයි ඇවිත් එබිලා බැලුවෙ තමන්ගේ නම හරි සෙක්ෂන් එකට යනවද කියලා දැනගන්න.

මං එක ඇප්ලිකේෂන් එකක් අරන් බලද්දි ඒකෙ තෝරාගන්නා අංශය කියන තැන හිස් තැනක් තිබුණා. මේක පුරවපු එකාට මෙලෝ සිහියක් නෑ කියලා හිතලා මං නම කියලා කෑ ගහන්න හදද්දිම කවුද කතා කලා.



" අයියේ, මේක කලා අංශයට දාන්න"

මයිගොඩ් ! ඒ අර සුදු නංගි.

"හරි නංගි , මං දාන්නං ඔයා යන්න."

මං ඉක්මනට එයාව යවාගත්තෙ ඒ ඇප්ලිකේෂන් එකේ විස්තර ටිකක් බලාගන්න.

නම : දූෂානි සංජුලා මොරගොඩ
උපන්දිනය : මැයි 21

හැබැයි සුදූ, ඒ නම නං ඔයාට ගැලපෙන්නෙ නෑ කියලා මට නිකං හිතුනා. ඒත් ඉතිං ගතිම වැඩේ කියන්නේ අද මැයි විස්ස උන එක. ඒ කියන්නෙ හෙට ඔයාගෙ උපන්දිනේ. අදට වඩා හෙට හොඳයි කියනවනෙ. අපි බලමුකො. ඒත් අප්පා අපි කොමර්ස් කරද්දි මේ රාණි මුකර්ජිව කලා අංශෙට දාලා හිත හදාගන්නෙ කොහොමද ? මං අර ප්‍රින්ටින් මිස්ටේක් එකක් උනා වගේ හෙමීට ඒක වාණිජ අංශය කියන ෆයිල් එකට දාලා වටපිට බැලුවා. අවුලක් නෑ කෙල්ල මාව විශ්වාස කරලා එතනින් ගිහින්. මගේ සීන් කෝන් එක දැක්කෙ ෂෝටා විතරයි.

"මාර පාර නේද බං? " ඌ ඒ ඇහුවෙ කෙල්ල ගැන.

" ඔව් බං තාර පාර වගේ, කිසි ඇදක් නෑ"

" දැන් එතකොට හෙට ඉඳලා ඒකි කොමර්ස් ක්ලාස් එකේ"



SL-UNLIMITED . COM

WWW.EXPRESSLANKA.TK 9

"ආයිත් අහලා. පස්සෙ ඒකි මිස්ලාට කියලා ඕක හදා ගනී. ඒත් ටික දවසක්වත් අපේ එකේ ඉඳියිනෙ "

" ටික දවසක් ඉදලා ඒකි දිගටම කොමර්ස් කරන්න ඕනේ කිව්වොත් මරේ මරු"

මූත් ඉඳගෙන දවල් හීන දකිනවා. කොහොම හරි ඒ හීනේ හැබෑ වෙනවානම් මාර ගති. කොහොමටත් සියළු සයන්ස් කාරයෝ නැසෙන සුළුය. නොපමාව කොමර්ස් කරන්න කියලා කතාවකුත් තියනවානේ.

අපි උදේ පීරියඩ් දෙකම වගේ හිටියෙ හෝල් එක ඇතුලෙ. එළියට ඇවිත් බලද්දි ගොඩක් අම්මලා තාත්තලා ගිහින්. ඒත් ඉතිං සමහර අය හරියට මොන්ටිසෝරියට ළමයි දාලා යන්න දුකෙන් ඉන්නවා වගේ තාම ගේට්ටුව ලඟ. යකෝ මෙහෙම පුරුදු කරගත්තොත් එහෙම මුං බැඳලා යන දවසටත් අම්මලා පස්සෙන් යයි.

දවල් වෙනකල්ම චාටර් කාපු අපි මොනවාහරි ටිකක් ආමාශගත කරගන්න පංතියට ආවා. ඒ වෙද්දී අපේ කට්ටිය අළුත් නැවේ දිග පළල හොයාගෙන ඉවරයි.

" මචං ලස්සනම කෙල්ලො ටික ආර්ට් එකේ බං"

නිරෝධගෙ ශෝක ජනක කටහඬ මුලින්ම ඇහුනා.

" ඒත් බං රාණි නං අපේ සෙක්ෂන් එකේ "





ෂෝටා පැනලා දුන්නා.

SLU

" ඒයා බං, මහ ගොඩේ නමක්නේ. ෂුවර් එකටම ඒකි අනුරාධපුර, පොළොන්නරු පැත්තේ ඩයල් එකක් වෙන්න ඇති."

අඩේ ! මු හිතං ඉන්නේ රාණි කියන්නේ කෙල්ලගේ නම කියලා. ෂෝටා දෙකට නැමීගෙන හිනාවෙනවා.

" ඒයි නිරෝධයෝ, රාණි කිව්වේ ඒකිගේ නම නෙමෙයි බං. රාණි කිව්වේ රාණි මුකර්ජි කියන එක. ඒකි සිරාවටම ලස්සනයි"

" මචං අපේ සෙක්ෂන් එකටත් ඇවිත් ඉන්නවා නිකං කාජල් වගේ සුදු කෙල්ලෙක් "

ඒක කිව්වේ ආර්ට් එකේ ඉඳං ආපු සාරංගයා. මෙහෙම යද්දී තව එකෙක් කියයිද දන්නෙ නෑ ප්‍රියංකා චොප්රාත් ඇවිත් හිටියා කියලා. බලං යද්දී හින්දි තිලියො සේරම ටික සෙන්ට්‍රල් එකේ. පිස්සු පීකුදු වෙනවා. අදනං කට්ටියට බඩගිනිත් නැති පාටයි.

SL-UNLIMITED.COM

ඊයේ වගේම අපි සෙට් එක උදේම ඉස්කෝලෙට ආවෙ අද ඒ ලෙවල් මීටින් එක ලෑස්ති කරන එකටත් වඩා ඊයේ ආපු කැකුලියො ටික උදේම බලා ගන්න.



WWW.EXPRESSLANKA.TK 10

" රන්දූ මට අර කෙල්ල ගැන දුකයි බං. පව් ඒකි උඹට හිතෙන් බැන බැන කොමර්ස් ක්ලාස් එකේ ඇති "

ෂෝටා උදේම ඒ මතක් කලේ අපේ රාණි හෙවත් සුදු නංගිව. එතකොටයි මට මතක් උනේ අද මැයි 21 කියලා.

"මචං අද එයාගෙ උපන්දිනේ. දෙමුද පොඩි ගේමක්..."

අපිත් ඉතිං ඔය වගේ පොඩි පොඩි චාන්ස් මිස් කරන්නෙ නෑනේ.

" උඹ කොහොමද ඒක දන්නේ ? "

" ඇයි බං ඒක ඇප්ලිකේෂන් එකේ තිබුණනෙ"

" හරි හරි, උඹ තත්පරෙන් ෆෝල්ඩර් එකම කොපි පේස්ට් කර ගත්තා වගේ. යමං අපි උන්ගෙ පංති පැත්තෙන්ම මේන් හෝල් එකට යමු "

අපි දොළහ වසරෙ කොමර්ස් ක්ලාස් තුනම බලාගෙන ගියාට ඒ එකකවත් එයා හිටියෙ නෑ. ඇවිත් හිටපු ළමයිත් අවතාර දැකලා වගේ පුටුවල ඇලිලා බලාගෙන ඉන්නවා. අපිව දැක්ක සමහර අය ගුඩ් මෝනිං අයියෙ කියලා පුටුවෙන් නැගිටලම කිව්වෙ ඊයේ දැකලා පුරුදු නිසා වෙන්න ඇති. අනික ඉතිං ෂෝටයි මමයි හතරරියන් සහ දෙරියන් වගේ නිසා කොහොමත් මතක හිටිනවනෙ.





SLU

" කෝ බං නෑනේ "

ෂෝටා හතර වටේම කරකව කරකව හිටපු ඇස් දෙක මගේ දිහාට හරවලා කිව්වා.

" තව වෙලා තියෙනවනෙ. ඒකි එයි බං. යමු මෙලහකටත් අරුන් ටික මේන් හෝල් එකේ ඇති "

අපි යද්දි අපේ කට්ටිය හයහත් දෙනෙක්ම ඇවිත් වැඩ. විහඟයා නිරෝධ එක්ක ජේළියට පුටු හදනවා. මහේෂයි ජනාලියි දෙන්නා අතුගානවා. අපිත් ගිහින් මයික් සෙට් කරලා ස්ටේජ් එක ලෑස්ති කරන්න ගත්තා. පොඩි වෙනසකටත් එක්ක බැලුම්බෝල ටිකක් එහෙම පුම්බලා ක්‍රේප් පටි දාලා එල්ලලා තිබ්බේ පොඩි ළමයි පිළිගන්න ඊට වඩා හොඳ විදියක් නැති නිසා. ඒ අතරෙ සාරංගයා දුවගෙන ඇවිත් නිරෝධට ඇහැක් ගැහුවා. මූත් එක පාරටම අතේ තිබුණ වයර් ටික බිම අතඇරලා දිව්වෙ අපි මූණට මූණ බලාගෙන ඉද්දි. මුන් දෙන්නගෙ මොකක් හරි සතරකන් මන්ත්‍රණයක් තියෙනවා කියලා තේරුන මං විහඟ එක්ක හෙමීට පස්සෙන් යන්න හිතා ගත්තා. මුන් කොහෙද අපේ කනෙන් රිංගන්නෙ කියලා හිතලා දොර ළඟට යන්න උනේ නෑ ප්‍රින්ස් ඇතුළට එනවා.

" ෂා නියමයි. කට්ටිය උදේම ඇවිත් වැඩේ ලස්සනට කරලා. එහෙනම් මේ මල් ටිකත් ඔයාලම ඇරෙන්ජ් කරන්නකො"

ප්‍රින්සිපල් පොඩි පංති වල නංගිලා දෙන්නෙක් ගෙනාපු මල් බෑග් ටිකක් අපිට දීලා මාරු උනා.



WWW.EXPRESSLANKA.TK 11

" බලපං ඉතිං! අපි මේ ෂර්ලොක් හෝම්ස් වගේ පොඩි ගේමකට සෙට් වෙන්න හදද්දීම පරාල ඇනයක් සෙට් උනානේ"

විහගට තද වෙලා.

SLU

අන්තිමට ඉතිං සාරංගලා පස්සෙන් යන එක පැත්තක තියලා අපි ෆාම්ස් අතුයි ඇන්තූරියම් මල් ටිකයි ඇරෙන්ජ් කරන වැඩේ බාර ගත්තා. බෙල් කරන්න විනාඩි පහක් තියෙද්දි අපේ වැඩ ඉවරයි. හෝල් එක ඇත්තටම ලස්සනයි කියලා හිතුනෙ දොර ළඟට ඇවිත් බලද්දියි. වැඩේ ඉවර වෙද්දිම සාරංගයි නිරෝධයි කුටු කුටු ගගා එනවා දැක්කා. ඒත් එක්කම අපේ මිස්ලා අළුත් ළමයි කට්ටිය පේළියට එක්කගෙන ඇවිත් හෝල් එකේ ඉන්දෙව්වා. අපේ දහතුන වසරෙ කට්ටිය ඉඳගත්තෙ පිටිපස්සේ. ඒ ලෙවල් ගුරුවරුත් ආවට පස්සෙ අපි රැස්වීම පටන් ගත්තා. ප්‍රින්සිපල් සර්ගෙ කතාව යන අතරෙ මම හෙව්වෙ බර්ත්ඩේ ගර්ල්ව. එයා හරි තැන්පත් විදියට සර්ගෙ කතාව අහගෙන ඉන්නවා. විශේෂාංග වටයෙදි හැමදාම පුරුදු විදියට මයික්‍රෆෝනය ආවෙ මගේ අතට.

" ඉතිං ආදරණීය සහෝදරවරුනි, අපේ විදුහල්පති ගුරු පියාණන්ගෙ හරවත් දේශනයෙන් ඔබ අපේ පාසල ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගන්න ඇති. අපි අද මේ රැස්වීම විශේෂයෙන්ම සූදානම් කලේ අපේම නංගිලා මල්ලිලා විදියට මේ විදුබිමට පා නැගූ ඔබ පිළිගන්නයි. ඉතිං අපි ඔබ වෙනුවෙන් කල මේ ඇගයීමට ඔබගේ දායකත්වය අප වෙත ලබා දෙන්න කියලා සහෝදරත්වයේ දෑත දිගුකර මං ඉල්ලා හිටිනවා. ඒ වෙනුවෙන් මුලින්ම මියුරු





ගීයකින් අප පිනවන ලෙස මං ආරාධනා කරනවා අද උපන් දිනය සමරන නවක සිසුවියක් වන දූෂානි සංජුලා නංගිට."

අපේ කට්ටිය කෑ ගහලා විසිල් පාරවල් දෙකතුනකුත් ගහලා සපෝට් එක දුන්නා. ප්‍රින්සිපල් සර්රුත් හිනාවෙවී බලන් ඉන්නවා.

හැබැයි සින්දුව කියන්න නැගිටලා ස්ටේජ් එකට ආවෙ අර සුදු නංගි නෙමෙයි. එයා ළඟ ඉඳගෙන හිටපු මහත කෙල්ල. උනේ මොකක්ද කියලා හිතාගන්න බැරුව මං ෂෝටා දිහා බැලුවා. ඌත් හරියට හොල්මනකට බයවෙලා වගේ. එතකොට ඇත්ත දූෂානි සංජුලා මෙයාද? අර නංගි මගේ අතට දුන්නෙ එයාගෙ ඇප්ලිකේෂන් එක නෙමෙයිද ? මං එයා කියලා හිතලා කොමර්ස් ක්ලාස් එකට දාගත්තෙ මෙයාවද ? වගේ ප්‍රශ්න තොගයක් මගේ ඔළුවෙ කැරකෙන්න ගත්තා. ෂෝටත් හරියට බහුවරණ ප්‍රශ්න පත්තරේ වගේ ප්‍රශ්න හතලියක් විතර මූණෙ තියන් අර මහත කෙල්ල දිහා බලන් ඉන්නවා. ස්ටේජ් එකට ඇවිත් මගේ අතින් මයික් එක ගත්තු එයාගෙ අත වෙව්ලනවා කියලා මට දැනුනා.

" නංගි ඔයාද සංජුලා ? "

මං සැකය නැති කරගන්න ඇහුවා. "ඔව් "කියලා හෙමීට කොඳුරලා එයා සින්දුව කියන්න පටන් ගත්තා.

" තරුද නිදන මහ රෑ
නිදිම් මහද නිදි නෑ.................. "



WWW.EXPRESSLANKA.TK 12

සංජුලාගෙ ගීතවත් හඬ ශාලාව පුරාම රැව්දෙද්දි හිනාඋන අපේ කොල්ලො ටික මීයට පිම්බා වගේ නිශ්ශබ්ද උනා. ඇත්තටම කෙල්ලගෙ පෙනුමට හිනාඋන එක ගැන මටම ලැජ්ජාවක් ඇති උනා. එයා ඒ තරමටම දක්ෂ කෙල්ලෙක්. ඒ අතරෙ සාරංග ඇවිත් මගේ අතට කොලයක් දුන්නා.

" මචං මේ අපේ සෙක්ෂන් එකේ කාජල්. ඒකිවත් ගෙන්නපං"

මං හෙමීට කොලේ දිගඇරලා බැලුවා. 'නෙත්මි අහිංසා ඉද්දමල්ගොඩ' මොනවා උනත් සිරා නමක්. සංජුලාගේ සින්දුව ඉවර උනාම මං ඒ නම කතා කලා. මෙන්න එතකොට නැගිට්ටෙ කාජල් නෙමෙයි. අපේ රාණි මුකර්ජි. දැන්නං මගෙයි ෂෝටාගෙයි මොලේ කොලොප්පං වෙන එක හොඳටම ෂුවර්. බලාගෙන යද්දි සාරංග කියපු කාජලුයි අපේ රාණියි දෙන්නම එක්කෙනෙක්. පත්තරේ විස්තරේ පස්සෙ දිග අරින්න හිතාගෙන අපි සින්දුව අහන්න සෙට් උනා.

SLU

" අම්මාවරුනේ............ අම්මාවරුනේ............
සම්මා සම්බුදු අම්මාවරුනේ ............ "

ඒ හඬ සංජුලාගෙ කටහඬටත් වඩා මාර ගති. එයා හරියන්නෙ කොමර්ස් වලට වඩා ආර්ට් වලට තමයි.

කොහොම හරි රැස්වීම ඉවර කරන්න උනේ මටත් සින්දුවක් කියන්න උනාට පස්සෙ. ප්‍රින්සිපල් සර් මගේ නම කියලා කතා කලේ වෙනදටත් සමිතිවල මගේ සින්දුවක් අනිවාර්ය නිසා වෙන්න





ඇති. මං කිව්වෙ අමරදේව මහත්තයගෙ 'සඳ තරු නිහඬයි' ගීතය. පිටි පස්සෙම පේළිවල හිටපු අපේ කට්ටිය සින්දුවට තාලය සපයද්දි හැමෝම ඒකට එකතු උනා.

" මචං උඹේ සින්දුව නං මාර සිරා"

විහඟයා පන්තියට යන ගමන් මගේ කරට අත දාලා කිව්වා. ඒත් ඒ වෙලාවෙ මගේ හිතේ තිබුණෙ සංජුලාගෙයි අර නංගිගෙයි නම් වල උන අවුල ගැන. මොනවා උනත් උන් දෙන්නටම ලස්සනට සින්දු කියන්න පුළුවං. ඒක ඉතිං කිරි ගහට පොල්ලෙන් ගැහුවා වගේ බුදු ෂුවර්. මං ෂෝටා දිහා බැලුවා. මූත් හරියට අර අන්දරේ වගේ නිකටට අත තියාගෙන කල්පනාව.

" මොකක්ද බං අර උන වාටර් සීන් එක "

මං උගේ ළඟට ගිහින් හෙමීට ඇහුවා.

" ඒයි රන්දූ උඹලා කියපු අර රාණි මුකර්ජීද පළවෙනි සින්දුව කිව්වේ ? උඹ උපන් දිනයක් ගැනත් කිව්වෙ. ඒකි නං නියම බැරල් බාගෙ. ඒ වගේද අපේ අයිටම් එක, මාර කොලිටි."

සාරංගයා හෙන සද්දෙකුත් දාගෙන පංතියට කඩන්පාත් උනා. ෂෝටගෙ මූණ ඇඹුල් වෙලා. වෙච්ච සීන් එක මූට කියනවට වඩා හොඳයි ඉරිදා පත්තරේට දාන එක. චාටරේ අපිටම නිසා කතාව අනිත් පැත්ත ගහන එක ඇඟට ගුණයි.

" නෑ බං ඊයෙ ආපු ඒ කෙල්ල අද ඇවිත් ඉන්නවා දැක්කෙ නෑ. සමහර විට ඊයෙම හැරිලා ගියාද කවුද දන්නේ "



WWW.EXPRESSLANKA.TK 13

" අඩේ මල්ලි බොරු එපා නිකං. නෙත්මි වගේ ලස්සන කෙල්ලෙක් වෙන එක පන්තියකටවත් ආවෙ නෑ. පුළුවන්නම් පෙන්නපං "

සාරංග චැලේන්ජ් කරද්දිම අපේ පංතියට මිස් ආවා.

" ආ ... මේ මොකද ආර්ට් එකේ ළමයි මේ පැත්තෙ ? "

" සහෝදර ප්‍රේමයනෙ මිස් දන්නෙ නැද්ද ? "

කියාගෙනම සාරංග මාරු උනා. හොඳ වෙලාවට මිස් ආවෙ. නැත්නං ඉතිං ඌ අපිව තවත් බයිට් එකට ගන්නවා. කොහොම උනත් මේ කෙල්ලො දෙන්නම හම්බවෙලා මේ ගැටේ ලිහාගන්න ඕනෙ.

" ළමයි උදේ පිරියඩ් දෙක තුනම මග ඇරුනා නේද ? කමක් නැහැ,ඔයාලා තමයි දැන් මේ ඉස්කෝලෙ ඉන්න ලොකුම ළමයි ටික. ඔයාලාගෙ ඔළුවෙ ලොකු වගකීමක් තියෙනවා ඉස්කොලෙ ගැන වගේම විභාගෙ ගැන "

මිස් කියද්දි විහඟ ඔළුව අතගානවා මං දැක්කා. ඌ හොයන්න ඇති ඔය කියන වගකීම කොයි හරියෙද තියෙන්නෙ කියලා.

"උසස් පෙළ පංතියෙ අවුරුද්දක්ම ගෙවිලා ඉවරයි. දැන් මේ ඉතුරු අවුරුද්දවත් හොඳට සැලසුම් කරලා පාඩම් කරන්න





පටන් ගන්න. මං හිතන්නෙ මේ පංතියෙ කවුරුවත්ම නෑ විභාගෙ ෆේල් වෙන මට්ටමේ. ඒ නිසා ඔයාලා හැමෝගෙම අධිෂ්ඨානෙ වෙන්න ඕනෙ සරසවි පිවිසුම. තේරුණා නේද ? දැන්ම ඉඳලා කාල සටහනකට වැඩ කරන්න පටන් ගන්න. එතකොට විභාගෙ කිට්ටු වෙලා දුම් දාගෙන පාඩං කරන්න ඕනෙ නැහැ."

ආපෝ! මිස් පංතියට ආපු ගමන් දිගට හරහට දේශනේ. හැබැයි ඉතිං මිස් කියපු දේවල් සීයට සීයක් ඇත්ත. මීට වඩා උනන්දු වෙලා පාඩං කරන්න ඕනෙ කියලා මටත් හිතුනා. අපි සෙට් එක හැමදාම හිතනවා කට්ටිය එකතුවෙලා පාඩං කරන්න. ඒත් ඒක බාලගිරි දෝෂය වගේ තමයි.

ආර්ට් සෙක්ෂන් එකේ ඉන්න සාරංග, දිනුක, අචිනි, ජනාලි එහෙම එක වසරෙ ඉඳලම අපේ පංතියෙ හිටපු කට්ටිය. කොයිතරම් මරාගත්තත් අපි අතරෙ වලි හරියට සෝඩා බෝතලේ ඇරියා වගේ තමයි. එකෙක්ට ප්‍රශ්නයක් උන වෙලාවට බොක්ක දෙන්න උනත් අනිත් කට්ටිය ඉන්නවා. අපේ පංතියෙ ඉන්න විහඟ, ෂෝටා නිරෝධ, සචිනි, මහේෂා සහ මම තමයි අපි දහදෙනාගෙ ඉතුරු ගැන්සිය. සෙක්ෂන් එක වෙනස් උනාට අපි තාම බුදු පිට්.

SL-UNLIMITED.COM

ගෙදර ඇවිත් නාපු ගමන්ම මට යකෙක් කන්න බඩගින්නක් ආවා. මං කොහොමත් වැඩ ගොඩක් කරන්න ඔළුවෙ තියාගෙන



WWW.EXPRESSLANKA.TK 14

අද ආවේ. ඒ නිසා ඉක්මනට කාලා පිඟානෙ බත් කටක් විතර ඉතුරු කරලා ඒක ගිහින් කුස්සියෙන් තිබ්බා. ඒ වෙන මොකටවත් නෙමෙයි. පිඟාන හෝදන්න තියෙන කම්මැලිකමට. නැතිව පිදුරුතලාගල වගේ බත් එකක් ගිලපු මට ඔය එක බත්කට මහ කජ්ජක්ද?

උදේ මිස්ගෙ දේශනාව අහපු මට ඇත්තටම හිතුනා හොඳට පාඩම් කරලා කැම්පස් යන්න ඇත්නම් කියලා. ඒකට ඉතිං මුලින්ම මේ යකා නටලා තියන පොත්පිත පිළිවෙලකට අස් කරලා මිස් කිව්වා වගේ පාඩම් කරන්න ටයිම් ටේබල් එකක් හදා ගන්න ඕනෙ. ඒත් ඉතිං ඔය සේරටම කලින් ගිලපු බත් එක දිරවගන්න එපැයි. මම ෆෑන් එකත් දාලා ටිකක් ඇඳේ ඇලවුනා.

" ඒයි නැගිටපං බං. මොකද මේ මහ දවල් කුම්භකරණයා වගේ නිදි "

ඇස් ඇරලා බලද්දි ෂෝටා ඇඳට පැනලත් ඉවරයි. අම්මපා මේ අපතයා නිදහසේ නිදියන්නවත් දෙන්නෙ නැතිහැටි.

" මොකද බං ඉස්කෝලෙදිත් වද දීලා දීලා ගෙදර ඇවිල්ලවත් ඉන්න දෙන්නේ නැද්ද ? උඹලගෙ ගෙවල් තෙමෙනවද? "

මං තවත් කොට්ටයක් අරන් මූණ වහන ගමන් කිව්වා.

" ඒ රන්දූ නැගිටපං. මං උඹේ රාණි මුකර්ජිගෙ ෆිල්ම් එකේ විස්තරේ හොයාගත්තා. "





ඒක ඇහුවමනම් මගේ නිදිමත ගියා. එතකොටම අම්මා පැෂන් වීදුරු දෙකකුත් අරන් කාමරේට ආවා. ඒ කියන්නේ මූ අම්මා ගාවටත් ගිහින් පොත අත්සන් කරලා ඇවිත් තියෙන්නෙ.

" ඔන්න පුතාට රස්නෙයි කියපු නිසා මං කූල් එකක් හදාගෙන ආවා."

අපේ අම්මා මට වගේම මගේ යාළුවො ටිකටත් හරි ආදරෙයි.

" ඒකනේ ඇන්ටි මූ ඉතිං ආපු වෙලේ ඉඳලා කරන්නේ බනින එක. එත් ඇන්ටි අපිට සලකනවා කියලා අපි දන්නවා. "

අප්පා! මූ එනගමන් කඩේකට රිංගලා හෙන බටර් තලියක් ගෙනත් හෝ ගාලා උලනවා. අම්මා ඌගේ ඔළුවත් අතගාගෙනමයි ගියේ. පොර මගේ දිහා බලලා කොලර් එක උස්ස ගත්තා.

" මේකයි බං සීන් එක අර සුදූ කෙල්ල නෙත්මියි බැරල් බාගෙ හෙවත් සංජුලයි දෙන්නම හොඳම යාළුවොලු. උන් කලින් ගිහින් තියෙන්නේ රත්නපුරේ ඉස්කෝලෙකට. උන් දෙන්නම ඒ ඉස්කෝලෙන් සමස්ත ලංකා ගායනා තරග වලටත් ගිහින් තියෙනවා. කොහොම හරි නෙත්මි එයාගෙ ෆෝම් එක භාරදීලා තියෙන්නේ කලා අංශය කියලා දාලා. ඒත් ඒකිගෙ යාළුවට ඒක දාන්න අමතක වෙලා. ඒකි උඹ ළඟට ඇවිත් කලා අංශෙට දාන්න කියලා තියෙන්නෙ එයාගෙ ෆෝම් එක නෙමෙයි යාළුවගෙ එක. උඹත් ඉතිං ගුලිය කාලා ලස්සන කෙල්ලව කලා අංශෙට දාලා බැරල් බාගෙ අපේ එකට දාගත්තා."



WWW.EXPRESSLANKA.TK 15

මළකෙලියයි. එහෙනං ඒක තමයි මේ වැඩේ චකබ්ලාස් වෙලා තියෙන්නේ. ඒත් මූ කොහොමද මේ විස්තරේ මේ තරම් හොඳට හොයාගෙන තියෙන්නේ.

" දැන් සීන් එක හරිනෙ මල්ලි. දැන් උඹ අහන්න යන්නෙ මං මේක දැනගත්තේ කොහොමද කියලනේ ?"

මූට නම් දිවැස් තියෙනවා. ඇඟ පොඩි උනාට මොලේ පොඩි නෑ.

"එහෙනං ඉතිං අගේ නොකර ඒකත් කියපං "

" උඹ දන්නවනේ අපේ චුටි නැන්දගෙ දුව පවිත්‍රා. මේකිත් ඒ ලෙවල් වලට අපේ ඉස්කෝලෙට රිංගලා. එයත් ආර්ට් ක්ලාස් එකේ. මං දැන් එන ගමන් එහෙ ගියා. ඒකි මගෙන් අහනවා අපි කොහොමද නෙත්මිට සින්දු කියන්න පුළුවං කියලා දැනගෙන එයාව ස්ටේජ් එකට ගෙන්නුවෙ කියලා "

" ඒ කියන්නේ උඹලගෙ නංගි ඉන්නෙ නෙත්මිගෙ පංතියෙද ? "

" ඔව් බං. කෙල්ල අඬනවලු එයාගෙ පොඩිකාලේ ඉඳලා හිටපු යාළුවව කොමර්ස් ක්ලාස් එකට දාලා කියලා. ඒ විතරක් නෙමෙයි ඒකි කිව්වලු අර අමරදේවගෙ සින්දුව කියපු අයියා තමයි ඒක වරද්දලා තියෙන්නේ කියලා."





මිල්ක් ෆාදර්ට ඩෝග්ස්ලා බාකිං කිව්වලු. බලපං මේ කෙල්ල මාව පාවලා දීලා තියෙන කැත විතරක්. මට වැරදිලා යාළුවව දාලා එහෙම අඬනවානං ඒකිව කොමර්ස් වලට දැම්මනං කොහොම අඬයිද?

" උඹලගෙ නංගිත් ඒ පන්තියටම වැටුන එක එළකිරි මචං. දැන් ඉතිං අපිට ඒකිගෙ නිව්ස් ගන්න පුළුවං සිං සිං ගාලා. "

" අනේ පලයං බං යන්න. උඹ නං කියයි. මෙච්චර කාලයක් මගේ තිබ්බ ස්වෛරීභාවය දැන් ඉතිං කම්බස්. අපේ හැම මගෝඩි වැඩක්ම මේකි ගෙදර ගිහින් චුටි නැන්දා එක්ක කියයි."

කතාවනං ඇත්ත තමයි. ඒත් මට ඒකෙන් ආබාධයක් නැහැනෙ. අනික මූට කුඩු වෙන්න තරම් කාඩ් එකක් තියන එකක්යැ.

"ඒක නෙමෙයි බං අපි හැමදාම පිස්සු නටලා හරියන්නෙ නැහැ. අපි සෙට්එක එකතු වෙලා පාඩං කරමු. අපිට සචිනිලව ගන්න බැරි උනත් අනිත් කට්ටිය හරි එයිනේ. උඹ මොකද කියන්නෙ ? "

මං පොඩි සීරියස් කතාවක් දැම්මා ෂෝටගෙ අදහස් දැනගන්න. පාඩං කිරිල්ල කෙසේ වෙතත් අපේ කට්ටිය සෙට් කරගන්න එකනං ඒ තරං අමාරු වෙන්නෙ නැහැ.

"ඕක ඉතිං හැමදාම ගහන බයිලාවනෙ. අපි සෙට් උනාට කවද්ද පාඩං කලේ ? "



WWW.EXPRESSLANKA.TK 16

" ඒක නිසා තමයි ගොනෝ කිව්වෙ දැන්වත් පටන් ගමු කියලා "

"හරි හරි උඹලා මොකටද ගොන්නු එක්ක පාඩම් කරන්නෙ. ඕන මගුලක් කරගනින්. මං එන්නෙ නෑ "

" උඹ නැතිව කොහොමද බං මගුල කරන්නෙ, එතකොට කවුද මගේ පේජ් බෝයිට ඉන්නේ "

ෂෝටගේ රතු කට්ට පන්නන්න හිතාගෙන මං කිව්වා. ඌ හරිම අකමැතියි ඌ පොඩියි කොටයි කියලා කියනවට. ඒත් ෂෝටා කියන නමටනං ඌ දැන් පුරුදු වෙලා.

" අනේ පලයං පොළොස් කොට්ටෝරුවො යන්න. බලපං මං කවදා හරි බාල්කෙ එල්ලිලා හරි උස යනවා."

පොඩි එකාගෙ හිත රිද්දන්න හොඳ නැති නිසා මං කට වහගෙන හිටියා. කොයි තරම් තද උනත් මූ ගියේ අපේ අම්මා හවස දීපු වැලිතලප වලටයි, තේ එකටයිත් වැඬේ දීලා.

SL-UNLIMITED.COM

ෂෝටා ගියාට පස්සෙ මං කාමරේ අස්කරන්න පටන් ගත්තා. පොත් මේසෙ ඇදලා දාලා තිබුණ පොත් ටික පිළිවෙලට අස් කරලා පොත් බෑග්, සපත්තු එහෙම රැක් එකේ තට්ටු වල වෙන වෙනම තිබ්බා. මගේ කාමරේ අනිත් කාමර වලට වඩා ටිකක්





ලොකු නිසා ඕන දෙයක් හිතේ හැටියට එහෙමෙහෙ කරන්න ඉඩ තියෙනවා. වෙනසකටත් එක්ක ඇඳත් පැත්ත මාරු කලා. අමාරුම වැඬේ තමයි ඇඳුම් රැක් එක අස් කරන එක. සති ගානක් ඇඳපු ඩෙනිම් ටී ෂර්ට් තාම රැක් එකේ. හෙට නිවාඩු නිසා මේ ටික අපේ අක්කණ්ඩිට කියලා හෝදලා දාගන්න ඕනෙ. කිලුටු ඇඳුම් සේරම ටික ගිහින් රෙදි බේසමට දාලා ආවට පස්සෙයි මෙච්චර දවසක් කාමරේ තිබුණ මගේ ජීවන ගඳ අඩුවෙලා ගියේ. ඇඳට අළුත් බෙඩ්ෂීට් දාලා කාමරේ අතුගාලා ඉවර වෙද්දි ලොකු කුණු ගොඩක් එකතු වෙලා තිබුණා.

" ආ .......හලෝ මොකක්ද මේ සැබෑ වෙනස ? "

අක්කා කාමරේට ආවේ මම සේරම අස් කරලා ඉවර උනාට පස්සෙ.

" මේකනේ සහෝදරී, අද ඉඳලා ඔයාගෙ මල්ලි ගේමට බැස්සා. ඒකට ඉතිං පොඩි සපෝට් එකක් ඕනෙ. "

" මුලින්ම කියනවා මොකක්ද ඔය බැහැපු ගේම කියලා "

"අපි මේ පාර ඒ ලෙවල් ලියන කොල්ලොනෙ හලෝ. ඒ නිසා අපි කට්ටිය කැම්පස් ගේමට බැහැලා ඉන්නෙ. "

" ෂා........ අහන්නත් සතුටුයි. දැන් මොකක්ද ඕන සපෝට් එක කියන්න. මගේ මල්ලි කැම්පස් යනවනං මං ඕනම සපෝට් එකක් දෙන්නම්."



WWW.EXPRESSLANKA.TK 17

අක්කා ඒක කිව්වෙ බොක්කෙන්ම කියලා මං දන්නවා. මට ඉස්සර ඉදලම ටොකු ඇන ඇන පාඩම් කියලා දුන්නෙත් එයා. අනික අද එයා පාසල් ගුරුවරියක්. හැබැයි තාම පොඩි එකෙක් වගේ. කොටින්ම පිස්සු කෝච්චියක්.

" දූනට ඕනෙ එක උදව්වයි. හෙට නිවාඩු නිසා මගේ අර රෙදි ටික හෝදලා දාන්න පුළුවන්ද? "

මං රෙදි ටික කියලා කිව්වෙ අක්ක ඒක දක්කෙ නැති නිසා. දක්කනං අහයි ඒ රෙදි කන්දටද ටික කිව්වෙ කියලා. මොනවා උනත් දූන් ඒ වැඩෙත් ෂේප්. එයාෆ්‍රෙෂ්නර් බෝතලේ ගෙනත් අක්කා කාමරේ වටේටම ස්ප්‍රේ කලා.

" ඔන්න ලස්සන වෙලා විතරක් මදි. හඩු ගඳ යන්නත් එක්ක මේක කාමරෙන්ම තියාගන්න."

එහෙම කියලා අලුත්ම බෝතලේ මගේ අතට දීලා ගියා. මේක අක්කා ගිය සතියෙ ගෙනාපු එකද කොහෙද. එයා පව් කියලා මට හිතුනා.

ටයිම් ටෙබල් හදලා පාඩම් කරන්න කිව්වට අපි කවදාවත් ඒ විදියට වෙලාවට පාඩම් කරන්නෙ නැති නිසා මං ඒ අදහස අත ඇරලා දැම්මා. බොරුවට කොලේකට විතරක් සීමා උන කාල සටහන් නැතුවට පුළුවන් හැම වෙලාවෙම පාඩම් කරන්න ඕනේ. දූන් තියෙන්නෙ ගේම පටන් ගන්න එක විතරයි.

" පොඩි පුතා ඔයා වැඩක්ද ?"





තාත්තා එහෙම අහගෙන කාමරේට ආවා.

" ෂා.. නියමයිනේ. ඔයාටත් පිළිවෙලට වැඩක් කරන්න හිතිලා වගේ. "

තාත්තා කාමරේ වටේම බලලා පොඩි නෝන්ඩියක් දැම්මා. මං කොච්චර පිළිවෙලට වැඩක් කලත් එයා කවදාවත් ඒකෙ පිළිවෙලක් දක්කෙ නැහැ. හැමදාම කිව්වෙ ඇදක්ම තමයි. හැබැයි අම්මා නං කිව්වෙ තාත්තා එහෙම කරන්නෙ තරහට නෙමෙයි මාව හදාගන්න කියලා. අපේ තාත්තනං ඇත්තටම මං වගේ නෙමෙයි. මාර නීට්.

"මේක අද මට බැංකුවෙන් හම්බ උනා. ඒත් මේක ඔයාගේ ජාතික ඇඳුමේ අනිවාර්ය අංගයක් නිසා ඔයාට තමයි හොඳ ආ........ "

එහෙම කියලා මගේ අතට දුන්නෙ එළකිරි වගේ ගති කැප් එකක්. ඒක දීලා තාත්තා යන්න හදලත් දොර ගාවට ගිහින් ආපහු හැරිලා බැලුවා.

" පොඩි පුතා පිස්සු නැටුවට කමක් නැහැ. කොල්ලො උනාම දඟ නැත්තං ඒක ලෙඩක්. ඒත් විභාගෙ අනාගන්න එපා. ඔයාට මොනවා හරි ඕනෙනං මට බැරිනං අම්මට හරි කියන්න. ඔයා කවදාහරි මටත් වඩා ඉහල තැනකට යනවා බලන්නයි මට ඕනේ."

තාත්තා අන්තිම ටික කිව්වෙ හරිම හැඟීම්බර හඬකින්. එයා බැංකුවක මැනේජර් කෙනෙක්. ඒ නිසා අපිට පොඩි කාලෙ



WWW.EXPRESSLANKA.TK 18

ඉදලා කිසිම දේක අඩුවක් කලේ නෑ. මං තාත්තට වඩා ඉහල තැනකට යන්න විභාගෙ හොඳට පාස් වෙන්නම ඕනෙ. බැරි වුනොත් නං එඩ්මන් හිලරි වගේ එවරස්ට් නගින්නවත් යන්න වෙනවා. මොකද අපේ තාත්තා සිරිපාදෙට වඩා ඉහල තැනකට ගිහින් නෑ.

*******





Scanned for SL-Unlimited.com by Sheree

# 02

අද සෙනසුරාදා. ඒ කියන්නේ අපි වල බහින දවස. අපිට උදේ නමයෙ ඉදලා හවස හතර වෙනකල් නුගේගොඩ ක්ලාස්. ඊයේ හෝදන්න දාද්දි ඉතුරු උන එකම කලිසමයි ටී ෂර්ට් එකකුයි ඇඳලා මං තාත්තා දීපු කැප් එකත් දාගත්තා. අම්මගෙන් පොඩි ගානකුත් කඩාගෙන මං පාරට ආවේ විභඟ එයිද බලන්න. ඌ බයිසිකලේ ඉස්කෝලෙ ආවට පන්ති යන්න එන්නෙ බස් එකේ. එදාට අපි කට්ටියම සෙට් වෙන දවස නිසා වැඩි හරියක් පන්ති යන්නෙ නැහැනෙ. ඉතිං වලක් බහින්න ඒ බයිසිකල් කට්ට වදයක්. අනික මල් මල් වනයක් වගේ තියෙන නුගේගොඩ හන්දියට ඒකෙ එනවට වැඩිය හොඳයි කලිසම නැතුව පයින් යනවා. මං කල්පනා කර කර ඉද්දිම බස් එකක් ඇවිත් නතර කලා කකුල් දෙක ළඟම.

" රත්දූ නැගපං බං ඉක්මනට "

විභඟයා ජනේලෙකින් බෙල්ල දාලා කෑ ගහද්දි මම ෆුට් බෝඩ් එකේ එල්ලුනා. හයිලෙවල් පාරට ඇවිත් බස් එකෙන් බහිද්දිම ජනාලියි මහේෂයි ඉස්සර වෙලා යනවා දැක්කා.



WWW.EXPRESSLANKA.TK 19

" අන්න උඹේ සුනබ අසිපත"

මං විහඟට මහේෂාව පෙන්නන ගමන් කිව්වා.

" ඒකි මොකද ජනාලිට සෙට් වෙලා. අද කිඹුල්ලු නෑ වගේ."

විහඟ ඇහුවෙ සචිනියි, අචිනියි ගැන. උන් දෙන්නා නිවුන්නු. මෙලෝ යකෙක්ට අඳුරන්න බෑ. ඒ තරමට එක වගේ. හැබැයි පොඩි කාලේ ඉඳලම එකට ඉඳලා අපිට ලාවට වගේ තෝට්. ඒත් ඈතට දැක්ක ගමන් අපිත් ලණුව කනවා. ඒ ලෙවල් වලට ආවට පස්සෙ සචිනි වාණිජ තෝර ගත්තා. අචිනි කලා තෝරා ගත්තා. ඒ නිසා සචිනි වැටුනෙ අපේ පන්තියට. එයා මහේෂා එක්ක ක්ලාස් යද්දි අචිනි ගියේ ජනාලි එක්ක ආර්ට් වලට.

"ඒයි ජනා..... කෝ බං අද සචීලා නැද්ද ?"

විහඟ ජනාලිට ළංවෙලා ඇහුවා. ඒකිගෙ මූණත් ටිකක් අප්සට් පාටයි.

" ඊයේ හවස ක්ලාස් ඇරිලා යද්දි අචිනි බස් එකෙන් වැටිලා "

ජනාලි හෙන දුකෙන් කිව්වෙ. ෂුවර් එකටම එහෙනං සචිනිත් ඇති කරකවලා අතඇරිය ගානට. උන් දෙන්නගෙ පුදුම බැඳීමක් තිබුණෙ.





" එතකොට උඹලා දෙන්නා අද ක්ලාස් යන්නෙ නැතිව එහෙ යනවද ? "

"අද උදේ සිංහල පංතියට යන්නම ඕනෙ. දොළහට පංති ඉවර උනාම යනවා "

මං අහපු ප්‍රශ්නෙට උත්තර දුන්නෙ ජනාලි. අචිනි තුවාල වෙලා කිව්වම නොගිහිනුත් බෑ. මේකිගෙ කකුල කැඩිලද දන්නෙත් නැනෙ. ඒත් ඔය ප්‍රශ්නෙ දැන් අහන්න ගියොත් මුන් දෙන්නා මගේ කම්මුල ස්පර්ශ කරන්නත් බැරි නෑ.

" හරි හරි මුලින්ම යමු නුගේගොඩට "

එකසිය තිස් අට බස් එකකට අත දාන ගමන් මං කිව්වා. අපි කට්ටිය නුගේගොඩ හන්දියෙන් බහිද්දි ෂෝටා නිරෝධ එක්ක බෝ ගහ යට ඉඳලා අපිට අත වැනුවා.

SLU

" ආ..... නංගිලා.... කෝ අපේ වූ සිස්ටර්ස්ලා "

ෂෝටා ජනාලියි මහේෂයි දිහා බලලා ඇහුවා.

" අචී ඊයේ බස් එකෙන් වැටිලලු බං "

" එහෙනං ඒකි හන්දියෙ බාර් එක පැත්තෙ ගිහින් ටිකක් වැඩි වෙන්න ඇති "



WWW.EXPRESSLANKA.TK 20

මුගේ වාචාල කටටත් බ්‍රේක් නෑ. ඔහේ කියවනවා. ජනාලි ෂෝටා දිහා රවලා බලපු පාර ඌ ජෝක් එකට වගේ මගේ පිටි පස්සෙ හැංගුනා.

" අපි කට්ටිය එහෙනං දවල්ට උන්ගෙ ගෙදර යං.දොළහට පංති ඉවර උනාම කට්ටිය මෙතනට සෙට් වෙමු."

අපි කිව්වට පස්සෙ ජනාලියි මහේෂයි දෙන්නා දෙපැත්තට බෙදිලා එයාලගෙ පංති වලට ගියා. අපිට උදේ තිබුණේ ආර්ථික විද්‍යාව පංතිය. හවස ව්‍යාපාර අධ්‍යනය නිසා ඒක මගෙ ඇරුණට ලොකු පාඩුවක් වෙන්නේ නැහැ.

"ෂෝටා උඹෙ නංගි ක්ලාස් යන්නේ කොහෙද දන්නෙ නැහැ නේද?"

SLU

"මේ අහන ප්‍රශ්නෙ කෙලින් අහපං බං. උඹට දැන් දැනගන්න ඕනෙ රාණි යන පංතියනෙ නේද ?"

මූටත් හැමදේම ගොනාට වගේ තේරෙන හැටි බලපංකො.

" අපි වෙලාවක යන්ද උඹලගෙ නැනගෙ ගෙවල් පැත්තෙ"

මං දෙවෙනි ප්‍රශ්නෙත් ඇහුවෙ මූගෙන් උත්තරයක් නැති නිසා.

"උඹලා හදන්නෙ මාව ගෙදරිනුත් එළවන්නද ? උඹට





දැනගන්න ඕන විස්තර මං සඳුදට අහලා කියන්නම්. එතකල් ඉවසාපං පපුව කියලා හිටපං "

අපේ කතාවට විහඟයා කොරවෙලා. ඌ දන්නෙ නැහැ ෂෝටාගෙ නැන්දගෙ දුවගෙ ජාතක කතාව. දැන් අටටත් කිට්ටුයි. ඔක කියන්න ගියොත් අද පංති යන්න වෙන්නෙ නැහැ. අපි හතර දෙනා පුරුදු විදියට තෝස පාරකුත් දාලා කොහුවල පැත්තට ඇවිදගෙන ආවා ක්ලාස් එකට යන්න.

පංතියට යද්දි වෙනදා ඉන්න හරියෙ ඉඩ නෑ. බුද්ධිමතුන් බිහිවන්නේ පසුපස පේළි වලිනි කියලා අපි කට්ටිය පිටි පස්සටම ගිහින් ඉඳ ගත්තා. හය දෙනෙක්ට ඉඳ ගන්න පුළුවන් ඩෙස්ක් එකේ කොහොම හරි දහයක් ඉන්දවන්න ටික්කො ටික හෙන ගේම. මුං ගිය ආත්මෙ සැමන් ටින් කරපු එවුන්ද කොහෙද. අපිත් ඇරියෙ නැහැ. බූරු ඇඳවල් ටික දිග ඇරලා ටිකක් සැප පහසුවට ඉඳ ගත්තා.

"ඔය මල්ලිලා ටිකක් ළං වෙලා ඉඳගෙන මේ පොඩි මල්ලිටත් ඉඩ ටිකක් දෙන්න. "

එහෙම කියපු ටික්කා ෂෝටාව අපි හිටපු පැත්තට තල්ලු කරලා දැම්මෙ උගෙ බාප්පා වගේ. කොහොම හරි හතරට පහට ගුලිවෙලා ටියුට් ටිකත් බාගෙට දිගැරගෙන ටිකක් වෙලා ඉද්දි දාඩිය ගලන්න පටන් ගත්තා.

" මචං පිට දිගේ දුන්හිඳ කඩං වැටෙනවා බං "



WWW.EXPRESSLANKA.TK 21

මං විහඟගෙ කනට කරලා කිව්වෙ ෂෝටාට ඒක කියන්න බැරි නිසා. මොකද ඌගෙ කණ තිබුණේ ගොඩක් පහත.

" ඔව් බං මේ ෆෑන් කට්ට වැඩ කරන්නෙ නැද්ද මන්දා "

ඌ එහෙම කියද්දි මමත් නිකමට වගේ උඩ බැලුවා. ෆෑන් එක කැරකෙනවා නිකං මට ඕනෑවට වගේ.

" බලපං අනික් ෆෑන් ඔරේ රන් කියලා කැරකෙනවා. මූ ඒකට කැඳ ගහලා වගේ."

" දාමු සර්ට චිට් එකක් "

විහඟ කොලයක් කඩලා අරන් මොනවද ලියලා මට දුන්නා. 'සර් පිටිපස්සෙ පේළියෙ ෆෑන් එක කැරකෙන වේගෙට පෙති ගණන් කරන්න පුළුවං.' ඌ ලියලා තිබුණෙ ඒක. මමත් කොලේ රෝල් කරලා ඉස්සරහට යැව්වා.

විනාඩි දහයකට විතර පස්සෙ සර් චිට් එක කියෙව්වා.

" පිටි පස්සෙ පේළියෙ ඉන්න කවුද ෆෑන් එකේ පෙති ගණන් කරන්න හදන්නෙ "

සර් ඒක අහද්දි මුළු ක්ලාස් එකම වගේ පිටි පස්ස හැරුණා.

"තමුසෙලා අමාරුවෙන් උඩ බලාගෙන ඕකෙ පෙති ගණන් කරන්න ඕනෙ නැහැ. ඕකෙ පෙති තුනයි තියෙන්නෙ. දැන් පාඩම අහගන්නවා "





මුළු පන්තියම හයියෙන් හිනා උනා. ෂිට්...... චාටර් ගෝනියයි. අපිත් අපිට නෙමෙයි වගේ අනිත් උන් දිහා බලලා හිනා වෙන්න ගත්තා. හැබැයි සර් එවලේම ටික්කන්ට කියලා අපි ළඟ තිබුණ ෆෑන් එක වැඩි කලා.

SLU

දවල් දොලහ වෙනකල්ම සාර්ව ආර්ථික ගැටළු කියලා දුන්නට පංතියෙන් එළියට එද්දි ඒ එක ගැටළුවක්වත් මටනං මතක තිබුණෙ නැහැ. මගේ ඔළුවෙ තිබුණෙ වෙනමම ගැටළු ටිකක්. අපි සෙට් එක කොහුවල ඉඳලා නුගේගොඩ බෝගහ ළඟට ගිහින් අනිත් කට්ටිය එනකල් පොඩි කට්ටක් කෑවා. කට්ටක් කිව්වට පංති ඇරෙන වෙලාවට නුගේගොඩ ඉන්න එක කට්ටක්ම නෙමෙයි. හවස හතර පහ විතර වෙද්දි මේ හරියෙ මාර ත්‍රිල් එකක් තියෙන්නෙ. ගිය ආත්මෙ ඉඳලා මේ සැපට පුරුදු උන එවුන් මැරිලා කාක්කො වෙලා ඉපදිලා අපේ ඔළු වලට බෙටි දදා තාම පාර දිහා බලං ඉන්නවා.

" නිරෝධ මොකද අද උඹේ ටකරම වැහිලා "

බර කල්පනාවක හිටපු නිරෝධගෙ පිටට තට්ටුවක් දාලා ෂෝටා අහද්දි ඌ උඩ ගියා.

" පස්සෙ කියන්නම් බං "

ඌ ඒක කියපු විදියට ඌට දිරව ගන්න බැරි ප්‍රශ්නයක් තියෙන පාටයි.



WWW.EXPRESSLANKA.TK 22

" අපි ගොඩක් පරක්කුද "

ජනාලි එහෙම අහගෙන ආවෙ තනියම නෙමෙයි සාරංගයි දිනුකයි එක්ක. දිනුකගෙනම් මූණ දාහට අරන් තිකංවත් දෙන්න බැරි ගානට කළු වෙලා. ඒක එහෙම නොවුනනම් තමයි පුදුමෙ. මොකද මූ අවිනිගෙ සත්‍ය ප්‍රේම බ්‍රෑංග රාජයනේ. ඒ සීන් එක පටන් ගත්තේ ඒ ලෙවල් කරන්න පටන් ගත්තට පස්සෙ.

"ඕවා ඔහොම තමයි මස්සිනා. අල වගේද ගෝවා"

කියලා දිනුකයව ෂේප් කරන්න විහඟ බණ කියවන්න ගත්තා.මහේෂත් ආවට පස්සෙ අපි අට දෙනාම සචීලගේ ගෙදර යන්න රෙඩි උනා. ලෙඩෙක් බලන්න යද්දි අපතයො ටික වගේ අතපය වන වන යන්න හොද නැති නිසා අපි ගෙනියන්න දෙයක් කල්පනා කලා.

"දවල්ට කාලාත් නෑ බං. කන්න තියෙන සල්ලි වලින් තමයි මොනවාහරි ගන්න වෙන්නේ."

ෂෝටා එහෙම කියලා ඌගෙ හිගන පර්ස් එක දිගඇරියා. ඒකෙ කවමදාකවත් රුපියල් සීයකට වඩා තියෙනවා මම දැකලා නෑ.

" රයිට් එහෙනං පින්වතුන් පොඩි ආධාරයක් කරන්න බලන්න."





මම දාගෙන හිටපු තොප්පිය ගලවලා පොඩි කලෙක්ෂන් පාරක් දාන්න යද්දි විහඟයා සින්දුවක් පටන් ගත්තා.

" සඳ හිරු තරු පවතින තුරු
ෆේල් වෙන්නෙ නෑ....
සෙන්ට්‍රල් බිමේ කොල්ලො අපි
ඒ හතරක් අපට හිමි........
ෆේල් වෙන්නෙ නෑ........ //

SLU

ඌ ඒක කියන අතරෙ මං තොප්පිය අරන් එක එකා ළගට ගියා. දිනුකයා තදයා වගේ කෙලින්ම රුපියල් සීයෙ පටියක් දාලා ස්ටාට් එක දුන්නා. මහේෂා ජනාලි දෙන්නත් සීය ගානෙ දැම්මට අපේ අනිත් උන්ගෙන්නම් පනහකට වඩා ගන්න බැරි උනා. අපි දිහා හිනාවෙවී බලබල හිටපු ආච්චි කෙනෙක් ළගටත් මං නිකමට වගේ ගිහින් තොප්පිය දික්කරා. දත් නැති කට පුරෝලා හිනාඋන ඒ ආච්චි තංගල්ල බැංකුවෙන් විත්ඩ්‍රෝ කරලා පටාස් ගාලා රුපියල් පනහක් දැම්මා.

" පිනට කැමති මේ අම්මට බුද්ධං සරණේ සරණයි"

විහඟ ආච්චි ළග වටයක් කැරකිලා තවත් සින්දුවක් පටන් ගත්තා.

" එහෙම කියපු ඔය කොලුවට ධම්මං සරණේ සරණයි "

ෂෝටා විහඟ ළගට ගිහින් කියද්දි අර ආච්චි ෂෝටා දිහා බලලා හිනා උනා. සමහර විට ආච්චිට ෂෝටා දකිද්දි ශිෂ්‍යත්වෙ



WWW.EXPRESSLANKA.TK 23

ලියන, මුණුඹුරෙක් මතක් වෙන්න ඇති. කොහොම හරි සිංදුව ඉවර වෙද්දි මගේ පින්වන්ත කැප් එක ඇතුලෙ රුපියල් පන්සීයක් විතර එකතු වෙලා තිබුණා.

" මොනවද බං මේකෙන් අරගෙන යන්නෙ ?"

සල්ලි ටික ගණන් කරලා මං විහඟගෙන් ඇහුවා.

" කේක් බිස්කට් වගේ දෙයක් ගත්තොත් ඕක එන්න කලින් අපිම කාලා ඉවර කරයි. ජනා කෙල්ලො කැමති මොනවටද බං"

ඌ කෙලින්ම ප්‍රශ්නෙ ජනාලිට යොමු කලා.

" කෙල්ලො කැමති මොනවද කියලා කෙල්ලන්ට වඩා හොඳට දන්නෙ කොල්ලොනෙ. "

ජනාලිගෙ කතාවෙත් ඇත්තක් තියෙනවා. එහෙනම් මේ ප්‍රශ්නෙ අහන්න හොඳම කෙනා දිනුක. අචිනි කැමති ඒවා ඌ නොදැන ඉන්න විදියක් නැහැනෙ.

"දිනුක උඹවත් කියපංකො අචිනිට දෙන්න හොඳ දෙයක්"

" අපි ඔය ගානට පොඩි ටෙඩි බෙයාර් කෙනෙක් අරන් යන් "





" ඔන්න බලපං සැබෑ ස්වාමිපුරුෂයන්ගෙ ලක්ෂණ "

විහඟ දිනුකගෙ කරට අත දාලා කියද්දි උගෙ මූණෙ තිබ්බ මූඩ් එක මංචි ජිංජර් බිස්කට් එකක් කෑවා වගේ වෙනස් උනා. කොහොමටත් කෙල්ලො ටෙඩි බෙයාලට ආසයි කියලා මමත් දන්නවා. මොකද අපේ සහෝදරීගෙ කාමරෙත් හැම තැනම ටෙඩීලා. නිදියන්නෙත් තඩි වලහෙක්ව තුරුළු කරන්. ලස්සන ටෙඩියෙක් අරන් එන්න කියලා අපි මහේෂටයි ජනාලිටයි සල්ලි දීලා යැව්වා. ටික වෙලාවකින් උන් දෙන්නා ආවෙ ලස්සන රෝස පාටයි සුදු පාටයි ටෙඩියෙක්ව අරන්. උන්ගෙ සිලෙක්ෂන් වලට අපි කට්ටියම සැටිස්.

SLU

හන්දියෙ ඉඳලා සචීලගෙ ගෙදරට බස් හෝල්ට් දෙකක් විතර දුරයි. අපි කට්ටිය පොඩි කෝප්පයක් හෝදන ගමන් ඒ දුර පයින්ම ගැටුවා. එකහමාර විතර වෙද්දි අපි එහේ.

අපිව දක්කා විතරයි ගේ ඉස්සරහා හිටපු සචී දුවලා ඇවිත් ජනාගෙයි මහේෂගෙයි අත් දෙකෙන් අල්ල ගත්තා. ඒකිගෙ ඇස් දෙක රතුවෙලා. ඒ කියන්නේ දැන් ටිකකට කලින් සචී අඬලා තියෙනවා.

" කෝ බං අචිනි, එයාට ගොඩක් අමාරුද? "

දිනුකට අහන්න තදියමේ හිටපු ප්‍රශ්නෙ ඇහුවෙ ජනාලි.

"යංකො ගෙට. එයා ඉන්නවා."



WWW.EXPRESSLANKA.TK 24

අපි කට්ටියම සාලෙට යද්දි අචිනි සෙටියෙ වාඩිවෙලා කකුල් දෙක ස්ටූල් එකක් උඩ තියාගෙන හිටියා. එක කකුලක් විලුඹ හරියෙන් දිගටම බැන්ඩේජ් කරලා. අනිත් කකුල දනිස්ස ළඟ බැන්ඩේජ් කරලා. මේකි එක් අන්ඩක් නෙමෙයි අඬු දෙකම කඩාගෙන වගෙයි. මොනවා උනත් අපිව දැක්ක ගමන් කෙල්ලගෙ ඇස් දෙකට කඳුළු පිරුණා.

" ඔයාට ගොඩක් අමාරුද අචිනි?"

එයා ලඟින්ම ඉඳගෙන අතකුත් අල්ලගත්ත ජනාලි ඇහුවා.

"නෑ"

SLU

කියලා එයා ඔළුව වැනුවා. එහෙනං අඬන්නෙ මොන මගුලකටද දන්නෙ නෑ කියලා අහන්න හිතුනත් මං නිකං හිටියා.

" ආ..... පුතාලා දැන්ද ආවෙ? ඊත් මෙයාලා කිව්වා අද සමහර විට යාළුවො ටික එයි කියලා."

සචීලගෙ අම්මා ඇවිත් අපිව ආදරෙන් පිළිගත්තා. ඉස්සරත් මුන්ගෙ උපන්දින වලට එහෙම ඇවිත් අපි කට්ටියම සචීලගෙ ගෙදර අය හොඳට දන්නවා.

"ඔයාලා පන්ති ගිය ගමන්නෙ එන්න ඇත්තෙ. මං කන්න මොනවා හරි ලැස්ති කරන්නම්"

අපේ කට්ටියගෙ බඩවල් ගැන නොදන වගේ ඇන්ටිලා කෑම ලැස්ති කරන්න හදන්නෙ. අට දෙනෙක්ට කන්න දෙන





එකත් දානයක් දෙනවා වගේ තමයි. ඒ අතරෙ ජනාලි අචිනිගෙන් කතන්දරේ අහන්න පටන් අරන්.

" ඊයේ ඔයා බහිද්දිත් හොඳටම වැස්සනෙ ජනාලි. මමත් බස් එකෙන් බහිද්දි පාර පේන්නෙ නැති තරමට වැස්ස. මං බැස්සෙ ඇන්ටිලා දෙන්නෙක් බැස්සට පස්සෙ අන්තිමට. ඒත් මං බහිනවා දැක්කෙ නැතුව ඩ්‍රයිවර් බස්එක ඇද්දුවා. මං බහින්න ලැස්තිවෙලා ෆුට්බෝඩ් එකේනෙ හිටියෙ. සෙරෙප්පුව ලිස්සලා එක පාරට මාව බිමට වැටුනා. අර ඇන්ටිලා දෙන්නා තමයි මාව ත්‍රීවිල් එකක දාගෙන ගෙදර එක්කං ආවේ."

"ඉතිං බං ඔච්චර දෙයක් වෙලත් ඔය බස් කාරයා නැවැත්තුවෙ නැද්ද? "

ෂෝටාට තද වෙලා ඇහුවා.

" බස් එකේ මිනිස්සු දැකලා කෑ ගැහුවා. එත් ඩ්‍රයිවර් නැවැත්තුවෙ නැහැ."

"ඔය කාලකන්නි හැත්ත ඔහොම්මමයි. උඹට බස් එක මතක නැද්ද ? අඩු ගානේ අංකෙවත් බලා ගත්තෙ නැද්ද ?"

සාරංගත් අහන්නෙ මාර ප්‍රශ්න. ඔය වගේ මහ වැස්සට නතර නොකර යන බස් එකක අංකෙ බලන්න වැටුන එකාට පුළුවන්ද? අනික මතක තියාගන්න මේ පාරෙ 138 බස් කීයක් කියලා තියෙනවද ?



WWW.EXPRESSLANKA.TK 25

අචිනි කකුල බිම තියන්න හදලා ආව් කියලා ආපහු උඩට ගත්තා. පෙන්නුවෙ නැතුවට ඒකිට ටිකක් අමාරු පාටයි.

" ඔහොම හිටපං බං අචී දඟලන්නෙ නැතුව. අපි හිටියට කමක් නෑ. උඹ පහසු විදියට හිටපං"

ඒකි තවත් අප්සට් කරන්න ඕනෙ නැති නිසා මං කිව්වා. එතකොටම අපි ගත්තු ටෙඩිබෙයාව දිනුක ගෙනැල්ලා අචිනි අතට දුන්නා. දුන්නම් ඒකිගෙ මූණ බලබ් වැලක් එල්ලුවා වගේ පාට වැටිලා.

" අනේ හරි ෂෝක්"

එහෙම කියපු අචිනි ටෙඩීට කිස් එකක් දුන්නෙ අපි ඉන්නකොට දිනුකට කිස් එකක් දෙන්න බැරි නිසා වෙන්න ඇති. මොනවා උනත් කොල්ලා යෝජනා කරපු තෑග්ග සීයට සීයක් සාර්ථකයි කියලා හිතුනෙ අචිනි ඒක ආදරෙන් තුරුළු කර ගත්ත විදිය දැක්කමයි.

"උඹලට කොස් කිරන්න ඕනෙනං අපි අහක බලාගන්නං"

දිනුකගෙ මූණ දිහා බලලා නිරෝධ අහපු විදියට අචිනිට ලැජ්ජා හිතිලා. ඒකිගෙ සුදු මූණ රතු වෙලා. ඒ අතරෙ සචී බීම ට්‍රේ එකක් අරගෙන ඇවිත් අපිට ඇල්ලුවා. ඊට පස්සෙ ඉතුරු උන බීම එක අචිනිගෙ අතට දීලා එයත් අචිනි ළඟින්ම ඉඳ ගත්තා. ඔහොම ළංවෙලා ඉද්දි තමයි මුන් දෙන්නගෙ ගතිය වැඩි. ඇත්තටම ඩබල හරියට බෝනික්කො දෙන්නෙක් වගේ මාර ලස්සනයි.





එත් අර නිතර දෙවේලෙ දකින කුකුළගෙ කරමලේ සුදුයි වගේ උන්ගෙ ලස්සන අපිට ඒ තරම් ගානක් නෑ. අපිට නොදැනුනාට උන්ගෙ අගේ දිනුකට නං දැනිලා තියෙනවා.

"බලන්න රන්දූ අපිට ලොකු ප්‍රශ්නයක්"

"ඇයි බං මොකක්ද කේස් එක"

SLU

"අක්කි ලබන සතියෙ සමස්ත ලංකා නැටුම් තරගෙට නුවර යන්න හිටියෙ. එයා පහුගිය ටිකේම ඒකට ප්‍රැක්ටිස් කලා. අපරාදෙ දැන් ඒකට යන්නත් බැරි වෙනවා."

අචිනිටයි, සචිනිටයි පොඩි කාලෙ ඉඳලම හොඳට නටන්න පුළුවන්. උන් දෙන්නා එකාට එකා දෙවෙනි නෑ. එත් සචී ඒ ලෙවල් කොමර්ස් තෝරාගත්තට පස්සෙ නැටුම් තරඟ වලට ගියේ නැහැ. ගිය අවුරුද්දෙ ඉදිරිපත් උනේ අචිනි විතරයි. එයා මීට මාස දෙකකට විතර කලින් දිස්ත්‍රික් තරඟ වලට ඉදිරිපත් වෙලා කොළඹ දිස්ත්‍රික්කෙ පළවෙනි තැනට තේරුණා. එදත් අපි කට්ටියම මෙහෙ ඇවිත් සතුට සමරලා පොඩි බජව්වක් දාලා ගියේ.

" ඉතිං අපි කලිනුත් ඔය විදියෙ ගේම් දීලා තියෙනවනෙ. අචී වෙනුවට සචී ගියා නම් වැඩේ ගොඩ"

මං කිව්වම අපේ කට්ටියගෙම මූණු දිහා බලලා. අපි දහ දෙනාට රහසක් රකින එක ප්‍රශ්නයක් නෙමෙයි.



WWW.EXPRESSLANKA.TK 26

" එහෙම බැනේ රන්දූ. අක්කි පුරුදු උන නැටුම මං දන්නෙ නැනෙ. අනික අපිට ලබන සතියෙ විභාගෙ තියෙනවනෙ"

සචී බයවෙලා කිව්වා.

SLU

" මේ සීන් එක තාම ඉස්කෝලෙන් දන්නෙ නෑනෙ. අපි කියමු බස් එකෙන් වැටුනෙ සචී කියලා. ඉතුරු ටික ස්ටෙප් බයි ස්ටෙප් ප්ලෑන් කරමු."

විහඟත් ඕන දේකට ෆුල් සපෝට්. කොහොමහරි මේ තරගෙට සචීව යවන්න අපි හිතා ගත්තා. වැඩේ ටිකක් අමාරුයි තමයි. ඒත් කොහොම හරි වැඩේ ගොඩ දාන්න අපි කට්ටියම අතට අත දාලා ගිවිස ගත්තා. අමාරුම වැඩේ උනේ සචීලගෙ අම්මලව කැමැති කරව ගන්න එක.

" මම නං ඔය වැඩේට කැමැති නැහැ පුතා. අනික ගුරුවරු රවට්ටලා ඔය වගේ දෙයක් කරන්න අනුබල දෙන්න අපිට කීයටවත් බෑ. අංකල්ගෙනුත් මට බැනුම් අහන්න වෙයි."

අපි ටොප් ගියර් එකට දාලා පාගන්න හදද්දි ඇන්ටි රිවස් එකටමයි කතාව.

" මේකනෙ ඇන්ටි සචිනිටත් හොඳට නටන්න පුළුවන් එකේ එයාට නැටුම පුරුදු කරන එක විතරයි තියෙන්නෙ. අනික මේ තරගෙ තියෙන්නේ නුවරනෙ. කවුරුවත් සචිනිව අඳුරගන්න එකක් නෑ. "





" එතකොට ඇන්ටි ගුරුවරුන්ව රැවටීමක් වෙන්නෙ නැහැනෙ"

"ඒ වගේම සචිනි දින්නොත් එහෙම අපේ ඉස්කෝලෙට වගේම ඇන්ටිලටත් කොයි තරම් ආඩම්බරයක්ද ?"

අපේ එකෙක් නවත්තද්දි අනිකා කියවන්න පටන් ගන්නවා. ඇන්ටිට එක වචනයක් කියන්න ඉඩ දුන්නෙ නැහැ. අන්තිමට ලාවට වගේ ඇන්ටිව අපේ පැත්තට නම්ම ගන්න අපිට පුළුවන් වුනා.

"අනේ මන්දා ඔයාලා කරන දෙයක් අන්කල්ගෙනුත් අහලා කරන්න. හැබැයි පරිස්සමෙන්. "

එහෙම කියලා ඇන්ටි ගිහින් කෑම මේසේ ලෑස්ති කලා. අපි කට්ටිය කන ගමනුත් කල්පනා කලේ අපේ ප්ලෑන ගැන.

" එතකොට නංගි නුවර යනවා නම් මං එයා වෙනුවට එක්සෑම් එකට ලියන්න ඕනෙද?"

අචිනි බයවෙලා වගේ ඇහුවා. ඒකි බයවෙන එක සාධාරණයි. මෙච්චර දවසක් ආර්ට් ඉගෙනගෙන එක පාරටම කොමර්ස් විභාගයක් ලියන්න උනොත් අන්තිමට කෙල්ලට ඇඩ්රසුත් නැති වෙනවා.

" අනේ මං කොමර්ස් ගැන මුකුත්ම දන්නෙ නැහැනෙ"



WWW.EXPRESSLANKA.TK 27

" උඹ බයවෙන්න එපා බං. ඒකට තමයි අපි සෙට් එක ඉන්නෙ. උඹට තියෙන්නේ විභාගෙට එන එක විතරයි. ඉතුරු ටික අපි බලාගන්නම්."

සචී කවදත් ඉගෙනගන්න දක්ෂයි. එයා වෙනුවට අචිනි විභාගෙට ඉන්නවානං හොඳට ලකුණු ගන්න වෙනවා. ඒකට අචිනිට අනිවාර්යයෙන් කොපි කරන්න වෙනවා. නැතුව වෙන කිසිම විකල්පයක් නෑ. දැන් වැඩේට බැහැපු එකේ බොරු දාහක් කරලා හරි මේක ගොඩ දාගන්න ඕන.

" අපිට නැටුම් කරන කුමුදු මිස් නෙමෙයි මට මේක ප්‍රැක්ටිස් කලේ. එයා කලායතනයක අක්කා කෙනෙක්ව ගෙනාව මට නැටුමක් පුරුදු කරන්න. ප්‍රින්සිපල් සර්ගෙනුත් අහලා තමයි එයා ඇවිත් තියෙන්නෙ."

ඒ කියන්නේ මේ කතන්දරේ ඇතුලෙ තවත් චරිතයක් ඉන්නවා. එයාට ඇත්ත නොකිය මේක ආපහු මුල ඉඳලා පුරුදු වෙන්න බෑ. අපේ සෙට් එකේ දහයයි සචීලගේ අම්මයි තාත්තයි ඇරුනම දහතුන් වෙනියටත් බොරුව කියන්න වෙනවා. දහතුන් දෙනෙක් අතර රහසක් රකින එක මළාට කරන්න බැරි වැඩක්. අපි දහදෙනා අපිට ෂුවර් උනාට ඉතුරු අය කොහොම වෙයිද කවුද දන්නේ.

ඔය නැටුම් පුරුදු කරන අක්කගෙ කටින් ඕක අපේ නැටුම් මිස්ට යන්න බැරි නෑ. කොහොමත් ඔය ගෑනුන්ට කටවල් පරිස්සම් කරගෙන ඉන්න හරි අමාරුයිනේ. තමන් දන්න රහසක් අනිකට කියනකල් උණ ගැනිලා වගේ දඟලන්නේ. අන්තිමට ඒ අක්කා





ගාවට ගිහින් වැඩේ ෂේප් කරගන්න එක මහේෂායි ජනාලියි බාර ගත්තා. දැන් වැඩේ සීයට අසූවක් විතර ප්ලෑන් කරලා ඉවරයි. හෙට කලායතනෙට යන වැඩේ දාගෙන අපි කට්ටිය ගෙදර එන්න ලෑස්ති උනා. දිනුකයට ඒත් නිකං හිටියා මදි වගේ. තාම අචිනි ළඟට වෙලා ඉඳගෙන ඉන්නවා.

" උඹ එන්නේ නැතුව අදම බින්න බහින්නද කල්පනාව. යකෝ ඇන්ටි ඉලපත ගන්න කලින් වරෙන් යන්න. දැන් හොඳටම හවස් වෙලා."

SLU

ෂෝටාගෙ වැඩේ දිනුකව පල් කරන එක. අපි යන්න මිදුලට බහිද්දිත් අචිනි ඇස්වල කඳුළු පුරෝගෙන. මේ කෙල්ලො හැම ඉලව්වකටම කරන්නේ අඬන එක. අපි එහෙම හිතුවට දිනුකගෙ ඇස් වලත් කඳුළු තියෙනවා දැක්කෙ පාරට ආවට පස්සෙ. ඌට දුක ඇති ඒ තරම් අමාරුවෙන් ඉඳපු කෙල්ලව දාලා එන්න උන එකට. අපි හන්දියට එද්දි හවස හයටත් කිට්ටුයි. අපි මුලින්ම කලේ ජනාලිවයි මහේෂවයි ගෙවල් වලට යන්න බස් වලට දාපු එක. ඒක අපේ ඉස්සර ඉඳලා තිබුන පුරුද්දක්. අන්තිමට මම විහඟ එක්ක ඇවිත් අපේ ගේ ළඟින් බහිද්දි කළුවරත් වැටිලා.

" අනේ අනේ හොඳයි කොල්ලො ගෙදර එන වෙලාව "

මිදුලෙ තිබුණ ගල් බැංකුවක වාඩිවෙලා හිටපු අපේ අක්කා මාව දැක්ක ගමන් පුපුරන්න ගත්තා. මෙයත් හරියට චීනපටස් එකක් වගේ තමයි. ළඟින් ගියොත් ඇහැක් නැහැ.



WWW.EXPRESSLANKA.TK 28

SLU

" තමුසෙ අද කොහෙද ගියේ ?"

කිසිම ගැලවීමක් නැති පාටයි. මම පොඩි ෂේප්මන්ට් එකක් දාගන්න එයා ළඟට ගියා. එතකොටයි මං දැක්කේ අපේ අක්කා ළඟ තව කෙල්ලෙක් ඉන්නවා.

" බලන්න හංසි, මෙයා මට හෝදන්න කියලා පත රෙදි ගොඩකුත් දාලා පංති යනවා කියලා උදේම ගියා. දැන් එනවා මෙතන රස්තියාදු ගහලා "

එහෙනම් මෙයයි අපේ අක්කගේ බ්‍රැකට් එක හංසි. නම අහලා තිබුණට ඔයාව අදනෙ දැක්කෙ බබෝ. ඒත් මෙයා ඉස්සරහ අක්කට සෙකන්ඩ් වෙලා බැහැනෙ.

"පංති තමයි හලෝ ගියේ. බොරුනං ඔය ටියුට් එක අරගෙන බලනවා."

එහෙම කියලා මම සාක්කුවෙ දාගෙන හිටපු ඉකෝන් ටියුට් එක එයාගෙ ඔඩොක්කුවට විසිකලා.

" බලනවා ඉතිං ඉගෙන ගන්න එවුන් ටියුට් ගෙනියන ලස්සන. බීඩියක් වගේ රෝල් කරලා සාක්කුවෙ දාගෙන "

එයා ආපහු ටියුට් එක මගේ පැත්තට වීසි කරලා දැම්මා. අක්කයි මමයි දිගට හරහට ගේම ඉල්ලනවා. හංසි බයවෙලා අපි දිහා බලන් ඉන්නවා.





"බලන්න අක්කේ ඔයාගෙ යාළුවා හැමදාම ඔහොමයි. ගෙට ගොඩවෙද්දිම බොරුවට බෙරිහන් දෙනවා."

මං හංසි දිහාට හැරිලා කිව්වෙ යාළුවෙක් ළඟ ඉන්නවා කියලා අපේ අක්කට මතක් කරලා දෙන්නයි.

" කවුද බොරුවට බෙරිහන් දෙන්නෙ ? තමුසෙ පංති ගියානං කොහොමද දවල් පාරෙ සින්දු කිය කිය තොප්පිය අරන් සල්ලි එකතු කලේ ?"

විකේයියා! කවුරු හරි ගෝත්‍රයෙක් සීන් එක අක්කගෙ කනේ තියලා තියෙනවා. නිකං නෙමෙයි එක දහය කරලා ගින්න දීලා තියෙන්නෙ. ඌ හිතුවද දන්නෑ මං පාරෙ හිඟා කෑවා කියලා.

" හලෝ මේ තමුසෙගෙ ඔය රොයිටර්ට කියනවා බොරු කියලා අඬු කඩාගන්න එපා කියලා. මං පාරෙ හිඟා කෑවෙ නැහැ. අපේ යාළුවෙක් ඇක්සිඩන්ට් වෙලා. ඌව බලන්න යන්න ප්‍රසන්ට් එකකට සල්ලි එකතු කලා. හැබැයි පාරේ හිටපු එවුන්ගෙන් නෙමෙයි, අපේම යාළුවන්ගෙන්. එච්චරයි හරිද?"

තිබ්බ කේන්තියට දිගට හරහට කියවගෙන ගිය මං දෙන්නගෙ මූණවත් නොබලා කාමරේට ආවා. ඇඳුම් ටික ගලවලා තුවායක් ඇඳගෙන බාත්රූම් එකට ගියේ අක්කට කේලම කියපු එකා ගැන හිත හිත. හැබැයි ඒ කේලමා හංසි වෙන්න බැහැ. මොකද මෙයා මාව කලින් අඳුරන්නේ නැහැනෙ. ඒ වගේම අද මෙයා මොකද අපේ ගේ අස්සේ රිංගලා ඉන්නෙ කියන ප්‍රශ්නෙත්



WWW.EXPRESSLANKA.TK 29

මගේ ඔළුවට ආවා. මම ඇඟ හෝදලා කාමරේට එද්දි අම්මා තේ එකත් අතේ තියාගෙන කාමරේ.

" පොඩි පුතා පරක්කු වුන නිසා අපි කලින් තේ බිව්වා. මේක බීලම ඔයා කන්න එන්න."

මට හවසට ගෙදර ආපු ගමන් තේ එක ඕනමයි කියලා අපේ අම්මා දන්නවා. එයා මගේ අතට තේ එක දීලා කාමරෙන් ගියේ මගේ ඔළුවත් අතගාගෙනම. අම්මා යද්දිම චීන පටස් එක ආපහු කාමරේට ආවා.

"මල්ලි ඔයා මගෙත් එක්ක තරහද? "

එහෙම අහගෙන ආපු එයා කෙලින්ම මගේ ඇඳෙන් ඉඳගත්තා. මං ඇහුනේ නෑ වගේ තේ එක බොන ගමන් බිත්තියෙ ගහලා තිබුන ටයිටැනික් නැවේ ලොකු පින්තූරෙ දිහා බලාගෙන හිටියා.

"ඔයා පරක්කු උන නිසයි මං බැන්නෙ. ඔයාගෙ යාළුවෙක් ඇක්සිඩන්ට් වෙලා කියලා මං දන්නෙ නැහැ."

මම තාමත් පින්තූරෙ දිහා බලාගත්තු ගමන්මයි. හැබැයි දූන්නම් තේක ඉවරයි. අක්කා ඇඳෙන් නැගිටලා ඇවිත් මගේ උරහිසට අත තිබ්බා.

"කවුද මල්ලි ඇක්සිඩන්ට් උන යාළුවා? දවල්ට ඔයා එක්ක එන මල්ලිද ? "





අපේ අක්කා හදන්නෙ අර යස අගේට අතපය හතර තියාගෙන ඉන්න විහඟයව හප්පන්න. ඌ දන්නවනං මෙයාට නඩු දානවා.

" ඌට මුකුත් වෙලා නැහැ. අවිනි ඊයේ බස් එකෙන් වැටිලා "

" අවිනි කිව්වේ"

SLU

"අවිනි කිව්වෙ ටුවින්ස්ලගෙන් එක්කෙනෙක්"

" අනේ අර ලස්සන නංගිලා නේද? අර අපේ ගෙදර ඇවිත් තියෙන්නෙ"

" ඔව් ඔව් උන් තමයි. දැන් යනවා හලෝ වද නොදී. තමුසෙගෙ යාළුවා බලාගෙන ඇති."

"එයා තව ටිකකින් අම්මලා ආවම යයි."

" ආ ඇත්තද? මං හිතුවා ගෙදරින් එළවලා කියලා."

අක්කා කාමරෙන් ගියාට පස්සෙ මං තුවාය ගලවලා සරමට බැස්සා. හෙට උදේ පංති යන වෙලාවට විහඟ එයි. ඒත් හෙට පන්ති කට් කරලා ජනාලියි මහේෂයි කලායතනයට යනවා කිව්වනෙ. කොයි එකටත් උන්ගෙ සපෝට් එකට අපිත් ගියානම් හොඳයි. ඔය නැට්ටුක්කාරි මොන වගේ ඩයල් එකක්ද දන්නෙත්



WWW.EXPRESSLANKA.TK 30

නැනෙ. මං ටීවී එක ටිකක් බලන්න හිතිලා සාලෙට යද්දි අක්කලා ඩබල පතරංග ජාතකේ වගේ දිග නාට්ටියක් බලනවා.

" අනේ මල්ලි මං අම්මා එක්ක කෑම ටික ලෑස්ති කරනකල් ඔයා හංසි එක්ක ටිකක් කතා කර කර ඉන්නකො"

මාව දැක්ක විතරයි එහෙම කියල අපේ අක්කා වාෂ්ප උනා. මං මොන කෙහෙල්මලකටද මේච්චර ලොකු කෙල්ලන්ට තනි රකින්නෙ. එයා මේ තරම් ආසාවෙන් බලන නාට්ටිය බල බල ඉන්නෙ නැතැයි. මමත් කට වහගෙන ටීවි බලන්න ගත්තා.

" මල්ලි ඔයා හිතන්නෙ අක්කට ඔයා ගැන කේලම් කිව්වෙ මං කියලද ? "

"නෑ එහෙම හිතන්න ඔයා මීට ඉස්සර මාව දැකලා තිබුණෙ නැහැනෙ. "

"මං ඔයාව ෆොටෝ වලින් දැකලා තියෙනවා. අක්කා නිතරම ඔයා ගැන කියනවා. එයා ඔයාගෙ ඇල්බම් එකක්ම මට පෙන්නුවා."

අපේ අක්කටත් ඕන නැති මගුලක් නෑ. හැම අටමගලයක්ම යාළුවන්ට පෙන්නනවා. ඉතිං පාරෙ තොටේ ඉන්න එවුන්ගෙන් බාගයක්ම මාව අඳුරනවනෙ.

" එයාගෙ වැඩේම ඉතිං මට බනින එකනෙ. ඔයාට ෆොටෝ පෙන්නල කියන්න ඇති මේ ඉන්නේ අපේ ගෙදර වසවර්තියා කියලා"





" ඔයා එහෙම හිතුවට අක්කා ඔයාට ගොඩක් ආදරෙයි. කටේම තියෙන්නෙ මගේ මල්ලි කියන එක"

" අපෝ බොරුවට මිනිස්සුන්ට ඇහෙන්න එහෙම කිව්වට දැක්කනෙ ගෙදර ඉන්නකොට මාව කන්න හදනවා. "

"ඇත්තටම ඔයාගෙ යාළුවෙක් ඇක්සිඩන්ට් වෙලාද?"

"ඇයි ඔයත් හිතන්නේ මං බොරු කියනවා කියලද? මේ කෙල්ලො ඔක්කොම එකයි"

"අක්ක කිව්ව එක ඇත්ත. ඔයාට පොඩ්ඩක් ඇත්තං තරහ යනවනෙ."

මං කිව්වෙ නැද්ද අපේ අක්කා මගේ වැරදි සේරම යාළුවන්ගෙ කනේ තියලා. අක්කා ඉක්මනට කන්න දීලා මෙකිව යැව්වනං ඉවරයි. මොකද දන්නෙ නැහැ අද මෙයාට මේ පැත්ත මතක් උනේ.

" ඔයා මීට කලින් මෙහෙ ඇවිත් නැහැ නේද? "

"මං දවස් දෙකක් ඇවිත් තියෙනවා. ඒත් ඒ එක දවසකවත් ඔයා හිටියෙ නැහැ."

" එතකොට අද මොකද මේ රෑ වෙලා"

SLU



WWW.EXPRESSLANKA.TK 31

" අපේ අම්මලා අද ගාල්ලෙ මළ ගෙදරක ගියා. එද්දි රෑ වෙයි කිව්ව නිසා මං මෙහෙ ආවා."

අක්කා කෑම ලෑස්ති කරලා කතා කරපු නිසා අපේ කඩේ නැවතුනා. කාලා කාමරේට ගිහින් පාඩම් කරන්න හැදුවට අද හතර වටේ පයින් ඇවිදිලා ඇඟට අමාරුයි වගේ. ඉතිං බාලගිරි දෝෂය අද නෙවේ හෙට කියලා මං පොත වහලා ඇඳට පැන්නා.

* * * * * * *





Scanned for
SL-Unlimited.com
by Sheree

# 03

අදත් උදේම ලෑස්තිවෙලා එළියට බැස්සේ පන්ති යනවද අරුන් එක්ක නැටුම් මිස් බලන්න යනවද කියලා ෂුවර් එකක් නැතුව.

"මල්ලි ඔහොම ටිකක් ඉන්න."

ගේට්ටුව ළගට යද්දි අක්කා පස්සෙන් දුවගෙන ආවා.

" අදත් යාළුවා බලන්න යනවද?"

"හවස් වෙලා යන්න තමයි ඉන්නෙ, ඇයි?"

" එහෙනම් මේක අතේ තියාගන්න. පරිස්සමෙන් යන්න."

මගේ අතට සීයෙ කොල වගයක් දීපු අක්කා හැරිලා ගෙට ගියා. මං ගණන් කරලා බලද්දි එතන රුපියල් පන්සීයක් තිබුණා. මෙයා නං දෙයියෙක් නෙමෙයි දේවාලයක්. ඊයේ පාරේ සල්ලි එකතු කලා කියලා බැනලා දැන් එයාම ආධාර දෙනවා. අනේ



WWW.EXPRESSLANKA.TK 32

මන්දා මෙහෙමත් කෙල්ලො. කොහොමත් මාසෙ විසි ගණන් වෙද්දි අපේ තාත්තයි අක්කයි දෙන්නම පොල් කඩන නිසා මට උනත් විදේශාධාර යහමින් ලැබෙනවා. මං සුපුරුදු විදියට හතහමාරට බස් එකේ නගිද්දි විහඟයා හිටියා බස් එකේ.

"රන්දූ මොකද කියන්නෙ අද පන්ති යනවද?"

"අද එකවුන්ටස් බං. නොගිහිනුත් බෑ. එත් කම්මැලියි වගේ"

"රයිටෝ, එහෙනං අපිත් යං අරුන් දෙන්නා එක්ක කලායතනෙ පැත්තෙ"

මූත් ක්ලාස් කට් කරන්න දෙයියා. මං රෙඩි නං මූ එවරෙඩි.

"උඹට ඕනෙ මහේෂාව හම්බවෙන්න නේද?"

අපි ඉස්සර ඉඳලා විහිළු කලාට මූ මහේෂාටවත් මහේෂා මූටවත් කැමති නෑ කියලා අපි හැමෝම දන්නවා. ඒත් ඒක දන් ජොලියට උනත් රෙජිස්ටර් වෙලා. හැබැයි කෙල්ල කළු උනාට ගතිගුණ එළකිරි. ඕන දේකට ඔට්ටුයි.

"අනේ පලයං බං. ඒකිට හරියන්නෙ මේ විහඟ දසුන් රණසිංහ නෙමෙයි."

"එහෙනම් මොකාද ?"

"ප්‍රින්ස් කලූ"





ඌ ඒ කිව්වේ කළු කුමාරයා ගැන. හැබැයි ප්‍රින්ස් කලූ උනත් මහේෂට වඩා සුදු ඇති.

"ඒකිව බඳින එකාට දෙයියංගේම පිහිටයි"

SLU

"ඇයි උඹ එහෙම කියන්නෙ?"

"ඇයි බං නිකං හරි කරන්ට් ගිය වෙලාවක ඉන්න තැන හොයා ගන්න බැරිවෙනවනෙ."

මූටත් හිතෙන දේවල්. අපි ඔය කොයි තරම් මහේෂාව චාටර් කලත් ඒකිගෙ මූණට මුකුත් කියන්නෙ නැහැ. හැබැයි කිව්වත් ඒකි ඒ ගැන ලොකුවට හිතන්නෙත් නැහැ කියලා අපි දන්නවා.

අපි දෙන්නා තුම්මුල්ල හන්දියට ගියේ ජනාලිලා එතනට එනවා කියපු නිසා. අපි යද්දිත් ඩබල ඇවිත් පාර අයිනෙ කිචි බිචි ගගා ඉන්නවා.

"ආ.. ඔය දෙන්නත් පන්ති යන්නෙ නැතුව මෙහෙ ආවද?"

"උඹලා දෙන්නා නීති විරෝධී ගනුදෙනු ගැන කතා කරන්න තනියෙන් ගිහින් ගුටි කන්න වෙයි කියලා අපි දෙන්නත් ආවා."

ජනාලිගෙ ප්‍රශ්නෙට විහඟ උත්තර දුන්නෙ පාරෙ ගිය තවත් කෙල්ලෙක්ට ඇහැක් ගහන ගමන්.



WWW.EXPRESSLANKA.TK 33

"දැන් උඹලා දෙන්නා මෙතනට වෙලා හිටගෙන ඉන්නෙ කවුරු එනකල්ද ?"

"ඇයි සචී. එයාගෙ අද ඉදලා නැටුම් පුරුදු වෙන්න ඕනෙ. ඉතිං එයා නැතුව අපි ගිහින් වැඩක් තියෙනවද?"

"සචීව දැක්කම ඒ අක්කා උනත් හිතයි ඒ අචිනි කියලා. සචීට ටිකක් හරි ඔය නැටුම නටන්න පුළුවන්නම් අපිට මේ කතන්දරේ එයාට නොකියම කරන්න පුළුවන්."

"එත් බං ගිය සතිය පුරාම අචිනි පුරුදු උන ඩාන්ස් එක සචී දන්නෙ නැහැනෙ."

අපි කට්ටිය කතා කර කර ඉද්දි සචිනිත් ආවා. දැන්ම යන්න පිටත් උනොත් තව පැය ගාණකට මුකුත්ම ආමාශගත කර ගන්න වෙන්න නැහැ. ඒ නිසා උදේ දානෙ වළඳලාම යන එක ශරීර සෞඛ්‍යයට හොඳයි.

"උඹලා කාලද ආවේ? මට නං බඩගිනියි බං"

මං කියන්න කටහදපු දේ මට කලින් විහඟ කිව්වා. ඌටත් මට හිතෙන දේවල්මයි හිතෙන්නේ.

"අපෝ මෙයාලානම් කා කියාගත්තු ගමන්මයි."

"නංගි මේ... අපි මේ ලෝකෙ ඉපදිලා ඉන්නෙ මොකටද? කන්න කන්න තමුසෙලාට ඒකවත් තේරෙන්නෙ නැහැ."





අපි කට්ටිය ඇවිදගෙන ශාන්ති විහාර් පැත්තට ආවා. ඒකෙ බෝඩ් එක දකිද්දිම සචීට හිනා ගියා. ඔය හිනාවට හේතුව මම දන්නවා. එක දවසක් අපේ කොල්ලො සෙට් එක මෙතනින් කාලා පන්ති ගියා. අපි යද්දි ටිකක් පරක්කු උන නිසා සචී ඇහුවා "ඔයාලා කොහේද ගියේ" කියලා. අපි ශාන්ති විහාර් ගියා කිව්ව ගමන්ම මෙකි ඇහුවා ඒක පන්සලක්ද කියලා. එදා මුළු පන්තියම ඒකිට හිනා උන එක තාම මතක ඇති.

"සචී පන්සලෙන් තෝසයක් කාලම යමු නේද? "

මං අහද්දි ඒකි හිනාවෙන්න ගත්තා. ඒ හිනාව දකිද්දි මට අචිනිව මතක් උනා. අචිනි මෙලහකට අඩු දෙකත් උඩ තියාගෙන ඇඳට වෙලා ඇති.

අපි තෝස ඕඩර් කලාම වේටර් පත පිඟන් පහක් ගෙනල්ලා කාඩ් පැක් එකේ කොල බෙදනවා වගේ මේසෙට බෙදාගෙන ගියා. ඊට පස්සෙ ගෝනි වගේ තෝස ට්‍රේ එකක් ගෙනැත් මැද්දෙන් තිබ්බා. ඒ තොසේ සයිස් එක දකපු කෙල්ලො තුන් දෙනාට කන්න කලින්ම බඩ පිරුනද කොහෙද? උන් බෙදාගන්නෙ නැතිව තෝසෙ දිහා බලන් ඇඹරෙනවා.

"යකෝ මේක මේසෙ උඩ තිබ්බෙ මේක දිහා බලන් ලව් කරන්න නෙමෙයි. දාගෙන කාපං. නැත්නං දෙවෙනි පාරත් ඕඩර් කරන්න වෙයි."

එහෙම කියපු විහඟයා තෝස දෙකක්ම උගේ පිඟානට දාගත්තා. මේ පිඟන් කොයිතරම් ලොකු උනත් තෝසෙ ඊටත්



WWW.EXPRESSLANKA.TK 34

වඩා ලොකුයි. කොටින්ම කිව්වොත් තෝසෙ මේසෙ. තෝසෙ හොද්ද සැර මදි කියලා මූ තව මාළු හොදිත් ඕඩර් කලා. මේකා කන්න ගියාම අච්චාරුව වගේ හැම ගූ ගොඩක්ම දාගන්නවා.

"මොනාද බං උඹ ඔය කන විදිය. අර හොදියි, මේ හොදියි සම්බාරුයි සේරම එකට අනාගෙන "

ඌ දිගට හරහට බැට් කරන අතර මං ඇහුවා.

"ඌරන්ට මොන සෞඛ්‍යද බං. උඹලට පුළුවන්නං කාපං. බැරිනම් නිකං හිටපං"

එහෙම කියලා ඌ ඇඟට පතට නොදැනී තුන්වෙනි තෝසෙත් බෙදා ගත්තා. කෙල්ලො ටික තාම පළවෙනි තෝසෙවත් කා ගන්න බැරිව අත ගානවා. මමත් හෙමින් සැරේ දෙවෙනි තෝසෙත් බෙදා ගත්තා. මාළු කෑල්ලක් දාගන්න බැලුවට ඒකෙ කෑලි පේන්න තිබුණෙ නෑ.

"කෝ බං මේකෙ මාළු කෑලි හොයන්න අමුඩයක් ගහගෙන කිමිදෙන්න එපැයි"

හිනාවෙන්න ගිය සචිනිට කැම හිරවෙලා කැස්සක් ආවා. ජනාලි එයාගෙ පිට අතගාද්දි විහඟ කෑ ගැහුවා.

"ඔහොම පොඩි එවුන්ට ක්‍රීම් ගානවා වගේ අතගාලා හරියන්නෙ නැහැ බං. මෙන්න මෙහෙම කරපං"





එහෙම කියලා විහඟ සචීගේ පිටට ගැහුව පාරට ඒකිගෙ ඇස් දෙකෙන් කඳුළු පිට උනා.

"විහඟ උඹට පිස්සුද? උඹ මෙයාවත් ඉස්පිරිතාලෙ නතර කරන්නද හදන්නෙ?එහෙම වුනොත් උඹට තමයි නුවර ගිහින් නටන්න වෙන්නෙ."

මං ඒක කිව්වම ඌට කොච්චර තද උනාද කියනවනම් ඌ වඩේත් ඕඩර් කලා. මූ නං කිඹුලා කිරිමැටි ගිලිනවා වගේ කයි. අන්තිමට අපි පස්දෙනාටම වළං හෝදලා තමයි ගෙදර යන්න වෙන්නෙ.

"උඹ ඔය දිගට හරහට ගිලින්නෙ අතේ සල්ලි තියාගෙනද"

මං ඇහුවෙ විහඟගෙ කනට කරලා. කෙල්ලො ටික පලවෙනි තෝසෙ විතරයි කෑවේ. උන්ටත් බය ඇති බිල ගැන.

"කාපං බං කාපං. බිල ගෙවන්නෙ කලා ඉවරවෙලානෙ."

"උඹ කියන්නෙ කාලා ඉවර වෙලා දුවමු කියලද ? උඹයි මමයි විතරක් හිටියා නම් ඒක කරන්න තිබ්බා. ඒත් මුන් ටික"

අපි දිව්වා වගේ නෙමෙයි කෙල්ලො තුන් දෙනා දුවන්න ගත්තොත් මේක වීදි නාට්ටියක් වගේ වෙයි. අනික මහේෂා දුවගෙන යද්දි පාරෙ ඉන්න මිනිස්සු බය වෙලා දුවන්න ගනියි. මට සීන් එක මැවිලා පේන්න ගත්තා.



WWW.EXPRESSLANKA.TK 35

කොහොමහරි අපි කාලා ප්ලේන්ටි පාරකුත් ගහලා ඉවර වෙද්දි බිල රුපියල් හත්සිය තිහයි. බිල දැකලා ජනාලි බය වෙලා. අපි කට්ටිය පර්ස් දිග අරිද්දි විහඟ ප්ලේට් එකට අලුත්ම අලුත් මොණරෙක් අත ඇරියා. මං ඒක අරගෙන උඩට හරවලා බැලුවෙ ඒකෙ සිංහයා ඉන්නවද කියලා දැනගන්න. ඌ හොර සල්ලි අච්චු ගහලද දන්නෙ නැහැනෙ.

"මල්ලි මේවා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වලංගු මුදල් හරිද"

මූ අද පොර වෙලා. ඒක තමයි තව ටිකකින් ලෝකෙ විනාස වෙනවා වගේ අඹරගෙන ගියේ.

"උඹට කොහෙන්ද බං දාහෙ පටි.උඹ තාත්තගෙ පර්ස් එකටවත් බැස්සද?"

මං එහෙම අහද්දි සචිලා විහඟට සල්ලි දික් කරා ඌ තනියම බිල ගෙවපු නිසා.

"උඹලා කන්න ආවෙ අපිට ඕන නිසානෙ. ඒ නිසා ඔය සල්ලි ඕනෙ නැහැ. ඕකෙන් ටිකට් ගනින්."

අදනං විහඟගෙ සැබෑ වෙනසක් වෙලා. අපි ඌට විහිළු කර කර ඇවිත් බස් එකට නැග්ගා.

"සචී ඔයා දන්නවද ඔය කලායතනෙ තියෙන තැන."





මං ඇහුවෙ අපි තදයො වගේ ආවට එකෙක්වත් පාර දන්නෙ නැති නිසා.

"දන්නෙ නං නෑ ඇඩ්‍රස් එක තියෙනවා. අපේ අක්කි උනත් එහෙට කලින් ගිහින් නෑ. ඒ අක්කා නැටුම් උගන්වන්නෙ ඉස්කෝලෙට ඇවිත්නෙ"

ඒ කියන්නෙ පස් දෙනාගෙන් කවුරුවත්ම පාර දන්නෙ නැහැ. අපි එක එක්කෙනාගෙන් පාර අහගෙන අන්තිමට ඔය කියපු කලායතනෙ හොයා ගත්තා."සරස්වතී කලායතනය" කියලා බෝඩ් එකක් ගහලා තිබුන ඒ තැන හරිම නිස්කලංකයි. ඒ වගේම තමයි නැටුම් වලට අදින ජීන්ස් එකයි බ්ලවුස් එකයි අර අඟල් පහක් විතර දිග සායවලුයි ඇඳගත්ත එක එක වයසෙ කෙල්ලො හැම තැනම.

"මේ දැස මගේ පින්වන්තයි..
තේරුනේ දැන් තමයි..."

SLU

මං විහඟ දිහාට හැරිලා කියද්දි ජනාලි මාව කෙනිත්තුවා. අනේ මන්දා මේ කෙල්ලො කොට්ච්චියෝ වගේ නියපොතු වවාගෙන අපිව හූරං කන්න හදන හැටි.

"ඔව් බං පණ පිටින් දිව්‍යලෝකෙ ගියා වගේ. බලපං සීගිරි ලළනාවියන් වගේ මුන්ගේ ලස්සන"

"අපෝ අපිත් ඇවිත් තියෙන්නේ මාර ඇඹලයෝ දෙන්නෙක් එක්කනේ. ඔයාලා ඔහොම පැණි හල හල ඉන්න. අපි ඇතුලට ගිහින් අක්කා එක්ක කතා කරලා එන්නම්"



WWW.EXPRESSLANKA.TK 36

එහෙම කියපු ජනාලි සචිනිවයි මහේෂවයි ඇදගෙන හෝල් එක පැත්තට ගියා.

"සීගිරි ලඳුනේ ඇයි තනිවී, නිහඬව ඉන්නේ ඇයි ගොළුවී..."

විහඟ බංකුවක වාඩි වෙලා හිටපු තව කෙල්ලෙක් දිහා බලාගෙන කියන්න පටන් ගත්තා. මූ තව ටිකකින් අර කෙල්ලගෙන් සෙරප්පු පාරක් කනවා. ඊට කලින් මං ඌවත් ඇදගෙන ජනාලිලා ගිය පැත්තටම ගියා.

"බලපං බං ෆිගර් එක. පිස්සු හැදිලා ආයෙත් හැදෙනවා"

ඌ පිටිපස්ස හැරීගෙනත් අර කෙල්ල දිහා බලන් කියවනවා. අපි ඇතුලට යද්දි අපේ ඩයල් තුන ගුරු මේසයක් ගාව ඉඳගෙන හිටපු අක්කට කාරණේ පැහැදිලි කරනවා අපි දැක්කා. මමත් විහඟ එක්ක එතැනට කිට්ටු වුනා.

මල ජූලියයි කිච්චලු. මේ නැටුම් ටීච හෙවත් අක්කා ඊයේ අපේ ගෙදර ආපු හංසි. මාව දැක්කා විතරයි එයා ඉඳගෙන හිටපු පුටුවෙන් නැගිට්ටුනා.

SLU

"මල්ලි ඔයා මෙහෙ......."

එයා පුදුම වෙලා වගේ අහද්දි අපේ කට්ටිය ඇලඩින්ගේ පුදුම පහන දැක්කා වගේ ඊටත් වඩා පුදුමෙන් බලන්න ගත්තා.





"එතකොට ඊයේ ඔයා බලන්න ගිය යාළුවා අචිනි නංගිද?"

මෙයා ගත් කටටම ඇහුවා. දැන් තියෙන ලොකුම කේස් එක තමයි මේ රහස අපේ අක්කිට නොකියන්න මෙයාව පොරොන්දු කර ගන්න එක. අපි කට්ටියම එකතු වෙලා දිගට හරහට කරුණු පැහැදිලි කලා මේක සචිනිට උගන්නන එක ගැන.

"ඔයාලා කියන දේ මට තේරෙනවා. මෙයාටත් අචිනිට වගේම හොඳට නටන්න පුළුවන් කියලා ඔයාලා කිව්වනේ. ඉතිං අචිනිට කියලා දුන්න එකේ මේ නංගිට කියලා දෙන එක මට ප්‍රශ්නයක් නෙමෙයි. ඒත් ඔයාලගෙ ප්‍රින්සිපල් සර් මට මේ වැඩේ බාර දුන්නේ මං ගැන ලොකු විශ්වාසයක් තියලා. අනික මාව ඒව්වෙ කලා අංශෙ අචිනිට නැටුමක් පුරුදු කරන්න මිසක් එයාගෙ නංගිට නැටුම් කියලා දෙන්න නෙමෙයි"

බලාගෙන ගියාම මෙයයි අපේ අක්කයි ඩබලම එක නැට්ටේ දෙහි. මාර ලෝ තියෙන්නේ.

"ඉතිං මිස් ඔයා මේ තරම් ළමයින්ට නැටුම් උගන්නන එකේ අපේ සචිනිට උගන්නන එක කොහොමද වැරැද්දක් වෙන්නේ ?"

විහඟයා මූකුත් නොදන්න ගානට බබා ටෝක්ක් දැම්මා. මේකට අපේ ප්‍රින්ස් සම්බන්ධ එක තමයි තියෙන ලොකුම ප්‍රශ්නෙ.

"මං කියන දේ ඔයාලට තේරෙන්නේ නැහැ මල්ලි. මට මේ නංගිව කලායතනෙට බඳවගෙන නොමිලේ උනත්



WWW.EXPRESSLANKA.TK 37

උගන්නන්න පුළුවන් මේ ප්‍රශ්නෙ වෙන එකක්නෙ. මං හෙට ඉදලා ඉස්කෝලෙට ඇවිත් අචිනිට කියලා සචිනිට උගන්නන්න එපැයි. ඉතිං ඒක වංචාවක් නෙමෙයිද ?"

මේ පඬි කතා අහගෙන ඉද්දි මට තද උනේ හංසි එක්ක නෙමෙයි අචිනි එක්ක. මේකි එක්කො වැටෙන්න තිබුණෙ ප්‍රැක්ටිස් පටන් ගන්න කලින්. එහෙම උනා නං අපිට මේ තරම් එක එකාගෙ කකුල් දෙක ළඟ පිණ්සෙන්ඩු වෙන්නේ නැතුව මුල ඉදලම සචීව මෙයාට මුණගස්සන්න තිබුණා. මේ කෙල්ලත් ෆයිනල් තරගෙකට අගටම ඇවිත් පිණුමක් ගැහුවනෙ. ඒකිගෙ අඬු දෙකම නැතුව එක අණ්ඩක් කඩාගත්තනං බට්ටා පැන පැන හරි සචිනිට උගන්නන්න තිබ්බා. දැන් ඉතිං වෙච්ච දේට එන්න සෙයිය කියලා අන්තිම තුරුම්පුවත් ගහලා බලන්න වෙනවා.

"කමක් නැහැ අක්කෙ, අපි මේ තරම් ප්ලෑන් කරපු එකේ අපිට තිබුණා මෙයා සචිනි නෙමෙයි අචිනි කියලා ඔයාටත් බොරු කරලා මේක කරන්න. මොකද ඔයාට කොහොමත් මේ දෙන්නව වෙන් කරලා අඳුරන්න බැහැනෙ. ඒත් ඔයා නැටුම් උගන්නන ගුරුවරයා. ඉතිං ඔයාට වංචා කරලා මේක කරන්න අපි කවුරුවත්ම කැමති උනේ නැහැ. ඒකයි අපි ඔයා හොයාගෙනම ඇවිත් ඇත්ත කියලා මේ ගැන කෙලින්ම කතා කලේ.

අනික අචිනි ගියත් සචිනි ගියත් එයාලට අනිවාර්යයෙන් ප්ලේස් එකක් ගන්න පුළුවං. ඉතිං මේකට සචිනිවත් සහභාගි නොවුනොත් අපේ ඉස්කෝලෙට ඒ අවස්ථාව නැති වෙනවා. අපි මේ තරම් ඔයාට බල කරන්නේ වංචාවක චේතනාවක් මුල් කරන් නෙමෙයි. මේ තරගෙ දින්නම අපේ ඉස්කෝලෙට ලැබෙන





ගෞරවේ ඇරෙන්න අපිට වෙන කිසිම පෞද්ගලික ලාභ ප්‍රයෝජනයක් නැහැ."

මම දිගටම කියවගෙන යද්දි කට්ටිය කොරවෙලා වගේ මගේ මූණ දිහා බලං හිටියා. මමත් ඇරියෙ නැහැ. හංසිගෙ ඇස් දිහා බලාගෙනම මං ඉතුරු ටිකත් කිව්වා.

"ඔයා හිතනවා ඇති අපි මහ බොරුකාරයො වංචාකාරයෝ කියලා. කමක් නැහැ අක්කේ අපි මේ ගමන ආවේ යාළුකම, සහෝදරකම වගේම අපේ ඉස්කෝලෙ ගැනත් හිතලා. ඒකෙන් ඔයාට කරදරයක් උනානං සොරි. හැබැයි ප්ලීස් මේ ගැන අපේ අක්කට කියන්න එපා. අපි යනවා."

එහෙම කියපු මං අපේ කට්ටිය හෝල් එක ඇතුලෙ ඉද්දිම එළියට ආවා.

"මල්ලි ඔහොම ටිකක් ඉන්න" SLU

හංසි මගේ පස්සෙන් එළියට ඇවිත් මාව නතරකර ගත්තා.

"අක්කා කිව්වටත් වඩා ඔයා ගොඩාක් හොඳ කෙනෙක් මල්ලි. මං අක්කට මේ ගැන වචනයක්වත් කියන්නේ නැහැ. මාව විශ්වාස කරන්න. මං හෙට ඉදලා සචිනිට ප්‍රැක්ටිස් කරන්නම්"

එයා අන්තිම ටික කියද්දි අපේ කට්ටියත් එතනට ඇවිත් අපිව වටකරගත්තා. මගේ හිතට දැනුන සතුට මං වැඩිය පෙන්නන්න ගියේ නෑ. හැබැයි අපේ කට්ටියගෙ මූණු ටික නම්



WWW.EXPRESSLANKA.TK 38

ලොතරැයියෙ පළවෙනි දිනුම ඇදුනා වගේ. අපි කට්ටියම එයාට ස්තුති කරලා එන්න හදද්දි හංසිත් මගේ පස්සෙන්ම ගේට්ටුව ළගට ආවා.

"මං ඊයේ රෑ ඔයාට කියලා එන්න බලද්දි අක්කා කිව්වා ඔයාට නින්ද ගිහින් කියලා "

"ඔව් ඊයෙත් මේ වැඩ වලට ඇවිදලා මාර මහන්සියෙන් හිටියෙ අක්කෙ"

මම අර මළ පැනපු මූඩ් එක අත ඇරලා එයාගෙ යාළුවගෙ මල්ලි විදියට හිනාවෙලා කිව්වා.

"මං හිතුවෙ ඔයා ඊයෙ යාළුවෙක් ඇක්සිඩන්ට් වෙලා කියලා බොරුවක් කිව්වා කියලයි. අද අහම්බෙන් හරි ඔයා ඒක ඇත්තක් කියලා ඔප්පු කලා."

අනේ මන්දා හංසි තවත් කියෝනවා. මේ කෙල්ලට අද පන්ති කරන්න ඕනේ නැද්ද මන්දා.

"අපි බොරු කියලත් නැහැ කියන්නෙත් නැහැ. අපි යනවා අක්කෙ බායි"

එයාට චේව් එකක් දාලා ඇවිත් මං කට්ටියට සෙට් උනා. විහඟ පැනපු ගමන් මගේ කරට අත දාගත්තා.





"උඹේ මාර ඇක්ටින් පාර බං. කොහොම හරි බොක්කෙන්ම ටෝක දීලා වැඩේ බැලන්ස් කරා නේද ? "

"ඔව් ඉතිං රන්දූ අද ආපු නිසා අපි ගොඩ ගියා. නැත්තං ඊයේ ගහපු ප්ලෑන් සේරම ඉවරයි"

අපේ ස්ත්‍රී පාර්ශවයෙනුත් මට නම්බුනාම එද්දි මම කතාව වෙන පැත්තකට හැරෙව්වා. මොකද ඔය වැඩි වර්ණනාවට මං කැමති නැහැ.

"හරි හරි බං. දැන් ඒක ඉවරයි. අරකිට බණ දෙසලා මගේ දිවත් ගිලෙන්න එනවා. යං මොනවා හරි බීලා ඉමු."

අක්කා උදේ දීපු රුපියල් පන්සීය මතක් වෙලා මං කිව්වා. අපි කඩේකට සෙට් වෙලා බීම බොන අතරෙ මං හංසිව අඳුරන හැටි අහගන්න මුන්ට තදියම් වෙලා.

"ඒකි අපේ අක්කගේ යාළුවෙක්. මං අදත් එක්ක එයාව දවස් දෙකයි දැකලා තියෙන්නේ"

කාරණේ කෙටියෙන් පහදලා මං බීම එක බොන්න ගත්තා. ඒ අතරෙ විහඟගෙ ඇස්දෙක හතර වටේ කැරකෙනවා. මං හැරිලා බලද්දි අපේ පිටිපස්සෙ මේසෙ ලස්සන කෙල්ලො දෙන්නෙක්.

"ඕක ඉක්මනට බීලා යමන් බං"

SLU

මූට තදියං වෙලා තියෙන්නේ අර කෙල්ලො දෙන්න බිල ගෙවලා යන්න හදන නිසා අපිත් පාරට එද්දි එයාලා අපිට ඉස්සර



WWW.EXPRESSLANKA.TK 39

වෙලා පැද්දි පැද්දි ගියා. සෙනඟ අඩු හිස් බස් එකක අපි නගිද්දි ඒ දෙන්නත් ඒකටම නැග්ගෙ අපිව තඹේකටවත් මායිම් කරන්නෙ නැතුව. කොහොමත් අපි දෙන්නා ගියේ කෙල්ලො තුන්දෙනෙක්ම ඉස්සර කරගෙනනෙ.

"මචං පොඩි ෆලෝ එකක් දෙමුද? එකෙක් හරි වට්ටගන්න බැරිවෙන එකක් නැහැ"

මේවා සචිනිලට ඇහුනොත් හිතයි මමත් මූ වගේ දකින දකින කෙල්ලො පස්සෙ යනවා කියලා. මූ අහිංසක මගෙත් චරිතෙ ඝාතනේ කරන්න හදන්නෙ. ඒත් තාම සචීලට වැඩේ නෝන්ඩි උනේ නැහැ.

"මේ ජනාලි උඹලට පුළුවන්නෙ සචීවත් ඇරලවගෙන යන්න. මගේ කම්පියුටරේට කෑලි වගයක් ගන්න තියෙනවා. මං රන්දු එක්ක මගින් බහිනවා"

පුහ්! මූට කෑලි ගන්න කම්පියුටරයක් තියෙන්න එපැයි. මේ අපතයා මාවත් ගාවලා බොරුවක් දෙසා බලා පැණි හලන්න යන්නයි ලෑස්තිය. මොනවා කලත් මූට කවදා හරි දාගන්න වෙන්නේ මේ සුදෝ සුදූ මහේෂාවම තමයි කියලා මට හිතුණා. හැබැයි අද පන්ති ගියෙත් නැති එකේ ගෙදර ගිහින් පාඩම් කරන එක මේ යකා එක්ක අවලමේ යනවට වඩා වටිනවා. මට හිතන්න තරම් වෙලාවක් උනේ නැහැ.අර කෙල්ලො දෙන්නා බහින්න හදද්දි මූ මාවත් ඇදගෙන පිටිපස්සේ දොරෙන් බැස්සා. සැක හිතුන ජනාලි දෙපාරක්ම හැරි හැරී බලද්දි බස් එක ඇද්දුවා.





"මොන මගුලක්ද බං කරන්නේ. උඹ වගේ එකෙක් එක්ක ආවට මට බූවල්ලෙන් තලන්න ඕනෙ. බලපං උඹට අපිත් එක්ක ආපු යාළුවො ටිකට වඩා කොහෙවත් යන කෑලි දෙකක් ලොකු වුනා."

මං කෑ ගහද්දි ඌ මගේ කට වැහුවෙ ඒක අරුන්ට ඇහෙයි කියලා හිතලා වෙන්න ඇති. අපි දෙන්නා බස් ස්ටෑන්ඩ් එකේ ඉද්දි අර කෙල්ලො එතන තිබුණ කේ. එෆ්. සී එකට රිංගුවා. අනේ මන්දා මූන්ටත් බඩවල් නෙමෙයි තියෙන්නෙ. දැන් අර බස් එකට නගින්න කලින් එක කඩේකට රිංගලා ආවේ. දැන් තව එකක්.

"මේ......මේවා උඹට ලේසියෙන් වට්ටගන්න පුළුවං කෑලි නෙමෙයි. බලපං උන් කන්නෙ ඉංගිරිසි අකුරු තුනේ බුරියානි. දැන් ඉතිං උන් කාලා එනකල් අපි මෙතනට වෙලා කෙල ගිල ගිල හිටන් ඉන්නද කියන්නේ. මෙන්න මෙහෙ වරෙන් ගෙදර යන්න."

ඒ වෙලාවෙනං මං ඇත්තටම මල පැනලා හිටියෙ. ඇයි ඉතිං මේ යකා කවදාවත් කියන දෙයක් අහන්නෙ නැහැනෙ.

"මොනාද බං තව විනාඩි දෙකක් ඉවසපං"

"උඹ හිතුවේ උන් විනාඩි දෙකෙන් කාලා එයි කියලද? "

මොනව උනත් මේ ගෝතයව මග දාලා යන්න බැහැනෙ. ඒ නිසා මම ඉවසගෙන හිටියා. අපි දෙන්නත් කේ.එෆ්.සී. එකේ



WWW.EXPRESSLANKA.TK 40

දොරකඩට වෙලා හිටන් හිටියෙ බුරියානි කාලා දැන් එළියට ආපු දෙන්නෙක් වගේ. හැබැයි ඉතිං උගුරට ඇඟිල්ල දාලා බැලුවනම් අපි වමනෙ දාන්නෙ තෝසෙ කෑලි. එත් කවුද ඕවා දන්නේ. මං තද වෙලා ඔරලෝසුව දිහා බලද්දිම අර ඩබල එළියට එනවා. උන් උන් කන්න නෙමෙයි කෑම ගෙනියන්න ඇවිත් තියෙන්නෙ. උන් එළියට එද්දි දොර ළඟ හිටපු අපිව දැකලා ටිකක් අප්සට් ගියා කියලා මට තේරුණා.

" මචං අර ත්‍රී ක්වාටර් ගහලා ඉන්න කෑල්ල ගතිනේ. "

" මොන ගතිද බං ඒකි මහ සෙක්සි පාටයි. "

මං ඇත්තම කිව්වා.

" ඒකම ඇතිනෙ ගතියට. බලපං ඒකි හොඳ සකසුරුවමට හැදිච්ච පවුලක කෙල්ලෙක් . මීටර් බාගයකින් අඩුම ගානේ ඇඳුම් පහක් වත් මහනවා ඇති."

අපි කතා කර කර ඉද්දි ආපු එකසිය පනස් හතර බස් එකක කෙල්ලො දෙන්නා නැග්ගා. වවුලගෙ මගුල්ගෙදර ගිහින් එල්ලිලා ඉන්න වෙනවා වගේ වෙන කරන්න දෙයක් නැති කමට මමත් විහඟ එක්ක බස් එකට නැග්ගා. බස් එකේ එක ළඟ සීට් තිබුනෙ නැති නිසා ත්‍රීක්වාටර් අයිටම් එක පිටිපස්සේ සීට් එකට කලින් සීට් එකේ ඉඳගත්තා. මං අමාරුවෙන් පස්සෙ සීට් එකේ ඉඳගත්තෙ චිත්‍රපටිය පැහැදිලිව බලාගන්න ඕනෙ නිසා. විහඟ එතනම හිටගෙන අර කෙල්ල ඉඳගෙන හිටපු සීට් එකෙන් අල්ල ගත්තා.





ටික දුරක් යද්දි ආපු අනිත් කෙල්ල මෙයාට ටටා පාරක් දාලා බැස්සා. දැන් වැඩේ මාර ගති. කෙල්ල තනියෙන්. මං අහැක් ගහලා, විහඟට සපෝට් එක දුන්නා. බම්බලපිටිය හන්දියට එද්දි විහඟයා කෙල්ල ළඟ හිස් උන සීට් එකේ ඉඳගත්තා. ඒ අස්සේ ටිකට් ගන්න කියලා කොන්දා බෙරිහන් දෙනවා.

"බොරැල්ල එකක් "

අර කෙල්ල සල්ලි දික් කලා. මමත් විහඟ එක්ක ආපු නැති ගානට හිටියා. මූ මටත් එක්ක ටිකට් ගත්තා.

SLU

" බොරැල්ල දෙකක් "

දැන් පලකො බොරැල්ලෙ. ඒ අතරෙ කෙල්ල විහඟට රවනවා මං දැක්කා. මගේ ඉස්සරහ සීට් එක නිසා දර්ශන පථය ඉතා පැහැදිලියි. ටිකක් වෙලා යනකල් විහඟත් සද්දයක් නෑ. අර කෙල්ලත් ඔරේ රන් කියලා බෙල්ල ඇමැට්ටි කරගෙන කවුළුවෙන් අනන්තය හොයනවා. මෙන්න බොලේ ටිකක් වෙලා යද්දි විහඟ නිදි. මේකනං සිරාවට මූගේ මර්සියක් වෙන්න ඕනෙ. එතකොට බ්‍රේක් පාරක් ගහද්දිවත් පොඩ්ඩක් ඒ පැත්තට වීසි වෙන්න පුළුවන්නෙ. ඒත් තව හෝල්ට් දෙක තුනක් ගියත් මං හිතපු විදියෙ දෙයක් උනේ නැහැ. හැබැයි එක පාරටම කෙල්ල වෂිම් අකුම් පන්දු යවන වේගෙටත් වඩා වැඩි වේගෙකින් විහඟ දිහාට හැරුණා. මමත් උන් දෙන්නා ළගට කණ හලාගෙන හිටියේ සීන් එක අහගන්න.

" මේ හලෝ "



WWW.EXPRESSLANKA.TK 41

මේකි හෙන සද්දෙට විහඟට කතා කලා.

" තමුසෙ තනියම නිදාගන්නෙ නැතිව මේ අතත් නිදිකරගන්නවද?"

ෂිට්! මල නෝන්ඩියයි. මූ අත දාගෙන මොන අවලං වැඩක් කරන්න හැදුවද කියලා මං දැක්කෙ නැහැ. ඒත් එක්කම මේකි පොත් ටිකත් අරගෙන නැගිටලා පස්ස අංශක එකසිය හැටක් විතර ගස්සලා දාලා ගිහින් ඉස්සරහා සීට් එකකින් ඉඳගත්තා. විහඟ මූණ බෙරි කරගෙන පිටිපස්ස හැරිලා බලද්දි මං ඌත් එක්ක ආවේ නෑ වගේ අහක බලා ගත්තා. ඌට ඔහොම වෙලා මදි. ඒ අතරෙ මං දැක්කා කෙල්ල කොන්දොස්තරට මොනවද කුටු කුටු ගාලා තව සල්ලි කීයක්ද දෙනවා. ඔහොම යංකො. මම කොහොමත් මෙතන ප්‍රේක්ෂකයා විතරයිනෙ. බස් එකත් පැය ගානක් කොට කොට ඇවිත් බොරැල්ලෙ නතර කලා. මිහ්........ කෙල්ල බහින පාටක් නෑ. විහඟටත් බහින තැන මතක නෑ වගේ ඔහේ ඉඳගෙන ඉන්නවා. මේකි දිගටම කිරිබත්ගොඩටම යනවද දන්නෙ නැහැ. මං විහඟට තට්ටුවක් දැම්මා. ඒ අස්සෙ කොන්දා කෑගහනවා.

" බොරැල්ල ටිකට් ගත්ත අය සේරම මෙතනින් බැහැගන්න."

මං සීට් එකෙන් නැගිට්ටා. ඒත් මූ මෙච්චර චාටර් කාලත් තාම ලැජ්ජ නැතුව ඉඳගෙන ඉන්න හැටි. කොන්දා අපි දෙන්නා දිහා හොඳට බලනවා මං දැක්කා.

" බොරැල්ල මෙතනින් ඉවරයි. බහින අය ඉක්මනට බැහැ ගන්න."





චාටර් හැත්තෑවයි කිව්වලු. අර කෙල්ලත් පිටි පස්ස හැරිලා නක්කලේට හිනා උනා.කොන්දා අපේ බෙල්ලෙන් අල්ලලා එළියට දාන්න කලින් මං විහඟව ඇදගෙන බැහැගත්තා. ඌ නිකං කසාය බීපු ගොළුවා වගේ මූණත් ඇඹුල් කරගෙන බිම බලාගෙන ඉන්නවා.

SLU

" දැන් සනීපද උඹට"

" උඹත් මට පල් එක දානවනේ "

" පල් එක නෙමෙයි ඩෝ උඹව එල්ලන්න ඕනෙ. උඹ අර කෙල්ලගෙ අස්සෙ අත දාගෙන මොන මගුලක්ද කරන්න ගියේ."

මූ කෙල්ලගෙ කොහේ හරි අල්ලන්න හැදුවද දන්නෙ නැහැනෙ. ඇත්තටම මේක එහෙම දෙයක් කරන්න ගියානං චාටර් උනා මදි කියලා මට හිතුනා.

" උඹ හිතන විදිහෙ ජරා වැඩක් මං කලේ නෑ බං. ජොලියට ට්‍රයි එකක් දැම්මට මං එහෙම කුපාඩියෙක් නෙමෙයි."

" එහෙනම් අරකි මොකටද උඹට අත නිදි කරගන්න කිව්වෙ. උඹ නිදි වගේ හිටියට උඹේ අත ඇහැරිලානෙ තියෙන්න ඇත්තෙ."

"නෑ බං, මං හැදුවේ ඒකිගෙ අතේ තිබුණ පොත් ටිකෙන් ඒකිගෙ නම බලාගන්න. මං පොතක් අදිද්දි කෙල්ලට ඒක දැනුනා."



WWW.EXPRESSLANKA.TK 42

" පුදුමයි ඒකි උඹට කම්මුල් ගාය හදවපු නැති එක. ඔන්න මං උඹට එකක් කියන්නම්, ආයෙනම් උඹේ ඔය ගුටිකන වැඩ වලට මං නෑ."

ඒ චැප්ටර් එකත් එතනින් ක්ලොස් උනා. මං සීන් එක වෙන කාටවත්ම කියලා මූව පල් කරන්න ගියේ නෑ. අපේ සෙට් එකේ ඉතුරු අට දෙනාට විතරයි කිව්වෙ.

විහඟ එක්ක බොරැල්ල වටේ කැරකිලා මං ඌටත් බැන බැන යන්තං හවස් වෙන්න කලිං ගෙදර ආවා. ඒ එද්දි අම්මයි තාත්තයි දෙන්නම මිදුලෙ පුටු දෙකක ඉඳගෙන කතාව. මාව දක්ක විතරයි ඒක නතර උනා. සමහර විට මාතෘකාව එයාලගෙ ආදරණීය පොඩි පුතා ගැන වෙන්න ඇති.

" පොඩි පුතා ඔයා කාලද ඉන්නෙ?"

මම කාමරේට එද්දි අම්මත් මගෙ පිටිපස්සෙන් ඇවිත්. කොයි තරම් මග දිගට කකා බිබී ආවත් දැන්නම් මගේ බඩ සතියකින් කාලා නැති ගානට ගුරු ගුරු ගානවා.

" නෑ අම්මා බඩගිනියි. මං ටක් ගාලා නාලා එන්නං. අම්මා බත් බෙදලා තියන්න."

මං පුරුදු විදියට ගෙදර ආපු ගමන් බාත් රූම් එකට රිංග ගත්තා. දවස තිස්සෙම කාපු වාටර් ගෝනිය හෝදලා දාන්න හිතාගෙන මං සින්දුවකුත් කිය කිය නෑවා. එළියට එනකොට





බඩගින්න ඩබල්. අම්මා කෑම එක බෙදලා මේසෙ උඩින් වහලා තිබුනට එයා ජේන්න හිටියේ නෑ. මං බත් පිඟානත් අරන් අම්මා ළඟට ගියා.

" අනේ අම්මා ඔයාට බැරිද මට මේක කවන්න."

කාලෙකින් අම්මට කියලා කවාගන්න බැරි උන නිසා මං ඇහුවා. කොහොමටත් මං අනලා කනවට වඩා ඒ බත් එකම අම්මා කවද්දි රස වැඩියි. ඒ අපේ අම්මා මට තියෙන ආදරෙත් බත් එකට දාලා අනන නිසා වෙන්න ඇති. අම්මා බත් කටෙන් කට අනලා කවනකල් මං එයාගෙ කකුල් දෙක ළඟ ඉඳගෙන හිටියා. ඉස්කෝලෙදි කොයිතරම් වීරයා උනත් තාම අපේ අම්මගෙයි තාත්තගෙයි පොඩි පුතා මමනෙ.

අම්මට කියලා බත් කවා ගත්තට පස්සෙ ඇඟට වගේම හිතටත් මාර ෆිට් එකක් ආවේ. මෙච්චර දවස් අද නෙමෙයි හෙට කියලා කල් දදා හිටපු පාඩම් කිරිල්ල මං හවස්වරුවෙම පටන් ගත්තා. එක දිගට පැය තුනක් විතර කාමරේට වෙලා පාඩම් කරද්දි අම්මයි අක්කයි සැරෙන් සැරේ මට බොන්න එක එක දේවල් හදන් ආවා. බලන් ගියාම පාඩම් කරන ජනතාවට පුදුම සැලකිල්ලක් අපේ ගෙදර තියෙන්නෙ. එයාලගෙ හිත රිද්දන්න හොඳ නැති නිසා මං ඒ හැම දෙයක්ම නම්බුවවත් ඉතුරු නොකර අන්තිම උගුරටම ඇදලා දැම්මා. පාඩම් කරලා ඉවර වෙද්දි මගේ මොලේට ගිය දේවල්වලට වඩා බඩට ගිය දේවල් වැඩියි.

හෙට ඉස්කෝලෙ යන්න කලින් සචිට කෝල් එකක් දීලා බැලුවොත් හොඳයි කියලා හිතුන නිසා මං සාලෙට ගිහින් ෆෝන් එක ඔඩොක්කුවට අරන් ඉඳගත්තා.



WWW.EXPRESSLANKA.TK 43

" හෙලෝ"

" හෙලෝ ආන්ටි සචී ඉන්නවද? මං රන්දූ"

මං මගේ ෆේමස් නමෙන්ම මාව සචීලගේ අම්මට හඳුන්වලා දුන්නා.

" ආ පොඩ්ඩක් ඉන්න පුතා"

SLU

එහෙම කියලා ආන්ටි සචීට කතා කරන සද්දෙ ඇහුනා. මෙකි ෆෝන් එකට දුවගෙන ආවෙ හති දාගෙන.

" කොහෙද බං හිටියෙ. මොකද ඔය හති දාන්නෙ"

" මං අත හෝදන්න දිව්වා රන්දූ. ඒකයි"

" ඇයි උඹ මැටි බෝල හද හදාද හිටියේ "

මං එහෙම ඇහුවට කෙල්ලන්ට ගෙදර කරන්න කොයිතරම් වැඩ ඇතිද? අම්මලා අපිට වගේ හැම දේම අතට ගෙනැත් දෙන්නේ නැතිව ඇතිනේ.

" මං අක්කිට වින්ටෝජිනෝ ගෑවා. එයා වැටුන වෙලාවෙ කොන්ද ඇනිලා"





එදා අවිනි දකපු වෙලාවේ මට ඔය ටික හිතුනා. කෙල්ල අඬු දෙකම කඩාගෙන හිටපු විදියට බිම පෙරලෙන්නම වැටෙන්න ඇති. ඒකනේ එදා මෝල්ගස් ගිලලා වගේ සීරුවෙන් ඉඳගෙන හිටියෙ. අපි සෙට් එක පල් කරයි කියලා අපිට කියන්න නැතුව ඇති.

" අවීට තාම ගොඩක් අමාරුද?"

" කකුල් නමන්න බෑ කියලා කෙඳිරි ගගා ඉන්නවා රන්දූ. පව්."

කොහොමටත් මුන් දෙන්නට දෙන්නා පුදුම ආදරෙයි. ඒ නිසා සචීට දුක ඇති.

" එයාට මේ ටිකේ ඉස්කෝලෙ එන්න බැරි වෙයි නේද?"

" ඔව් එයාට ඇවිදින්න අමාරුයිනෙ. මං ඔයාට පණිවිඩයක් කියන්න හිටියෙ රන්දූ"

" ඒ මොකක්ද?"

" අපිට විභාගෙ තියන්නෙ ලබන සිකුරාදානෙ. අක්කිට සිකුරාදා වෙද්දි ඒ තරම් සනීප වෙන එකක් නැහැ. එයාව බදාදට ආපහු බෙහෙත් දාන්න ගෙනියන්නත් ඕනේ. ඒ නිසා මං වෙනුවට එයාට විභාගෙ ලියන්න කියන එක පව්නෙ"

" එතකොට විභාගෙ? උඹට මිස්ලගෙන් බේරුමක් නැති වෙයි."



WWW.EXPRESSLANKA.TK 44

" නෑ විභාගෙ ලියන්න මං එනවා. අක්කි අමාරු තියාගෙන එන එක විතරක් නෙමෙයි, එයා කොපි කරන්න ගිහින් ප්‍රශ්නයක් උනොත්"

සචිනි ගොඩක් හොඳ සහෝදරියක් වගේම ගොඩක් උත්සාහවන්ත කෙල්ලෙක් කියලා මට හිතුනා.අනික එක වංචාවක් වහන්න තව වංචාවක් කරන එක ගැන කෙල්ලගෙ හිතටත් හරි නැතුව ඇති.

" එතකොට නැටුම් තරගෙ"

"ඒක තියෙන්නෙ සෙනසුරාදනෙ. සිකුරාදා මට එන්න පුළුවං. මං හෙට ඉස්කෝලෙ එනවා රන්දූ. ඒත් ඒ සචිනි විදියට නෙමෙයි. අචිනි විදියට. ඔයාලා හැමෝම කිව්ව නිසයි අපි මේකට කැමති උනේ. ඒ නිසා අපිට උදව් කරන්න රන්දූ ප්ලීස්. අනිත් අයටත් කියන්න."

" ඒ ගැන කිසිදේකට බය වෙන්න එපා. මතක ඇතිව උඹෙයි අචිනිගෙයි කරාබු දෙක මාරු කරලා දාගන්න. මොකද අපි එක පාරටම හොයාගන්නෙ ඒකෙන්නෙ. මං අපේ උන් ටිකට සීන් එක කියන්නං. හැබැයි උඹ පුරුද්දට අපේ පංතියට එන්න එපා උදේම. හරිද?"

" හරි හරි මං එහෙනං තියන්නං. බුදු සරණයි! "





" බුදු සරණයි! "

අද දිනුක අචිනිව බලන්න ගිහින්ද කියලා අහන්න හිටියට මට ඒක මතක් උනේ ෆෝන් එක තිබ්බට පස්සෙ. හෙට ඉස්කෝලෙ ගියාට පස්සෙ ඔය ගැන විස්තර දැනගන්න පුළුවන්නෙ.

SL-UNLIMITED.COM

* * * * * * *



WWW.EXPRESSLANKA.TK 45

Scanned for
SL-Unlimited.com
by Sheree

# 04

මං උදේ පන්තියට යද්දි අපේ කට්ටිය ගොඩක් ඇවිත්. හැබැයි කට්ටියගෙ මූණු වල තිබුණෙ මල පැනපු ලුක් එකක්. මං පුරුද්දට වගේ පොත් ටික මගේ ඩෙස් එක උඩට දාන්න හැදුවත් එතැන ඩෙස් එක තිබුනෙ නැහැ.

" කෝ බං, මේකෙ තිබුණ ඩෙස් පුටු වලට මොකද වෙලා තියෙන්නෙ ?"

" ඒක තමයි බං අපිත් මේ ආපු ගමන් බැලුවෙ. ෂුවර් එකට අලුත් එවුන් ගෙනියන්න ඇති."

ෂෝට්ට තද වෙලා හිටපු හේතුව ඒකයි එහෙනං. අලුත් බැජ් එක ආවම අපේ ඩෙස් පුටු වලට ඔය ආනිසංසෙ අත්වෙනවා කියලා දන්න නිසාම අපි උන් එන්න කලින් පංතියේ සේරම ඩෙස් බංකු ගුරු මේස එහෙම ලා නිල් පාට තීන්ත ගාලා පංතියේ නමත් ගහලයි තිබුනේ. එහෙම තියෙද්දිත් මුං ඒවා අරන් ගිහින් නං කට්ටියව හම ගහන්න ඕනෙ.





" වරෙන් යං අලුත් ක්ලාස් පැත්තෙ. නිකං හරි උන් අරගෙන නං උන්ට කියලම ආපහු ගෙන්නගන්න ඕනෙ."

මං එහෙම කියලා ඉස්සර වෙද්දිම අනිත් කට්ටියත් පස්සෙන් ආවා. එළියට ආවමයි තේරුනේ ඩෙස් අඩු අපේ පන්තියේ විතරක් නෙමෙයි කියලා. හැම 13 වසර පන්තියකම තිබ්බ ඩෙස් පුටු අඩු වෙලා. සේරම කට්ටිය අලුත් එවුන්ගෙ මුළු ඥාති පරපුරම මතක් කර කර තම තමන්ගෙ ඩෙස් හොයනවා.

අපි දොළහ වසරෙ කොමස් ක්ලාස් එකකට යද්දි උන්ගෙ පංතියෙ ඩෙස් පුටු හරි ලස්සනට පේළියට හදලා. හැබැයි ඉස්සරහ පේළියෙ තිබුණු ඩෙස් හයම අපේ පන්තියේ ඒවා. ඒක දැකලා මට තද උනා. ඒ ඩෙස් එකක් උඩ ඉදගෙන හිටපු කොල්ලෙක් ගාවට මං ගියා විතරයි උෟ ඩෙස් එකෙන් බිමට පැන්නා.

" මල්ලි කවුද මේ නිල් පාට තීන්ත ගාපු ඩෙස් මෙහෙට ගෙනාවේ?"

" ගෙනාවේ අපි "

මූ නිකං කතා කලේ ප්‍රින්සිපල්ගෙ පුතා වගේ. මං වැදගත් විදියට මල්ලි කියලා කතා කරපුවම මූ එනවා ඔළුවට අත හෝදන්න.

" හලෝ මේ තමුසෙ මේවා ගෙදර තිබිලා ගෙනාපුවා නෙමෙයිනෙ. මේ අපේ ක්ලාස් එකේ ඩෙස් "



WWW.EXPRESSLANKA.TK 46

මං උගේ කොලර් එකෙන් අල්ලලා කියද්දි විහඟත් මැද්දට පැන්නා.

" මොකද ඩෝ රවන්නේ? මේවායේ 13 වසර කියලා ගහලා තියෙනවා. පේන්නේ නැද්ද? "

" අපිට අඩු ඩෙස් ගෙනැත් පන්තිය හදාගන්න කිව්වේ අර නන්දනී කියන මිස් "

උෟත් ගේම අත අරින පාටක් නෑ. නන්දනී මිස් කිව්වා කියපුවම අපි නකුට කකුල් දෙක අස්සෙ ගහගෙන යයි කියලා උෟ හිතන්න ඇති.

" නන්දනී මිස් කිව්වද අපේ පන්තිවල තියෙන ඩෙස් උඹලට අරන් එන්න කියලා. අයිසෙ මේ, නිකං බාසාව දාන්නෙ නැතුව හොඳ හිතින් මේවා ගෙනත් දානවා අපේ පංතියට"

මගේ සද්දෙට පංතියෙ කෙල්ලො ටික බයවෙලා. එක කෙල්ලෙක් බිම බලාගෙන මගේ ළඟට ඇවිත් නතර උනා.

" අයියේ මිස් එහෙම කිව්වෙ නැහැ. ඒත් අපේ පංතියට ගොඩාක් ඩෙස් අඩුයි."

" නංගි මේ පංතියෙ ඇතිනෙ පරණ ළමයි. උන් එක්ක ගිහින් මේන් හෝල් එකෙන් ඔයාලට ඕන ඩෙස් පුටු අරන් එන්න. ඒ වගේම ඔයාලගෙ යාළුවන්ට කට පරිස්සම් කරගන්න කියන්න."





මං අරූගෙ ෂර්ට් එක අත ඇරලා දැම්මා. ඒ අස්සෙ විහඟ කෑ ගහනවා.

" යකෝ බලපංකො මුන් අම්මගෙ අප්පගෙ බූදලේ වගේ මගේ ඩෙස් එකත් ගෙනත් "

එතකොට අපිට හිනා ගියා. මොකද විහඟගේ ඩෙස් එක ඕන තැනක පැහැදිලිව අඳුන ගන්න පුළුවන්. උෟ ඩෙස් එකේ ලස්සන සිංදුවක කොටසක් පදයක් වෙනස් කරලා ටිපෙක්ස් වලින් ලියලා තිබුණා. ඒ මෙහෙමයි.

" ඔබද මාම විය.......
මාද ඔබම විය......
ඔබ අන්සතු විය.......
ඉන් මට කෙලවිය...."

SLU

මේ ගායකයෝ දන්නවනං මූට විරුද්ධව නඩු දානවා සිංදු හතරැස් කරනවට. විහඟ ඕක ලිව්වෙ උෟ ට්‍රයි කරපු කෙල්ලෙක් වෙන කොල්ලෙක් එක්ක මුකුළු කර කර ඉන්නවා දැකලා.

අපි කට්ටිය අපේ ඩෙස් පුටු ඒ පංතියෙ හිටපු කොල්ලන්ටම කියලා අපේ පංතියට අරගෙන ගියා. උන් ඩෙස් ටිකක් උස්සගෙන පෙරහැර වගේ එන ගමන් හිතෙන් අපේ ගුණ වර්ණනා කලාද දන්නෙත් නැහැ.

අපිට උදේ පීරියඩ් දෙකම තිබුනේ ගිණුම්කරණය. ඒ විෂය ඉගැන්නුවෙ ගලප්පත්ති කියලා මහ නිදිමත සර් කෙනෙක්. එයා



WWW.EXPRESSLANKA.TK 47

නිදිමතේ වගේ උගන්නපු දේවල් අපිට විතරක් නෙමෙයි එයාටවත් තේරෙන්නේ නැතුව ඇති. ඒත් අද සර් ඇවිත් ඉන්නවා දැක්කේ නැති නිසා මං ඒ ගැන විහඟගෙන් ඇහුවා.

" ඒයි ගලප්පත්ති ආවද බං"

ඒත් මුගෙන් ප්‍රතිචාරයක් නැහැ. ඒ වෙනුවට ඌ කලේ කට ඇරගෙන මගේ පිටිපස්සෙ කොරිඩෝ එක දිහා බලං හිටපු එක. ඒ එක්කම ෂෝටයි, නිරෝධයිත් ඩෙස් උඩින් බිමට බැස්සා. මමත් පිටිපස්ස හැරුනේ මුන්ගෙ සැබෑ වෙනස දැකගන්න. මළ කෙලියයි! ගලප්පත්ති සර් පිටිපස්සෙ. එයාට මං කියපු දේ ඇහෙන්න ඇති. සර් කෙලින්ම ආවේ මගේ ළඟට.

" තමුසෙ මොකක්ද ඇහුවේ."

සර්ගේ කන් ඇහීම ඉතා හොඳයි වගේ. ඒත් ඉතිං මමත් ෂේප් වෙන්න ඕනෙනේ.

" සර්.. මං.. මේ.. මෙයාගෙන් ඇහුවේ ....."

මං විහඟ දිහාට අත දික්කරලා ගොත ගහන්න ගත්තා. විහඟ මං දිහා රවාගෙන ඉන්නවා. ඌ හිතන්න ඇති මං ඌව මාට්ටු කරයි කියලා.

" කියනවා ඉතිං තමුසෙ මොනවද මෙයාගෙන් ඇහුවේ?"

" මං ඇහුවේ සර් ගණිත පංති ආවද කියල "





අපේ සෙට් එකට වගේම සර්ටත් ඒකට හිනා ගියා. ඒයා හොඳටම දන්නවා මං පටස් ගලා වචනේ වෙනස් කලා කියලා. ඒත් ශබ්දය එක වගේ නිසා සර්ට බනින්නත් විදියක් නැහැ.

" හරි හරි ඉඳගන්නවා. මට අද උදේ වරුව දොළහ වසර පන්තියක් බලන්න තියෙනවා. තමුසෙලට විභාගෙ ළඟයිනෙ. පොත් බලාගන්නවා"

SLU

"තැන්ක් යූ සර්"

ෂෝටා කෑ ගහලා කියද්දි යන්න ගිය සර් ආපහු පන්තිය පැත්තට හැරුනා. අපි දැක්කෙ නෑ වගේ අහක බලන් ඉද්දි සර් තනියම මොනවද කුටු කුටු ගගා හැරිලා යන්න ගියා.

" මචං යන්ද ආට් ක්ලාස් පැත්තේ ?"

නිරෝධ ඇවිත් අහද්දියි මට මතක් උනේ සචීව. එයා උදේ ඇවිත් මොන බාල්දියක් පෙරළ ගත්තද දන්නෙ නැහැ. කොයි එකටත් ආර්ට් ක්ලාස් පැත්තෙ යනවානං ෂෝටාවත් එක්කං යන එක හොඳයි. එතකොට නෙත්මිලගෙ පංතිය පැත්තෙත් යන්න පුළුවන්.

" ෂෝටා වරෙං ආර්ට් ක්ලාස් පැත්තෙ රවුමක් දාලා එමු."

" යමං යමං එතකොට අර මිහිරි හඬින් ගී ගයන නංගිලවත් බලාගන්න පුළුවන්නෙ"



WWW.EXPRESSLANKA.TK 48

මූත් ඇගේ සයිස් එකට නෙමෙයි කතාව. වෙලාවකට විහඟට හපන්. අපි කට්ටිය දොලහ වසර ආර්ට් ක්ලාස් වලට යද්දි ෂෝටාගෙ නැන්දගෙ දූවයි, අපේ රාණි මුකර්ජියි ලොකු වළඳක් හෝදනවා. අපි ළඟට යනකල්ම උන් දැක්කෙ නැහැ.

ෂෝටාගෙ නංගි ඌව දකපු ගමන් ඇවිත් කතා කලා. මමත් ඒකිව දවසක් දෙකක් විතර දකලා තියෙනවා වගේ මතකයි. ඒත් කතා බහ කරලා නෑ. මම නෙත්මිට පේන්නම එයා එක්ක කතා කලා.

" නංගි ඔයා මොකක්ද මට චෝදනාවක් කලා කියලා ආරංචියි"

" අනේ අයියේ මමනං නෙමෙයි මේ අපේ නෙ..........."

කියලා කෙල්ල යාළුවා දිහා බලද්දි එයා රවනවා මං දක්කා.රෝස මලක් වගේ ලස්සන උනාට මෙයාට රවන්නත් පුළුවන්නෙ. මොනවා උනත් ෂෝටගෙ නංගි යාළුවව පාවා දුන්නෙ නැහැ.

" අයියේ සංජුලාව අපේ පන්තියට මාරුකරලා දෙන්නකෝ. එයා දැන් ඉන්නෙ කොමර්ස් ක්ලාස් එකේ."

" සංජුලා කිව්වේ........"

කියලා මං කල්පනා කරන්න ගත්තා. සංජුලා ගැන මුළු සීන් එකම හොඳට මතක තිබුනට මං නංගිට පේන්න පොඩි පොතක් දැම්මෙ.





" අර එදා බර්ත් ඩේ එක කියලා අයියා සින්දුවක් කියන්න ස්ටේජ් එකට ගෙන්නුවේ "

" ආ....... හරි හරි. දැන් මතක් උනා."

මේක මං හිතලා කරපු වැඩක් කියලා දන්නවනං මූං මාව හම ගහයි. හැබැයි ෂෝටා ඒ කතාව නංගිට කියලා නැතුව ඇති. ඌ පොඩි උනාට හොඳ එකා. කොහොමහරි ඒ වැඩේ කරලා දෙන්න පොරොන්දු වෙලා මං ෂෝටා එක්ක එළියට ආවා. අරකි නිකංවත් මගේ දිහා බලලා හිනා උනේ නෑ. ආඩම්බර කෙල්ල.

ඊළඟට අපි අවීලගෙ පන්තිය පැත්තට යද්දි අනිත් දොලහ වසර පන්තියෙ සාරංගයි දිනුකයි හිටියා. මුන් දෙන්නා මොනවද මේක අස්සෙ කරන්නෙ.අපිත් ඒ පංතියට රිංගුවා. දිනුකනං ඩෙස් එකකට හේත්තු වෙලා බලං ඉන්නවා. සාරංගයා ඉනටත් අත්දෙක තියාගෙන කෙල්ලෙක් දිහා බලන් කෑ ගහනවා.

" ඔහොම බෑ, හයියෙන් කියනවා "

" තිහයි, තිස් එකයි, තිස් දෙකයි. "

කෙල්ලත් බිත්තිය ළඟ මොනවද කර කර ගණන් කරනවා. මූ උදේම කෙල්ලට රැග් එකක් දීලාද කොහෙද?

" මොනාද බං අරෑ අර කෙල්ලට කියලා ගණන් කරවන්නෙ"



WWW.EXPRESSLANKA.TK 49

කරන දේ පැහැදිලි නැති නිසා මං දිනුකගෙන් ඇහුවා. ඒ අතරෙත් අර කෙල්ල ගණන් කර කර අඩිය අඩිය ඉස්සරහට යනවා.

" මූ කෙල්ලට කියලා බිත්ති හතරෙ දිග මනින්න කියලා"

" දිග මනින්නෙ මොකෙන්ද ?"

" ඇයි උඹට පේන්නෙ නැද්ද ඒකිගේ අතේ තියෙන දේ. මූ ඒකිට පුංචි ඉරේසර් කෑල්ලක් දුන්නා ඒකෙන් ගණන් කර කර බිත්තිය මනින්න කියලා"

" පව් බං මිස්ට කරදර එහෙම ආවොත් උඹලට සොරි ඩොට් කොම් තමා."

මං කිව්වෙ අපේ වයිස් ප්‍රින්සිපල් ගැන. එයාගෙ නම කරදන. හැබැයි සර් ළමයි හැමෝටම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම කරදරයක්. හොස්ස ළඟින් මැස්සා යන්න බෑ. ඉතිං හැමෝම කරදන වෙනුවට කිව්වේ කරදර කියලා.

" පනස් නමයයි, හැටයි..."

කෙල්ල දිගටම ගනිනවා. මට ඒකි ගැන දුක හිතුනා. හරි අහිංසක පාට කෙල්ලෙක්. මං සාරංගට ඇහැක් ගහලා ඒ ළමයට කතා කලා.

" නංගි මේ ..."





ඒක ඇහුන ගමන් කෙල්ල ගණන් කරන එක නතර කරලා මං දිහාට හැරුණා. එයාගේ ඇස් දෙක කඳුළු වලින් පිරිලා තියෙනවා දකිද්දි මට සාරංග එක්ක තරහත් ආවා.

" ඔය ඇති නංගි, ඔයා ඉඳගන්න."

ඒකි මගේ මූණයි සාරංගගෙ මූණයි දිහා මාරුවෙන් මාරුවට බලනවා. එතකොටම එළියෙ හිටපු විහඟ විසිල් පාරක් ගැහුවා. අපිට පන්තියෙන් එළියට යන්න උනේ නෑ ආර්ට් සෙක්ෂන් එක භාර සර් පන්තියට ආවා.

" ඔය ළමයි ඇයි මෙහෙ?"

එහෙම අහපු සර් ඊළඟට හැරුනෙ අර කෙල්ල දිහාට. මේකිට ඉඳගන්න කියලා සිංහල බාසාවෙන් කියලත් තාම හිටගෙන. දන්නං අපි කට්ටිය ඉවරයි තමයි.

" ඇයි දුව ඔයා හිටගෙන? ඇයි මේ ඇස්වල කඳුළු"

සර්ගේ ප්‍රශ්න වලට කෙල්ලගෙන් උත්තර නෑ. ඊළඟට සර් අපේ පැත්තට හැරුනා.

" මට ඇත්ත කියන්න හේෂාන්. මෙතන මොකක්ද සිද්ධ වුනේ?"



WWW.EXPRESSLANKA.TK 50

හැම මගුලම අහන්නෙ මගෙන්. මෙතන සිද්ධ වුන දේ මමත් අහගත්තෙ දිනුකගෙන්. අන්තිමට වැඩේ ෂේප් කරන්න ගිය මාවයි අල්ලගත්තෙ. ඒත් මං උත්තරයක් දෙන්න කලින් අර කෙල්ල කතා කලා.

" සර් මගේ ඔළුව රිදෙනවා. මං මේ අයියලගෙන් පැනඩෝල් දෙකක් ගන්න තැනක් ඇහුවා."

කෙල්ලගේ උත්තරේට අපි කට්ටිය හොල්මන් උනා. එයා එහෙම නොකිව්වනං අද අපිට වෙන දේ අපිවත් දන්නේ නැහැ. මොනවා උනත් කෙල්ල ග්‍රේට්.

" මෙයාට ෆස්ට්ඒඩ් බොක්ස් එකෙන් පැනඩෝල් දෙකක් ගෙනැත් දෙන්න. ඔයාලා ගොඩක් හොඳයි ළමයි. ඔය වගේ සැරෙන් සැරේ ඇවිත් මේ පංති ගැනත් හොයලා බලන්න."

අපි කර කර හිටපු වැඩේ ගැන නොදන සර් අපේ නම් වලට ලකුණුත් දාලා පන්තියෙන් ගියා.

" තැන්ක්ස් නංගි. තැන්ක් යු වෙරි මච්"

මං අර නංගි දිහා බලලා එහෙම කියද්දි එයා හිනාවෙලා ගිහින් ඉඳගත්තා. දූන් තප්පර ගානකට කලින් අඬන්න ගිය කෙල්ල ඒ පාර හිනා වෙනවා. අනේ මන්දා මේ කෙල්ලො කියන ජාතිය තේරුම් ගන්න ලෝකෙ මවපු මහා බඹාටවත් බැරුව ඇති.





අපි නැටුම් ශාලාව පැත්තට යද්දි ඒකෙ එක පැත්තක කුමුදු ටීච නංගිලා කට්ටියකට උගන්නනවා දැක්ක නිසා අපි අනිත් පැත්තට ගියා. එතන අච්නි හෙවත් අපේ සචිනි හංසි අක්කගෙන් නැටුම් පුරුදු වෙනවා. අපි ටිකක් වෙලා සචිනි නටන දිහා බලන් හිටියා. ඒකි තාලෙට අඩි තිය තියා ගිනි සිළුවක් වගේ නටන හැටි දැක්කම ඇත්තටම ආස හිතුනා. අපි කට්ටියට ඒක දකිද්දි හිතුනා සචී සෙනසුරාදා තරඟෙන් කොහොම හරි දිනයි කියලා. සචීට සමහර අඩි කියලා දෙන්න හංසි ඉස්සරහට ඇවිත් නැටුවා. බලන් යද්දි එයාටත් මරු පහට නටන්න පුළුවන්නෙ. අපේ අක්කටත් ඉන්නේ මාර යාළුවෝ තමයි. ඒ දෙන්නා අපිව දැක්කෙ නැති නිසා අපි ෂේප් එකේ එතනින් මාරු වුනා.

අපි පංතියට ඇවිත් කතා කර කර හිටියට ගුරුවරු කවුරුත් උගන්නන්න එන පාටක් තිබුණෙ නැහැ. අපිත් ඒ ලැබුණු නිදහස උපරිමේට භුක්ති වින්දා. සාරංගලත් අපේ පංතියට ආවම කතා උනේ අපිට විභාගෙ සිකුරාදා නිසා හෙටයි අනිද්දයි ගෙදර ඉඳලා පාඩම් කරන්න. ඉස්කෝලෙ ආවත් අපි කලේ පිස්සු නටපු එක විතරයිනෙ.

" ඔන්න උඹලා මේ දවස් වල එන්නේ නැත්තං මං වැඩේ සිකුරාදට දා ගන්නං"

සාරංග එහෙම කිව්වට ඌ කියපු වැඩේ මොකක්ද කියලා අපි දැනගෙන හිටියෙ නැහැ.

" සිකුරාදා පිස්සු කරන්න බෑ බං. එදාට විභාගෙනෙ"



WWW.EXPRESSLANKA.TK 51

" මේක එහෙම වැඩක් නෙමෙයි. මං අළුත් එවුන් කට්ටියකට කිව්වා කේක් ගෙන්න කියලා. උන් ෂුවර් එකට ගෙනෙයි. මං කියන්නං සිකුරාදා ගේන්න කියලා."

සාරංගයා නං අළුත් එවුන්ව හොඳට බයිට් කරනවා. ඒත් අපේ සෙක්ෂන් එකේ කට්ටියට රැග් කරන්න කවුරුත් ගියෙ නැහැ. ඉස්කෝලෙ ඇරෙන්න කලින් මං සංජුලාව ආර්ට් ක්ලාස් එකට මාරු කරන වැඩේ නන්දනී මිස්ට කියලා කලා. නැත්තං අර කෙල්ලො දෙතුන් දෙනාම එකතු වෙලා අපේ අම්මට පීනසේ හදවනවා. ගෙදර යන්න කලින් අපි සචීව බලන්න නැටුම් ශාලාව පැත්තෙ යද්දි හංසි මාව දැකලා ලා හිනා පාරක් දාලා ගියා. අපි දවස් දෙකක් එන්නේ නෑ කිව්වම සචීගෙ මූණ ඇඹුල් උනා. අපි ගෙදර ඉඳන් පාඩම් කරාට කෙල්ල අක්කා වෙනුවට ප්‍රැක්ටිස් එන්න එපැයි.

" උඹ කිසි දේකට බය නැතුව ඇවිත් ප්‍රැක්ටිස් කරපං. අපි උඹටත් එක්ක පාඩං කරන්නං. පුළුවන් උනොත් අචීව බලන්න අපි එන්නං"

විහඟ සචී ගාවට ගිහින් කියද්දිත් කෙල්ලගෙ මූණ හරි නෑ වගේ.

" නෑ කමක් නෑ. ඔයාලා එහෙනං හොඳට පාඩම් කරන්නකො"

කෙල්ල ඒක නං කිව්වෙ දුකෙන් වගේ. අපිට කියන්න බැරි අවුලක් තියෙනවද දන්නෙත් නැහැ. ඒත් ඔය ගෑණු ළමයි





ලේසියෙන් හිතේ තියෙන දේවල් කියන ජාතියෙ අය නෙවෙයි. ඉස්කොලේ ඇරිලා මං විහඟ එකක් පාරට එද්දි නිරෝධ මගේ ළඟට දුවගෙන ආවා. විහඟ ඒක වැඩිය ගණන් ගන්නේ නැතුව උගේ බයික් එක අරන් එන්න කොම්යුනිකේෂන් එක පැත්තට ගියා.

" රන්දූ මං අනිද්දා රෑට උඹ එක්ක පාඩං කරන්න එහෙ එන්නද?"

නිරෝධගෙ මූණ හැටියට ඌ එන්නෙ පාඩං කරන්න විතරක් වෙන්න බෑ.

" කිසි අවුලක් නෑ වරෙං. මටත් තනියම පාඩං කරද්දි නිදිමතයි."

" හැබැයි විහඟට කියන්න එපා බං. මට උඹත් එක්ක ටිකක් කතා කරන්නත් ඕන."

කොහොමටත් කොල්ලා කියාගන්න බැරි දෙයක් හිතේ තියන් විඳවනවා කියලා මට හිතුනෙ අද ඊයෙ නෙවෙයි. මේ රන්දූත් ඉතිං යාළුවන්ට ඕන සපෝට් එකක් දෙන්න එවරෙඩි.

" ඕකේ මචං. එනවානම් පරක්කු වෙන්නෙ නැතිව වරෙං"

එහෙම කියලා මං විහඟ එක්ක ගෙදර ආවා.

ගෙදර හිටපු දවස් දෙකට මං පහුගිය මාස දෙක තුනටම වඩා වැඩියෙන් පාඩං කලා. අපේ අම්මලා මේ දවස්වල ටීවි එක



WWW.EXPRESSLANKA.TK 52

උනත් දම්මේ ප්‍රවෘත්ති බලන්න විතරයි. අපේ අක්කත් සැරෙන් සැරේට බෙල්ල දාලා බැලුවේ මං ඇත්තටම පාඩං කරනවද නැත්තං නිදිද කියලා බලන්න වගේ. බදාදා හවස් වෙද්දි මං නාලා කාමරේ එහෙම පිළිවෙලකට අස් කරලා තිබ්බේ නිරෝධත් පාඩං කරන්න එනවා කියපු නිසා. ඌ අපේ ගෙදරට ආවේ හවස පහට විතර.

" මං හිතුවා උඹ කලින් එයි කියලා."

මං එහෙම කිව්වෙ ඇත්තටම නිරෝධ එනකල් මං ගොඩාක් වෙලා මිදුලෙ බලන් හිටපු නිසා.

" මං අද ඉස්කෝලෙ ගියා. ඒකයි පරක්කු වුනේ."

" අපි කට්ටියම කතාවෙලානේ ගෙදර ඉන්න තීරණය කලේ. එහෙම එකේ උඹ මොන මගුලකටද ඉස්කෝලෙ ගියේ."

මට මූ එක්ක මාර තරහක් ආවේ. වචනයක් කිව්වොත් ඒක ඒ විදියට තියෙන්න ඕනෙ. අපිට එකක් කියලා මූ හොරෙන් ඉස්කොලේ ගිහින්. හැබැයි මගේ ප්‍රශ්නෙට උත්තරයක් නෑ. මේකා බිම බලාගෙන ඉන්නෙ වැරැද්දක් කලා වගේ. වගේ කිව්වට වගේ නෙමෙයි. මූ කලේ වැරැද්දක් තමයි. ඒත් ඉතිං මිනිහෙක් ගෙට ගොඩ උන ගමන් ඇඟට කඩන් පනින එක හරි නෑනේ. මං ඌත් එක්ක කාමරේට ආවා.

" උඹට කියන්න තියෙන ඒවා අපි පස්සෙ කතා කරමු. ආ ටවල් එක. දැන් ගිහිං වොෂ් එකක් දාන් වරෙං."





එහෙම කියලා මං ඌගෙ ඇඟට තුවාය දම්මා.

" උඹට ඇඳුමක් ඕනෙද ?"

SLU

" එපා බං මං ගෙනාවා. "

නිරෝධ බාත්රූම් එකට ගියාට පස්සෙ මං අම්මට ගිහින් තේ ලැස්ති කරන්න කිව්වා. අද පාඩං කරන එක කෙසේ වෙතත් රෑට ඇහැරිලා ඉන්න නං වෙනවා. නිරෝධ ඇඟ හෝදගෙන ආවට පස්සෙ අපි තේ බීලා කාමරේට රිංගුවා.

" උඹේ වැඩ මාර නීට්නේ රන්දු. උඹ පිස්සු නටන විදියට මං හිතුවෙ නැහැ මේ තරම් පිළිවෙලට වැඩ කරනවා කියලා."

නිරෝධ මගේ කාමරේ හැම අස්සක් මුල්ලක් දිහාම හොඳට බලලා කිව්වෙ පුදුමෙන් වගේ. මගේ කාමරේ මේ තරම් පිළිවෙලට තියාගන්න අපේ අක්කත් මට හෙල්ප් එක දෙනවා කියලා මූ දන්නෙ නැහැ. ඒත් මට ඕන වෙලා තිබුණෙ ඒක ගැන කියන්න නෙමෙයි. මේකා අද තකහනියක් ඉස්කොලෙ ගිය හේතුව දැනගන්න.

" මට ඉස්සෙල්ලා කියපං උඹ ඇයි අද අපි කවුරුවත්ම නැතුව ඉස්කොලේ ගියේ කියලා."

" කෝ බං උඹලගේ අක්කත් ගෙදර ඉන්නවද ?"

මං අහපු දේට මූ කිව්වෙ යන්නෙ කොහෙද පොල්ලේ මල් වගේ කතාවක්. අනික මූ ආවෙ අපේ අක්කව බලන්න වෙන්න



WWW.EXPRESSLANKA.TK 53

බෑ. අපේ අක්කා කරපු උපාධියට අමතරව බී. ඒ එක කරන්නෙ නෑ කියලා මට ෂුවර්.

" ඇයි උඹ හිතුවෙ අක්කා පැනලා ගියා කියලද? එයා ඇති කාමරේ. මේ.... උඹ කියන්න හදන්නෙ අපේ අක්කා ගැන දෙයක් නෙමෙයි නේද?"

" උඹට පිස්සුද? මං එහෙම ඇහුවෙ අපි කතා කරන දේවල් එයාට ඇහෙයිද කියලා දැනගන්න."

" ඒ ගැන බය වෙන්න එපා. එයාගෙ කාමරේ තියෙන්නෙ උඩ තට්ටුවේ."

" අපි දැන් පාඩං කරමු බං. කට්ටිය නිදා ගත්තම මං උඹට කියන්නං"

මේ කතාව එසේ මෙසේ හුටස්පරයක් වෙන්න බෑ. සමහර විට මූගේ පපුවට අනංගයගෙ හීය වැදිලද දන්නෙත් නැනෙ. මං කොයි තරම් ඇහුවත් මේ යකා මට විස්තරේ කියන්න ගත්තෙ ඊ කෑම කාලත් පැයකට විතර පස්සෙ.

" මොනාද බං උඹ ගිය සඳුදා ඉඳලා ඕක කියන්නං කියලා මගේ ඔළුවත් කචල් කරලා තියෙන්නෙ. දැංවත් කියහංකො ඔය අටමගලෙ"

" මේක උඹට කචල් වෙන්න තරම් දෙයක් නෙමෙයි. මගේ පෞද්ගලික දෙයක්"





බලහල්ලකො මූගෙ කතාව. මෙච්චර කාලෙකට අපි කට්ටිය අතර කිසිම පෞද්ගලික කතාවක් තිබිලා නෑ. අර බස්වල ගහලා තියෙන විදියට අප පෞද්ගලික වුවත් සේවය පොදුයි වගේ තමයි අපේ වැඩ. මේකා කියන මගුලක් කියන්නෙත් නෑ තටමනවා. තව ටිකකින් ගෙදර මිනිස්සුන්ට විතරක් නෙමෙයි මටත් නින්ද යනවා.

SLU

" දැන් උඹ ඕක මට අද කියනවද?"

" මචං මේකයි.. මං...... මං ..... කෙල්ලෙක්ට ආදරේ කරනවා."

දවස් ගානක් හිර කරගෙන හිටපු එක මූ කියලා දම්මා. සුනිල් මස්සිනා මල් හතයි ආ... කියලා කටට ආවත් මං නිකං හිටියෙ කෙල්ල කවුද කියලා දැනගන්නකල්. තාම අපේ සෙට් එකේ දීග ගිය එවුන්ට ඉන්නෙ දිනුකයි, අචිනියි විතරයි. විහඟයා එහෙම විසිපස්වෙනි වතාවටත් ප්‍රථම ප්‍රේමය වගේ තාම දකින දකින කෙල්ලට ට්‍රයි.

" කියපං ඉතිං ඉතුරු ටිකත්. කවුද ඔය වාසනාවන්ති අලුත් නැවේ කෑල්ලක්ද?"

" නෑ බං වෙන කෙනෙක්. උඹ හොඳටම දන්න කෙනෙක්. උඹත් එක්ක ගොඩක්ම කිට්ටු කෙනෙක්."

මල කෙලියයි කිව්වලු. මූ කියන විදියට ඔය කෙනා අපේ අම්මා හරි අක්කා හරි වෙන්න ඕනේ. මොකද මං හොඳටම දන්න මට ගොඩක්ම කිට්ටු ස්ත්‍රී පරාණ දෙකකට ඉන්නෙ ඒ දෙන්නනෙ.



WWW.EXPRESSLANKA.TK 54

" එයා තමයි බං ......, උඹ මේක අපේ සෙට් එකේ කාටවත් කියන්නෙ නෑ නේද?"

දන්නම් ඉතිං මේ රන්දූගෙ යකා ටොප් ගියර් එකටම නගිනවා. කියන රෙද්දක් කියන්නෙත් නෑ.

" උඹ එපා කියනවානම් මම නොකියා ඉන්නම්. හැබැයි මට මුළු සීන් එකම කියපං."

SLU

" එයා සචිනි"

නිරෝධ එක පාරම ඒක කියපුවම මගේ ඔළුවට කරන්ට් එකක් වැදුනා වගේ උනා. ඒත් ඒකට හේතුව මටම තේරුණේ නැහැ. හැබැයි නිරෝධ කිව්ව වගේ අපේ සෙට් එකේ කෙල්ලො හතර දෙනාගෙන් මං වැඩිපුරම ආශ්‍රය කලේ සචිනිව. ඒ වගේම සචිනිත් අනිත් අයට වඩා මං එක්ක එකතුයි කියලා මං දන්නවා. නිරෝධ ඒ කතාව කියපුවම මගේ හිතට දුකක් ඊරිසියාවක් වගේ කියන්න නොතේරෙන මොකක්දෝ දෙයක් දැනුනා. සචී කියන්නෙ ගොඩාක් ලස්සන වගේම ගොඩක් හුරතල් කෙල්ලෙක්.

" මොකෝ බං උඹට උනේ ? "

" නෑ බං මට පුදුම හිතුනා. දැන් ඔය කතාව සචී දන්නවද? එයා උඹට කැමතිද?"





" ඒක තමයි බං ප්‍රශ්නෙ. මං තාම මේක එයාට කියලා නෑ. මං අද ඉස්කෝලෙට ගියේ කවුරු නැතත් එයා ප්‍රැක්ටිස් වලට එනවා කියලා දන්න නිසා."

" ඉතිං සචීව හම්බවුනාද? උඹට අදවත් ඕක කියන්න තිබුණනෙ"

" පොඩි කාලෙ ඉදලා බං බොලං කියලා ආශ්‍රය කරලා එක පාරටම ඒ මූණ බලාගෙන ඔය වගේ කතාවක් කියන්නෙ කොහොමද?"

ඒ කතාවෙත් ඇත්තක් තියෙනවා. මට දැනගන්න ඕන කරන ප්‍රධානම දේ සචී නිරෝධට කැමතිද කියන එක.

" උඹේ හිතට ඔය වගේ දෙයක් දැනුනෙ කවදා ඉදලද? උඹ ඕක සචීට අඟවලාවත් නැද්ද?"

" හිතිලා නං දැන් මාස ගාණක් වෙනවා බං. ඒත් මං මොන විදියට දැනෙන්න ඇරියත් ඒකි තේරුනේ නැති ගානට ඉන්නවනෙ."

" දැං උඹ කියපං උඹ ඕක කියන්න ඇයි මාවම තෝර ගත්තෙ කියලා. මගෙන් මොනවද කෙරෙන්න ඕනේ ?"

මං වරකට දෙක බැගින් කැමට පෙර සහ පසු වශයෙන් මුගෙන් ප්‍රශ්න අහගෙන ගියා. හැබැයි වෙන වෙලාවක වගේ විහිළු කරන්න පුළුවන් විදියෙ මූඩ් එකක් මගේ ළඟ තිබුනෙ නැහැ.



WWW.EXPRESSLANKA.TK 55

" සචී උඹත් එක්ක ගොඩක් හිටි නිසා උඹට බැරිද මට සචීගෙ කැමැත්ත අරං දෙන්න."

නිරෝධ කියන විදියට කැමැත්ත අරං දෙන්න තිබුණා කෙල්ල කැමැත්ත අල්මාරියෙ දාලා අරන් තියලා තිබුනා නං. ඒත් මේක ඊට වඩා සිරා ගේමක්නෙ. අනික මූ මාස ගාණක් තිස්සේ අපේ සචීට අපිටත් හොරෙන් ලයින් පාර දාලා කියලා ඇහුවම පුදුමත් හිතුනා.

" උඹ මෙච්චර දවස් අඟවලත් ඒකි නෝ ආන්ස්වර් නං මං කෙලින්ම අහන්නං. හැබැයි ඕවා සේරම ලබන සතියට කල් දාන්න වෙනවා. ඒකිට ඔළුව අප්සට් කර ගන්නෙ නැතුව විභාගෙටයි නැටුම් තරගෙටයි යන්න අපි ඉඩදෙන්න ඕනෙ."

" උඹ කියන්නෙ ඕක අහපුවම සචිනි අප්සට් යයි කියලද?"

ඕක අහලා මං මේ තරම් අප්සට් ගියානං සචී කොයිතරම් අප්සට් වෙයිද කියලා මට හිතා ගන්න බැරි උනා.

" නෑ නෑ කෙල්ලට මේ ටිකේ තියන ප්‍රෙෂර් එක වැඩියිනේ. ඉතිං අපි ලබන සතියෙ කියමු. උඹට සචීව දවස් දෙකක් බලන්නෙ නැතුව ඉන්න බැහැ නේද?"

නිරෝධ අද ඉස්කොලෙ ගියා කියපු කතාව මතක් වෙලා මං ඇහුවා.





" දවස් දෙකක් නෙමෙයි බං එක දවසක් නොදැක ඉන්න බැහැ. ඊයේ හවසත් දිනුක අච්නිව බලන්න යනවා කිව්වම මං ඌ එක්ක ගියා. අපිට හැම සෙනසුරාදා ඉරිදටත් සචීව ක්ලාස් එකේදී හම්බවෙනවනෙ"

ඕනම හයිරං කාරයෙක් ආදරේ ඉස්සරහ බොළඳ වෙනවා කියන එක නිරෝධගෙ කතාවෙන් තව දුරටත් ඔප්පු උනා. අපි දෙන්නා රෑ එකත් පහුවෙනකල්ම කලේ සචී ගැන කතා කරපු එක. මේ වෙද්දි කෙල්ල නිදි නැතිව දිගට හරහට හචිං යවනවා ඇති.

කතා කරලා ඉවරවෙලා, පාඩං කරන්න හැදුවට දෙන්නටම පාඩං කරන්න තරම් හිතක් තිබුනේ නෑ. අපි හෙට ඉස්කොලේ යන්න ඕන නිසා නිදාගන්න ඇඳට ආවා. ටිකක් වෙලා යද්දි නිරෝධට නින්ද ගියාට මගේ නින්දනං අහලකවත් තිබුණේ නැහැ. නිරෝධගෙ කතාවෙන් පස්සෙ මගේ මුළු හිතේම හොල්මන් කලේ සචිනි.

මේ අවුරුදු දහඅටටම මං කෙල්ලෙක් එක්ක යාළුවෙලා හිටියෙ නැහැ. මං ආශ්‍රය කරපු කෙල්ලො හතර දෙනාගෙන් වැඩි පුරම ළං වෙලා හිටියෙ සචිනිට. ඒලෙවල් වලදී මහේෂායි සචිනියි විතරක් අපේ පංතියට ආපු එකෙන් ඒ බැඳීම තවත් වැඩි වුනා.ඉස්කෝලෙදි පංති යද්දි උනත් මං පුළුවං හැම වෙලාවෙම එයාලව පරිස්සං කලා. හැබැයි යාළුකම, සහෝදරකම ඇරුනම වෙන දෙයක් මට දැනුනද කියලා මංවත් දන්නෙ නැහැ. දිනුක අච්නි එක්ක යාළු උනාම මට මේ විදියෙ දෙයක් දැනුනෙ නැතිව සචිනි ගැන විතරක් ඊරිසියාවක් දැනෙන්නෙ ඇයි? 'මගේ හිත



WWW.EXPRESSLANKA.TK 56

මටත් හොරෙන් සචිනිට ආදරේ කරාද?' කියන ප්‍රශ්නෙත් මගේ හිතට ආවා. ඒ එක්කම මට මතක් උනේ නෙත්මිව. හැබැයි අද ඊයේ අඳුනගත්තු නෙත්මි මොන වගේ කෙල්ලෙක්ද කියලා මං තාම දන්නෙ නෑ. සමහර විට නෙත්මිට ගමේ කොල්ලෙක් ඉන්නත් පුළුවං. අනික එයාගේ රූපෙ ගැන ආසාවක් හිතුනට මට එයා ගැන ආදරයක් දැනිලා නැහැ.ඒ වගේද සචිනි, මං පුංචි කාලෙ ඉඳලා දන්න හොඳ ගතිගුණ තිනෙ ලස්සන කෙල්ලෙක්. ඉතිං ඒ වගේ කෙනෙක් මගේ හොඳම යාළුවෙක්ට ලැබෙන එක ගැන සතුටු වෙන්න ඕන උනත් මටනං පුංචි සතුටක්වත් ඇති වුනේ නැහැ. හැබැයි දැං මේ රන්දූ පරක්කු වැඩියි. නිරෝධ මට කලින් රේස් එක පටන් අරන්. දාහක් දේවල් කල්පනා කර කර ඉඳලා මට නින්ද ගියේ පාන්දර.

" රන්දූ ඒයි නැගිටපං"

මං ඇස් ඇරලා බලද්දි නිරෝධ නැගිටලා ලැස්ති වෙලත් ඉවරයි.

SLU

" කීයද බං වෙලාව?"

" තාම හයයි. මං ගෙදර ගිහින් ලැස්තිවෙලා ඉස්කෝලෙ යන්න ඕනනේ. උඹ තව ටිකක් වෙලා ඉඳලා ලැස්ති වෙයං. මං ඇහැරෙව්වේ යනවා කියන්න."

මූ ඊයේ හවස ආවේ අයියගෙ වැලියෙ නිසා ඉක්මනට ගෙදර යන්න පුළුවං. අනික සචී බලන්න ඕන නිසා අද යන්නම එපැයි. මට නං ඇස් දෙක ඇරගන්න බැරි තරම් නිදිමතක්





තිබුණේ. මං නැගිටින්න කලිං අපේ අම්මා මූට තේ හදලත් දීලා. ඌ ගියාට පස්සේ මං ආපහු ඇඳට පැන්නා. දන්නෙම නැතුව මට ආපහු නින්ද ගිහින්.

" පොඩි පුතා ඔයා අදත් යන්නෙ නැද්ද?"

අම්මා කාමරේට ඇවිත් කතා කරද්දි මං උඩ ගිහින් ඇහැරුනේ. ඔරලෝසුව බලද්දි හතයි වෙලාව. දැන් ලැස්ති වෙලා යන්න කොහොමත් වෙලා මදි.

" මගේ ඇඟට ෆිට් නෑ වගේ අම්මා. මං ගෙදර ඉන්නවා."

මං එහෙම කිව්වට මගේ ෆිට් එක නොතබුනේ ඇගේ නෙමෙයි හිතේ. ඉස්කෝලෙට ගිහින් සචීගෙ මූණ බලන්න බැරි ගතියක් මට දැනුනා. ඒ අතරෙ අම්මා මගේ නළලට අත තියලා බලනවා උණද කියලා. මං එයා දිහාට හැරිලා ඇස් ඇරලා බැලුවා.

" ආ.... ඔයාලා ගොඩක් රෑ වෙනකල් පාඩං කලාද? ඔයාගෙ ඇසුත් රතු වෙලා."

"මට නිදියන්න ඕන අම්මා. ඔයා යන්න එපා"

එහෙම කියලා මං අම්මගෙ ඉන වටේට අත්දෙක දාලා එයාගෙ ඔඩොක්කුවට ඔළුව තියාගත්තා. රෑ එළිවෙනකල් හිතේ තිබුණ දුක කඳුලක් වෙලා පිටවෙලා අම්මගෙ ඇඳුමට උරාගත්තා. ඒත් අම්මා ඒක දැක්කෙ නැති එක හිතට ලොකු සහනයක්. නැත්තං ලෙඩක් හැදුනත් අඬන්නේ නැති පොඩි පුතාගෙ ඇස් වලට



WWW.EXPRESSLANKA.TK 57

කඳුළු එන්න හේතුව ඇහුවොත් මට දෙන්න උත්තර නැති වෙනවා. ඇත්තටම මං ළඟ ඒකට උත්තරයක් නෑ. දිග හුස්මක් පිට කරපු අම්මා ටික වෙලාවකට පස්සෙ මං ළඟින් නැගිටලා ගියා. විනාඩි පහක් යන්න උනේ නැහැ අපේ අක්කත් ඉස්කෝලෙ යන්න ලෑස්ති වුන සාරිය පිටින්ම කාමරේට දුවගෙන ආවා. අම්මා නිව්ස් එක පත්තරේ දාලා වගේ.

" ඇයි මල්ලි ඔයා අසනීපෙන්ද?"

එයා ඇවිත් මගේ අත් දෙකෙන්ම අල්ලගනිද්දි මට අක්කා ගැන ලොකු ආදරයක් දැනුනා.

" මං අද නිවාඩු දාන්නං මල්ලි. අපි දවල් වෙලා බෙහෙත් ගන්න යං"

මගේ පුංචි වෙනසකට අපේ ගෙදර හැමෝම කලබල වෙලා. තව ටිකකින් තාත්තත් එයි මොකද බලන්න. ඒ නිසා මට ලෙඩක් නෑ කියලා පෙන්නන්න මං ඇඳෙන් නැගිට්ටා.

" මට අමාරුවක් නෑ අක්කෙ. ඊයේ රෑ වෙනකල් පාඩම් කරපු නිසා නිදිමතයි"

" ඔය ඇත්තමද කියන්නෙ මල්ලි ?"

" ඔව් හලෝ ඔයා වැඩට යන්න. තව ටිකක් නිදා ගත්තම මේක හරියයි"





ඒත් අක්කා මං ළඟින් නැගිටලා ගියේ අකමැත්තෙන් වගේ. එයා ගියාට පස්සෙ මං මූණහෝදන්න ගියා. නැත්නම් අපේ අම්මා තව පැනඩෝල් පෙත්තක් හරි පොවනවා. තාත්තයි අක්කයි වැඩට ගියාට පස්සෙ මං කෑම කාලා පොතකුත් අරන් මිදුලෙ බංකුව ළඟට ගියා පාඩං කරන්න. අටහමාර විතර වෙද්දි අම්මා කතා කලා කෝල් එකක් කියලා. මං ෆෝන් එකට ගියේ මේ උදේ පාන්දර කතා කරන්නේ කවුද කියලා හිතාගන්න බැරිව.

SLU

" හෙලෝ "

" හෙලෝ රන්දූ ගුඩ් මෝනිං! මං සචිනි"

මං මඟහරින්න හිතං හිටපු කෙනා උදේම කතා කරද්දි මට ලොකු අමුත්තක් දැනුනා.

" ගුඩ් මෝර්නින් සචී! ඔයා ඉස්කොලේ ගියේ නැද්ද? කොහෙ ඉඳලද ඔය කතා කරන්නේ"

" මං ඉස්කොලේ ආවා රන්දූ. ඔයා ඇයි ආවේ නැත්තෙ ? මං ඔයාට කතාකරන්න ඕන නිසා බොරුවක් කියලා එළියෙ කමියුනිකේෂන් එකට ආවා"

ඉස්කොලේට බොරු කරලා එළියට ඇවිත් මේ රන්දූට කතා කරන්න තරම් සචීට තියෙන අවශ්‍යතාවය මොකක්ද කියලා මට හිතා ගන්න බැරි උනා.

"ඇයි සචී මොකක්ද කේස් එක"



WWW.EXPRESSLANKA.TK 58

" රන්දු හෙට විභාගෙට මං එන නිසා නැටුම් ප්‍රැක්ටිස් වලට එන්න බැරි වෙනවනෙ. ඒත් කුමුදු ටීච හංසි අක්කට කිව්වා අනිද්දා නුවර යන්න ඕන නිසා හෙට දවසම ප්‍රැක්ටිස් කරන්න කියලා.මං ඔයා එනකල් හිටියෙ හංසි අක්කා එක්ක කතා කරලා මොනවා හරි කරන්න කියන්න."

" හරි හරි සචී මං හංසිට කෝල් කරන්නං. ඔයා එළියෙ ඉන්න එපා. ඉක්මනට ඉස්කෝලෙට යන්න."

එහෙම කියලා ෆෝන් එක තියපු මම එතන ලාච්චුවෙ තිබුණ ටෙලිෆෝන් නොම්මර ලියන පොත අරන් බැලුවෙ හංසිගෙ අංකෙ තියෙනවාද කියලා. නැත්නං ඒක හොයාගන්න වෙන්නෙ හවස අක්කගෙ ෆෝන් එකෙන් තමයි. මගේ හරි සචිනිගෙ හරි වෙලාව හොඳ කමට අක්කා ඒක ලියලා තිබුනා. මං ඒ නම්බර් එකට කතා කලේ එයා දැං අපේ ඉස්කොලේ ඉන්නවා කියලා දැන ගෙන.

" හෙලෝ නිශා ඔයා අද ගෙදරද"

මලා! මෙයා හිතලා තියෙන්නෙ අපේ අක්කා කියලා. ඒ කියන්නෙ අපේ ගෙදර නොම්මරේ ෆෝන් එකේ සේව් කරලා තියෙනවා කියන එකනෙ.

" හලෝ හංසි අක්කෙ මං.. "

අම්මට ඇහෙයි කියලා මං කතා කලේ ගොඩක් හෙමින්. හංසිට මාව නම කියලා හඳුන්වලා දුන්නෙ නැත්තෙ එයා මාව දන්න නිසා.





" ආ මල්ලි, ඇයි ඔයා අද ඉස්කොලේ ආවෙ නැද්ද"

" නෑ අක්කෙ හෙට විභාගෙනෙ අපිට. මං පාඩං කරනවා. මට ඔයාගෙන් පොඩි උදව්වක් ඕනෙ."

SLU

" ඒ මොකක්ද මල්ලි ?"

" හෙට විභාගෙට සචිනිත් ලියනවා. ඒත් කුමුදු මිස් හෙට සමහර විට ප්‍රැක්ටිස් එන්න කියයි. ඔයාට බැරිද බොරුවක් කියලා මිස්ට පොඩි ෂේප් එකක් දාගන්න."

මට සචිනි දූන් කතා කලා කියලා අඟවන්නෙ නැතුව මං හෙමීට ඇහුවා.

" ඔව්, මිස් උදේම කිව්වා තමයි හෙට ප්‍රැක්ටිස් කරන්න කියලා. අනික අනිද්දා නුවර යන එකේ හෙටත් පුරුදු වෙන එක ගොඩක් වටිනවා."

" ඒත් සචිනි විභාගෙට ආවේ නැත්තේ ඇයි කියලා බැලුවොත් අපේ වැඩ සේරම වතුරෙ යයි "

" හරි මං එහෙනං මිස්ට කියන්නම් හෙට මම මෙයාව අපේ කලායතනයට ගෙනැල්ලා ප්‍රැක්ටිස් කරන්නම් කියලා. සචිනිට ඇවිත් විභාගෙ ලියන්න කියන්න."" තැන්ක්ස් අක්කා. ඔයා මේ කරන උදව් වලට ඕන උදව්වක් ඉල්ලන්න මං කරන්නං"



WWW.EXPRESSLANKA.TK 59

එහෙම කියලා මං ෆෝන් එක තිබ්බා. අපේ අක්කගෙ යාළුවා දැං මගෙත් හොඳ යාළුවෙක් වෙලා. සචිනි ඉල්ලපු උදව්වත් කරලා මං ආපහු ගියේ පාඩං කරන්න. හෙට විභාගෙ හොඳට ලියන්න ඕනේ කියන එක මගේ හිතට තදින්ම දැනුනා.

* * * * * * *





Scanned for
SL-Unlimited.com
by Sheree

05

මං විභාගේ දවසෙ උදෙන්ම පංතියට යද්දි අපේ පංතිවල ඩෙස් ඇත් කරලා විභාගෙට ඕන විදියට හදලා තිබුණා. මං පුරුදු විදියටම හිනා වෙලා හිටියෙ නිරෝධ ගැනවත් සචී ගැනවත් කාටවත්ම නොකියන්න හිතාගෙන. මාව දැක්ක ගමන්ම සචී මගේ ළඟට දුවගෙන ආවා.

" ඔයා ඊයේ කරපු උදව්වට තැන්ක්ස් රන්දූ"

ඔය කියන්නෙ ඇත්තේ මං හංසිට කතා කරලා ෂේප් කරපු එක වෙන්න ඇති.

" දැන් ඒ වැඩෙත් හරිනෙ. උඹ විභාගෙට ලෑස්තිද?"

" ඔව් පාඩං නං කලා. මට බය තියෙන්නෙ විභාගෙ ගැන නෙමෙයි. තරගෙ ගැන. "

අපි කතා කර කර ඉන්න තැනට නිරෝධත් ආවා. මං කිසි වෙනසක් පෙන්නුවෙ නැහැ.



WWW.EXPRESSLANKA.TK 60

" සචී මං පාඩං කරලා ආවේ. ඔයාට විභාගෙදි මොනවා හරි අහන්න ඕනෙ නං මගෙන් අහන්න"

වෙනදට සචීගෙන් කොපි කරන එකා අද සචීට කියලා දෙන්න හදනවා. මූත් මාර පොරක් තමයි. සෑහෙන්න දියුණු වෙලා. අපි කට්ටිය විභාගෙට ඉදගත්තෙ එක ළග. ඒත් මිස් පේපර් බෙදලා අපි ළඟම වගේ පුටුවක් තියාගෙන ඉදගත්තා. ඉතිං අපි කවුරුවත් කොපි කරන්න ගියේ නැතුව තමන්ට පුළු පුළුවන් විදියට විභාගෙ ලිව්වා. මං නං ලියපු පේපර් ගැන ගොඩක් සැටිස්. කොහොමටත් මේ ටිකේ ගෙදරට වෙලා ෂෝට් නෝට් ගහලා පාඩං කරපු නිසා ගොඩක් කරුණු මතක තිබුණා. පළවෙනි විෂය ඉවර වෙලා නැගිටිද්දි කුමුදු මිස් සචිනිව හොයාගෙන අපේ පංතියට ආවා.

" සචිනි ඔයාට දැන් හොඳයිද දරුවෝ? පහුගිය ටිකේ අසනීපෙන් හිටියා කියලා අක්කා කිව්වා."

සචිනි අසනීපෙන් ගෙදර ඉන්නවා කියලා කියන්න ඇත්තෙත් සචිනිම තමා. අපිත් ඒ කතාව ඇහුනෙ නෑ වගේ හිටියා.

" ඔව් මිස් දැන් ටිකක් හොඳයි"

"මං මේ ආවේ අද අචිනි නැටුම ප්‍රැක්ටිස් කරන්න කලායතනෙට ගියාද කියලා දැනගන්න."

" ඔව්, අක්කි උදේ මගෙත් එක්කම ඇවිල්ලයි බස් එකට නැග්ගෙ"





" හරි හරි එතකොට හෙට නුවර යනනේ කවුරු කවුරුද? ම්........ එක්කෝ ඔයා විභාගෙ ඉවරවෙලා යන්න කලින් මාව හම්බවෙන්න."

එහෙම කියලා මිස් යන්න ගියා. මේ වැඩේ කරන්න මුලදි අකමැති උන සචී දැන් අපිටත් වඩා හොදට සීන් එක රඟපානවා. මිසුත් හොඳට ලණුව කාලා ඉන්නේ. හෙට හවස්වෙද්දි මේ රඟපෑම් සේරම ඉවරයි.

විභාගෙ ඉවරවෙලා අපි කට්ටියම කැන්ටින් එකට සෙට් වෙලා හෙට නුවර ගමන ගැන කතා කලා.

" සචී දැං හෙට මොකද කරන්නේ? "

" මෙහෙමයි රන්දූ, ප්‍රින්සිපල් සර් කුමුදු මිස්ට කිව්වලු එයාටයි හංසි අක්කටයි මගෙත් එක්ක නුවර යන්න කියලා. අපේ අම්මත් මගෙත් එක්ක එනවා කිව්වා. ඔයාලත් එනවද?"

සචීලා එක්ක නුවර යන්න හිතාගෙන හිටියට මට දැන් ඒ ගමන යන්න බෑ වගේ. අනික හංසිත් යන එකේ මේ කතා අපේ අක්කටත් යයි. හංසිව මට ඉස්කෝලෙදි හම්බ වෙනවා කියලා අක්කා දැන ගත්තත් අවුලක් නෑ. ඒත් සචීව දාලා කරන මේ ඩබල් ඇක්ටින් ගේම එයා දැනගන්නවට මං කැමැති නෑ.

" ජනා උඹයි මහේෂයි මොකද කරන්නේ?"



WWW.EXPRESSLANKA.TK 61

" සවී නටනවා බලන්නත් කට්ටිය ඕනනෙ. අපි දෙන්න නං යනවා. ඔයාලත් එන්න."

ජනාලිලා නං වෙලාසන ඒවා ප්ලෑන් කරලා වගෙයි. නිරෝධත් එක පයින් නෙමෙයි දෙපයින්ම කැමතියි කියලා මං දන්නවා. ඒත් මූ බලාගෙන ඉන්නේ මුලින් අපි කාගෙන් හරි වචනෙ පිටවෙනකල්. අපි ගියාට අචිනි නිසා දිනුක නම් යයිද කියන්න බෑ.

" අපිත් යනවනං අචිනි ඇරුනම තව දෙනෙක් ඉන්නවනෙ. ඒත් යන අයගෙන් කුමුදු මිස් දන්නෙ නැහැ අචිනි වෙනුවට යන්නෙ සවී කියලා. ඉතිං අපි නම දෙනාටයි හංසි අක්කටයි සවීලගෙ අම්මටයි හැමෝටම කටවල් පරිස්සං කරගන්න වෙනවා"

මං එතන තිබුන අමාරුම කාරණේ කට්ටියට පහදලා දුන්නා. ඉස්කෝලෙ ගුරුවරයෙක් එතන නියෝජනය කරන්න ඕනෙ නිසා කුමුදු මිස්ව හලන්නත් බෑ. අන්තිමට අපි හැමෝම හෙට යන්න එනවා කියලා පොරොන්දු වුනා.

ගෙදර ගිහින් හෙට උදේ ගමන ගැන කියලා අම්මගෙනුයි තාත්තගෙනුයි පර්මිෂන් ගන්න එක හැබැයි ටිකක් අමාරු වැඩක්.

" මේ විභාගෙ ළඟ තියාගෙන ඔයාලා ට්‍රිප් යන්නද හදන්නෙ පොඩි පුතා"





තාත්තා සැරෙන් මගෙන් ඇහුවේ අපි හොරෙන් කොහෙහරි යන්න හදනවා කියලද දන්නෙ නෑ. ඒත් මං අම්මට මේ ගමන කලින් කියලා තිබුණා.

" නෑ තාත්තා මේක ට්‍රිප් එකක් නෙමෙයි. අපේ යාළුවෙක් සමස්ත ලංකා නැටුම් වල ෆයිනල් තේරිලා. හෙට ඒ තරගෙ තියන්නෙ නුවර. අපේ මිස්ලත් යනවා. ඒකට ඉස්කෝලෙන් අපිට වාහනේකුත් ලෑස්ති කරලා දුන්නා."

මං තාත්තට මුළු කතන්දරේම කෙටියෙන් කියාගෙන ගියා. අපේ අක්කත් කුස්සියෙ ඉදලා ඇවිත් හොරෙන් සැටලයිට් එක දාගෙන ඉන්නවා මං දැක්කා. හංසි මොනවත් කියලද දන්නෙත් නෑ.

" ඒ වගේ ගමනක් නම් කමක් නෑ. ඔයා දන්නවනේ මං ඔයාලව ගොඩක් විශ්වාස කරලයි ඔය නිදහස දීලා තියෙන්නෙ. ඒ විශ්වාසේ කඩ කරන්න එපා පුතා."

අපේ තාත්තා අම්මා වගේ නිතරම මගෙත් එක්ක කතා නොකලට එයා කියන වචනෙ දෙක උනත් බොක්කටම වදින්න කියනවා. තාත්තා එහෙම කියලා ඉවර වෙලා කාමරේට ගියාට පස්සෙ මං කැමරාව අරගෙන ටෙස් කරලා බලලා බෑග් එකට දාගත්තා. අක්කත් කතාව අහගෙන හිටපු නිසා ඇවිත් මට රුපියල් දාහක් එක්කම අවවාද ටිකකුත් දීලා ගියා. රෑ මම පාඩම් කර කර ඉන්නකොට තාත්තා කාමරේට ඇවිත් අම්මටත් හොරෙන් රුපියල් දෙදාහක් මගේ අතේ ගුලි කලා. දෙන දෙයියො වොකු ඇන ඇන දෙනවා කියන්නෙ ඕවට තමයි.මේ දූප්පත් රන්දූගෙ පර්ස්



WWW.EXPRESSLANKA.TK 62

එකේ මොණරුම තුන්දෙනෙක්. තාත්තා ළඟ වගේ අම්මා ළඟ සල්ලි නැති උනත් හෙට උදේ යන්න කලින් එයත් මට කීයක් හරි දෙනවා කියලා මං දන්නවා. ගෙදර බාලයා වුනාම මොන තරම් සැපද කියලා මට හිතෙන්නෙ මේ වගේ වෙලාවල් වලට තමයි. උදේ හය වෙද්දි ඉස්කොලෙට එන්න කියපු නිසා මං ටිකක් කලින් නිදා ගන්න ගියා.

SL-UNLIMITED.COM

උදේ පහමාර වෙද්දි විහඟ එළකිරි වගේ කිටක් මරලා අපේ ගෙදරට ආවේ අපේ තාත්තා අපිව උදේම වෑන් එකෙන් ඉස්කෝලෙට දාන්නං කියපු නිසා. මමත් ඩෙනිමක් ගහලා අත්දිග ටී ෂර්ට් එකකුත් ඇඳලා සුපුරුදු කැප් එකත් දාගෙන තාත්තට හොරෙන් සන්ග්ලාස් දෙකත් බෑග් එකට දාගත්තා. අම්මටයි තාත්තටයි වැඳලා අක්කටත් බායි පාරක් දාලා අපි තාත්තා එක්ක ඉස්කෝලෙට ආවා. ඒ වෙද්දි අපේ කොල්ලො දෙන්නෙකුයි සචීලයි, කුමුදු මිසුයි ඇවිත් හිටියෙ. තාත්තා අපි දෙන්නව බස්සලා එවලේම ගියේ නෑ. ටිකක් වෙලා ගියාට පස්සෙයි මං දැක්කෙ මේ උදේ පාන්දර ප්‍රින්සිපල් සර් ටී ෂර්ට් එකක් දාලා කොල්ලා වගේ ඇවිත්. අපේ තාත්තත් යන්න කලින් සර් එක්කත් කතා කරලයි ගියේ. ඒකෙන් එයාගෙ හිතේ සැකයක් තිබුණානං ඒකත් යන්න ඇති.

කට්ටිය සේරම ආවට පස්සෙ අපි ප්‍රින්සිපල් සර්ටත් වැඳලා යන්න පිටත් උනා.





" ඒයි උඹ අචීගේ අයිඩෙන්ටිය ගෙනාවද? " මං සචීගෙ කනට කරලා ඇහුවෙ ඒක අමතක උනොත් නුවර ගිහිනුත් වැඩක් වෙන්නෙ නැති නිසා. ඒවා සේරම හරි කියන්න වගේ ඒකි ඔළුව වැනුවා.

කොළඹ පහුවෙන්න හම්බඋනේ නෑ අපේ කට්ටිය ගෙනාපු ඩ්‍රම් එකට තල තල බජව්ව පටන් ගත්තා. මුං සිංදු කියන්න ගියාම බාගයක් කියන්නේ කුනුහරුප. ඉතිං මෙතන වැඩිහිටියො ඉන්න නිසා ඒ හරියෙදි හඬවල් ඉබේම මියුසික් බවට පත්වෙනවා. සින්දු කියන අතරෙ සාරංග මහේෂා එක්ක කතා කරනවා දැකලා මං ඒක විහඟට පෙන්නුවා. හිතේ දුක මූ එකපාරටම පිට කලේ තව සින්දුවකින්.

" මගේ කුඩුවට ඇවිත් ........
කොට්ටාවෙ පෙම්වතෙක්
මගෙ මහේෂා සමග හාදව
දුන්න ගින්දරක්...........
මට දුන්න ගින්දරක්"

ඌ ඒක කියන්න ඇත්තෙ සාරංග ඉන්නෙ කොට්ටාවෙ නිසා වෙන්න ඇති. හැබැයි ඒ සින්දුවට වෑන් එකේ හිටපු හැමෝටම හිනා. සින්දු පාර එක්කම සචීලගෙ අම්මා දීපු සැන්විච් බෑග් එකම වාෂ්ප උනේ කෑවද කියලා මතකයක්වත් ඉතුරු නොකර. අපිත් එක්ක එක දිගටම හංසි අක්කත් සින්දු කිව්වා. මෙයත් ඉතිං ටීච වගේ සාරියක් පටලවගෙන ආවට අපේ අක්කගෙ වයසෙම වෙන්න ඇති. ඒ කිව්වෙ විසි පහකට විසි හයකට වඩා වැඩි වෙන්න බෑ. හංසිත් කලාවේ උල්පත වගේ තමයි. නටන්න වගේම සින්දු කියන්නත් පුළුවන්.



WWW.EXPRESSLANKA.TK 63

මගදි වාහනේ නතර කරලා බනිසුයි බීමයි ගත්ත කුමුදු මිස් කිව්වෙ ප්‍රින්සිපල් සර් මග අමතර වියදමට රුපියල් පන්දාහක් දුන්නා කියලයි.

" ඕක ඉතුරු උනොත් සර්ගෙ හිත නරක් වෙයිනෙ මිස්. අපි යන්න කලින් ඔය පන්දාහම ඉවර වෙන්න කමු."

ඒක කිව්වේ හැමදාම අඩුවෙන් කන අපේ විහඟ. ඌගේ කොහොමටත් කකුලෙ මහපොටගිල්ලෙ ඉඳලම තියෙන්නෙ ආමාශෙ විතරයි. හංසි අක්කා මං එක්ක කතාකරනවා දැකලා කුමුදු මිස් අපි ළඟට ආවා.

" හේෂාන් කොහොමද හංසිව අඳුනන්නේ?"

" මිස් මේ අපේ අක්කගෙ හොඳම යාළුවෙක්"

" අපරාදේ ඔයාට අක්කවත් එක්කං එන්න තිබුණේ. එතකොට හංසිටත් පාළු නැහැනෙ."

නයි කයිද ඔරෙක්ස් පෑන් කිව්වලු. මිසුත් කියන්නෙ මාර කතා තමයි.

" නෑ මිස් මට පාළු නෑ. මෙයාලා කට්ටියම ඉන්නවනෙ."

මොනා උනත් හංසි හොඳ කෙල්ල. තැනේ හැටියට ඇණේ ගහන්න එයා දන්නවා. අපි යන අතරෙ මමයි විහඟයි මාරුවෙන්





මාරුවට මගේ කැමරාවෙන් ෆොටෝ ගත්තා. අපේ කට්ටිය කැමරා තුන හතරක්ම ගෙනැත් තිබුණ නිසා වැඩි අවුලක් නැතිව අපිට ඕන ෆොටෝ වෙන වෙනම ගන්න පුළුවන් උනා. හැබැයි මේ විහඟයා මටත් හොරෙන් මගෙයි හංසිගෙයි ෆොටෝ දෙක තුනක්ම අරන්.

කාලා බීලා ඉවර වෙලා අපි නුවරට යද්දි නමයයි හතලිස් පහට විතර ඇති. තරගෙ තිබුණෙ ටවුමෙ වැව ළඟම තිබුණ ගෑණු ළමයින්ගෙ ඉස්කෝලෙක. අවිනිගෙ නමට වෙලාව දීලා තිබුණෙ උදේ එකොළහට නිසා අපි කට්ටිය ඉස්කෝලෙට යන්න කලින් දළදා මාළිගාවට ගිහින් පඬුරු දාලා වැඳලයි ගියේ. සච් අද කොහොමහරි දිනයි කියලා මගේ හිතේ ලොකු විශ්වාසයක් තිබුණා.

" බලපංකො බං නුවර කෙල්ලන්ගෙ ලස්සන"

විහඟගෙ පැණි හැළිය ආයෙත් ඇරිලා. අපි වෑන් එකට එද්දි ඩෙනිමක් ගහපු ලෝකසුන්දරී විතර හීන්දෑරි කෙල්ලෙක් අයිස් ක්‍රීම් එකක් කකා එනවා. ඒකි ළං වෙද්දි ෂෝටා සැළලිහිණි සංදේශයේ තිබුණ කවි පදයක් හයියෙන් කිව්වා.

" සිසිවන උවන .......
ඉඟ සුඟ ගත හැක මිටින"

ඒකි කණ්ඩුල හැරුනා වගේ ෂෝටා දිහාට හැරෙද්දි මූ උසේන් බෝල්ට්ටත් වඩා හයියෙන් දුවගෙන ගිහින් වෑන් එකට නැගලා දොරත් වහගත්තා. නිකං හරි ඒ කෙල්ල මූට දෙකතුනක්



WWW.EXPRESSLANKA.TK 64

ඇන්නානං ආප්ප හැන්දෙන් හූරලා තමයි මූගේ කැලි එකතු කරන්න වෙන්නෙ. ඒක බුදු ෂුවර්.

ඉස්කෝලෙට අපි යද්දි ලංකාව වටේම ඉස්කෝල වලින් ෆයිනල් තේරුණ කට්ටිය ඇවිත් තැන් තැන් වල හිටියා. අපිට ටිකක් වෑන් එකේ ඉන්න කියලා කුමුදු මිස් සචී එක්ක හෝල් එකට ගියා. හැබැයි ආපහු එද්දි එයාලගේ මූණු වෙනස්.

" ළමයි පොඩි ප්‍රශ්නයක් තියෙනවා. තරඟ තියෙන පැත්තට පිරිමි ළමයින්ට යන්න දෙන්නෙ නැහැ. අනික හෝල් එක ඇතුලට යන්න දෙන්නෙත් නටන ළමයටයි ටීචර්ටයි විතරයි."

" අයියෝ මොනවද මිස්, ඒක හරි කැතයිනෙ. අපි මේ තරම් දුර ආවේ අපේ ස..... මේ අපේ අච්චි නටනවා බලන්නනෙ"

නටන එක කෙසේ වෙතත් මේ මෝඩ විහඟයා තව පොඩ්ඩෙන් සචීගෙ නම කියලා බාල්දියක් පෙරලනවා.

" වෙන මොනවා කරන්නද එහෙනං. මිස්ලා ඒ පැත්තට යන්න. අපි වෑන් එකේ රවුමක් දාලා එළියෙ ඉන්නම්"

මං එහෙම කිව්වම නිරෝධගෙ මූණ පෙගුණ පාන් බාගයක් වගේ උනා. අපි හයදෙනා ඩ්‍රයිවර් එක්ක වෑන් එකේ ඉද්දි සචී ජනාලියි මහේෂයි එක්ක යන්න ඉස්සර උනේ දුකෙන් අපි දිහා බලන් ඉදලයි. අපි වෙනසක් නැතුව හිනාවෙලා කෙල්ලට සුභ පැතුවා. අපිට ඇවිදින්න යන්න එපා කියලා මිස් හංසිවයි සචීලගේ අම්මයි එක්කගෙන ඇතුළට ගියා.





" මචං දැන් මොකද කරන්නෙ. ඉඳලා ඉඳලා නුවර ආවේ මේ වෑන් කට්ට අස්සෙ වේලෙන්න නෙමෙයි නේ."

සාරංගට තද වෙලා. දිනුකත් වැඩි සද්ද බද්දයක් නැතුව බලාගෙන ඉන්නවා.

" රයිට්.... උඹලා තව ඇඳුමක් අරන් ආවානං යන්න තැනක් තියෙනවා."

සාරංග ආයෙත් අහද්දි අපි කට්ටියම රෙඩි කියලා අත් ඉස්සුවා.

" අපේ අංකල්කෙනෙක් ඉන්නවා කටුගස්තොට හරියෙ. හැබැයි මචං මෙතන ඉදලා කිලෝමීටර් පහක් විතර වගේ යන්න ඕනේ. මොකද කියන්නෙ එහේ නාන්න මරු තැනක් තියෙනවා."

" එළනෙ! යං යං මෙච්චර කිලෝමීටර් එකසිය විස්සක් තිහක් විතර ආපු එකේ ඔය පහ මොකක්ද බං"

ෂෝටා පැනලා උත්තර දුන්නෙ ඌ අපේ සෙට් එකේ පුංචි කොලුවා නිසා වෙන්න ඇති. තාම සෙල්ලමටමයි හිත.

" අන්කල් මේ ළඟට ගිහින් එන්න යමුද?"

මං ඩ්‍රයිවර් අන්කල්ගෙන් ෂේප් එකේ ඇහුවා. මෙයා බෑ කිව්වොත් ඉතිං අපිට ගඟකින් උනත් ඇදගෙන තමයි නාන්න වෙන්නෙ.



WWW.EXPRESSLANKA.TK 65

" යන්න නං පුළුවං පුතා. ඒත් ඔයාලගේ ටීචර් මට බනියිද දන්නෙ නැහැ."

අන්කල් ආසයි බයයි වගේ කියලා මට තේරුණා.

" අපි එහෙම අන්කල්ට බනින්න දෙනවද? අපිට මිස් තමයි කිව්වේ එයාලා පරක්කු වෙන නිසා කොහේ හරි ගිහිං එන්න කියලා"

මේ විහඟයා අපේ අහිංසක ටීචව අමු අමුවේ පාවලා දීලා අන්කල්ව කැමති කරව ගත්තා. අපි එහේ ගියේ මගින් ලොකු කේක් එකකුත් අරගෙන. ඊට අමතරව නාද්දි බොන්න කියලා ජින්ජර් බියර් බෝතල් ටිකකුයි බයිට් කඩල පැකට් තුනකුයි අපේ ඩ්‍රයිවර් අන්කල්ව යාළු කරගන්න බුලත් විට තුනකුයි අර ගත්තා.

" බලපං අපි වෙනදට ජින්ජර් නැතුව බියර් බොන්නෙ. අද මේ ගෑණු එක්ක ඇවිත් ඒකටවත් නිදහස නෑ."

විහඟ එහෙම කිව්වට මූ බොන්න පුළුවං එකෙක් නෙමෙයි. මේකා බ්‍රැන්ඩි කියලා බොන්නෙ ෂැන්ඩි. හැබැයි සාරංගනම් පාටි වලට ගියාම ගෙදර උන්දෑලට හොරෙන් එක එක ඒවා අත්හදා බලනවලු.

" ඒකනේ අද ඉතිං මතට තිත තමයි. වෙනදට අපි තිතට මත නෙ. හෝව් හෝව් අන්කල් ඔතනින් දකුණට"





සාරංග අන්කල්ට පාර පෙන්නගෙන ඔය කියන ගෙදර මිදුලටම අපිව එක්කං ආවා. එහෙ වටපිටාවෙ තිබුණෙ පුදුම ලස්සනක් වගේම අමුතු ලා .... සීතල ගතියක්.

" බලපං අපේ සීයලට උනත් ඉස්සර මීට වඩා හිතන්න තිබුණා. නැත්නං අපිටත් මේ සාරංගට වගේ රටපුරා නෑයෝ ඉන්නවනේ."

මං ඒක කියද්දීම ඌගෙ අන්කල් ගෙයින් එළියට ආවා. පොර හරියට තේ වත්තක සුපිරින්ටන්ඩන් කෙනෙක් වගේ සුදු ෂෝට්කුයි සුදු ටීෂර්ට් එකකුයි ඇඳලා හැට් එකක් දාලා සපත්තු දාලා හිටියේ.

" හෙලෝ සනා .... කම් කම් .. නයිස් ටු මීට් යූ ආෆ්ටර් වෙරි ලෝන්ග් ටයිම්."

මළ කෙලියයි අන්කල් කාරයට සුද්දගෙ අසූචි පෑගිලාද කොහෙද. සාරංගත් ඉස්සරහට ගිහින් අන්කල්ව බදා ගත්තා.

" බලපංකො බං මූ පැන්ෂන් ගිය පොලිස් කාරයෙක් වගේනෙ."

විහඟ මගේ කණට කරලා හිමීට කිව්වා.

" මචං උඹේ සාක්කුවේ ඩික්ෂනරියක් තියෙනවද?"



WWW.EXPRESSLANKA.TK 66

අනිත් පැත්තෙ ඉදන් නිරෝධ අහද්දි මට හිතත් ගියා. මොනවා නැතැත් පොර ජොලි ඩයල් එකක් කියලා අපිට කතාකරපු පළවෙනි විනාඩි පහෙන්ම තේරුණා.

" වීනි කම් හියර් මයි ඩාලිං"

අන්කල් දොරෙන් ඇතුලට බෙල්ල දාලා කතා කලේ ගෙදර බල්ලටද දන්නෙත් නෑ. අපි සපත්තු දාගෙන සුදානම් ශරීරෙන් හිටියෙ වීනී හපන්න ආවොත් දුවන්න බලාගෙන. එත් ගේ ඇතුලෙ ඉදලා අඟර දඟර පපා ආවේ ලන්සි ටයිප් එකේ ආන්ටි කෙනෙක්.

" වීනී .. ඩූ යූ නෝ දිස් ජෙන්ට්ල්මන් ?"

අන්කල් කාරයා සාරංගව පෙන්නලා ඇහුවා. බොලේ .. වීනී කියන්නෙ අන්කල්ගෙ වයිපරේ.

" ඕ.... මයි ගෝඩ් "

ආන්ටි එහෙම කියලා සාරංගට අත දික්කලා. බලන් යද්දි මූ අපිව එක්කන් ඇවිත් තියෙන්නේ මාර තැනකට. මෙතන කැටයම් ගොඩයි. ඒ මදිවට සිං සිං ගාලා එහෙට මෙහෙට කඩ්ඩ වැනෙනවා. අපි ඔළු පාත් කරගෙන හිටියෙ කතා නොකරන තාක්කල් මෝඩයත් පණ්ඩිතයෙක් කියලා කවුද කියපු කතාවක් මතක තිබුණ නිසා.

අන්කල් සාරංග එක්ක ආගිය තොරතුරු කතා කරන අතරෙ අපි ඒ ලස්සන වත්ත වටේ පොඩි රවුමක් දැම්මා. වීනී ආන්ටි





මොන මොනවද කෑම ජාතිත් එක්ක තේ ලෑස්ති කරලා අපිට කතා කරද්දි මම ඒ පරිසරයට වශී වෙලයි හිටියෙ.

" අන්කල් අපි කට්ටිය ආවෙ පිටි පස්සෙ දොලෙන් නාන්න."

" ඕකේ සනා. යූ එන්ජෝයි විත් යුවර් ෆෙන්ඩ්ස් "

මේ යකානං මාර පොරක්. සිංහලෙන් කියන දේට උත්තර දෙන්නෙත් ඉංග්‍රීසියෙන්. වීනී ආන්ටි අපිට චේන්ජ් කරගන්න කියලා කාමරයක් පෙන්නුවා. අපි ෂෝටවල් ටිකකට බැහැලා කාමරෙන් එළියට එද්දි අන්කල් අලුත්ම තුවා තුනක් විතර අපිට දුන්නා.

"එපා අංකල් අපි ළඟ තුවායක් තියෙනවා."

" නෝ නෝ සනා ටේක් දිස්. "

SLU

ඒක කියද්දි විහඟ තුවා ටික ඉක්මනට අතට ගත්තෙ නැත්තං අන්කල් ඉංග්‍රීසියෙන් බනියි කියලා වෙන්න ඇති. බැන්නත් ඉතිං අවුලක් නෑ. අර බල්ලා කියන හැමදේටම නගුට වනනවා වගේ හිනාවෙලා අහන් ඉන්න තියෙන්නෙ. මොකෝ තේරෙන එකක්යැ. අපි ඩ්‍රයිවර් අන්කල්ට කියවන්න පත්තර ටිකකුත් දීලා අන්කල් එක්ක වත්ත පහලට ගියා.

වත්තෙ ඉස්සරහා තියෙනවට වඩා ලොකු ඉඩක් පිටි පස්සෙ තිබුණා. බෑවුම වගේ තිබුණ ඒ හරියෙ මල් වවලා ඒ පාත්ති අතරින් ගල් වැටි වගේ දාලා පාරවල් හදලා එළකිරි ලුක් එකක් තිබුනේ. අපේ කෙල්ලො ටික එහෙම මේ මල් වත්ත දැක්කනං



WWW.EXPRESSLANKA.TK 67

උන්ගෙ අවසන් හුස්ම පොද මෙතනම යනවා. ඒ තරම් ගති. පහල පෙනුන දොල පාර දකිද්දි මට මතක් උනේ නාච්චි මලේ. නාන්න ඕනෙ නැහැ. දැක්කත් සැපයි.

" ඕ......... වට් අ නයිස් ප්ලේස්"

ෂෝටා ටිකක් උච්ච ස්වරයෙන් කිව්වෙ අන්කල්ට ඇහෙන්න වෙන්න ඇති. කොළඹින් ඇවිත් ගොඩේ බයියො ටික වගේ ඉදලා බෑනෙ.

" යර්ස් සනා. ඔයාලා කැමති නං කට්ටියම ස්කූල් වැකේෂන් එකට මෙහෙ ඇවිත් ඉදලා යන්න."

ඔන්න අපේ එකා දන්න ඉංග්‍රිසි වචන දෙක තුන කිව්වා විතරයි අන්කල්කාරයා සිංහලට බැස්සා. මොනව නැතත් පොරගෙ යෝජනාවනං ටොප්. අපි නාන්න පටන් ගත්තම අන්කල් ගෙදර ගියා. අපේ ගැන්සිය ගල් උඩින් පැන පැන පෙරලි පෙරලි වතුරෙ දඟලන්න ගත්තෙ හරියට සහරා කාන්තාරෙ ඉඳලා ආවා වගේ. වැඩියම දඟලුවේ ෂෝටා. ඌ එක දිගට තිබුණ ගල් පේලියක් දිගේ යද්දි ජබොක් ගාලා ඇදගෙන වැටුනා. මං පොඩි කවියක් මතක් වෙලා කියද්දි ඉතුරු හතර දෙනත් මාත් එක්ක එකතු වෙලා කෑ ගහලා ඒක කිව්වා.

" ඒ දණ්ඩේ ...... කොටා
යන විට ගාට.......ගාටා....
වැටුණේය .......... වතුරටා.....
හූ.......ටා...................."

SLU





කොටා කියපු නිසාද මන්දා ඌගේ මූණ දෙකවෙලා. අපි බීම බිබී කඩල කකා ෆුල් ෆන් එකක් ගත්තා.

" මචං ෂෝටා ..උඹ දන්නවද අර අලියගෙයි කුඹියගෙයි කතාව?"

විහඟ අහද්දි අපි කට්ටිය ඌ දිහාට හැරුණා.

" අලියගෙයි කුඹියගෙයි කතා කොයිතරම් තියෙනවද උඹ අහන්නෙ කොයි එකද ?"

" අලියයි කුඹියයි නාන්න ගිය එක"

" මහ්.. කියපංකො බලන්න."

" මෙහෙමයි.... අලියයි කුඹියයි නාන්න ගියාලු. මුලින්ම අලියා නාලා ඉවරවෙනකල් කුඹියා ගොඩට වෙලා බලන් හිටියලු. දන්නවද ඇයි ඒ ඇයි කියලා."

"අලියට පෑගිලා ඌ මැරෙයි කියලා වෙන්න ඇති."

" නෑ. උඹලා දන්නවද උත්තරේ"

"ඒකත් ඉතිං උඹම කියහං"

" අලියා නාලා ඉවරඋනහම ඌගෙ ෂෝට ඉල්ලගන්න."



WWW.EXPRESSLANKA.TK 68

" හරි හරි ඩෝ.. උඹ ඒ කතාවේ කොනකටත් මාව ගාව ගන්නද හදන්නේ? "

ෂෝටා අද දවසේ බයිට් එක වෙලා. පිස්සු නට නට නාලා ගොඩ එද්දි අපේ අත්වල ඇඟිලි රැලිවැටිලා. හැබැයි ඇඟටනං දැනුනෙ පුදුම සනීපයක්.

" මචං සාරංගයො උඹලගෙ අන්කල්කාරයා අපිට ආමාශගත කරන්න මුකුත් දෙන එකක් නැද්ද? යකෙක් කන්න බඩගිනියි."

විහඟත් හරියට ස්කූබි ඩූ වගේ. කන්න දෙනවනං ඊට වඩා දෙයක් නෑ.

" වෙලාව කීයද දන්නෑ බං. අරුන් එළියට ඇවිත් අපිව හොයනවද දන්නෙත් නෑ."

මං කිව්වේ අපේ ස්ත්‍රී පාර්ශවය මතක් වෙලා. අපි ගෙදරට යද්දි විනී ආන්ටි කෑම ලෑස්ති කරලා බලාගෙන හිටියා.

" ඔයාලට බඩගිනි ඇතිනෙ. ඉක්මනට චේන්ජ් කරගෙන එන්න. ලන්ච් එක රෙඩි."

" බලපං බං ආන්ටිට පුදුම තේරුම්ගැනීමේ හැකියාවක් තියෙන්නෙ. මේ වගේ උදවිය බුදුන් දැක නිවන් දකින්න ඕන."

අපි ආන්ටිට පින් දිදී කෑම මේසෙට සෙට් උනා. ආන්ටි හදලා තිබුණේ මැකරෝනි. ලොකු කුකුල් මස් තසිමක් එක්ක





තිබුණ උණු උණු මැකරෝනි දකිද්දි විහඟ කෙල බාල්දියක් විතර ගිලලා ඉවරයි.

SLU

" මචං ඩ්‍රයිවර් අංකල්"

මං ඇහුවේ මෙච්චර වෙලා කාටවත්ම උන්දැව මතක තිබුණෙ නැති නිසා.

" ඔයාලා කන්න. මං එයාට කෑම බෙදලා දුන්නා."

" ආන්ටිලත් එන්න කන්න. කෝ අන්කල් ?"

" එයා හදිස්සියෙ කෝල් එකක් ඇවිත් වත්තට ගියා. තව ටිකකින් එයි. මං අන්කල් ආවම කන්නං"

එහෙම කියලා ආන්ටි අපිට කෑම බෙදුවා. අපරාදෙ කියන්න බෑ අපේ බඩවල් වල තරම දැනගෙනද කොහෙද ආන්ටි කොත ගහලා මැකරෝනි දාගෙන ගියා. මේවා තම්බපු බට කෑලි වගේ උනාට ආන්ටිගෙ මස් හොද්දත් එක්ක අවුට් නොවී බැට් කරන්න පුළුවං. ඒක කාලා ඉවර වෙද්දි අයිස් ක්‍රීම් මේසෙ උඩ. ඒකටත් වග කියපු අපි ආන්ටිලාට නොසෑහෙන්න පිං දීලා එන්න සෙට් උනා.

" ආන්ටි අන්කල් එන්න පරක්කු වෙයි වගේ නේද? අපි එහෙනම් ගිහිං එන්නම්. අන්කල්ටත් කියන්න."

" ඕකේ සනා. ආයෙත් දවසක යාළුවො එක්ක එන්න. ටේක් කෙයා!"



WWW.EXPRESSLANKA.TK 69

" අපිට සංග්‍රහ කලාට තැන්ක්ස් ආන්ටි. එහෙනං අපි ගිහින් එන්නං බායි."

සාගත මළු ටිකත් පුරවගෙන ජොලියක් දාලා අපි ආයෙත් අර ඉස්කෝලෙට ආවත් අපේ කවුරුවත් පේන්න හිටියෙ නෑ. හැබැයි උදේ තිබුණට වඩා වාහනත් අඩුයි.

" අපි ටික නැති නිසා මුං ගෙදර ගිහින්ද දන්නෑ බං"

" සචීලගෙ අම්මයි හංසි අක්කයි මොබයිල් ගෙනැත් තිබුණා. වරෙං පහලට ගිහින් කෝල් එකක් දීලා බලමු."

වෑන් එක ඉස්කොලේ තියෙද්දි අපි කට්ටිය පයින්ම වැව පැත්තට ඇවිදගෙන ආවා. ඒ හරිය ප්‍රේමවන්තයින්ට සුර ලොවක් වගේ. මං පර්ස් එකේ දාගෙන හිටපු හංසිගෙ නොම්මරේට බොක්ස් එකකින් කෝල් කලා.

" ආ මල්ලි ඔයාලා කොහෙද ඉන්නෙ? මේ නංගි සෙකන්ට් රවුන්ඩ් එකට සිලෙක්ට් උන නිසයි ටිකක් පරක්කු උනේ. තව පැයකින් විතර මේක ඉවරයි."

හංසි කියපු පණිවිඩේ මං අනිත් කට්ටියට කිව්වා. හැමෝම කිව්වෙ අපි තව ටිකක් වැව රවුමේ ඉමු කියලා. ඉතිං අපි වැව දිහා බල බල ඒ හරියෙ ඉන්න කෙල්ලන්ට විහිළු කර කර හිටියා.

" බලාගෙන බං නුවර කෙල්ලන්ට විහිළු කරලා මුං ගහන්න ආවොත් දුවන්න පාරවල් දන්නෙත් නැහැ. ටිකක් පරිස්සමෙන්."





" අපි කවද්ද බං කෙල්ලන්ගෙන් ගුටි කෑවෙ. බැරිම අවස්ථාවක් ආවොත් වැවට පනිනවා."

ෂෝටා එහෙම කිව්වට ඌට මතක නැතුව ඇති උදේ ඇතින්නක් විතර කෙල්ලෙක් ඌව සුප් කරන්න හදපු හැටි. අපි කතා කර ඉන්න පැත්තට චයිනා ලුක් එකක් තියෙන චප්ප මුක්කු ඩයල් තුනක් ආවා. මොකක්දෝ මන්දා චාං චූං බාසාවක් කතා කර කර ආපු උන් අපිව පහු කරද්දීම විහඟයා උන්ට හලෝ කිව්වා. තුන්දෙනාගෙන් ඉස්සරහින්ම ආපු පොර හිනාවෙලා මොකක්දෝ මන්දා දෙයක් විහඟට කිව්වා. හිනාවෙලා කියපු හැටියට ඒක 'නයිස් ටූ මීට් යූ' වගේ සුහද ටෝකක් වෙන්න ඇති කියලයි මට හිතුනේ. මෙන්න බොලේ ඌ ඒක කියද්දිම විහඟත් ඒ වගේම බාසාවකින් ඔළුව පාත්කරලා මොනවද කිව්වා. සුද්දො ටික හිනාවෙවී යද්දි අපි ලෝකෙ අටවෙනි පුදුමෙ දැක්කා වගේ විහඟ දිහා බලන් හිටියා.

SLU

" උඹ මොකක්ද බං අර චීනට කිව්වෙ"

" ඌ සුභ පතද්දි මමත් ඌට සුභ පැතුවා."

පිස්සු පපඩං කතාවක් තමයි මූත් කිව්වෙ. මූ චීනට සුභ පැතුවලු.

" උඹ චීන භාෂාව දන්නවා කියලා අපි දන්නෙ නැනේ. අපි හිතුවෙ උඹ දන්නෙ සිංහල විතරයි කියලා."



WWW.EXPRESSLANKA.TK 70

" සිංහල තමයි බං මං කිව්වෙ. ඌ කියපු මෙලෝ දෙයක් මට තේරුණේ නෑ. මොනවා හරි කියන්න ඕන නිසා මමත් කිව්වා."

මූත් මාර පොරක් තමයි.

" ඉතිං උඹ මොනවද ඒ ඔළුවත් පාත්කරලා කිව්වේ."

" මං කිව්වෙ 'සාට මොයිකල් කොමතර අටස්' කියලා "

" ඒ කිව්වේ. "

" ඒ කිව්වේ බං 'මෝට සයිකල් අමතර කොටස්' කියලනෙ"

අපි කට්ටිය හිනා උනේ මූ කියපු හරුපෙ කටට කොහෙන් ආවද දන්නෑ කියලා හිතලයි.

" අරුන් තුන්දෙනා දූං ගිහිං චීන ඩික්ෂනරිත් පෙරලයි ඒකෙ තේරුම හොයන්න."

" උඹ තමයි බං දවසකටවත් මිනිහා. උන් ටික හිනාවෙවී යන්න ඇත්තෙ ඒක තේරුනේ නැති නිසා තමයි."

අපි හවස තුනට විතර ආපහු ඉස්කෝලෙ පැත්තට එද්දි මිස්ලා ඈත ඉඳලා වෑන් එක පැත්තට එනවා දැක්කා. කට්ටියම කට කපලා හිනාවෙවී ආවේ. අපේ සවී දිනලද මන්දා.





" ආ ඔයාලා උදේ ඇඳන් හිටියෙ මේවා නෙමෙයිනෙ. කොහෙද ගියේ ?"

" අපේ සැබෑ වෙනස මුලින්ම තේරුණේ හංසිට. එයා මං දිහා බලලා එහෙම කියද්දි අනිත් කට්ටියත් අපේ කේශාන්තයේ ඉඳලා පාදාංතය වෙනකල්ම බැලුවා."

" මිස් මෙයාලා කොහෙන්ද නාලා."

SLU

සවී ඉස්සිලා මගේ කැප් එක ගලවලා ගත්තා. අනිත් කට්ටියගෙ කොණ්ඩේ වේලිලා තිබුණට කැප් එක දාගෙන හිටපු නිසා මගේ කොණ්ඩෙ තෙතයි.

" අපි ගිය තැන් පස්සෙ කතා කරමු. දැන් කියනවා බලන්න උඹේ නැටුමට මොකද උනේ කියලා. උඹ දින්නා නේද?"

" දින්නද කියලා තාම දන්නෙ නැහැ. උදේ ෆස්ට් රවුන්ඩ් එකෙන් හයදෙනෙක්ව තෝරලා තව වටයක් තිබ්බා. මම ඒකෙන් දෙවෙනියට නැටුවෙ. ඉතුරු හතරදෙනා නටලා ඉවරවුනාම තමයි ප්ලේස් එක කියන්නෙ."

සවී අපි කට්ටියටම ඇහෙන්න කිව්වා. සවීලගේ අම්මනං හරි සන්තෝසෙන් හිටියෙ.

" අපිට හෝල් එකට යන්න දුන්නෙ නැති වුනාට අපි කට්ටිය ජනේලෙන් බලන් හිටියෙ මෙයාලා නටනවා. අපේ අවී තරම් ලස්සනට කිසිම කෙනෙක් නැටුවේ නැහැ."



WWW.EXPRESSLANKA.TK 71

ජනා අවී කියලා හයියෙන් කිව්වෙ කුමුදු මිස් හිටපු නිසා වෙන්න ඇති. ජනාලි එහෙම කියද්දි නිරෝධ මට පේන්න කොලර් එක උස්ස ගත්තා. මූ දැන්මම සචීගෙ හස්බණ්ඩා වගේ ඇක්ෂන් දාන්නෙ.

" ළමයි අනිත් කට්ටිය ඉවර වෙද්දි පහත් පහු වෙයි. ප්ලෙස් එක අහන්න හිටියොත් අපිට රෑ වෙනවා. එයාලා සඳුදට ඉස්කෝලෙට දෑනුම් දෙනවලු. අපි දෑන් යං."

මිස්ගෙ තීරණය අවසාන තීරණය වේ කියලා අපි කට්ටිය වෑන් එකට නැග්ගා. මං ෂේප් එකේ සචී ළඟින් ඉඳගත්තා. ඒකිව කතාවට අල්ලගන්න හිතාගෙන. සචී නැටුමට මේකප් කරපු නිසාද දන්නෙ නැහැ ඒකිගෙ සුදු කම්මුල් රෝස පාට වෙලා. මේ තරම් ළඟට ඒ ලස්සන මූණ දකිද්දි මට ලෝභ හිතුනා.

එයාලා ඇතුලට ගියාට පස්සෙ අපි මොකද කලේ කියලා සචී අහපු නිසා මං විස්තර විචාරෙ දුන්නා. හංසි අහක බලං වගේ හටියට එයාගෙ කණ තිබුණෙ අපි දෙන්නා ළඟද කොහෙද? විහඟලා සින්දු කියන්න පටන් ගත්තට ඒක උදේ වගේ නැගලා ගියේ නෑ. ඒ නිසා එක එකා තනියම සින්දු කියන්න ගත්තම අනිත් කට්ටිය මියුසික් දුන්නා.

" ඒයි අපේ අසහාය ගායකයා කියපංකො බං සින්දුවක් "

සාරංග ඒ කෑ ගැහුවේ මට. මං සච්නිගෙ මූණ දිහත් ටිකක් වෙලා බලන් ඉඳලා සින්දුවක් පටන් ගත්තා.





" ඔබට සිත ආදරේ කරයි....
දෙතොල ගොළු වී සිටී....
නැගුණු සෙනෙහේ කියනු බැරි වී
මගේ සිත වේදනා විඳී..."

SLU

නුවර පාර දිගේ හයියෙන් ගිය අපේ වෑන් එක ඇතුලෙ මගේ සින්දුව හොඳ පැහැදිලිව ඇහුනා. කට්ටිය ඩ්‍රම් එක ගහන්නත් අමතක වෙලා ඇස් වහගෙන සින්දුව රස විඳිද්දි සචී හිටියෙ මගෙ මූණ දිහාම බලාගෙන. එයාට එහා පැත්තෙ හිටපු අම්මා නිදාගෙන ඉන්නවා මං දැක්කා. සින්දුව ඉවර කරද්දි කට්ටිය විසිල් ගහලා ඉල්ලුවෙ තව සින්දුවක්. ඊළඟට මං ගොඩක් ආස කරන නින්ද නැති රැයේ සින්දුව කියන්න ගත්තා.

" මචං උඹේ රාණි හිටියනං උඹට යුග ගීයක් කියන්න තිබුනා නේද?"

මම සචී ළග ඉදගෙන හිටපු නිසා ඊරිසියා හිතිලද කොහෙද නිරෝධ එකපාරටම නෙත්මිව මතක් කලා.

" කවුද රන්දු රාණි කියන්නෙ ?"

" රාණි කියන්නෙ මුගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්."

ජනාලි අහපු ප්‍රශ්නෙට උත්තර දුන්නෙ සාරංගයා. ඒක ඇහෙද්දි හංසි මගේ පැත්තට හැරුනෙ පැයට හැටේ වේගෙන්. ඔය නිව්ස් එක අපේ අක්කට ගියොත් ඉතිං මට බඩුම තමයි. කිසිම ගැලවීමක් නෑ.



WWW.EXPRESSLANKA.TK 72

" ඒ කතාව ඇත්තද රන්දූ? ඔයාට ගර්ල් කෙනෙක් ඉන්නවද? ඇයි අපිට කිව්වෙ නැත්තෙ ?"

ඕන ප්‍රශ්නයක් වරකට එක බැගින් ඇහුවනං ඉවරයිනෙ. සචී ප්‍රශ්න වැලක්ම ඇහුවෙ එක හුස්මට.

" ඔව් බං, ඒක ඇත්ත. හැබැයි තාම කියන්න තරං කාලයක් උනේ නෑ."

මං සචීට පොඩි නයි පැටියෙක් ඇරලා බැලුවා. කෙල්ල බිම බලාගෙන කල්පනා කරනවා. මේකි ලණුව කාලා කියලා මට තේරුණා.

" සචී මට ඇත්ත කියන්න. ඔයා කාටවත්ම ආදරේ කරන්නෙ නැද්ද?"

මෙයාට කොල්ලෙක් නැති විත්තිය නං අපි දන්නවා. ඒත් කවුද දන්නෙ සචී නිරෝධට ලව්ද කියලා. කට්ටිය එකා දෙන්නා වෙන වෙනම කතාව. ඉතිං අපේ සංවාදෙ වෙන කවුරුත් අහං ඉන්නෙ නෑ කියලා දැනුන නිසා මං සචීගෙන් ඇහුවා.

" මං.... මං.... ආදරේ කරනවා රන්දූ. ඒත් ඒක මං එයාට කියලා නෑ."

මං හිතුවා හරි. නිරෝධ සචීට ලව්. ඒත් තාම කියලා නෑ. ඒ වගේම සචිත් ලව් කරන්නෙ නිරෝධටම වෙන්න ඇති. එයත්





ඒක හිතේ තියං ඉන්නවා. මේ රන්දූට ඉතිං සොරි ඩොට් කොම් තමයි.

" ඔයා ආදරේ කරන්නේ අපේ සෙට් එකේ කාටහරි නේද සචී?"

මං හෙමීට එහෙම අහද්දි කෙල්ලගෙ ලස්සන ඇස්වල කඳුළු පිරිලා. ආදරේ හිතේ තියන් දුක් විඳින එක කොයිතරම් අමාරුද කියලා මට අමුතුවෙන් කියලා දෙන්න ඕනෙ නැහැ. ඒ දුක මටත් දැනිලා තියෙනවා. ඊයේ පෙරේදා අලුතෙන් ආපු කෙල්ලෙක් දිහා හොරෙන් බැලුවට පුංචි කාලෙ ඉඳලා මං ළඟ හිටපු සචිනිට මං ආදරේ කරලා කියලා මට දැනුනේ නිරෝධ අපේ ගෙදර නතර උන දවසෙ රෑ. ඒත් මට ඒ පොත පෙරලන්නෙ නැතුවම වහලා දාන්න වෙලා. මං දන් මගේ හොඳම යාළුවෙක් උන නිරෝධට උදව් කරන්න පොරොන්දු වෙලා ඉවරයි.

" සචී මට ඇත්ත කියන්න සචී"

SLU

" ඒ ගැන අහන්න එපා රන්දූ. මං දන්නෙ මං එයාට ගොඩක් ආදරෙයි කියලා විතරයි."

මෙච්චර වෙලා සචීගෙ ඇස්වල පිරිලා තිබුණ කඳුළු බින්දු නිදහසේ ගලාගෙන යද්දි එයා ඉස්සරහ සීට් එකට ඔළුව තියාගත්තා. කෙල්ලො කොයිතරම් අඬනවා දැකලා තිබුනත් සචීගෙ කඳුළු ඉස්සරහ මගේ හිත උණු උනා.



WWW.EXPRESSLANKA.TK 73

" ඔයා ආදරෙයි කියනකං එයා බලන් ඉන්නවා සචී. ඒක ඉක්මනට කියන්න."

සචීගෙ සිනිඳු අතක් උඩින් අත තියලා මං කියද්දි එයා මගේ අත තද කරලා අල්ල ගත්තා. දැන් මේ රත්දු ෆුල් හොල්මං. මේ රෝස මල නිරෝධගෙ අතට දෙන්නෙ කොහොමද කියන එක මං කොළඹට එනකල් කල්පනා කර කර ආවේ. මග නතර කරලා ආප්ප කාලා තේ බීලා ආපු නිසා ඉස්කෝලෙට එද්දි හයහමාර විතර උනා.අපි මගදි කෝල් කරපු හින්දා ගෙවල් වලින් ඇවිත් තිබුණට සාරංගටයි දිනුකටයි යන්න විදියක් තිබුණේ නැහැ.

" සාරංග උඹලා දෙන්නව අපේ වෑන් එකේ ගිහින් දාන්නද?"

මං ඇහුවෙ උන්ව මග දාලා යන එක හොද නැති නිසා.

" නෑ බං තාම කළුවර වැටිලත් නැනෙ වැඩිය. අපි ත්‍රීවිල් එකක යන්නං"

එහෙම කියලා උන් දෙන්නා පාර පැත්තට ගියා. කුමුදු මිස්ව ගෙදරට දාන්න සචී භාරගත්තා.

" හංසි අක්කෙ, ඔයා යන්නෙ කොහොමද?"

මං ඇහුවේ එයා ගැන අහන්න මට යුතුකමක් තියෙනවා කියලා හිතුන නිසා. මොකද හංසි දැන් මට මගේ අක්කා වගේම තමයි.





" අපේ මල්ලි බයික් එකේ ඇවිත් ඉන්නෙ. මං එයා එක්ක එන්නං. ඔයාලා පරිස්සමෙන් යන්න."

ගේට්ටුව ළඟ පල්සර් බයික් එකක් නතර කරලා තිබුණෙ හංසිගෙ මල්ලි වෙන්න ඇති. හැමෝම යන්න සෙට් වෙද්දි මං අපේ වෑන් එකට නැග්ගෙ විහඟත් එක්ක. ඌට අද රෑ අපේ ගෙදර ඉන්න කිව්වත් මහන්සියි කියලා ගෙදර යන්න ඕනෙ කිව්වා. ඌවත් ගෙදර දාලා අපි ගෙදර එද්දි හත හමාරට විතර ඇති.

" පොඩ්ඩි පුතා කොහොමද ගමන"

මං වෑන් එකෙන් බහිද්දිම අම්මා ඇවිත් මගේ අත අල්ල ගත්තා. එයා ගොඩක් වෙලා පාර බලන් ඉන්න ඇති කියලා මට හිතුනා ඒ මූණ දකිද්දිම.

" ගමන නං නියමයි. අම්මා.... හැබැයි හරිම මහන්සියි."

"ගමන නියමයි කියලා තේරෙනවා කටහඬට වෙලා තියෙන දේ බලද්දි. හරියට වචන පිටවෙන්නෙත් නෑ."

අක්කා සුපුරුදු ගෝරනාඩුව දාලා මාව පිළිගත්තා. මග දිගට සින්දු කිය කිය ඇවිත් අක්කා කිව්වා වගේ මගේ උගුර බැරැන්ඩි වෙලා තිබුණෙ. ඉක්මනට ඇඟ සෝදපු මම රෑට කන්නෙත් නැතුව ඇඳට පැන්නා.

SL-UNLIMITED.COM



WWW.EXPRESSLANKA.TK 74

SL-UNLIMITED.COM

# 06

මං පහුවෙනිදා උදේ පාන්දර නමයට විතර නැගිට්ටෙ කවුදෝ මන්දා අපතයෙක් කෝල් කරපු නිසා. මං නිදිමතේම ගිහින් ෆෝන් එක ගනිද්දි කතා කලේ සාරංග.

" මචං උඹලා දෙන්නා ඊයේ ගියේ කොහොමද?"

" ආ.. අපි කිසි ආබාධයක් නැතුව සැපට ත්‍රීවිල් එකක ගියා. ඒක කියන්න තමයි ගත්තෙ."

" ෂුවර් එකට උඹලා මොකක් හරි මගෝඩි ගේමක් දෙන්න ඇති"

" අපි නගිද්දි ඇහුවා ගාන කීයද කියලා. මේ යකා රුපියල් දෙසිය පනහක් ඉල්ලුවනේ බං."

මේ කියන්නෙ ත්‍රීවිල් කාරයා ගැන වෙන්න ඇති. මුන් දෙන්නා ඌට පොල්ලක් තියලා කියලා මට නිකමට හිතුනා.





" ඉතිං බං අපේ ගෙදරට එච්චර ගන්නෙ නෑනෙ වෙනදට. දිනුකත් අපේ ගෙදර නවතිනවා කියපු නිසා ඩබලම නැගලා ගියා."

"ඉතිං දෙසිය පනහ දුන්නද?"

" මොන පිස්සුද ? අපි හිස් මෙගා බෝතල් දෙකක් දාපු බෑග් එකක් ත්‍රීවිල් එකේ තියලා අපේ ගේ පහුකරලා තියෙන ෂොප් එකක් ළඟින් බැස්සා සිගරට් දෙකක් අරන් එන්නං කියලා. පොරත් හිතන්න ඇති අපේ බෑග් එකකුත් ඇතුලේ තියෙන නිසා අපි එයි කියලා. අපි හෙමීට ඉස්සරහ දොරෙන් ගිහින් පිටි පස්සෙ කා පාර්ක් එක පැත්තෙන් බැහැලා වැටක් අස්සෙන් රිංගලා ගෙදර ගියා. ඒක කොච්චර සිම්පල් ප්ලෑන් එකක්ද බලපං. අපේ සල්ලිත් ඉතුරුයිනෙ."

මුං කලොත් කරන්නෙ ඔහොම නොහොබිනා වැඩක්ම තමයි. පව්! ඒ අහිංසක ත්‍රීවිල්කාරයා මුං එනකල් සෑදී පැහැදී බලන් ඉන්න ඇති.

" පොර ආපහු යන්න ඇත්තෙ උඹලගෙ හත්මුතු පරම්පරාවම මතක් කර කර වෙන්න ඇති."

කොහොම උනත් ඊයේ දවස ගෙවිලා ගියේ අපේ හිත්වල විශේෂ මතක සටහන් තැන්පත් කරලා.



WWW.EXPRESSLANKA.TK 75

අද පන්ති දවසක් නේද කියලා මතක් උනේ දහය හමාරට විතර කෑම කනකොට. ඊයේ දඟලලා අතපයත් රිදෙනවා. ඉතිං මොන පන්තිද? මං හවස් වරුව ගෙදරට වෙලා පාඩම් කලා.

* * * * * * *

SLU

සඳුදා උදේ ඉස්කෝලෙ යද්දි සචිනිත් ඇවිත් හිටියා. අද ඉඳලා සුපුරුදු විදියට සචිනි අපේ පංතියෙ. උදේ ඉස්කෝලෙ පටන් ගනිද්දි ප්‍රින්සිපල් සර් ප්‍රධාන රැස්වීම කියලා හැමෝවම ග්‍රවුන්ඩ් එකට කැඳෙව්වා. ගාථා කියලා ඉවර උනාම ප්‍රින්සිපල් කිව්වෙ අපි හැමෝම අහන්න සතුටු උන කාරණයක්. අචිනි නවෝදා අත්තනායක සමස්ත ලංකා නැටුම් තරගෙ පළවෙනි තැනට තේරිලා කියලා සර් කියද්දි මගේ අගේ ඇත්තටම හිරි ගඬු පිපුණා. ඔය ජයග්‍රහණය ලබා ගන්න අපි කොයිතරම් බකප් එකක් දුන්නද කියලා සර් දන්නෙ නැහැ.

අචිනි නවෝදාට ඒ ජයග්‍රහණය ගෙනැත් දුන්නෙ සචිනි පබෝදා කියන එක ගොඩ දෙනෙක්ට රහසක්. සර් අචිනිගෙ නම කියලා අඬගහද්දි එයා සචිනිට ස්ටේජ් එකට යන්න කිව්වා. ඒත් සචිනි ඒ ජයග්‍රහණය නිහඬවම අචිනිට පවරලා පැත්තකට උනා. මේ වගේ කෙල්ලෙක් තමාගෙ නිවුන් සහෝදරියක් වෙලා ඉපදෙන්න අචිනි ගොඩක් පින් කරන්න ඇති.

රැස්වීම ඉවර උනාම අපි සචීට සුභපතලා එයාවයි අචිනිවයි ඩබලම එක්කගෙන කුමුදු මිස් හම්බවෙන්න ගියා. එයත් මේ වැඩේට ගොඩක් මහන්සි උනානෙ.





" ආ.. දැන් දසමහ යෝධයො ටිකට සතුටු ඇති "

අපිව දැක්ක ගමන් මිස් ඉස්සරහට ආවේ එහෙම කියාගෙන. එයා කෙලින්ම ඇවිත් අල්ලගත්තෙ සචිනිගෙ අත් දෙක.

" ඔයා ලස්සනට නටපු නිසා තමයි අපේ ඉස්කෝලෙට මේ වාසනාව පෑදුනේ."

මළ කෙලියයි. මිසුත් දෙන්නව මාරු කරගෙනද කොහේද?

" මිස් ඔය සචිනි. මෙයයි අචිනි."

මං එහෙම කියද්දි මිස්ගෙ මූණට නෝන්ඩි හිනාවක් ආවා.

" අරයා අචිනි කියලා මමත් දන්නවා. මං කතාකලේ තරගෙට නටපු එක්කෙනාට"

හුටා අපේ රහස එහෙනං එයත් දැනගෙන. මිස්ට ඕක කියන්න ඇත්තෙ හංසි වෙන්න ඇති. මම කිව්වේ මේ කෙල්ලන්ට කට පරිස්සම් කරගන්න බෑ කියලා. දැන් බඩු හරිනෙ. අපි ටික ඇටිකෙහෙල් කාපු උගුඩුවො වගේ බිම බලන් හිටියා.

" මොකද කට්ටිය බයවෙලා වගේ. අනේ කොල්ලනේ උඹලා හිතුවෙ මුන් දෙන්නා එක වගේ උනාට පොඩි කාලේ ඉඳලා මං නැටුම් උගන්නපු කෙල්ලො දෙන්නා මට වෙන්කරලා අඳුරගන්න බෑ කියලද?"



WWW.EXPRESSLANKA.TK 76

දීපංකො ඉතිං උත්තර. අපි මිස්ව ඇන්දුවා කියලා හිතං හිටියට අන්තිමට ඇඳගෙන තියෙන්නෙ අපිමයි. ඒ කියන්නෙ අපි නුවර යන්නත් කලින්ම වැඩේ ලෙඩේ වෙලා ඉවරයි. මිසුත් කට වහගෙන දන්නෑ වගේ හිටපු එක තමයි මතක් වෙද්දි කාලා ඉන්න බැරි.

" බයවෙන්න එපා මං මේක දැනගත්තෙ ඔයාලා කවුරුවත් කියලා නෙමෙයි. ඒ වගේම තමයි මේක මං කාටවත් කියන්නෙත් නෑ."

මිස් එහෙම කියද්දි ඇඟට දැනුනෙ ලියුකේමියාව හැදිලා හොඳ උනා වගේ සනීපයක්. නැත්නං අපි කට්ටියටම ප්‍රින්ස්ගෙන් සම්පත ඇදෙනවා. මිස්ගෙ කතාව ඉවර වෙද්දිම අපි ලිස්සන බෝට්ටුවෙ හිටපු ආඳො ටික වගේ එතනින් කැපුනා.

අපි පන්තියට ගියත් ටෙස්ට් එක ඉවර උන නිසා ගුරුවරු ආවෙ නැහැ. අපි කට්ටිය පොඩි ජොලියක් දාන්න හිතං පුටුත් හරවගෙන ඉඳගත්තා.

" මං කාඩ් පැක් එකක් ගෙනාව මචං. ගහමුද ඕබියක් "

විහඟ ඒ ප්‍රශ්නෙ අහද්දි ඌ කැට කොළ ටික වෙන් කරලත් ඉවරයි. මිස්ලා එන එකකුත් නැති නිසා මමයි විහඟයි ෂෝටයි නිරෝධයි ඉඳගද්දි සාරංග පැක් එකේ හිස් පෙට්ටියත් අතේ තියාගෙන සුදානම් ශරීරෙන් හිටියෙ මිස් කෙනෙක් ආවොත් දුවන්න බලාගෙන. අපි සෙල්ලම් කරන කොට සාරංග හොරෙන් මහේෂාගෙ පර්ස් එකේ තිබිලා අරගත්තු ටිෂු පැකට් එකක් අර පෙට්ටිය ඇතුලට දාලා ඒක උඩදදා හිටියා.





මමයි විහඟයි දිනාගෙන එද්දිම නන්දනී මිස් කොහෙද ඉඳලා පාත් උනා.

"ඔතන පුටු හරවගෙන කට්ටිය මොකද කරන්නෙ ?"

මිස් එහෙම ඇහුවට එයාගෙ සාරි පොට දකිද්දිම අපි කාඩ් ටික හංගගෙන ඉවරයි.

" උඹලා කාඩ් ගැහුවා නේද මෙතන"

SLU

අවුරුදු විසිගානක් ගුරු සේවයේ ඉදපු නිසාද මන්දා මිස්ට පුදුම ඉවක් තිබුණෙ. එයා කාඩ්පැක් එක දෙන්න කිව්ව ගමන් සාරංග අතේ තිබුණ පෙට්ටිය දුන්නා. ජෝකර්ලා දෙන්නට අමතරව මූ තව කුණු ගොඩවල් ඒකට ඔබපු නිසා පෙට්ටිය තිබුනේ ටිකක් බරට. ලණුව කාපු මිස් ඒක ඇරලා බලන්නේ නැතුව අරන් ගියේ අපිට බැන බැන.

" මචං මිස් බූමුරංගෙ වගේ ගිය සැනින් ආපහු එයි. ඕං මං ගියා."

එහෙම කියලා සාරංග දිනුකගෙ අතිනුත් ඇදගෙන ආර්ට් ක්ලාස් පැත්තට ගියා. දැන් පංතියෙ හිටියට කොහොමත් කාඩ් ගැහිලි බොරු. අපෙත් කාඩ් කුඩු වෙනවා. අපිත් දොලහ වසර පැත්තෙ රවුමක් දම්මේ ටික දවසකින් නෙත්මිව දැක්කෙත් නැති නිසා. මට දැන් නෙත්මි ඇරෙන්න වෙන එල්ලෙන්න අත්තක් ඉතුරු වෙලත් නැනේ.



WWW.EXPRESSLANKA.TK 77

එදා ගෙදර ආපු ගමන්ම මම හංසිට කෝල් කලේ අපේ සචී දින්නා කියලා නිව්ස් එක දෙන්න. ඒත් ප්‍රින්සිපල් සර් උදේම ඒක එයාට කියලා. මමත් වීරයා වගේ මේ තුන් කුළුදුලේ හොට් හොට් නිව්ස් එක දෙන්න ගිහින් අන්තිමට කෝපි කඩේ අබිලින් වගේ නිකං කිව උනා.

SL-UNLIMITED . COM

සතියක් විතර ඇල් වතුරත් නිවලා බීපු ගානට ගෙවිලා ගියේ මෙලෝ රහක් නැතිව. බාල්දියක් පෙරලන්නේ නැතුව දවසක් ගෙවුනත් නිකං පාවනේ වගේ. ඇඟ පත වෙව්ලනවා.

අනිත් එක විභාගෙට තිබුනෙ මාස ගානක් නිසා රිවිෂන් ක්ලාස් දාලා සතියෙ දවස් දෙකක්ම පංති බඩගාන්නත් උනා. මේ මලකඩ ජීවන රටාව වෙනස් කලේ අපේ ප්‍රින්ස්. එයාටත් හැම වැඩේටම අපි නැතිව බෑ.

සර් අපි කට්ටියට කතා කරලා කිව්වෙ තව මාස දෙකකින් කලා උළෙල තියෙන නිසා පුළුවං වෙලාවට ඒකෙ වැඩත් බලන්න කියලා. විභාගෙ නිසා සම්පූර්ණ වගකීම අපිට පැටෙව්වෙ නැති උනාට අන්තිමට ඉතිං මුළු බරම අපේ කරපිට තමයි.

කලා උළෙල නිසා මට නෙත්මිව වෙනදට වඩා ළඟින් ආශ්‍රය කරන්න පුළුවන් උනා. අපි හිටියෙ කොමර්ස් වල උනාට සංගීතය පැත්තේ වැඩි බර දැරුවෙ අපියි. නෙත්මිටත් ලස්සනට සින්දු කියන්න පුළුවන් නිසා අපේ කණ්ඩායම් ගීත හැම එකකටම





එයත් හිටියා. දවසක් මං ටැප් එක ළඟ ඉඳලා යද්දි ෂෝටගෙ නංගි පවිත්‍රා ඇවිත් මාව නතර කලා.

" අයියෙ ඔයා අපේ චූටි අයියගෙ යාළුවෙක් නිසයි මං මේ අහන්නෙ. හැබැයි මුකුත් හිතන්න එපා."

" අහන්න නංගි ඕන දෙයක්. මං මුකුත් හිතන්නෙ නෑ."

කෙල්ලත් නිකටට අත තියාගෙන බිම බලාගෙන අර හැට හතරෙන් එකක් දාලා ආයෙත් කතාව පටන් ගත්තා.

" අයියගෙ හිතේ නෙත්මි ගැන මොනව හරි අදහසක් තියෙනවාද?"

මෙයා ඔළුව වටේ අතදාද්දි මට හිතුනා අන්තිමට එන්නෙ නහය ළඟට කියලා. ඒත් නෙත්මිව මතක් කරපු ගමන් මාව ටිකක් අප්සෙට් ගියා.

" එහෙම මුකුත් නෑ නංගි. ඇයි ඔයා එහෙම අහන්නෙ."

" නෑ, අයියා පහුගිය ටිකේම එයා එක්ක හිටපු නිසා මං ඇහුවේ. එහෙම අදහසක් නැත්නම් කමක් නෑ අයියෙ. මං යනවා"

මට වචනයක්වත් කියන්න නොදී ඒකි කොණ්ඩ කරල් දෙකත් ගස්සලා දාලා දිව්වා. නෙත්මි මෙයා එක්ක මං ගැන මොනවා හරි කියලා ඇති. එයා ගැන අදහසක් තියෙනවා කියලා



WWW.EXPRESSLANKA.TK 78

කිව්වනම් ස්ටෝරිය අහගන්න තිබුණා. ඒත් මං නෙත්මිට කැමතියි කියලා මේ කොහේවත් යන ඇඹිට්ටිල්ලන් ඇවේකට කියලා වැඩක් තියෙනවද?

අපි ඉස්කොලේ ගිය දවස් තුනේ වැඩිපුරම හිටියෙ සංගීත කාමරේ. අපේ ඒලෙවල් පංති සේරම පාළුවට ගිය අම්බලන් වගේ වෙලා. අචිනියි සචිනියි සුපුරුදු විදියට කලා උළෙලෙ ප්‍රැක්ටිස් කියලා කකුල් දෙකටම ජීන්ස් දෙකකුත් ඇඳලා උඩ පැන පැන හිටියා. ඒ නිසා මට නිරෝධගෙ අයිඩියා එක තාම සචීට කියාගන්න වෙලාවක් ආවෙ නෑ. හැබැයි ඒ අතරෙ නෙත්මි දවසින් දවස මගේ හිතට ගොඩක් ළං උනා.

දවසක් මං සංගීත කාමරේ පැත්තට යද්දි නෙත්මි තනියම පැදුරක් උඩ වාඩිවෙලා වයලින් එක ප්ලේ කරනවා. ඒකෙ එක කොනක් නිකටට තද කරගෙන අනිත් අතින් තාලෙට බෝ එක හසුරවද්දි පිට උනේ මහා දුක හිතෙන මියුසික් එකක්. කෙල්ල දිගටම ප්ලේ කලේ මාව දැක්කෙ නැති නිසා. හැබැයි කෙල්ල හිටපු ඉරියව්ව නම් එළම කිරි. මෙතන මේ හේෂාන් රන්දුල වික්‍රමබාහු වෙනුවට ලියනාඩෝ ඩාවින්චි එහෙම හිටියනම් මේකිව චිත්‍රයට නගනවා. ආයේ ඒක අහන්න දෙයක් නෑ. කෙල්ලට තනියම ඉන්න ඇරලා මං හැරිලා අපේ පංතියට ආවා. එද්දි සචිනි පන්තියෙ. අදනං මගේ සිකුරා උච්ච වෙලාද කොහෙද? මං හීමිට කොලයක් කඩාගෙන නිසදැසක් ලිව්වා. ඒ අතරෙ සචිනි හැරි හැරී මගේ දිහා බලනවා දැක්කත් ඒකි මට ඩිස්ටර්බ් කලේ නෑ.

" නිවි නිවී දිලිසෙනා නෙතු තාරකා යුවල
මොනවදෝ හෙමි හෙමින් කියනවා..."





ලා රෝස පැහැ ගැහුණු ඔබේ ඔය දෙකම්මුල්
දුටුව විට මගේ හිත සැලෙනවා...

ඇසෙන නෑසෙන හඬින් මුමුණනා වදන් වැල්
මා හදේ රැව් දිදී ඇසෙනවා...

පුංචි කුමරියෙ කිමද හොර ඇහින් බලන්නේ
සත්තකයි ආදරේ හිතෙනවා........"

නෙත්මි ගැන ලියනවා කියලා හිතාගෙන පංතියට ආවත් අන්තිමට ලියලා ඉවරවෙනකල්ම මගේ හිතේ හිටියෙ සචිනි. එයා හොරෙන් බලනවා දැකපු නිසා තමයි මං අන්තිම පේළියට ඒ වගේ දෙයක් ලිව්වේ. මං ලියලා කොලේ නමන්න හද්දිම පිටිපස්සෙන් ආපු සචිනි ඒක අතට ගත්තා. උදුරලා ගන්න මුලදි හිතුනත් මං ඒකිට කියවන්න ඇරලා බලන් හිටියා.

" හරි ලස්සනයි රන්දු. කාටද මේක ලිව්වෙ ?"

මහා අමුතු බැල්මක් මගේ දිහාට දාලා සචිනි ඇහුවෙ කණට ඇහෙන්නෙ නැති ගානට. මං ඕක කාට ලිව්වත් මෙයාට මොකද?

" මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්ට"

SLU

එහෙම කිව්වට ඉතිං මගේ ඔය කියන ගර්ල් ෆ්‍රෙන්ඩ් කවුද කියලා මං දන්නෙත් නෑ. හැබැයි සචීගෙ මූණ නං නිකං හුලං ගිය



WWW.EXPRESSLANKA.TK 79

බැලුමක් වගේ උනා. මගේ අතට කොලේ දීපු කෙල්ල වෙන වචනයක්වත් කිව්වෙ නැතුව හැරිලා යන්න ගියා. මුං නටල නටලාමද දන්නෙත් නෑ අඩිය තියන්නෙත් තාලෙට. සචී කොරිඩෝ එකේ පේන්නෙ නැති වෙනකල්ම මං බලාගෙන හිටියෙ ලොකු ආදරේකින්. ඒත් මේ සුන්දර වස්තුව මගේ යාළුවගේ නේද කියලා හිතට දැනෙද්දි තමයි වාවන්නෙ නැත්තේ.

" මොකද බං අහස පොළව ගැටගහන්න වගේ කල්පනා කරන්නෙ? මොකක් හරි අවුලක්ද?"

සචී ගියා විතරයි අනිත් පැත්තෙන් පන්තියට ආවේ නිරෝධ.

" අපරාදෙ බං උඹට තව ටිකක් කලින් එන්න තිබුණෙ. සචී පංතියෙ තනියම ඉඳලා දැනුයි එළියට ගියේ."

"නැහ්....... බලපං මං නැටුම් ශාලාවෙයි අරහෙයි මෙහෙයි හැමතැනම ඒකිව හෙව්වා මේච්චර වෙලා."

මූ තාම සචීට ට්‍රයි කරන එක නතර කරලා නෑ වගේ.

" රන්දූ උඹට බැරිද මේ ලෙටර් එක සචීට අද ඉස්කෝලෙ ඇරෙන්න කලින් දෙන්න."

මූත් මාව ලෝක අමාරුවක දාන්න හදන්නෙ. කෙල්ලගෙන් මට ගුටි කන්න වෙයිද දන්නෙත් නෑ.





" මොකද ඕක අදම දෙන්න හදිස්සි. මෙච්චර මාස ගාණක් ඉවසුවා වගේ තව දවසක් ඉවසපං"

" මට දැන් ඉවසලා ඇතිවෙලා බං තියෙන්නෙ. මේකෙ දෙකෙන් එකක් ඉවර කරගන්න ඕනේ."

මූට තියෙන තදියමට කෙල්ලො දාගන්න බෑ. උන් කැමති උනත් කියන එකක්යැ. පස්මහ බැලුම් වලිනුත් පාට පහම මැච් උනොත් විතරයි හා කියන්නෙ. නිරෝධ බලෙන්ම වගේ ලියුම මගේ කමිස සාක්කුවට දැම්මා. ඒකෙන් ආවේ අමුතු සෙන්ට් සුවඳක් වගේ එකක්. මූත් වෙලාවකට දෙකේ පංතියෙ වැඩ කරන්නෙ.

අපි දෙන්නා ආර්ට් ක්ලාස් එක පැත්තට යද්දි නෙත්මිලගෙ පංතියෙ දොර ගාව ළමයි පිරිලා. උන්ගෙ මූණු වලින් එකයි හිනාව. සමහරවිට පන්තියෙ මිස්ට බීන් වත් පෙන්නවද දන්නෙ නැහැ. අපිත් ටිකක් කිට්ටු වෙලා බැලුවා. උන් හිනාවෙන්නෙ දොරේ අලවලා තිබුණ කොලයක් දිහා බලාගෙන.ඒක අතින් ඇඳපු මරණ දැන්වීමක්.

අනිච්චාවත සංඛාරා කියලා කළුපාට මාකර් පෙන් එකකින් ලියලා ඊට යටින් එකේ පංතියෙ ළමයි මගේ අම්මා කියලා අඳින චිත්‍ර ජාතියෙ ඇටකෝටු බබෙක් ඇඳලා තිබුණා. හැබැයි ලොකු අකුරෙන් ලියලා තිබුණ නම දකිද්දි මට පොඩි පුරුදු ගතියක් දැනුනා. " දූෂානි සංජුලා මොරගොඩ" රා ...... යිට් ඒ මං අර උතුර දකුණ මාරුකරගෙන කොමර්ස් වලට දාපු බැරල් බාගෙ. කෙටියෙන් කියනවා නං නෙත්මිගෙ යාළුවා. මමත් ඉතිං සීන් කෝන් එක බලාගන්න මුළු කොලේම කියවගෙන ගියා.



WWW.EXPRESSLANKA.TK 80

දූෂානි සංජුලා මොරගොඩ මෙනවිය අද උදෑසන සප්ත ස්වරය ගායනය කරමින් සිටියදී " රි" ගිලී මරණයට පත්විය. ඇගේ අවසන් කටයුතු යථා කාලයේදී සෙන්ට්‍රල් භූමියේ පැවැත්වීමට නියමිතය.

මෙයට ශෝකයට පත් ස්වාමිපුරුෂයන් හා දරු දූසිම.

ෂා.. ආතල් කිතල් නිව්ස් එකක්. හැබැයි සප්ත ස්වරයේ අකුරු හතක්ම තියෙද්දි මේකි මොන ඉලව්වකට " රි " ම ගිල්ලද කියන එකයි ප්‍රශ්නෙ. මොනවා උනත් සිරා දැන්වීම. ඕක ප්‍රින්ස් හරි කරදර හරි දක්කනං ඉතිං දෙයියන්ගෙ පිහිටයි. අපි කොරිඩෝ එක දිගේ යද්දි සාරංග කැන්ටින් එක පැත්තෙ ඉඳලා විසිල් පාරක් ගැහුවා.

"මචං උඹලා දොලහ වසර පැත්තෙ ගියාද?"

" ඔව් බං, මේ ඒ පැත්තෙ ඉඳලා එන ගමන්"

"දැක්කද අර මරණ දැන්වීම"

ඒ කියන්නෙ ඒක මූං ටිකත් දැකලා වගේ.

" දැක්කා දැක්කා ෆුල් කොලිටි. හැබැයි දූෂානි ඒක දැක්කනං ලියපු එකාව මස් කරනවා."

" ඒකි කොහේද බං අපිව මස් කරන්නෙ. ඒවා හඳේ. කෙල්ල උදේ මියුසික් රූම් එකේ ඉද්දි කැස්සක් හැදිලා. අන්න පපුව අල්ලගෙන තාම කහිනවා."





ඒ කියන්නෙ පෝස්ටර් ගහපු කලාබර අපේ සාරංගයා. හැබැයි ඉතිං කෙල්ල පව් කියලා මට හිතුනා.

SL-UNLIMITED . COM

දවසක් අපි කට්ටිය නුගේගොඩ සෙට් වෙද්දි ෂෝටා ටිකක් පරක්කු වෙලා ආවේ. හැබැයි පොඩි එකා හිටියෙ සැහෙන හිතේ අමාරුවකින් කියලා මට තේරුණා.

" ඇයි බං උඹේ ඩයල් එක අප්සට්"

" අප්සෙට් යන්නැද්ද බං මේ වගේ කාලකන්ණි හැත්තවල් එක්ක. අම්මපා මට ඕකව තනියම හම්බ උනානම් දෙනවා පැණි බේරෙන්න."

පොරට නහුතෙටම නැගලා වගේ. කාටදෝ මන්දා ගුටි පූජාවක් තියන්නයි මූගේ ලෑස්තිය. පොඩි උනාට හරිම සැරයි ගම්මිරිස් ඇටේ කියන්නෙ නිකමටයැ.

" ඉස්සෙල්ලා කියපං බලන්න උඹ ඔය සද්ද පූජාව දාන්නෙ කාටද කියලා."

" ඒක හෙට කියන්නම්. පුළුවන්නං හෙට ක්ලාස් ඇරිලා පොඩි ගේමකට බහින්න බලාගෙන වරෙන්."

" ක්ලාස් අරින්නෙම පහටනෙ බං."



WWW.EXPRESSLANKA.TK 81

මං කිව්වෙ මූගේ ගේම දෙන්නෙ කීයටද කියලා හිතාගන්න බැරුව. කෙල්ලො හතර දෙනාව රෑ වෙනකල් තියාගන්නත් බැනෙ.

" ඒක තමයි කිව්වේ පරක්කු වෙන නිසා කියලා වරෙං කියලා. අපේ ගෙදර පිරිතක් තියෙනවා ඒකට එනවා කියලා වරෙන්. මේක නයිට් මිෂන් එකක්."

මේක නං කාලා යන වැඩක්ද, ඔතං යන වැඩක්ද මන්දා. හැබැයි ඉතිං ෂුවර් එකටම ඇදගෙන නාන වැඩක්.

" මේකයි සාරාංශය. හෙට උඹලට මගේ ගානෙ ඩිනර් එක. රෑට ගෙදර යන්න පුළුවං. "

SLU

" ෂුවර්ද"

මං ඇහුවේ ඇත්තටම ෂුවර් නැති නිසා.ගෙදර යන්න පුළුවන්ද, පොලීසියට යන්න පුළුවන්ද මන්දා. හැබැයි ඩිනර් එක කියලා ඇහුනා විතරයි විහඟ ඕකේ මචා.....ං කියලත් ඉවරයි.

* * * * * * *

ෂෝටගේ අන්ඩර් වර්ල්ඩ් ඩිනර් එකට රෙඩි වෙලා අපි පහවෙනිදා හවස බෝ ගහ ළඟට සෙට් උනා. අපේ නංගිලා ටික නං ගෙදර ගිහිං ඩිනර් එක ගන්නං කියලා කැපුනෙ ඕවා කාලා දිරවයිද කියලා ෂුවර් නැති නිසා වෙන්න ඇති.

" දැන් කොහෙද ඔය ඩිනර් එක තියෙන්නෙ බං. හිල්ටන්, ගලදාරි, ටාජ් සමුද්‍රා"





විහඟ තරු පහේ හෝටල් පේලියක නම් කියං ගියා. මේ ෂෝටා කොහෙන්ද අපිට ඕවගෙන් ඩිනර් දෙන්නෙ. විහඟත් මඤ්ඤං කතා තමයි අහන්නෙ.

" මං බැන්ද දවසක ඕවායෙන් එකක දෙන්නං. අද තියෙන්නෙ සයිවර් පාටියක්"

ඒ කියන්නෙ අපිට හිල්ටන් එකෙන් කන්න කාලාන්තරයක් බලං ඉන්න වෙනවා. මොකද මූ බඳින්න කලින් ලොකු වෙන්න එපැයි. අද තියන පරිප්පු සුප අනුභව කරන්න හිතාගෙන අපි හයට විතර බස් එකේ නැග්ගා.

" කොහෙටද බං මේ යන්නෙ. හැබැයි මොන මගුල කරත් පරක්කු වෙන්නෙ නැතුව ගෙදර යන්න ඕනෙ. නැත්තං අපේ තාත්තත් වැන් එක අරං උඹලගේ පිරිත් ගෙදර එයි අපිව හොයන්න. "

මං කිව්වෙ අපේ තාත්තා රෑට එන්නද කියලා දෙපාරක්ම අහපු නිසා. මූ මොන තුත්තුකුඩියක අපිව ගෙනියනවද මන්දා.

" මරදානේ සයිවර් හෝටලේකට යන්නෙ. උඹලට තියෙන්නෙ ඕන තරම් දේවල් කාලා මං පෙන්නන තැනට වෙලා ඉන්න විතරයි."

ඒ කියන්නෙ අපිට තියෙන්නෙ බොහොම ප්‍රණීත රංගනයක්. අපි ආරාධිත නළුවන් විදියට අයින් උනාම මේන් කැරැක්ටර් එක ගෙනියන්න ෂෝටා. ඌ බස් එකේ මරදානෙට එනකල් සීන් එක විස්තර කලා.



WWW.EXPRESSLANKA.TK 82

" මං පෙරෙයිදා හවස පුංචිලගෙ වැඩකට මරදානට ගියා. එන ගමන් ඔය කියන කඩේට ගිහින් සිගරට් එකක් ඉල්ලුවම මූ මුළු කඩේටම ඇහෙන්න මට බැන්නනේ බං."

" නෑ, පොර මොනවා කියලද බැන්නේ"

" පොඩි එවුන්ට සිගරට් විකුණලා ඌත් අමාරුවෙ වැටෙනවලු. අවුරුදු දොලහක් දහතුනක් යද්දි අපිට අං එනවලු."

ෂෝටා ඒක කියද්දි සාරංග ඌගේ ඔළුව දෙපැත්ත අතගාලා බැලුවෙ ඇත්තටම අං එනවද බලන්න වගේ. හැබැයි කඩේ මුදලාලියා මූව අවුරුදු දොලහක දහතුනක එකෙක් විදියට දැක්ක එකට තමයි මූගේ මල මුහුදටම පනින්න ඇත්තේ.

" ඉතිං.. ඉතිං.... ඊට පස්සෙ.."

" මං දෙන්නං හොඳ ගේමක් කියලා වැඩිය මූණ පෙන්නන්නෙ නැතුව එතනින් කැපුනා."

" ඊට පස්සෙ ඊයේ උදේ පංති යන්න එන ගමන් මං වේලාසන ඔය කඩේට ගිහින් ස්ට්‍රක්චර් එක බලන් ආවා. අවුලක් නෑ මට තනියම ගේම දෙන්න පුළුවං."

මරදානෙන් බැස්සට පස්සෙ ෂෝටා අපිට ඇවිත් ඉන්න කියලා තැනක් පෙන්නුවා. ගේම ඉවරවෙලා ඌ කඩේ පිටිපස්සෙන් එන විදියත් වෙනම පැත්තකින් පෙන්නලා අපිවත්





ඇදගෙන ගියා. ඔය කියපු කඩේ එකකට එකක් හේත්තු කරපු කඩ පේළියක තිබුණ ටිකක් ලොකු එකක්. ඕක පිටිපස්සෙන් එන්නේ කොහොමද කියලා ඇහුවම ඌ ඒ ටිකත් අපිට රහසින් කියලා කඩේ ඇතුළට ගියා. ඇතුල් වෙද්දි මං නිකමට වගේ ඔය කියන මුදලාලි දිහා බලද්දි මට තේරුණා ඌ ෂෝටා කිව්වා වගේ මරුමෝස් ඩයල් එකක් කියලා. අපි යද්දිත් කඩේ සෑහෙන සෙනඟක් හිටියා. අපි හය දෙනාම එක ටේබල් එකකට සෙට් වෙලා පරාටා, මස්හොදි, ගෝදම්බ රොටි සේරම ඕඩර් කලා.

වේටර්කාරයත් අපරාදේ කියන්න බෑ හොඳ සර්විස් එකක් දුන්නෙ අන්තිමට පොඩි සමිතිං එකක් ටිප් එක වදින නිසා වෙන්න ඇති. අපිත් සාරංගගෙ නුවර අන්කල්ගෙ වත්ත ගැන කතා කර කර තදයො ටික වගේ ගිලගෙන ගියා. නිකං හම්බවෙනවානං දෙමළ පත්තරේ උනාම මොකද කියලා අපිත් ඉස්මුරුත්තාවට එනකල්ම ගිල්ලා.

" මචං අපිට පරක්කු වෙනවා උඹලා මේකත් දාලා බිල ගෙවපං"

කියලා සාරංග වේටර්ට පේන්න ෂෝටගෙ අතට රුපියල් දාහක් දීලා දිනුකයි නිරෝධයි එක්ක එළියට ගියා. දැන් අපේ මිෂන් එක ස්ටෙප් බයි ස්ටෙප් ක්‍රියාත්මක වෙනවා. ඔය රුපියල් දාහ ෂෝටා බස් එකේදී සාරංග අතට දීපු එකක් කියලා මේ මෝඩ වේටර් දන්නෙ කොහොමද?ඊට පස්සෙ තිබුනෙ දෙවෙනි පියවර. අපි දොර දිහා බලන් හිටියෙ කවුරු හරි හොඳ වැදගත් පෙනුමක් තියෙන ජෙන්ටා බුවෙක් එනකල්. විනාඩි පහක් විතර



WWW.EXPRESSLANKA.TK 83

බලන් හිටියට ආපු එකෙක්වත් අපේ වැඩේට මැච් උනේ නෑ. හැබැයි උත්සාහවන්තයා ඇන ගනී කියනවා වගේ අන්තිමට ආවා අන්කල් කෙනෙක් සිරා ලුක් එකක් තියෙන.

" ආ...අන්කල් කොහොමද ඉතිං එන්න මෙතනින් ඉඳගන්න."

ෂෝටගෙ කෑ ගැහිල්ලට පොර අන්දුන් කුන්දුන් වෙලා බලාගෙන ඉඳලා අන්තිමට ඇවිත් අපි ළඟින් ඉඳගත්තා.

" අපේ තාත්තා නිතරම කියනවා අන්කල්ව දැක්කෙ නෑ ගොඩ දවසකින් කියලා."

මූ කියන සේරම කියන්නෙ වට පිට මිනිස්සුන්ටත් ඇහෙන්න. එතකොට උන් සේරම හිතන්නෙ අපි අන්කල්ව දන්නවා කියලනෙ. අන්කල් කාරයා ෂෝටා දිහා බලාගෙන මූදේ වතුර තීන්ත උනොත් පුරවන්න පෑන් බට කොච්චර ඕනවෙයිද ගානට කල්පනාව.

" සොරි පුතා මට ඔයාව මතක නෑනෙ."

" අන්කල් මිස්ටර් පෙරේරා නේද?"

ලංකාවේ මිනිස්සු දහයක් ගත්තොත් ඒ අතරෙ මිස්ටර් පෙරේරලා දෙතුන් දෙනෙක් හරි ඉන්න නිසා ෂෝටා ඇහුවා.

" නෑ පුතා මගේ සර්නේම් එක සිල්වා"





අපි කතාව අතරෙ ඉතුරු වෙලා තිබුණ පරාටා ටිකත් ගිලලා දැම්මෙ ඒවට හුලං වැදිලා නාස්තිවෙන නිසා.

" එතකොට අන්කල්ගෙ ගෙවල් කොහෙද?"

හෙමීට හෙමීට ෂෝටගෙ සවුන්ඩ් එක බාල වෙනවා. අන්කලුත් බර කතාව. ෂෝටා අහනවා පන්සල කිට්ටුවද, ඉස්කෝලෙ පහු කරන් යන්න ඕනද වගේ රටේ නැති දේවල්. අන්කල් හිතන්න මූ හැම පැත්තක් ගැනම දන්නවා කියලා. මූ ඔය පොදු ස්ථාන ගැන කියලා අහන්නෙ ලංකාවේ හැම ගමකම වගේ පන්සලක්, ඉස්කෝලයක් තියෙන නිසා මිසක් දැනගෙන නෙමෙයි.

" මචං උඹ ගාව බිල ගෙවන්න සල්ලි ඇතිද ?"

" හිටපං බලන්න"

SLU

එහෙම කියලා මූ වේටර්ට කිව්වා අපේ බිල හදලා කියන්න කියලා.

" මහත්තයලා තව මොනවා හරි ගන්නවද ? දැනට එක්දාස් තුන්සිය හැටයි."

බුදු කිරි අප්පච්චියේ! මට කලන්තෙ වගේ ආවත් උඩ ෆැන් එක තිබුණ නිසා බේරුණා. මූ බිල හදලා තියෙන්නෙ අන්කල් කාපුවත් එක්කද නැත්තං අපි එච්චර කෑවද කියලා මට හිතාගන්න බැරුව ගියා.



WWW.EXPRESSLANKA.TK 84

" මචං මේකත් දාලා ගෙවපං. අපේ තාත්තා ඔෆ් වෙන්න කලින් හන්දියට ගියෙ නැත්තං බස් එකේ තමයි යන්න වෙන්නෙ."

වේටර්ගෙ කණ අස්සෙන් නයි පැටියෙක් අරින ගමන් මං ෂෝටට රුපියල් පන්සීයක් දීලා නැගිට්ටා. මූ මට පොඩ්ඩක් ඉන්න කියලා අනතිමට ඕඩර් කරපු ප්ලේට් එකේ තිබුණ බිත්තර රොටි හත අටකුත් ඒෆෝ කොලේක ඔතලා දුන්නා මේසෙට යටින් අත දාලා. මමයි විහඟයි වේටර්ට වගේම මුදලාලිටත් ජේන්න අර අන්කල්ට බායි කියලා ආවේ ෂෝටගෙ අන්තිම පියවර සාර්ථක වෙන්න ඒකත් වැදගත් නිසා. අපි දෙන්නත් දොරෙන් එළියට යද්දි මුදලාලි ඉස්සිලා අපේ මේසේ දිහා බැලුවේ තව කවුද ඉතුරු බලන්න වගේ. අපේ පොඩි එකා අන්කල් එක්ක කියව කියව තවත් මොනවද කනවා. අපි හෙමීට පාරට බැහැලා සාරංගලා හිටපු තැනට එද්දි හතර වටේ හොඳටම කළුවර වැටිලා. දැන් ඉතිං ෂෝටව කතරගම දෙයියන්ට බාර කරලා ඌ එනකල් බලන් ඉන්න එක තමයි අපිට තිබුණේ.

" ඇයි බං උඹලා පරක්කු වුණේ. අපි හිතුවා සීන් එක දෙල් වෙලා කියලා."

" තාමනං දෙල් උනේ නෑ. දෙල් කර ගත්තොත් ඉතිං අරූ තමයි."

ෂෝටා එනවා කියපු පිටිපස්සෙ පාර පැත්ත බලාගෙන අපි හිටියෙ ත්‍රී විල් එකක් ළඟට කිට්ටු වෙලා. ඇයි ඉතිං අරූ බාල්දියක් පෙරල ගත්තතොත් පැන ගන්න බලන් ඉන්න එපැයි.





ඒත් එක ත්‍රීවිල් එකක හයදෙනා හෙවත් අපි පහමාර එක්කං යන්න මූ කැමති වෙයිද මන්දා.

විනාඩි දහයක් විතර යද්දි ෂෝටා අර පාර දිගේ පණ කඩාගෙන දුවගෙන එනවා හරියට ගොනෙක් අහින් පස්සෙන් එළවනවා වගේ. කමින් කලර් නෝ ගුඩ් කියලා අපි පස්දෙනාම හිරවෙලා එතන තිබුණ ත්‍රීවිල් එකට නැග්ගෙ ෂෝටා නැග්ග ගමන් යන්න බලාගෙන.

SLU

"මල්ලි ලෝඩ් එක වැඩියිනෙ"

ත්‍රීවිල් කාරයා මගුලක් කතා කරනවා. මෙච්චර නහය ළඟට වෙනකල් ගිලලා ගිලලා කොහොමද මේ බඩ උස්සගෙන දුවන්නෙ. දැන් ඉතිං මූගේ පිහිට තමයි.

" අයියෙ ඩබල් ගෙවන්නං ඉක්මනට යං"

ෂෝටා ළඟට එද්දි ඌවත් අතින් ඇදලා ඇතුළට දාගෙන මං කිව්වා විතරයි මූත් කොහෙටද යන්න ඕනෙ කියලා අහන්නෙත් නැතුවම හයියෙන් එළවගෙන ගියා.

" හෝව් හෝව් අයියෙ, ඔතනින් දාන්න."

එහෙම කියලා අපි සෙට් එක ඇස් වාට්ටුව ළඟින් බැස්සෙ නැත්තං කාපූ බිලට හරියන්න ඒ ගාන ත්‍රීවිල් එකට ගෙවන්න වෙන නිසා.



WWW.EXPRESSLANKA.TK 85

මොනවා උනත් ත්‍රීවිල්කාරයා හිත හොඳ එකා. ඌ රුපියල් සීයක් ඉල්ලද්දි අපි අතුරු ප්‍රශ්න නැතුව ඒ ගාන ගෙවලා වවුන් හෝල් එක පැත්තට පයින් ආවා. ලයිට් එළියට අපි දැක්කා ෂෝටගෙ කකුල්වල දණිස්සට එනකල්ම මඩ. ඒ මදිවට ඔළුවෙ මකුළු දැල් පිරිලා.

" මොකක්ද බං උඹේ ළඟින් එන මඩ පුවක් ගඳ"

" පලයං ඩෝ යන්න. මං මේ තරම් සීරාවට ගේම ෆිනිෂ් කරාට පස්සෙ උඹලා එනවා ගඳක් ගැන කතා කරන්න."

" ඔය තරම් සිරාවට ෆිනිෂ් කරා නං උඹ මොකද මෙලෝ සිහියක් නැතුව දුවං ආවේ."

මේකා පස්සවත් බලන්නෙ නැතුව හැටට හැටේ ආපු හැටි මතක් වෙද්දිත් හිනා යනවා.

" උඹලා දෙන්නත් ගියාට පස්සෙ මං බිල ගෙන්න කිව්වා. අන්කලුත් ටේබල් එකේ හිටිය නිසා මං බිල ගෙවන්න කලින් වේටර්ගෙන් ඇහුවා ටොයිලට් එක කොහෙද තියෙන්නෙ කියලා."

මූ සිරාවට බිල ගෙවන්න හිටිය ගානට බ්‍රහ්ම ටෝකක් දුන්නේ. ඒත් අපි උදුල්ල දාන්නෙ නැතුව ඌට අදහස් ප්‍රකාශ කරන්න ඉඩ දුන්නා.

" මං ඊයේ උදෙත් ඔය ටොයිලට් එකට ගිහින් ජනේලෙ සයිස් එක බලාගෙනනෙ ආවේ. හැබැයි ඒ ජනේලෙ හරහට





ඇතුලෙන් පොඩි ඉස්කුරුප්පු ඇණ දෙකක් දාලා ලී පටියක් අල්ලලා තිබුණේ.

මං ඇතුලට ගිහින් දොර වහපු ගමන් ඇණ දෙක ගලෝල ලී පටිය අරන් සින්ක් එක උඩින් තියලා ජනේලෙ ඇරලා එළියට පැන්නා. ජනේලෙනං යාංතං මගේ ඇඟ රිංගවන්න පුළුවං ගානට තිබුණට මං පැන්නෙ මඩ ගොඩකට බං. එතන මුඩුක්කුගෙවල් පේළියක්. උන් කෑ ගහන්න ගත්තු නිසා තමයි මෙලෝ සිහියක් නැතුව මං දුවගෙන ආවේ."

ෂෝටා පත්තරේ විස්තරේ කියලා ඉවර වෙද්දි මගේ හිතට ආවේ වෙනම ප්‍රශ්නයක්.

" උඹ කොහොමද ලී පටියෙ තිබුණ ඉස්කුරුප්පු ඇණ ගැලෙව්වෙ"

" මේ ෂෝටා ගාව බඩු හැව් මල්ලි."

SLU

එහෙම කියලා ඌ සාක්කුවෙන් එළියට ගත්ත ස්ක්රූප් නියනක් පෙන්නුවෙ තුරුම්පු ආසියා පෙන්නවා වගේ. මූව නං අදහන්න වටිනවා. මේ දවස් දෙකම ඌ කල්පනා කරන්න ඇත්තෙ ඔය ගේම ගැන වෙන්න ඇති. අර හෝටල්කාරයගෙ දවසේ ලාභය අනුභව කරලා අපි යංතං අටහමාර විතර වෙද්දි ගෙදර ආවා.

" ආ.... පිරිතට ගිය අය මොකද මේ වෙලාසනම ඇවිත්"



WWW.EXPRESSLANKA.TK 86

අක්කට මං පරක්කු උනත් වැරදියි. වේලාසන ආවත් වැරදියි. එයාගෙ කම්මුලකුත් මිරිකලා මම සාලෙට යද්දි මෙන්න බොලේ හංසි අපේ සාලේ බැබළි බැබළි වීවි බලනවා. කොණ්ඩෙත් කඩලා දාලා නෝමල් ගවුමක් ඇදලා හිටපු කෙල්ල අද රෑ අපේ ගෙදර තමයි කියලා මට දකිද්දිම හිතුනා.

" පොඩි පුතා ටිකක් පිරිත් අහලා එන්න තිබුණනෙ. තාත්තා ඒත් කිව්වා රෑ උනොත් ඔයාව එක්කං එන්න යනවා කියලා."

අනේ වාසනාවන්! මේ රන්දූ යංතං බේරුණා. අම්මා තාත්තව ෂෝටගෙ ගෙදර ඇරියනං මං ආපහු ගෙදර එනවා බොරු. එහෙනං අම්මගෙ පොඩි පුතාට වෙන බෝඩිමක් හොයාගන්න වෙනවා. නැත්තං රෑ එළිවෙනකල් අපේ තාත්තගෙ මහ පිරිත අහන්න වෙනවා. පොඩි කාලේ ඉඳලා අඳුරන නිසා මුංගෙ ගෙවල් අම්මලා දන්න එකත් වෙලාවකට මහම මහා වදයක්.

මං ඇඟ සෝදලා සරමට බැහැලා ඉවරවෙලා බෑග් එක අරිද්දියි දැකකෙ ෂෝටා ඔතලා දීපු බිත්තර රොටි ටික. අපේ අක්කත් ඕවා කන්න මහ පෙරේති. මං ඒක කොලේ පිටින්ම අරන් ගිහින් සාලේ හිටපු අක්කා අතට දුන්නා.

" ආනේ මල්ලි.... තැන්ක්ස්! ඔයාට මාව මතක් උනා එහෙනං"

අක්කා ටැංකිය බාල්දියකට දාලා දුන්නෙ ඔය ඒක එයාටම ගෙනාවා කියලා හිතලයි. ඔහොම යං අක්කෙ. ඔහොම යං.





" ඔව් අපි එද්දි තේ බොන්න කඩේකට ගියා. එතන උණු උණු රොටි දානවා. මට ඉතිං ඔයාව මතක් වෙලා ගෙනාවා."

අම්මපා මං කොයිවෙලාවෙ හරි මේ දෙසාබාන බේගල් වලට හිටගෙන අපායෙ යනවා. අක්කා නිකමට වත් ඇහුවෙ නැහැ ඇයි ඒක ඒෆෝ එකක ඔතලා තියෙන්නෙ කියලා. එයාව අන්දන්න ඕනෙ නැහැ. රෙද්ද අතට දුන්නම එයාම කපලා මහලා තනියම ඇඳගන්නවා. හරි ෂෝක්.

හැබැයි හංසිගෙ ලුක් එකනං මට ඇල්ලුවෙ නෑ. එයාට වැඩේ නෝන්ඩිද මන්ද. අපි දෙන මර්සි ගේම් ගැන එයත් ලාවට දන්නවනෙ.

SLU

" පොඩි පුතා ඔයාට බත් බෙදන්නද?"

පිස්සු පීකුදු කතා තමයි අපේ අම්මත් අහන්නෙ. මේ වෙද්දි මගේ ඇගේ හැම නහරකම දිව්වේ ලේ නෙමෙයි. පරාටයි බිත්තර රොටි කෑලියි. සල්ලි දීලා කද්දි නිකං රොටි ගිල්ලට පිනට හම්බඋන නිසා කැවෙම බිත්තර රොටි. ඒ මදිවට අම්මා බත් බෙදන්න අහනවා. ඇයි දෙයියනේ මනුස්සයෙක්ට කනවා කියලා ඔච්චරම කන්න පුළුවන්ද?

" එපා අම්මා අපි ෂෝටගෙ ගෙදරින් කාලා ආවේ."

මං හිමීට මාරු උනේ අම්මා කෑම ගැන තව මොනවහරි අහයි කියලා. ඇහුවොත් ඉතිං කියන්න තියෙන්නේ අති විශිෂ්ටයි



WWW.EXPRESSLANKA.TK 87

සර් කියලා තමයි. මං හංසි එක්ක වචන දෙක තුනක් කතා කරලා ඇඳට පැන්නෙ මේ ඉස්මුරුත්තාව තියාගෙන පාඩං කරන්න බැරි නිසා.

* * * * * * *





Scanned for
SL-Unlimited.com
by Sheree

# 07

මං උදේ නැගිට්ටිද්දි වෙනදට වඩා ගෙදර සද්දෙ වැඩියි. ඒ අස්සෙ අපේ තාත්තගෙ වොයිස් එකත් ඇහෙනවා. එයා අද මොකද ගෙදර කියලා හිතලා කැලැන්ඩරේ බලද්දි අද දිනේ වටේට කහ මදයක් ඇඳලා. එහෙනං අද පෝය. අපේ වැඩ කරන ජනතාව ගෙදර නිසා වෙන්න ඇති ඔය සද්ද පූජාව. ඊයේ ආපු හංසිත් තාම ගිහින් නැති පාටයි. මමත් ඇලි මැලි ලැලි කැලි ඔක්කොම කඩලා සාලෙට ආවා.

" පොඩි පුතා ආ ඔයාගෙ තේ එක"

අම්මා තේ එක මගේ අතට දීලා ආයෙත් කුස්සියට ගියා. මම තේ එකත් බොන ගමන් එළියට බැස්සෙ අක්කව හොයන්න. මෙන්න ඩබල මිදුලට වෙලා මල් කඩනවා. මල් කිච්චෙ ගස් වල පිපිලා තිබුන මල්.

" ආ මල්ලි ඔයා නැගිට්ටද ? අනේ හලෝ අර අරලිය මල් ටිකක් කඩලා දෙන්නකො"



WWW.EXPRESSLANKA.TK 88

පව් අප්පා කෙල්ලො දෙන්නට උස නැති නිසා නහයෙන් අඬනවා. අරලිය ගහ තිබුණෙ තාප්පෙ අයිනෙ. තාප්පෙට නැග්ගනං සැහෙන්න මල් කඩන්න පුළුවන්. එත් ඉතිං මේ සරම පිටින් තාප්පෙ උඩ නැගලා සරම කඩන් වැටුනොත් මොන දෙයියන්ට කියන්නද ? අක්කලා කඩපු මල් ටිකත් බිම දාලා දුවයි.

" මොනාද හලෝ කල්පනා කරන්නේ ? නැගලා කඩලා දෙනවකො."

" හරි හරි ඉන්නවා මං ෂෝටක් දාගෙන එන්නං. මේක ඇඳන් නැගලා සරම බිම වැටුනොත් තමුසෙලාට නූල් බඳින්න වෙයි."

එහෙම කියලා මං හැරෙද්දි දැක්කා හංසිට බකස් ගාලා හිනා ගියා. අක්කගෙ ඉල්ලීමක් අහක දාන්නත් බෑ. කොයි තරම් බර බරේ දැම්මත් හදිස්සියකදී විදේශාධාරයක්වත් ඉල්ලගන්න ඉන්නෙ මෙයා විතරනෙ. මං ෂෝටකුයි ටී ෂර්ට් එකකුයි දාගෙන මිදුලට එද්දි අක්කා මල් බෑග් එක හංසි අතට දීලා ගෙට ගියා.

" මං ගිහින් පොල් තෙල් හඳුන්කූරු ලෑස්ති කරලා ගන්නම්. ඔයා මල් ටික එකතුකර ගන්න හංසි."

ඒ කියන්නෙ මේ පෝය දවසෙ මෙයාලා පන්සල් යන්නයි ලෑස්තිය. සමහර විට මේ රන්දුට ගාඩ් එකට යන්න වෙයි. මං තාප්පෙට නැගලා අතු ටිකක් පාත් කරලා දුන්නා හංසිට මල් කඩාගන්න.





" එදා ෆොටෝ ටික සුද්ද කරාද මල්ලි"

ඇති යන්තං. මෙයා ඊයේ රෑ ඉඳලා දැනුයි වචනයක් කතා කරනවා ඇහුනෙ.

" ඔව් මං ළඟ තියෙනවා. ඔයා අපිත් එක්ක නුවර ගියා කියලා අපේ අක්කට කිව්වද?"

" මං මෙච්චර දවස් ඔයාගෙ අක්කට මුකුත්ම හංගලා නෑ. ඒත් මේක අක්කට කියන්න එපා කියපු නිසා මං කිව්වෙ නෑ."

ඒ කියන්නෙ මෙයා හොඳම යාළුවටත් කොලේ වහලා මට වෙච්ච පොරොන්දුව රැකලා. ඔහොම තමයි හොඳ ළමයි උනාම ඉන්න ඕනෙ.

" ෆොටෝ පෙන්නන්න නං පුළුවං. එත් අක්කා දකියිනෙ. ඔයා අද ගෙදර යනවද?"

" අපේ අම්මලා ඊයේ බාරයක් ඔප්පු කරන්න කතරගම ගියා. මං ක්ලාස් කරන්න ඕනෙ නිසා ගියෙ නෑ. හෙට රෑට තමයි අම්මලා එන්නෙ."

මං අහපු ප්‍රශ්නෙට මට ඊයේ ඉඳලා දැනගන්න ඕන කරපු විස්තර ටිකත් දාලා එයා උත්තර දුන්නා. ඒ කියන්නෙ අදයි හෙටයිත් හංසි අපේ ගෙදර.



WWW.EXPRESSLANKA.TK 89

" එහෙනම් යන්න කලින් පෙන්නන්නංකෝ"

එහෙම කියලා මං උඩ අතුවල තිබුණ මල් කඩලා හංසිගෙ අතට දුන්නා. එයා රෝසපාට හීනි ඇඟිලි දික් කරලා මල් ටික අතට ගනිද්දි මං ටිකක් වෙලා එයාගෙ දිහා බලන් හිටියා එයාටත් හොරෙන්. හංසි අපේ අක්කා තරම් සුදු නැති උනාට මාර හැඩයි. නියම කලා කෘතියක්. අම්මපා මට අයියා කෙනෙක් හිටියනං මං මෙයාව කොහොම හරි මගේ නෑනා කරගන්නවා. මේ වාගේ පින් පාට වස්තුවක් උදේ හවා දැක්කත් සැපයි.

" කොහොමද මල්ලි ඔයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ්"

කල්පනාවේ දූති අතරෙ හිරවෙලා හිටපු මං හංසිගෙ ප්‍රශ්නෙට ගැස්සුනා. තව පොඩ්ඩෙන් ගෙම්බා පොලේ ගැහුවා වගේ තාප්පෙන් බිම.

" මොන ගර්ල් ෆ්‍රෙන්ඩ්ද?"

" ඇයි එදා අර ඔයාගෙ යාළුවො කිව්වෙ රාණි කියලා ගර්ල් කෙනෙක් ගැන."

හූටා මෙයත් වලිගෙ පාගගෙන. හැබැයි ඔය රාණි කියන නම දූත් රෙජිස්ටර් වෙනවා.

" උන්ට පිස්සු. මට ඇති කෙල්ලෙක් නෑ."





" ඔය බොරු හංසි. මෙයාට නං කෙල්ලො හතර පස්දෙනෙක්වත් ඇති."

අපේ අක්කා උදූල්ල දාගෙනම අපි දිහාට එද්දි මං තාප්පෙන් බිමට පැන්නා.

" අනේ මල්ලි ඔයත් යංකො අපිත් එක්ක."

මං කිව්වේ නැද්ද? අද ඉතිං කෙල්ලො මුර කරන්න වෙනවා. නංගිලා දෙනෙක් නම් තව කමක් නෑ. එත් දෙන්නා සයිස් එකෙන් නම් මට වඩා පොඩියි.

" කවුරු කවුරුද යන්නෙ දූන්?"

SLU

" අම්මයි මමයි හංසියි ඔයයි."

මං තාම හා කිව්වෙත් නෑ. අපේ අක්කා මාව ගණන් තියලත් ඉවරයි. කම්මැලිකමේ ගෙදර ඉන්නවට වඩා පිනක් දහමක් කර ගන්න එක එන ආත්මෙටත් හොඳයිනෙ. අන්තිම මොහොතෙ මමත් ගමනට සෙට් උනා.

ඇඟ සෝදලා ලා නිල් පාට ඩෙනිමයි සුදු ටී ෂර්ට් එකයි දාගත්තු මං පුරුද්දට වගේ කැප් එකත් අතට අරගත්තා. අන්තිමට ලෑස්තිවෙන්න ගත්ත මං තමයි මුලින්ම ඇඳලා ඉවර උනේ. අම්මා සුදු ඔසරියකුත් ඇඳගෙන ආවට මේ ගෑණු ළමයි තාම නෑ. උන් ඉතිං පන්සලට යන්නෙත් බියුටි කවල් ඔක්කොම දාගෙනනෙ.



WWW.EXPRESSLANKA.TK 90

" පොඩි පුතා මං කිරිබත් හැදුවා. අක්කලා එනකල් ඔයා බෙදාගෙන කන්න."

මේ වෙලාවෙ කිරිබත් පිඟානාක් අමාරුවෙන් හරි දාගත්ත නං පන්සල් ගිහින් ඇවිත් දෙවෙනි ඉනිම බැට් කරන්න පුළුවං. ලොකු ලුණුමිරිස් හැන්දකුත් එක්ක කිරිබත් බෙදාගෙන කකා ඉද්දි අපේ සුරූපිනියො දෙන්නා පඩිපෙල බැහැගෙන එනවා දැක්කා. හංසි චාම් වර්ක් එකක් තියෙන සුදු සල්වාර් කිටක් ගහලා. හංසිව දැක්ක ගමන් මට කකා හිටපු කිරිබත් කට හිර උනා. අනේ මන්දා යාෂ් චොප්රාහරි කරන් ජෝහාර් හරි පන්සල් ඇවිත් හිටියනං මෙකිව ඉන්දියාවටම අරන් ගිහිල්ලයි නවතින්නෙ.

" ඇයි අම්මෙ තාත්තා යන්නෙ නැද්ද ?"

අන්තිම කිරිබත් කටත් ගිලින ගමන් මං ඇහුවා.

" තාත්තට බැංකුවෙ වැඩක් තියෙනවා කිව්වා. එයා යන ගමන් අපිව පන්සලට ගෙනිහින් දායි."

මේ පෝය දවසෙ බැංකුවෙ තියෙන වැඩ මොනවද මන්දා. රාජකාරිය දේව කාරියටත් වඩා උතුම් කියන වදන ඉහලින්ම පිළිපදින කෙනෙක් තමයි අපේ තාත්තා.

මාසෙ ඉවර වෙන්න දවස් තුන හතරක වෙලේ ඉඳලා මන්ත් එන්ඩ් එක කියලා දඟලයි. නැත්තං ට්‍රයල් එක අවුට් කියලා රෑ වෙයි. එක්කො කැෂ් බැලන්ස් නෑ කියයි. ඔවා ඉතිං කාට කියන්නද ? එයා කියනවා අපි අහනවා.





" කොයි පන්සලට ද යන්නේ."

වෑන් එකේ යතුරක් අරන් එළියට එන ගමන් තාත්තා ඇහුවා. කොයි පන්සලෙත් ඉන්නෙ එකම බුදු හාමුදුරුවො නිසා මට ඒ ප්‍රශ්නෙ වැදගත් උනේ නෑ.

" පිල්ලෑවේ පන්සලට යමු නේද දුව."

අම්මා එයාගෙ කැමැත්ත අක්කගෙ පිටින් දාලා කියවන්නයි හදන්නෙ.

" අනේ අම්මා හැමදාම එහෙ යනවනෙ. අද හංසිත් ඉන්න එකේ අපි කැළණි යමු."

අක්කා දෝස්මුරේ දාද්දි තාත්තා ටිකක් කලබල උනා.

" ඔයාලා කැළණියට ගිහින් දාලා මං ආපහු කීයටද බැංකුවට යන්නෙ."

" තාත්තා අපිව කොහුවලින් කැළණිය බස් එකට දාන්න. අපි යන්නං"

අපොයි! බස් එකේ චාටර් කන්න වෙනවා කියලා දන්නවනං මං ගෙදර ඉන්නවා. අම්මා කිව්වා වගේ පිල්ලෑවට ගියා නං ඉවරයි. කොහෙද මෙයා ඉල්ලන් කනවනෙ. කිරිබතුත් කාපු එකේ බස් එකට නැගලා කැළණියට යනකල් නිදාගන්න තමයි වෙන්නෙ.



WWW.EXPRESSLANKA.TK 91

කොයි තරම් උදේ ආවත් අපි කැළණියට එද්දි දහය හමාරට විතර ඇති. පන්සල වටේ හිටපු සෙනගයි තිබුණ වාහන ගොඩයි දකිද්දි මට වදින එකත් එපා උනා.

" මල්ලි ඔය තොප්පිය ගලවන්න."

පන්සලෙ ගහලා තිබුණ බෝඩ් එකක් පෙන්නලා අක්කා කිව්වා. මමත් ඒක අතට ගන්න ගමන් ඇන්ටනාව දාලා වටේ බැලුවා පුහ්! ලංකාවේ ගෑණු ළමයි සේරම අද පන්සල් ඇවිත් වගේ. සුදු නංගිලා සුදු පාට ඇදලා බිම බලාගෙන සන්සුන් විදියට යන හැටි දැක්කම සිල් ගත්ත මිනිස්සුන්ගෙ සිල් බිඳෙනවා ඇති. මට අපේ විහගයාව මතක් උනා. ඌට කෝල් එකක් දුන්න නං එක්කං එන්න තිබ්බා. හැබැයි ඌ ආවනම් හවස් වෙනකල් මෙතනින් ගෙනියන්න බැරි වෙන එක ෂුවර්. සෙනසුරාදා ඉරිදා දවස් වල බීච් එකටයි පාර්ක් වලටයි රිංගන කපල්ස් මේ වගේ දවස් වල පන්සල පැත්තෙත් එනවා. උන්ව දකිද්දි මට සචිනිව මතක් උනා. කෙල්ල මේ වෙද්දි මොනවා කරනවද මන්දා. බෝධියයි චෛත්‍යයි අමාරුවෙන් වැඳලා බුදුගෙට යන්න බලද්දි කිලෝමීටරයක් විතර දිග පෝලිමක්. ඒකත් එක්කෙනා පිටිපස්සෙ එක්කෙනා යන පෝලිමක් නෙමෙයි. කෙලින්ම ජන ගඟක්. අච්චර දුර ඉඳලා ආපු එකේ කොහොමහරි ඇතුලට යන්නත් එපැයි. හැබැයි පෝලිමේ හිටගත්තම යන්න ඕනෙ නැහැ. ඔටෝ යැවෙනවා.

යකඩ වැටවල් ගහලා වෙන් කරලා තිබුණ පෝලිමේ ටිකක් යද්දි මාව ඉබේම අම්මලට වඩා පස්සට යැවුනා. අපේ අක්කටයි හංසිටයි එහා පැත්තෙ හිටියෙ රස්තියාදුකාර කොල්ලො සෙට්





එකක්. බොඩි ෆිට් ටී ෂර්ට් එකක් ගහලා අමුතු කට් එකකට රැවුල කපලා හිටපු පොරක් කාන්දම වගේ හංසි ඉන්න පැත්තට හේත්තු වෙනවා මං බලාගෙන. එයාලා ගියේ මට අඩි දෙක තුනක් ඉස්සරහින්. සෙනග හිරවෙන එකෙන් උපරිම ප්‍රයෝජන ගත්තු අර කොල්ලො ටික හංසිගෙයි අපේ අක්කගෙයි මැද්දෙන් රිංගලා හංසිව වෙන්කර ගත්තා. අම්මපා පන්සල නෙමෙයි නං මං ඕකුන්ගෙ දත් දෙක තුනක් ගලවනවා. ඉක්මනට අක්කලා ළඟට යන්න ඕන උනත් සෙනඟ වැඩි නිසා ඒක කරන්න අමාරුයි. ඒත් අමාරුවෙන් තල්ලු කරගෙන මං හංසිට කිට්ටු කලා. එක කොල්ලෙක් හංසිගෙ ෂෝල් එකෙන් අදිනවා මං දැක්කෙ එතකොට. මුන් පන්සල් ඇවිත් තියෙන්නෙ වඳින්න නෙමෙයි ආතල් ගන්න. සීන් එක දැකපු මට සිරාවටම තද උනා. මං පෙරළගෙන එතනට ගිහින් අරුගෙ පිටට තට්ටුවක් දැම්මා.

" ඇයි මොකද ?"

උගෙ නහරක් වැඩියි කියලා ඒ වචන දෙකින්ම මට තේරුණා.

" හලෝ මේ ඔය ඇඳුම අතඅරිනවද ?"

මේක පන්සල නිසා මං වැඩිය කුලප්පු නොවී ෂේප් එකේ ඇහුවා.

" ඇයි මෙයා ඔයාගෙ කවුද ?"

SLU

" මෙයා මගේ ගර්ල්"



WWW.EXPRESSLANKA.TK 92

මං ඒ වචන තුන වටපිට බලලා කිව්වෙ අපේ අක්කට ඇහුනොත් මං කපෝති නිසා. ඒක ඇහුණම අරූගෙ මූණ වෙනස් උනා. ඌ බලන්න ඇති මං පිටිපස්සෙ ඉදන් ඇවිත් කෙල්ලට අයිතිවාසිකම් කියන්නෙ කොහොමද කියලා. මං කියපු දේ ඇත්තද අහන්න වගේ ඌ හංසි දිහාත් බැලුවා. මේ වගේ කාඩයෙක් දිහා එයා බලනවටත් මං කැමති උනේ නෑ. ඌට පෙන්නම හංසිගෙ අත අල්ලගෙන මම එයාව අයිනට කර ගත්තා. ඒ හීනි අත මේ දාඩිය දාන වෙලාවෙත් සීතල වෙලා. හංසි මගේ මූණ දිහා බැලුවෙ නැතුව මගේ අත එයාගෙ අත් දෙකෙන්ම අල්ල ගත්තා. අම්මයි අක්කයි අපිට ඉස්සරවෙලා ගියේ. එයාලා පිටිපස්ස බැලුවත් එයාලට මෙතන යන සීන් එක පේන්නෙ නෑ සෙනඟ වැඩි නිසා. හංසියි මායි අත්දෙක අල්ලගෙන යනවා අම්මා දැක්කනම් එයාට හාර්ට් ඇටෑක් හැදෙනවා. ගොඩක් වෙලා පෝලිමෙත් ඉදලා බුදු මැදුර ඇතුලටත් යනකල් අපි හිටියෙ අත් අල්ලගෙන. මේ කරන වැඩේ වැරදිදත් මන්දා. ඒත් මං වැරැද්දක් කලේ නෑ කියලා මගේ යටි හිත දන්නවා. මං එයාට කිට්ටු උනේ නරක චේතනාවෙන් නෙමෙයි. අර කොල්ලො ටිකගෙන් බේරගන්න.

බුදු මැදුරෙ ඇතුලෙ සැතපෙන පිළිමෙ ළඟට ගිහින් අක්කා අතේ තිබුණ මල් ඉල්ල ගන්න තමයි හංසි මගේ අත අතහැරියෙ. පෝළිම තව ටිකක් දික් උනානම් කියලා මට හිතුනෙ ඇයි දන්නෙ නැහැ. කොහොමහරි බුදු මැදුරෙන් අපි එළියට එද්දි හිටියෙ දාඩිය නාගෙන.

" අපෝ මේ අනිත් දවසෙනම් මේ චාටරේ කන්න මට අඩගහන්න එපා."





මං අක්කට කිව්වෙ අම්මටයි හංසිටයි ඇහෙන්න. ඇත්තටම ඒ වෙද්දි මට එපා වෙලා තිබුණෙ. තව පොඩ්ඩෙන් අරූ එක්ක බාල්දියක් පෙරලගන්න වෙනවා. මං පන්සල් ඇවිත් පුරවගත්තෙ පව් ද පින්ද කියන්න මං දන්නෙ නෑ. අපි ගෙදරට එන කල්ම හංසි හිටියෙ ගොළු වෙලා වගේ. හැබැයි එයා බස් එකේදි දෙතුන් සැරයක් මගේ දිහා අමුතු විදියට බැලුවා.

SL-UNLIMITED.COM

ගෙදර ඇවිත් හවස ඉස්කෝලෙ පොතක් පෙරලද්දියි මට නිරෝධ සචිනිට දෙන්න කියපු ලියුම මතක් උනේ. ඒක තාම මං ළඟ. ඌ සචිනිගෙන් උත්තරයක් එනකල් බලාගෙන ඇති. හැබැයි මං ඉස්සර ඉදලා සචිනිව දන්න නිසා මට හිතෙන්නෙ ඒකි නිරෝධට කැමති නැහැ කියලයි. ඒත් කෙල්ලෝ හිතේ තද කරගෙන ඉන්න දේවල් කවුද දන්නෙ. සචිනිත් කාට හරි හිතෙන් ආදරේ කරනවනෙ. නිකමට සචිනිට කෝල් එකක් දෙන්න හිතාගෙන මං සාලෙට එද්දි හංසි තනියම ටීවී බලනවා.

" ඇයි තනියම ? කෝ අපේ අක්කා"

" අක්කා නාන්න ගියා. මං මල්ලිගෙන් අර ෆෝටෝ ටික ඉල්ල ගන්න එන්නත් හදලා ආපහු නිකං හිටියා."

" ඉතිං ඇයි ආවේ නැත්තේ ? උදේ වගේ මං අතින් අල්ල ගනියි කියලා හිතුවද ?"



WWW.EXPRESSLANKA.TK 93

පන්සලේ සිද්ධිය මතක් වෙලා මං අහද්දි හංසිගෙ මූණ පටස් ගාලා රතු උනා. එයාට ලැජ්ජ හිතෙන්න ඇති. මං කාමරේට ගිහින් ෆොටෝ දාලා තිබුණ කවරෙ ගෙනැත් හංසි අතට දීලා කෝල් එක ගන්න ඉදගත්තා.

SLU

" හෙලෝ "

එහා පැත්තෙන් ආවේ පිරිමි කටහඩක්. ෂුවර් එකට සචීලගෙ තාත්තා වෙන්න ඇති. ඒ ගෙදර ඉතිං පිරිමි පරාණෙකට ඉන්නෙ එච්චරයිනෙ.

" හෙලෝ අන්කල් සචිනි ගෙදර ඉන්නවද ? මං රන්දු කතා කරන්නෙ."

මං හැමෝම දන්න ෂෝට් ෆෝම් එකෙන් කියලා දැම්මා.

" රන්දු කියන්නෙ අර..... බැන්ක් එකේ වැඩ කරන මිස්ට වික්‍රමබාහුගෙ පුතා නේද ?"

පොරගෙත් මාර මීටරේ. නම කිව්වා විතරයි තාත්තා වැඩ කරන තැනත් මතකයි.

" ඔව් අන්කල් "

" පුතා අපේ ළමයි දෙන්නා අම්මත් එක්ක පන්සල් ගිහින්නෙ. ඇයි මොකක් හරි විශේෂ පණිවිඩයක්ද ?"





මට සචීට කතා කරන්න විශේෂ පණිවිඩයක් ඕනෙයැ.

" නෑ අන්කල් මං මේ නිකං කතාකලේ. මං තියන්නං එහෙනං බායි."

අන්කල් ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන පටන්ගන්න කලින් මං ෆෝන් එක තිබ්බා. හංසි තාම රස කර කර ෆොටෝ බලනවා. ටිකක් වෙලා ගියාට පස්සෙ එයා ෆොටෝ ටික අරන් නැගිටලා මං ළඟට ආවා.

" මේ ඔයාගෙ කැමරාවේ ෆොටෝ විතරයි නේද ? අනිත් ඒවා ඔයා ළඟ නැද්ද ?"

" ඒ ෆොටෝ අරුන් මට පෙන්නලා ආපහු ගෙනිච්චා. එතනත් ගති ෆොටෝ තියෙනවා."

" මං ෆොටෝ දෙකක් ගත්තා මල්ලි. කමක් නෑ නේද ?"

ගත්ත ෆොටෝ දෙක පෙන්නන්නෙවත් නැතිව ඉතුරු ටික මට දීලා මේ කෙල්ල උඩ තට්ටුවට දුවගෙන ගියා. හංසිගෙ තනි එකක් මෙතන තිබුණ නිසා එයා ඒක ගන්න ඇති. එතකොට අනිත් එක ? ෆොටෝ ටික අරගෙන මං ආයෙත් එකින් එක බලන්න ගත්තෙ හංසි ගත්ත ෆොටෝ එක මොකක්ද කියලා දැනගන්න. හංසිගෙයි මගෙයි ෆොටෝ තුනක් තිබුනට දැන් තියෙන්නෙ දෙකයි. එදා උදේ කෑම කන වෙලාවේ අපි දෙන්නා කතා කරද්දි විහඟයා අපේ ෆොටෝ දෙකක් ගහලා තිබුනා. ඒ දෙකෙන් එකකුත් එයා අරන්. මෙකිනං මැන්ටල් කෙල්ලෙක්.



WWW.EXPRESSLANKA.TK 94

නැත්තං යාළුවගේ මල්ලි එක්ක තනියම ඉන්න ෆොටෝ එක හොරෙන් ගන්න හේතුවක් නැහැනේ.

" මොනවද මල්ලි ඔය අතේ තියෙන්නෙ. ෆොටෝ වගයක් නේද පෙන්නනන්නකො "

ආ.........පෝ......... අපේ අක්කත් නාලා ඇවිත්. මෙයාටත් ඕනෙ නැති මගුලක් නෑ.

" මේක මේ සාරංගගෙ ෆොටෝ වගයක්. ඔයා දන්න අය මෙතන නෑ."

ෆොටෝ ටික අරන් කැපෙන ගමන් මං කිව්වා. මේ ටික දැක්කනම් එයා දන්මම හංසිව ගෙදරින් එළවනවා.

" කෝ අක්කා අපේ දිගංචියා නැද්ද ?"

සුපුරුදු කටහඬක් ඇහුනා සාලේ පැත්තෙන්. ඒත් මොකාද මේ මට අලුත් නමක් දාපු පනික්කියා. මං කාමරෙන් එළියට එද්දි ෂෝටා දොරළඟ. ඌ කොට නිසා මට දිගංචියා කියන්න ඇත්තෙ පැහැදිලි ඊර්සියාවට.

" ආ කොටා.......... තෝ මොකද මේ පැත්තෙ ?"

" මොකද මල්ලි ඔය යාළුවන්ට කතා කරන කැත."

අපේ අක්කගෙත් මහප්ප්‍රාණ කතා තියෙන්නෙ. මූ මට දිගංචියා කිව්ව එක හොඳයි. අපි මොනවාහරි කිව්වොත් තමයි





ගුරු උණ මතුවෙන්නෙ. මං ෂෝටවත් ඇදගෙන මිදුලෙ තිබුණ ගල් බංකුව ළඟට ආවා.

" මචං උඹට කියන්න සීන් ගොඩක් තියෙනවා. "

ෂෝටා ඉඳගන්නත් කලින්ම ටෝකට බැස්සා.

" ඉතිං කියපං වන් බයි වන් "

SLU

" පළවෙනි එක තමයි උඹේ ගජයා.... විහඟ, ඌට මොබයිල් එකක් හම්බවෙලා."

ඒකනං අදහන්න වටින නිව්ස් එකක්. ඒත් මේ ගොරකයට ෆෝන් එකක් අරන් දීපු මෝඩයා කවුද දන්නෙ නෑ. දන් ඉබ්බා දියේ දැම්මා වගේ ඇති.

" කවුද බං ඌට ෆෝන් එකක් අරන් දීලා තියෙන්නෙ?"

" උන්ගෙ අයියට රට ඉඳලා ආපු යාළුවෙක් අලුත් ෆෝන් එකක් දීලා. අයියා ළඟ තිබුන එක මූට දීලා."

" ඇත්තද ? මං හිතුවා බ්‍රෑන්ඩ් නිව් බඩුවක් කියලා. බලන් යද්දි සූප්පපු කට්ටක් නේ."

" ඒකත් රුපියල් තිස්පන්දාහක් විතර වටිනවා බං. මං දැකලා තියෙනවනෙ."



WWW.EXPRESSLANKA.TK 95

එහෙනම් ඌ දන් පොර වගේ ඇති. පුදුමයි තාම කෝල් එකක් ආවෙ නැහැ.

SLU

" ඌ උඹට කතා කරාද ?"

" ඌ සිම් එකක් අරන් මුලින්ම කතා කලේ උඹලගෙ ගෙදරටලු. කවුරුවත් ආන්සර් කලේ නැලු."

එහෙනං ෂුවර් එකට උදේ අපි පන්සල් ගිය වෙලාවෙ වෙන්න ඇති. හැබැයි ඉතිං ඌගෙ සදාතනික ප්‍රථම කෝල් එක මිස් කෝල් එකක් උන එක තමයි දුක. පව් අප්පා.

" මං ඌගෙ නම්බර් එක ගෙනාවා. අපි පස්සෙ පොඩි ලුණු කැල්ලක් දීලා බලමු."

එහෙම කියලා ෂෝටා මොබිටෙල් නොම්මරයක් මගේ අතට දුන්නා.

" දැන් කියපං දෙවෙනි කාරණේ."

මං එහෙම කිව්වට මුගෙන් සද්දයක් නෑ. ඌ බය වෙලා වගේ අපේ වැරෙන්ඩා එක පැත්ත බලාගෙන කටත් ඇරගෙන ඉන්නවා.

" මචං රන්දු මේ...... අර.."

මූ මොනවා කියනවද මන්දා. මමත් හැරිලා බැලුවා. හංසි දොර ළඟ ඉඳන් අපි දිහා බලනවා මං දැක්කෙ එතකොට.





" ඔව් බං ඒ හංසි තමයි. හැබැයි උඹ කෑ ගහලා වැඩේ ලෙඩේ කරන්න එපා."

මූට වචන අමතක වෙලා නිසා මංම කියලා දැම්මා.

" එයා මොකද බං උඹලගෙ ගෙදර කරන්නෙ. බලපංකො ගහලා ඉන්න කිට. පොඩි එකෙක් වගේ. පුහ්........ පිස්සු හැදිලා ආයෙත් හැදෙනවා."

කොහොමත් ෂෝටා හංසිව දැකලා තියෙන්නෙ සාරි ඇඳලා ඉන්නවනෙ. මේකි පොඩි සායකුයි ටී එකකුයි දාලා බටු කෙල්ලෙක් වගේ ඉද්දි ෂෝටා කොර වෙන එක අහන්නත් දෙයක්ද ? හංසි සචීට නැටුම් උගන්නපු එකයි, අපි කට්ටිය එකට නුවර ගිය සීන් එකයි අපේ අක්කා දන්නෙ නෑ කියලා මං වේලාසනම ඌට කිව්වා. නැත්තං ඌ යන්න කලින් ඕක අනලා හත් පොලේම ගාලයි යන්නෙ.

" ඕක නිශා අක්කට හංගන්න දෙයක් නෙමෙයිනෙ බං. උඹලගෙ හිතේ හොරයක් තියෙන නිසා තමයි කොලේ වහන්න ඇත්තෙ නේද ? හැබැයි මචෝ නරකම නෑ. උඹට මැච් වෙනවා."

" උඹේ ඔළුව කොහෙහරි හැප්පිලාද ? ඒකි මට වඩා අවුරුදු හයක්වත් වැඩිමල් ඇති."

" පිස්සුද බං එච්චර වෙන්න බෑ. වැඩිම උනොත් විසි දෙකක් ඇති."



WWW.EXPRESSLANKA.TK 96

අම්මද බොල මුගේ කතාව! කෙල්ලන්ගෙ මූණු බලලා වයස කියන්න තරම් මූ දැන් පැහිලා. ඒ කතා පැත්තක තියලා මූ කියන්න ආපු අනිත් කාරණේ මං අහගත්තෙ හරි අමාරුවෙන්.

" මචං උඹ දන්නවද........ නිරෝධයා සචීට ලව්. අපිට වැඩේ අතටම මාට්ටුයි."

ඒකත් එහෙනං ලීක්වෙලා. හැබැයි සීන් එක මට කිව්වා කියලා වැඩිය ඇඟෙව්වෙ නැතුව මං ෂේප් උනා.

" ඊයේ පංති ඇරිලා යද්දි ඌගේ ටියුට් එකක් අපේ ඒවා එක්ක බස් එකේදී මාරුවෙලා. මමයි සාරංගයි බස් එකෙන් බැහැලා බලද්දි මූ ඒකේ පිටිපස්ස පිටුව පුරාම සචිනි නිරෝධ කියලා ලියලනෙ."

හප්පා....... සාරංග දනගත්තා කියන්නෙ ඉතිං මුළු සෙට් එකම දනගත්තා වගේ තමයි. ඌටත් මහ බෙලෙක් කටක්නෙ තියෙන්නෙ. නිරෝධත් කෙල්ලො කරන බොළඳ වැඩ කරන්නෙ. ඌ සමහර විට නම් දෙක ලියලා ඒක වෙඩින් කාඩ් එකකට මැච් වෙනවද බලන්න ඇති. දැන් සීන් එක සචීට කියන්න මං ඕනෙ නැහැ. ඒකි මෙලහට දන්නව ඇති.

අපි දෙන්නා කියවද්දි අම්මා තේයි බිස්කටුයි අරන් ආවා. එයා ෂෝටා ආවම මොනවා හරි ගිල්ලවලා තමයි යවන්නෙ. අපේ අම්මා ෂෝට්ට හරි කැමතියි. ඒ ඌ පොඩි එකා නිසා වෙන්න ඇති.





" උඹ අප්සට් වෙන්නෙ නැත්තං කියන්න තව දෙයක් තියෙනවා."

ඒ මොකක්ද ඒ ? මොකක් උනත් මේ රන්දුව අප්සට් කරන්න හිතන තරම් ලේසි නෑ. අහලම බලමු.

" උඹෙන් අපේ නංගි ළඟදි මොනව හරි ඇහුවද ?"

ඔය කියන්නෙ ඌගෙ නැන්දගෙ දුව පවිත්‍රා එදා ටැපු එක ළඟදි අහපු කතන්දරේ වෙන්න ඇති.

" ඔව් බං ඒකි අහනවා මං නෙත්මිට කැමතිද කියලා."

" ඉතිං උඹ ඇත්තටම කැමතිද ?"

" ඒකිට කවුද බං අකමැති. ඒකි සිරා කැල්ලක්නෙ. හැබැයි ඉතිං ඒකිව දා ගන්න තරං හිතක් නං මට තාම පහල වෙලා නෑ."

" ඒ කියන්නෙ උඹේ හිතේ ඒකි ගැන ආදරයක් නෑ කියන එකද"

" ඒකි ගැන හිතේ කැමැත්තක් තිබුනට ඒක ආදරේ නෙමෙයි බං. හැබැයි මං ඒකිට සිරාවටම කැමතියි. ආශ්‍රය කරලා පස්සෙ කාලෙක ආදරේ ගැන සලකා බලමු."

" එහෙනං මං උඹට කෙලින්ම කියන්නං උඹ ඒකිට තව ළංවෙන්නෙ නැතුව අතේ දුරින් හිටපං. ඒකි ගැන හෝප්ස් තියා ගන්නෙ නැති තරමටම හොඳයි."



WWW.EXPRESSLANKA.TK 97

මූ මෙහෙම කියන්නෙ හේතුවක් ඇතුව වෙන්න ඕනෙ. ඒත් නෙත්මිගෙ වැරැද්දක්නං මට පේන්නෙ නැහැ.

" ඇයි උඹ එහෙම කියන්නෙ. නංගි මොනව හරි කිව්වද ? ඒකි එහෙම වාටර් ඩයල් එකක් වෙන්න බෑ බං."

" කෙල්ල ඉස්කොලෙන් අවුට් උන ගමන්ම කසාද බඳිනවලු බං ඒකිගෙ මස්සිනාව. ඒ වැඩේ දූන් ස්ථිරයිලු. අපේ නංගි ඒක උඹට කියන්න කිව්වා."

ඒ කියන්නෙ ඒ කතන්දරෙනුත් මේ රන්දූට බින්දුව. හිතට ලාවට දුකක් ආවත් එදා නිරෝධ සචී ගැන කියපු දවසෙ තරම් මං අප්සට් උනේ නෑ. අපි තාම වැඩිය ආශ්‍රය කරලවත් කතා කරලවත් නැනෙ. මාව දැක්ක ගමන් ඒකි භූමිතෙල් ගෑවුණු ගැරඬියා වගේ විදගෙන යනවනෙ. ඉතිං කොහෙද කතා කරන්නෙ. මොනවා උනත් මහබඹා මේ අහස යට රන්දූටත් කවුරු හරි මවලා ඇති කියලා මං හිත හදා ගත්තා.

ෂෝටා යන්න කලින් මේ සතියෙ විහඟයි නිරෝධයි එක්ක අපේ ගෙදර පාඩං කරන්න එනවා කියලා අපේ අම්මටත් කියලයි ගියේ. ඌ ගියාට පස්සෙ මං නෙත්මි ගැන කල්පනා කරන්න ගත්තා. ඒත් ඒ ගැන හිතන එකෙන් ඉතුරු වෙන්නෙ හිතට දුකක් විතරයි.

* * * * * * *





Scanned for
SL-Unlimited.com
by Sheree

# 08

දවස් ගානක්ම එක දිගට වැස්ස නිසා අපි ක්ලාස් ගියෙත් නැහැ, ඉස්කෝලෙ ගියෙත් නැහැ. මෙහෙම කුම්බකරණයො වගේ ගේ අස්සෙ රිංගගෙන හිටියොත් නං ඉතිං විභාගෙට සොරිම තමයි. මං සචීට කෝල් එකක් දීලා බලද්දි ඒකි නං ඉස්කෝලෙ නොගියට පංති ගිහින්. මං ගියෙ නැති ටිකේ නෝට්ස් ෆෝටෝ කොපි කරලා තියන්නං කියලා කෙල්ල මට හවස එහෙ එන්න කිව්වා. කොයිතරම් වැස්ස තිබුණත් මං සුපුරුදු ඩෙනිමට බැහැලා අම්මගෙනුත් ගාණක් කඩාගෙන එළියට බැස්සා.

" පොඩි පුතා මොකද ළමයො ඔය තෙමි තෙමි යන්නෙ. මේ කුඩේ අරන් යන්න."

අපේ අම්මා රිලේ එකේ බැටන් එක අරන් එනවා වගේ කුඩෙත් දික්කරගෙන මගේ පස්සෙන් එනවා.

" අයියෝ අම්මේ දූන් පායලනෙ. ඕක උස්සන් යන්න මට බෑ."

අම්මා කොයිතරම් බල කරත් මං කුඩේ ගත්තෙ නැහැ. කෙල්ලො වගේ කුඩ උස්සන් යන්න ලැජ්ජ නැද්ද ? අනික ඉතිං අමාරුවෙන් අරන් ගියත් ආපහු එද්දි මට ඕක අමතක වෙනවා. ඉස්සර දවස් කීයක් අක්කගෙ කුඩ අමතක වෙලා මං බැනුම් අහලා තියෙනවාද ?

සචීලගෙ පාර ළඟින් බැහැලා පයින් යද්දි නං තරමක් වැස්සත් මං කැප් එකත් දාගෙන තෙමීගෙනම ගියා. මං එනවා කියලා කියපු නිසාද වැස්ස දිහා බලන් ඉන්න තියෙන ආසාව නිසාද මන්දා කෙල්ලො ඩබලම ඉන්නවා පාර දිහා බලාගෙන. මගෙත් ඔළුවට වතුර වැටිලා නිසාද දන්නෑ ඔහොම දකිද්දි මූන් දෙන්නගෙන් අචී කවුද සචී කවුද කියලා අඳුරගන්න බැහැ.

" අනේ රන්දු ඇයි ඔය තෙමීගෙන ?"

ආ....... ඒ නම් සචිනි. ඒකි තමයි හැමවෙලේම බටකොළ ආච්චි වගේ මට අවවාද දෙන්නෙ. ඒත් මං උත්තරයක් දෙන්න කලින් කෙල්ල හැරිලා ගෙට දිව්වා. බාගෙට තෙමිලා නිසා ඒකිට මං ළඟ අමුතු ගඳක්වත් ආවද මන්දා. හැබැයි ඉතිං කොල්ලා ගෙදරින් එද්දි විදගෙන ආපු පර්ෆියුම් සුවඳනං තාම තියෙනවා.

" එන්න රන්දු ඇතුලෙන් වාඩිවෙන්න."

අචී මාව ගෙට එක්කං ගියාට ඉඳගන්න නිකං මොකක්ද මොකක්ද වගේ. ඇයි දෙයියනේ පශ්චාත් භාගය බෙරි වෙලානෙ.

" ආ..... මුලින්ම පිහිදගෙන ඉන්නකො. ඔයා හොඳටම තෙමිලා."





කාමරේ ඉඳලා එළියට ආපු සචී ලස්සන ලා කොළ පාට තුවායක් මගේ අතට දුන්නා. ඒක පුංචි බබාලගෙ ඕඩිකොලොන් සුවඳයි.

" හප්පා මේකෙ ගඳ. කාගෙද බං මේ හබු තුවාය."

මං කිව්වෙ බොරුවට කියලා දෙන්නම දන්නවා. අචිනි හිනාවෙලා සචිනි දිහා බැලුවා.

" ඕක මගේ. ගඳ උනාට කමක් නෑ පිහදලා දෙන්නකො"

" කෝ උඹලගේ අම්මා. ?"

ඔළුව පිහදාන ගමන් මං ඇහුවෙ වෙනදට මේ වෙද්දි ආන්ටි ඇවිත් ප්‍රශ්න හැටක් විතර අහලා ඉවර නිසා.

" අම්මා හන්දියට ගියා. එනගමන් ඔයාගෙ ෆොටෝ කොපි ටිකත් අරන් එයි."

එලද බ්‍රා කිව්වලු. ඒ කියන්නෙ මේ වැස්ස වෙලාවෙ මේ ගේ ඇතුලෙ ඉන්නෙ ඉටි රූප වගේ කෙල්ලො දෙන්නෙක් එක්ක රන්දු විතරයි. කොයිතරම් ලස්සන උනත් මේ ඉන්නෙ මගේ අතිජාත බ්‍රැකට් දෙකක්නෙ. ඉතිං මොන ස්වීට් ඩ්‍රීම්ස්ද ? තුවාය සචී අතට දීලා මං ප්ලාස්ටික් පුටුවකින් ඉඳගත්තා. නැත්තං මං ගියාට පසසෙ මූන්ට පුටුත් වේලන්න වෙනවනෙ.



WWW.EXPRESSLANKA.TK 99

" ඕක තෙත නිසා ඔයාට ඇඳ ගන්න දෙන්න වෙන ඇඳුමක්වත් අපි ළඟ නැනෙ."

මෙකිත් කියන්නෙ මාර කතා. මට අඳිනවනං අඳින්න වෙන්නෙ මූංගෙ තාත්තගෙ පප්පා කෝට් කිටක් තමයි. නැතුව මේ ගෙදර කොයින්ද පිරිමි අඳුම්.

" එක්කො ඔයා ටවල් එකක් ඇඳගෙන ඕක ගලවලා දෙන්න අපි අයන් කරලා දෙන්නම්."

ආයිශ් අම්මා! මං තුවායක් ඇඳගෙන වාඩිවෙලා ඉද්දි සචීලගෙ අම්මා ආවනං එයාට කලන්තෙ හැදෙනවා. එහෙමනං මුන් දෙන්නව වෛද්‍ය පරීක්ෂණයකටත් භාජනය කරලා තමයි නවතින්නෙ.

" ඕකේ, මං ගලවලා දෙන්නම්. හැබැයි තෙමුන හැම ඇඳුමක්ම අයන් කරලා දෙන්න ඕනෙ. නැතුව බෑ."

ඇත්තනෙ, මං ඇඳගෙන ආවෙ ඩෙනිමයි ටී ෂර්ට් එකයි විතරක්යැ. කෙල්ලො දෙන්නා ඒකට රෙඩිනං ඇඳුම් ගලවලා දෙන්න මේ රන්දූත් රෙඩි. ඒත් මූං මාව නිර්වස්ත්‍ර කරන්න කලින් දෙයියනේ කියලා ආන්ටි ගෙදර ආවා.

" ආන්ටි මේ වැස්සෙ තකහනියක් ගියේ මගේ ෆොටෝ කොපි ටික ගේන්නමද ?"





" නෑ පුතා අපේ පොඩ්ඩි දවල් ඔය ටික හන්දියට ගිහින් දීලා ආවා. මං මේ කඩේ බඩු වගයක් ගන්න ගිය ගමන් අරන් ආවේ."

නෝට්ස් විතරක් නෙමෙයි ක්ලාස් එකේ ටියුට් ටිකත් මේ කෙල්ල ෆොටෝ කොපි කරලා. දැන් ඔය ටිකට සල්ලි දුන්නත් මෙකි ගන්නෙත් නැහැ. කමක් නැහැ ගනුදෙනුව යථා කාලයේදී බේරගන්න බැරියැ.

"අචී උඹේ එස් පී. බී. ආර් ආවේ නැද්ද ?"

මං අචිනියි සචිනියි දෙන්නා දිහාම බලලා ඇහුවෙ දිනුක ගැන.

" ෂ්.... හෙමින් හෙමින්. අපේ අම්මට වැඩේ ලීක් වෙලා තියෙන්නෙ"

සචී එහෙම කියලා මං ළඟටම පුටුවක් ඇදගෙන ඇවිත් වාඩිවෙලා හෙමීට කතා කරන්න ගත්තා.

" අපේ අක්කගෙ එෆෙයාර් එක ගැන මේ වෙනකල් අම්මලා දැනං හිටියෙ නැනෙ. දිනුකත් නිතර ආවා ගියාට එයාලා හිතුවෙ යාළුකමට කියලා. ඒත් අක්කි ඇක්සිඩන්ට් උනාට පස්සෙ මෙයා දවස් දෙක තුනක්ම තනියම ආපු නිසා අම්මට සැක හිතිලා ඇහුවා."

" ඉතිං අචී ඇත්ත කිව්වද ?"

SLU



WWW.EXPRESSLANKA.TK 100

" ඔව් එත් අපි හිතපු විදියට අම්මා බැන්නෙ නැහැ. එයා තාත්තටත් කියලා. තාත්තත් කිව්වෙ පොඩි කාලේ ඉඳලා දන්න ළමයිනෙ. ඔයාලගෙ කැමැත්තට අපි බාධා කරන්නෙ නෑ. හැබැයි හොඳට විභාගෙ කරන්න කියලා විතරයි."

" ෂා උඹලගෙ තාත්තා නියමයිනෙ. එහෙනං උඹටත් බාල්දි පෙරලන එකක් නෑ. දූන්ම වැඩේට බැහැපං"

හිතක් පපුවක් නැති ගානට මං කියලා දැම්මා. ඒකි මගේ මූණ බලන් හිටියෙ මහා දුකකින් වගේ.

" තාත්තා ඒත් මගෙන් ඇහුවා මට කවුරුවත් නැද්ද කියලා. කවදහරි අක්කිගෙයි මගෙයි වෙඩින් දෙකම එකට ගන්න ඕනෙලු."

ටුවින්ස්ලා දෙන්නෙක් එකම විදියට ඇඳලා එකම දවසෙ බඳිද්දි කොල්ලො දෙන්නට මනමාලියො මාරු වෙයිද මන්දා. අපි කතා කර කර ඉද්දි ආන්ටි උණු උණු කෝපි එකක් දුන්නා. වෙලාවෙ හැටියට ඒකත් මරේ මරු.

" සචී මට උඹෙන් පොඩි උදව්වක් ඕනෙ."

" ඒ මොකක්ද රන්දූ ?"

" ලබන සතියෙ අපේ අක්කගෙ උපන්දිනේ.ඒකි ඉතිං ටීචර්නෙ. මං සාරියක් අරන් දෙන්න හැදුවේ. ඒත් බං මං ඕවා තෝරන්න දන්නෙ නෑනේ."





" හරි මං හෙට පන්ති යන ගමන් එන්නං. අපි නුගේගොඩින් ගමු ලස්සන සාරියක්. ඔයා අක්කට ඉස්කෝලෙට අඳින්නද වෙඩින් එකකට වගේ අඳින්නද අරන් දෙන්න හදන්නෙ ?"

" මන් දන්නෑ බං ඕවා. මොනවගේ එකක් ද හොඳ ?"

" අපි පොඩි වර්ක් තියෙන වාම් සාරියක් ගමු. මං තෝරලා දෙන්නම්."

" හෙටත් ඉස්කෝලේ යන්නෙ නැනෙ. ඒත් අරුන් ටික පංති යන්න තුන විතර වෙද්දි නුගේගොඩට එනවා කිව්වා. අපි දෙන්නා දෙකට විතර යං. පැයක් ඇති වෙයිනෙ තෝරන්න."

කෙල්ලො එක්ක ෂොපිං යන වැඩේ අත ඇරලා දාලා තිබුණ මං සචී එක්ක හෙට නුගේගොඩ යන්න පොරොන්දු වෙලා ගෙදර ආවා.

රෑ වෙලා වොෂ් එකක් දාගෙන සචීගෙන් ගෙනාපු නෝට්ස් ටික අරන් පාඩං කලේ මේ ටිකේම කිසි දෙයක් කරපු නැති නිසා. සචී තරු දාලා හයිලයිට් කරලා බෝල අකුරෙන් ලියලා තිබුණ නෝට්ස් දකිද්දිනම් පාඩං කරන්න ආස හිතෙනවා. ඒකිගෙ වැඩ මාර පිළිවෙලයි. මං පන්ති යන්න බැරි වෙච්ච දවස් වල නෝට්ස් පාඩං කරලා ඉවර වෙද්දි ඒවා පංති ගිය දවස් වල ඒවට වඩා මතක හිටියා.

SL-UNLIMITED.COM



WWW.EXPRESSLANKA.TK 101

පහුවෙනිදා උදේ නමය වෙද්දිම සාරංගයි ෂෝටයි අපේ ගෙදර කඩං පාත් උනා.

" ආ ...... මචා.....ං පාඩං කරනවා වගේ."

" මෙච්චර වෙලා නං පාඩං කලා. ඒත් දැන් උඹලා දෙන්නා එක්ක මොන පාඩංද ?"

මං පොත වහලා දාලා උන් දෙන්නා එක්කම මිදුලට ආවා. ෂෝටා මටත් කලින්ම දුවලා ගිහින් එළියෙ පුටුවක ඉඳගෙන කකුල් දෙකත් උඩට ගත්තා.

" රන්දූ උඹට විහඟ කෝල් කරාද ?"

" දවස් දෙකක් විතර කතා කරා. ඊයෙත් කතා කරලා කිව්වා අද හවස පංති එනවා කියලා. ඇයි මොකක් හරි අවුලක්ද ?"

" නෑ බං, ඌට ෆෝන් එක හම්බඋනාට පස්සෙ පැණි පෙරිල්ල ඩබල් වෙලා. මූ පෙරෙයිදත් කෙල්ලො සෙට් එකකට උගේ ෆෝන් නම්බර් එක දීලා. අපි කෙල්ලෙක් දම්මලා දෙමුද කෝල් එකක්."

සාරංග සීන් එක පැහැදිලි කලා. ඒත් ඔය මොන වැඩේ කලත් විහඟයව මට්ටු කරන්නනං බෑ.

" කාට කියලද කෝල් කරන්නෙ ? අපේ කෙල්ලො හතර දෙනා කතා කරොත් ඌ අඳුර ගනීනෙ."





" ඌට කතාකරන කෙල්ලො තොගේ බැලපුවම ඌට කටහඬවල් වෙන්කරලා අඳුරන්න බෑ බං. අපි ජනාලිව දාලා වොයිස් එක වෙනස් කරලා ඌව පොඩි ට්‍රයල් එකක් යවලා බලමු."

මූං දෙන්නා මේ තකහනියක්ම ඇවිත් තියෙන්නෙ අපේම එකෙක්ට අංචියක් අදින්න. නැතුව වෙන හදිස්සි පණිවිඩේකට නෙමෙයි. හෙට හවස අපේ කොල්ලො පස් දෙනාම අපේ ගෙදර පාඩං කරන්න එනවා කියලා මූං දෙන්නා යන්න ගියා.

දවල් ඉක්මනට කාලා මං එකයි කාලට විතර එළියට බැස්සෙ සචී දෙකට නුගේගොඩට එනවා කියපු නිසා. මං ගිහින් පැය කාලකට විතර පස්සෙ එයා කහ පාට පිනපෝ ගවුමකුත් ඇඳගෙන බබා වගේ පැද්දි පැද්දි ආවා. ඒ කිට් එකට කෙල්ල මාර ලස්සනයි. හරියට කහ කිරිල්ලියක් වගේ.

" මොකද රන්දූ අමුතු විදියට බලන් ඉන්නෙ ?"

" බැලුවෙ අද උඹේ ලස්සන"

මං ඇත්තම කිව්වා. කෙල්ල ලැජ්ජ හිතිලද කොහෙද කතාව වෙන පැත්තකට හැරෙව්වා.

" අපි දැං කොහෙටද යන්නෙ ?"

SLU

" ඇයි බං කොතෙන්ටද යන්න ඕනෙ කියලා දන්නවනං මං උඹට එන්න කියනවයැ. හැබැයි කඩ හැටකට විතර රිංගන්න මට බෑ. එකතැනකින් ගමු."



WWW.EXPRESSLANKA.TK 102

" හරි එහෙනං අපි නෝ ලිමිට් යං."

" උඹටයි මටයි නෝ ලිමිට් යන්න පුළුවන්ද සචී ?"

මං එහෙම ඇහුවේ වෙන තේරුමක් ඇතුව. අපි නෝ ලිමිට් යන්න හැදුවට අපේ ගමනට ලිමිට් දාන්න කී දෙනෙක් එයිද කියලා කවුද දන්නෙ. මං සචී දිහා බලද්දි ඒකි හෙන දුක හිතෙන විදියට මං දිහා බලන් ඉන්නවා.

" ලිමිට් එකක් එනකල් අපි යං රන්දූ"

ඒක අහලා මාව කරකවලා අත ඇරියා වගේ උනා. ඒ කතාවෙන් සචී ඇඟෙව්වෙ එයා ලිමිට් එකක් එනකල් මං එක්ක ඕන තරම් දුර යන්න ලෑස්තියි කියන එකද ?

" මොනවද කල්පනා කරන්නෙ ? එන්න යං"

සචී මගේ අතින් ඇදගෙන පාර පැන්නත් මට කතා කරන්න දෙයක් ඔලුවට ආවෙම නෑ. මේ කෙල්ලොත් වෙලාවකට මාර හතර බීරි කතා තමයි කියන්නෙ. සචී ඉස්සර වෙලා ගිය නිසා මං එයා දිහා බලාගෙනම පිටි පස්සෙන් ගියා. කෙල්ලට මේ ඇඳුම් කඩ මාර හුරුයි වගේ. ගේ ඇතුලෙ ඇවිදිනවටත් වඩා මතකෙන් මේක ඇතුලේ ඇවිදින්නෙ. ඒකි සාරි හතරක් පහක්ම දිග ඇර ඇර බලලා අන්තිමට එකක් තෝර ගත්තා. ක්‍රීම් පාටට හුරු ඒ සාරිය ඇත්තටම අපේ අක්කට ලස්සනට තියෙයි කියලා මට හිතුනා.





" මේක හොඳයිද රන්දූ ? ඔයා මේකට කැමතිද ?"

" සාරිය නම් ලස්සනයි. ඒත් මේක ගොඩක් ගණන් ඇතිනෙ."

මොනව කරන්නත් මං ගෙනාවේ රුපියල් දෙදහයි. මේක ඒට වඩා වටිනවා ඇති. මං නිකමට හරවලා ගාණ බැලුවා. දෙදහස් පන්සිය පනහයි. මේකිත් මාව මාර අමාරුවක තමයි දාන්න යන්නෙ.

" මං ළඟ තියෙන්නෙ දෙදාහයි බං"

මං සචීගෙ කණට කරලා ඇත්තම කිව්වත් ඒකි ඒක ඇහුනෙ නෑ වගේ හිතා වුනා.

" මිස් මේක ගන්නවද ? මිස් සුදු නිසා මේ කලර් එක හොඳට යනවා."

සේල්ස්මන් සචී දිහා බලලා ඇහුවේ මේ සාරිය ඒකිට කියලා හිතලා වෙන්න ඇති.

" ඔව් ඕක දෙන්න."

SLU

" මිස් ලයිනින් "

අනේ අම්මපා මේ යකා අපිව විකුණන්නමයි හදන්නෙ. වෙන ගන්න මගුලක් අපේ අක්කා ගන්නෙ නැතෑ. මං එහෙම



WWW.EXPRESSLANKA.TK 103

හිතුවට සචී ඒකත් අරගත්තා. දැන් ඉතිං බිල ගෙවන්න එදා වගේ හැට් කලෙක්ෂන් එකක්වත් දාන්න වෙනවා. බිල් කරන්න ගියාම ගාණ දෙදහස් හයසිය ගාණක්. මගේ දෙදාහත් අරන් සචී ඉතුරු එක දාලා ගෙවද්දි මට පොළව පලන් යන්න හිතුනා. ඇයි දෙයියනේ බැංකු මැනේජර්ගෙ පුතා බඩු අරන් සල්ලි මදි උනාම කෙල්ලෙක් ලෝස් නැතිව ඒක ගෙවන එක වාවන්න පුළුවන්ද ? ඒත් ඉතිං වට් වු ඩූ නපුරු කලට කියලා හිතලා මං සචී එක්ක එළියට ආවා.

" ඉතුරු ගාණ මං හෙට ගේන්නං සචී. ඔයා කරපු උදව්වට තැන්ක්ස් "

" ඒ සල්ලි මට එපා රන්දූ. ඔයාගෙ අක්කගෙ ප්‍රසන්ට් එකට මමත් දායක උනා කියලා හිතා ගන්න."

මේ කෙල්ල කරන වැඩ වලින් මට දවසින් දවස එයාට ණය කාරයෙක් වෙනවා.

" රන්දූ තාම වෙලාව දෙකයි දහයයි. අපේ කට්ටිය එද්දි තුන විතර වෙනවනෙ. අපි මොකද කරන්නෙ ?"

සචිත් අහන්නෙ මාර කතා. කරන්න නං කොයි තරං දේවල් තියෙනවද ? ඒත් මේ රන්දූවා ක්ලීන් සූට් එම්ටි පොකට් කියලා ඇයි මේ කෙල්ලට තේරෙන්නෙ නැත්තෙ.

" අපි ටිකක් කතා කරන්න පුළුවං තැනකට යං"





අපිට කතා කරන්න ඕන නං මේ නුගේගොඩ ඉදලම ඒක කරන්න බැරිද කියලා මං කල්පනා කරලා බැලුවා. ඒත් මේ පට්ට දවාලෙ මේ තරං ජනාකීර්ණ ටවුන් එකක දාඩිය පෙර පෙර කෙල්ලෙක් එක්ක කතා කර කර ඉන්න පුළුවන්ද ? මට පටාස් ගාලා මතක් උනේ අඩු මුදලට වැඩි වටිනාකමක් තියෙන එකම තැන, පබ්ලික් ලයිබ්‍රරිය.

මං සචීවත් ඉස්සර කරගෙන බස් එකට නැග්ගා. මේ කොන්ක්‍රීට් වනාන්තරේ කොයි තරම් සෙනඟ හිටියත් ලයිබ්‍රරි එකට ගියාම එතන තිබුණෙ හරිම නිස්කලංක බවක්.

" අපිට ආපහු නුගේගොඩට යන්න වෙලා ඇතිවෙයිද රන්දූ"

ගේට්ටුවෙන් ඇතුලට යන්නත් කලින් මේකි ඔරලෝසුව දිහා බලලා බරබරේ දානවා. දැන් කොහේ හරි යං කිව්වෙත් එයාමයි. ආවට පස්සෙ යන්න තදියම. අපි දෙන්නා කැන්ටිමට ගිහින් බීම බෝතල් දෙකකුත් අරන් අයිනකින් ඉඳගත්තා. ඕහ්....... විනාඩි පහක් විතර ගියත් කෙල්ල කතා කරන පාටක් නෑ. බීම බටේ ඇඟිලි දෙකකින් අල්ලගෙන බෝතලේ අඩිය පහුරු ගානවා.

" සචී ...... මොනවද ඔයාට කියන්න තියෙන්නෙ ?"

" නිරෝධ ගැන"

SLU

ඒකි එකපාරටම ඒක කිව්වා විතරයි මගේ ඇඟේ කරන්ට් එකක් ගියා වගේ දැනුනා. කොහොමත් සචී ඔය ගැන කොයි වෙලාවෙ හරි කතා කරනවා කියලා මං දැනං හිටියා.



WWW.EXPRESSLANKA.TK 104

" ඇයි සචී ඌ ඔයාගෙන් මොනවා හරි ඇහුවද ?"

" එයා මගෙන් මුකුත් කෙලින්ම ඇහුවෙ නෑ. ඒත් මං ඒ ගැන දැනගෙන හිටියා."

ඔව් ඉතිං ගෑනුන්ට ඉව තියෙනවා කියන්නෙ නිකමටයැ. ගොනා හැරෙද්දි දන්නවා ඇති කෙසෙල් පැලේට කියලා.

" දැන් ඉතිං මොකක්ද තියෙන ප්‍රශ්නෙ ?"

" ප්‍රශ්නෙ මේකයි රන්දූ. නිරෝධ මෙච්චර දවස් ඕක යාළුවන්ට කියලා තිබුණෙ නෑ.එත් එයා ළඟදි ඕක අපේ කට්ටියට කියලා තියෙනවා. මට දැන් සාරංගලගෙන් බේරුමක් නෑ."

" ඌ ඕක කාටවත් කිව්වෙ නෑ සචී. සාරංගලා දැනගෙන තියෙන්නෙ වෙන විදියකට. හැබැයි මට ඕක කලින් කියලා තිබුණා. ඒත් මේ ළඟකදි"

" ඒ කියන්නෙ ඔයා දැනං හිටියා නිරෝධ ඔයාට මොනවද කිව්වෙ රන්දූ?"

" ඔයාගෙ කැමැත්ත අරගෙන දෙන්න කියලා කිව්වා. ඔයාට දෙන්න කියලා ලියුමකුත් මට දුන්නා. ඒත් තාම ඒක මං ළඟ"

ඒ පාර කෙල්ල ආපහු කල්පනා සාගරේ. මම බටෙන් බීම උගුරක් බිව්වා විතරයි මගේ රත්වෙලා තිබුණ පපුව සීතල වෙලා ගියා වගේ දැනුනා.





" සචී ඔයා කෙනෙක්ට ආදරේ කරනවා කියලා එදා නුවර ගිහින් එද්දි මට කිව්වනෙ. ඒ කෙනා නිරෝධ නෙමෙයිද ?"

ඔය ප්‍රශ්නෙට උත්තරේ දැනගන්න කල් මේ පිස්සු කෙල්ලගෙ පපුව කොයිතරම් පිච්චුනාද කියලා සචී දන්නෙ නෑ. ඒත් ඒකට උත්තරයක් නොදී අහක බලන් හිටපු ඒ මූණ මම මගේ පැත්තට හරව ගත්තා.

ඒ ලස්සන ඇස් පිහාටු යට වැටෙන්න බලාගෙන හිටපු කඳුළු බෝල දෙකක් කම්මුල් තෙමාගෙන ගලාගෙන යද්දි මගේ හිතට දැනුනෙ ලොකු දුකක්.

" කියන්න සචී ...... හැමදේම කියන්න. ඔයා අඬනවා බලන් ඉන්න මට බෑ."

" මගේ හිතේ නිරෝධ ගැන ආදරයක් නෑ රන්දූ. ඒත් පොඩි කාලෙ ඉඳලා යාළුවෙක් නිසා මට ඒක එයාට කෙලින්ම කියන්න බෑ. මගේ.... මගේ හිත තියෙන්නෙ වෙන කෙනෙක් ළඟ රන්දූ"

එහෙම කියලා කෙල්ල මේසෙට ඔළුව තියාගෙන ඉකිගහන්න ගත්තා. මං එයාගෙ ඔළුව හෙමීට අතගෑවෙ සචිව නලවන්න කියන්න ඕන මොනවද කියලා හිතා ගන්න බැරි උන නිසා. ඒ අතරෙ මං කල්පනා කලේ සචිනිගෙ ආදරේ දිනාගන්න පුළුවන් උන වාසනාවන්තයා කවුද කියලා. නිරෝධ ට්‍රැක් එකෙන් අයින් උනාට ඊට වඩා ලොකු චැලෙන්ජර් කෙනෙක් මට ඉස්සරහින් ඉන්නවා. ඒත්.....



WWW.EXPRESSLANKA.TK 105

ගොඩාක් වෙලාවකට පස්සෙ ඔළුව උස්සද්දි කෙල්ලගෙ ඇස් රතුපාට වෙලා කම්මුල් රෝස පාට වෙලාතිබුණෙ. මේ විදියට ඉද්දි ඒකිගෙ කවදාවත් නොදැකපු අහිංසක ලස්සනක් මට පෙනුනා.

" ඔයා නිරෝධට කෙලින්ම කියන්න මං කැමති නැහැ, ආයෙත් කවදාවත් මගෙන් ඔය ගැන අහන්න එපා කියලා."

" එතකොට ඔයා ආදරේ කරන්නෙ කාටද ?"

" ඒ ගැන මගෙන් අහන්න එපා රන්දූ ප්ලීස්. මං හරි පව්කාරියක්"

කවදාවත් කෙනෙක්ගෙ හිත රිදෙන්න වචනයක් නොකියපු සචී පව්කාරියක් උනේ කොහොමද කියලා මට හිතාගන්න බැරි උනා.

" මං ආදරේ කරන කෙනාට ඒක ඉක්මනට කියන්න. ඒක කියනකල් එයා බලන් ඉන්නවා කියලා එදා ඔයා කිව්වෙ කවුරු ගැනද?"

මං කියපු වචනයක් ගානෙ කෙල්ලට මතකයි.

" මං කිව්වෙ ඒ නිරෝධ කියලා හිතලා"

" ඒක තමයි මං කිව්වෙ මං හරි පව්කාරියක් කියලා."





ඒ කතාව මට තේරුනේ නෑ. ඒත් ඒ ගැන හාර හාර අහන එකෙන් වෙන්නෙ මේ අහිංසක හිත රිදෙන එක විතරයි.

" ඉතිං රන්දූ .... මට ඔයා ගැන කියන්නෙ නැද්ද ? ඔයාගෙ ගර්ල් ගැන."

මෙච්චර වෙලා කරපු කතාව වෙන පැත්තකට හරවලා මේකි හිනාවෙලා මගෙන් ඇහුවා. කෙල්ලො වෙලාවකට අහස වගේ. මේ දැන් වැහැලා ආයෙ තප්පරෙන් පායනවා.

" මට කොහෙද ගර්ල් කෙනෙක් ? කවුද ඔයාට කිව්වෙ ?"

" කිව්වෙ ගොඩක් විශ්වාසවන්ත කෙනෙක් "

" මොනවද එයා කිව්වේ ?"

SLU

" ඔයා පෝය දවසේ ලස්සන කෙල්ලෙක්ගෙ අතින් අල්ලගෙන කැළණි ගිහින් ඉන්නවා දැක්කා කියලා."

හුටා ගම කාලා. කවුරු හරි වහු කුණෙක් සචීට ගින්න දීලා. ඒත් ඒ තරම් සෙනඟ ගොඩක් මැද්දෙ මං හංසිගෙ අත අල්ලපු එක අපේ අම්මයි අක්කයිවත් නොදැකපු එකේ ඒක වෙන සැටලයිට් එකකට කොහෙන් අහු උනාද මන්දා.

" ඇයි කල්පනා කරන්නෙ ? කතාව ඇත්තනෙ"



WWW.EXPRESSLANKA.TK 106

" සීයට පනහක් ඇත්ත. සීයට පනහක් බොරු."

මං එහෙම කියද්දි සචීගෙ ඇස් ජිල්බෝල දෙකක් වගේ ලොකු වුනා.

" මොකක්ද ඇත්ත මොකක්ද බොරු "

" එදා විනාඩියකට විතර කෙල්ලෙක්ගෙ අතින් අල්ලගන්න උනා. ඒත් ඒ මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් නෙමෙයි."

ඊට පස්සෙ මං එදා මුළු සිද්ධියම සචීට කිව්වා. කොහොමත් හංසි අපේ ගෙදර යන එනවා කියලා එයා දන්නවනෙ.

" එතකොට ඔයාගෙ ගර්ල් රාණිද ? ඒ නංගි හරි ලස්සනයි. හැබැයි එයාට බඳින්න කෙනෙක් ඉන්නවලු."

කෙල්ලො තමයි කෙල්ලො මුන් නොදන්න දේකුත් නෑ. දන්න දේකුත් නෑ. කතාව අතරෙ මං නිකමට වගේ ඔරලෝසුව දිහා බැලුවා. මළා. හතරයි කාලයි. මේ තරම් වෙලා කතා කලා කියලා දැනුනෙවත් නෑ. මෙලහකටත් අරුන් ටික අපි දෙන්නව හොයන්න සී අයි ඩී එකෙන් දාලා ඇති.

" මං ඔයාව හම්බවෙන්න ආවා කියලා අක්කි දන්නවා. එයා ඒක කාටවත් කිව්වද දන්නෙ නෑ."

කියලා තිබුනොත් නං ඉතිං සොරිම තමයි. ගෙදර ගිහින් ඉවරයි. කොයි එකටත් මං සචීව ගෙදරට දාලා පංති ඇරෙන





වෙලාවට නුගේගොඩ බෝ ගහ ළඟට ගියා. මට වැඩිපුරම ඕනෙ උනේ වැඩේ ලීක්ද කියලා දැනගන්න.

මාව දැක්ක විතරයි කට්ටිය මගේ තොප්පියෙ ඉඳලා සෙරෙප්පු දෙකට යනකල්ම දෙතුන් පාරක් බලලා ප්‍රශ්න වැලක් ඇහුවා. ඒත් අචිනි කිසිදෙයක් ඇහුවේ නැතිව අමුතු බැල්මක් දැම්මා විතරයි. ඒ ලුක් එකෙන් මට තේරුණේ මේකි වැඩේ පත්තු කරලා නෑ කියන එක.

" කෝ බං විහඟයා ? ඌ ආවේ නැද්ද අද ?"

මං හතර වටේට බලලා ඇහුවේ මගේ අතීසාර මිත්‍රයගෙ මූණු පොඩ්ඩ නැති නිසා.

" උඹ හොඳ වෙලාවට දැන්වත් ආවේ. බලපං අද උඹේ යාළුවට වෙන දේ ඌවත් දන්නෙ නෑ."

"මේකයි සීන් එක. අපි උගේ ෆෝන් එකට දුන්නා හොඳ ලණුවක්. කතා කලේ ජනාලි. කොහොම හරි හවස හයට ඒ කෙල්ලව බලන්න අපේ ගොනා එනවා කිව්වා නාවල පාරෙ බස් ස්ටෑන්ඩ් එකට."

" කවුද බං පළවෙනි පාරට කෙල්ලෙක්ව බලන්න හැන්දෑවෙ හයට යන්නෙ. ඌට පිස්සුද ?"

" මුළු විස්තරේම හෙට කියන්නං. ජනා කිව්වා ඒකි රොටරි එකේ ක්ලාස් යන්නෙ. හයට බස් ස්ටෑන්ඩ් එකට එනවා කියලා.



WWW.EXPRESSLANKA.TK 107

අපිට මාට්ටු වෙයි කියලා වෙන්න ඇති මුලදි බෑ බෑ කියලා මූ අන්තිමට හා කිව්වා."

"දැන් කව්ද ඌ හම්බවෙන්න එතනට යන කෙල්ල "

මට අහන්න ප්‍රශ්න ගොඩක් තිබුණත් විහඟයා ගැන පව් කියලත් හිතෙනවා. ඌ කවදාවත් මට්ටු වෙන්නෙ නෑ. ඇඹලයා වගේ දකින දකින කෙල්ල පස්සෙ යනවනෙ.

" අපි බඩු ඇරෙන්ජ් කරලා තියෙන්නෙ. සිද්ධිය පියවි ඇහෙන් බලාගන්න ඕනෙ නං උඹත් වරෙන් අපි එක්ක."

අචිනිලා යන්න ගියාට පස්සෙ අපි පස්දෙනා හැංගි හැංගි ඒ පැත්තට ගිහින් බස් එකකට කවර් උනා. විහඟ පන්ති එන්නෙත් නැතිව ගෙදරට වෙලා ඌට තිබුණ හොඳම ඇඳුම අයන් කර කර ඉන්න ඇති.

හයට පහක් වෙද්දි මූ ඇවිත් බස් ස්ටෑන්ඩ් එකේ තිබුණ කඩයක් ලඟ හිටගත්තා පොර වගේ. මැක්සා කිටක් ගහලා හිටපු මගේ යළුවා දකිද්දි හිනා ගියා වගේම ඌ ගැන දුකත් හිතුනා.

ඊට ටිකකට පස්සෙ තාප පීප්පයක් විතර පුංචි, ලා කළු පාට නංගියෙක් ඇඹරි ඇඹරි ගිහින් ඒ කිට්ටුවෙන්ම හිටගත්තා. සාරංග හිනා වෙලා ඒ කෙල්ලව පෙන්නලා ඇහැක් ගැහුවෙ වැඩේට දාපු කෙල්ල එයා කියලා පෙන්නන්න. මූ කොහෙන් හොයා ගත්තද මන්ද මේ ඩෝසරේ. ටිකකින් මේ කෙල්ල බෑග් එක ඇරලා රෝස පාට සර්වියට් එකක් වගේ දෙයක් අතට





ගත්තා විතරයි විහඟයා කලබල උනා. ඒක වෙන්න ඇති හඳුනාගැනීමේ සංඥාව. ක්ලාස් කට් කරගෙන හොඳම සූට් එක ඇඳගෙන බලන්න ආව කෑල්ල මේකද කියලා හිතෙද්දි ඌට එලොව පොල් පෙනෙන්න ඇති.

පොර එතනින් හිමීට මාරු වෙන්න හදද්දි කෙල්ල ඌගේ අතින් අල්ලලා මොනවද ඇහුවා. දැන් ඌගේ අත දඬු අඬුවට අහු උනා වගේ ඇති. මූත් ගේම අත අරින පාටක් නෑ කෙල්ලව තල්ලු කරලා දාලා මූ දඩ බිඩ් ගාලා පාර පැන්නෙ අපි ඉන්න පැත්තට. අපි පස් දෙනාම එක සැරේ හූ කියාගෙන පාරට පැනලා ඌව වටකර ගනිද්දි විහඟයගෙ මූණ වතුරට දාපු පාන් බාගයක් වගේ බෙරි උනා. බස් ස්ටෑන්ඩ් එකේ හිටපු සමහරුන්ට සීන් එක තේරිලා වගේ උන් අපි දිහා බල බල හිනාවෙනවා. ඒ අතරෙ අර කෙල්ල සාරංගට වටා පාරක් දාලා යන්න ගියා. ඒක දකපු විහඟයා දැනගත්තා මේක සාරංගගෙ ගේමක් කියලා.

" මොනවද ඩෝ බලු වැඩ කරන්නෙ "

ආ....... අපේ මානමාල මහත්තයට තදවෙලා වගේ.

" කොහොමද උඹේ පියුමි නංගි ලස්සනද ?"

සාරංග නලෝලා අහද්දි මුගේ රතු කට්ට පැනලා වාර්තාගත දුරකට. ඒ සමහර විට ලැජ්ජාවත් කලවං උන නිසා වෙන්න ඇති.

" කොහෙන්ද උඹලා ඒකිව හොයාගත්තෙ ?"



WWW.EXPRESSLANKA.TK 108

" ඇයි නංගි කෙට්ටු වැඩිද ?"

" ඒකි හොඳයි හෙණ ගගහා වැහින රෑක ඇස් දෙක පියාගෙන තුරුල් කරං ඉන්න."

එහෙම කියලා අපිව තල්ලු කරගෙන මූ ගිහින් බස් එකක එල්ලුනා. මං ගෙදර ගිහින් ෆෝන් කරද්දි ඌගෙ මොබයිල් එක ඕෆ්. ගෙදරට ගත්තත් මූ ෆෝන් එකට ආවේ නෑ. අද කාපු වාටරේට බඩ පිරිලා කොල්ල වේල පහ නිදි ඇති.

SL-UNLIMITED . COM

සෙනසුරාදා හවස් වෙද්දි අපේ කට්ටිය ක්වචා වගේම අපේ ගෙදරට කඩා පැන්නා පාඩං කරන්න කියලා. ෂෝට්වල් දාලා ටී ෂර්ට් ගහලා බයිසිකල් වල ආවට මුන් පාඩං කරන්න පොත් ගෙනාපු පාටක් පෙනුනෙ නැහැ.පැපරාසි ටික වගේ මුන් ටික ආවා විතරයි අපේ ගෙදර මෙච්චර වෙලා තිබුණ සාමකාමී වාතාවරණය වාෂ්ප උනා වගේ.

" රෑ වෙලා පාඩං කරමු බං. වරෙන් එළියට "

මං සෙට් එකම අඬගහගෙන එළියට ආවෙ අපේ තාත්තට ඇහුනොත් මුන් පස්දෙනාගෙ විතරක් නෙමෙයි මගෙත් වීසා කැන්සල් වෙනවා කියලා දන්න නිසා. අපි කට්ටිය වටකරගෙන සාරංග විහඟගෙ මූණ දිහා බලාගෙනම අර සීන් එක ගැන කියන්න පටන් ගත්තා.





" හරි හරි නවත්ත ගනිං ඔය බම්බුව. දැන් ඒක ඉවරයිනෙ"

විහඟ සාකච්ඡා වටය පටන් ගනිද්දිම විරෝධතාවය ප්‍රකාශ කලා. ඊට පස්සෙ සාරංග කිව්වෙ අර බෝසර් කෙල්ල ගැන.

" ඒකි අපේ පැත්තෙ ඉන්න පොඩි වයර් ෂෝට් එකක් තියෙන ඩයල් එකක්. චොකලට් එකක් දෙනවා කිව්වොත් ඕන පරිප්පු වැඩක් කරව ගන්න පුළුවං "

" ජේනවා ජේනවා ඒකි චොකලට් කාලම වෙන්න ඇති ඔය සද්දන්ත ශරීරෙ හදාගන්න ඇත්තෙ"

මං එහෙම කියද්දි විහඟයා මටත් රවන්න ගත්තා. මූ ඇහෙන්න නෑ වගේ හිටියට කණ හලාගෙන ඉන්නේ.

" ඉතිං මං දවල් ගිහිං ඒකිට ලොකු චොකලට් එකක් දීලා සීන් එක කිව්වා විතරයි ඒකි අර වංගෙඩියක් වගේ තියෙන එක පයින්ම කැමති උනා."

සාරංග ඒක කියද්දි සිද්ධිය මතක් වෙලා අපිට ආයෙත් හිනා ගියා.

රෑ කට්ටිය ඇඟ පත හෝදගෙන කාලා බීලා මගේ කාමරේට රිංගුවේ පාඩං කරන්න පටන් ගමු කියලා. සාරංගයි දිනුකයි ආර්ට් කරන නිසා අපි හයදෙනාටම පොදු වෙච්ච ආර්ථික විද්‍යාව පේපර් ටිකක් කරන්න ගත්තා.



WWW.EXPRESSLANKA.TK 109

" ඒයි උඹලා දන්නවද වැඩක්"

එක පේපර් එකයි කරලා ඉවර කලේ විහඟයා කියවන්න ගත්තා.

" ඉක්මනට කියපං උඹේ ඔය වැඩේ."

" උඹලා දන්නවද අපේ අයියා ඒ ලෙවල් වලට පාඩං කරපු හැටි? නෑනෙ. විභාගෙට මාස හතරකට විතර කලින් පොර එයාගෙ ඒ ලෙවල් පොත් ටියුට් සේරම ටික ඇඳ වැහෙන්න ඇතිරුවා."

" ඒ මොකටද බං ?"

" ඒවා සේරම එක එක පාඩං කරලා අයින් කරන කල් ඇඳේ නිදාගන්න ඉඩ නෑනේ. එහෙම පාඩං කරලා ඉක්මනට ඇඳ හිස් කර ගන්නවා කියලා ඒ දවස් වල අපිටත් කිව්වා."

ඒකත් මාර හතර බීරි කතාවක් තමයි. මූ කියන විදියට නිදියගන්න එක්කො සේරම ටික පාඩං කරලා ඉවර කරන්න ඕනෙ. නැත්තං ඇහැරිලා ඉන්න ඕනෙ.

" ඉතිං උඹලගෙ අයියා නිදාගත්තෙ නැද්ද ?"

" නිදාගත්ත බං නිදාගත්තා "





" ෂා මාරයිනෙ. ඒ කියන්නෙ අයියාකාරයා විභාගෙ ඉවර වෙන්න කලින් අර පොත් සේරම පාඩං කරලා ඉවර කලාද ?"

අපි ඇහුවෙ කොරවෙලා වගේ. ඒත් මූගෙ අයියා ඒ තරං උගත් පොරක් කියලා ආරංචියක් නෑ.

" පිස්සුද බං. ඒකා විභාගෙ ඉවර වෙනකල්ම ඇඳ ළඟ පැදුරක් දාගෙන බිම නිදා ගත්තෙ. විභාගෙට පස්සෙ අර පොත් ටික ආපහු එකතු කරලා ඇඳ යටට දැම්මා."

අපි කට්ටියටම හයියෙන් හිනා යද්දි අම්මා කාමරේට ආවා.

" කට්ටිය පාඩං කරන සද්දෙ පාරටත් ඇහෙනවා ඇති. මං අක්කට ටීවි එක දාන්නත් එපා කිව්වා ඔයාලා පාඩං කරන නිසා. මේ ගොල්ලො කතන්දර කියනවා."

අම්මා එහෙම කියද්දි කතන්දරේ පටන් ගත්තු විහඟ පණ දාගෙන ගාණක් හදනවා. බොරුවට බැනලා වගේ කාමරෙන් ගිය අපේ අම්මා ආපහු ආවෙ කෝපි හදාගෙන. අපි කට්ටිය උත්තර සාකච්ඡා කර කර රෑ එක විතර වෙනකල් පේපර් කලා.

" හ් ආ........"

ෂෝටා යාර තුනක් විතර දිග ඇනුමක් ඇරපු පාර මට හිතුනෙම ඌගෙ කට ඉරෙයි කියලා.

" ටිකක් නිදාගෙන එලාම් තියලා නැගිටිමු බං."



WWW.EXPRESSLANKA.TK 110

ෂෝටා කියද්දි හැමෝම ඒකට කැමති උනෙ නිදිමත වැඩි නිසා වෙන්න ඇති. මං එහා කාමරෙ අයිනක දාලා තිබුණ අමතර මෙට්‍රස් එක ගෙනත් මගේ ඇඳ ළඟින් බිම දැම්මා.

" වැඩිය කොට්ට නං නෑ බං. හතරයි තියෙන්නෙ"

" මොන කොට්ටද මල්ලි. අපිට කළු ගලක උනත් ඔළුව තියන් නිදියන්න පුළුවං"

සාරංග දිනුකයි නිරෝධයි එක්ක ඒ මෙට්‍රස් එකට පැනලා දිගා උනා. ෂෝටා ඇඳේ බිත්තිය පැත්තෙ අයිනට ගියා. මං එලාම් එක උදේ හතරට තියලා ඒක ඇඳ ළගම තිබුණ පොත් කබඩ් එක උඩින් තිබ්බා.

" ඔය ලයිට් එක ඕෆ් කරලා වරෙන් බං."

උන්ගෙ සද්දෙට ලයිට් එක ඕෆ් කරලා ඇඳේ හිටපු ෂෝටයි විහඟයි මැද්දට පැන්නා. විනාඩි දහයක් විතර යද්දි ලී මෝලවල් දෙක තුනක් ලාවට ස්ටාට් උනා. මටත් නින්ද ගියා දන්නෙම නැතුව.

තද නින්දෙ හිටපු මාව ඇහැරුනේ ලස්සන මියුසික් එකක් ඇහිලා. ටිකක් වෙලා අහගෙන ඉද්දියි මට මතක් උනේ ඒ එලාම් එකේ සද්දෙ කියලා. ඒ සද්දෙට අපේ එකා දෙන්නා නිදිමතේ කෙඳිරි ගගා ප්‍රතිචාර දක්වන්න ගත්තා. ඇඳ අයිනෙ හිටපු විහඟ අත දික්කරා නං ඌට එලාම් එක ඕෆ් කරන්න පුළුවං. එත් ඌ තාම නිදි.





" විහඟ ..... විහඟ නැගිටපං බං. ඔය එලාම් එක ඕෆ් කරපංකො"

මං උගේ උරහිස හොල්ලලා කිව්වා.

" කෝ බං කොහෙද ඒක තියෙන්නෙ"

විහඟයා හිටියෙ මං හිටපු පැත්තට හැරිලා. ඌ එක ඕෆ් කරන්න එහා පැත්තට හැරෙන්න ඕනෙ.

" අනිත් පැත්තෙ බං තියෙන්නෙ. ඕෆ් කරපංකො මළ වදේ."

" රා........ යිට්"

SLU

කියලා මූ හැරෙද්දීම " අම්මෝ "කියලා මර ලතෝනියක් ඇහුනා. තාමත් එලාම් එක වැඩ. මං ඇඳ අතගාලා බලද්දි විහඟ හිටපු හරිය හිස්. අඩියට දෙකට ඇඳෙන් බැහැපු මං ලයිට් එක දැම්මා. දැක්ක සීන් එකට මට හිනාවෙලාම නිදිමත ගියා.

විහඟයා සාරංගගෙයි දිනුකගෙයි ඇඟ උඩ හතරගාතෙ දාලා වැටිලා. උන් තුන්දෙනා එකාට එකා තල්ලු කරන් නැගිටින්න හදනවා. මං එලාම් එක ඕෆ් කරලා ෂෝටාට කතා කලා. ඌත් පුදුම වෙලා වගේ විහඟලා දිහා බලාගෙන.

" මොකක්ද බං මේ මෙතන වෙන්නෙ. මොකද මූන් උදේ පාන්දර මරා ගන්නෙ."



WWW.EXPRESSLANKA.TK 111

" මරාගන්නවා නෙමෙයි බං. මූ එලාම් එක ඔෆ් කරන්න කියලා අනිත් පැත්ත හැරුනා විතරයි ඇඳෙන් බිම."

මං විස්තරේ පැහැදිලි කලා. ෂෝටයි තිරෝධයිත් හිනාවෙවී බලන් ඉද්දි අරුන් තුන්දෙනාම නැගිට්ටෙ අපිට බැන බැන.

" අනේ යකෝ උඹලට ජොලි ඈ...?"

සාරංග විහඟව තල්ලු කරල දාලා ඇඳේ ඉඳගත්තා.

" බලපං මූ උදේම මහසෝනා වගේ ඇඟට පැනලා දවසම මස්ත බාල්දු කරානෙ"

" ඉට්ස් ඔකේ නව්. දැන් මොකද කියන්නෙ පාඩං කරනවද?"

මං ඇහුවෙ කට්ටියගෙ අදහස් දැනගන්න.

" පාඩං කරමු. එත් නිදිමතයි බං"

එහෙම කියලා ෂෝටා ආයෙත් ඇඳේ පෙරලුනා.

" එහෙනම් කට්ටියම නිදිමත යන්න වොෂ් එකක් දාගෙන එමු."

එකෙක් ඉවරවෙලා අනිකා හෝදන්න හිටියොත් අපිට හෙට දවල් වෙනකල්ම හෝද හෝද ඉන්න වෙයි. අපි කට්ටියම ඇඳුම්





ගලවලා ලයිට් එක ඕෆ් කරලා එක සැරේම බාත්රූම් එකට රිංගුවා. හතර වටේ තියෙන පයිප්ප ෂවර් සේරම ඇරලා වතුරෙ නටද්දිනං නිදිමත කොහෙන් ගියාද දන්නෑ.

" මචං උඹලගෙ අක්කා එහෙම ඇවිත් ලයිට් එක දායිද මන්දා"

ෂෝටා සබන් ගාන ගමන් වැදගත් ප්‍රශ්නයක් ඇහුවෙ.

" අවුලක් නෑ බං. එයා මේකට එන්නෙ නෑ. උඩත් එකක් තියෙනවා."

අපි නිගන්ඨයො සෙට් එක වගේ නාලා කරලා එකා එකා කාමරේට රිංග ගත්තා.

" සීතලයි බං. තාම හතරහමාරයි, තේ එකක් තිබ්බනං මරු."

මං කුස්සියට ගිහින් වතුර රත් වෙන්න තියලා ආවා. කට්ටිය පොත් දිග ඇරගෙන වැඩ. අපි උදේ අට විතර වෙනකල් ටියුට් බෙදාගෙන ෂෝට් නෝට් ගැහුවා.

" අද එකවුන්ට්ස් බං ක්ලාස් යන්නෙ නැද්ද ?"

" මේ දවස් වල අවසාන ගිණුම් කරන්නෙ. ඒ නිසා කොහොමහරි යං."



WWW.EXPRESSLANKA.TK 112

දඩි බිඩි ගාලා උදේට කාලා අපි කට්ටිය පන්ති යන්න ලෑස්ති උනා. කට්ටිය මෙහෙ ආවේ ෂෝට්වල් දාගෙන නිසා පන්ති යන්න ඇන්දේ මගේ ඇඳුම්. මගේ ත්‍රීක්වාටර් එකක්නං ෂෝට්ටාට තියම උසට තිබුණ නිසා බෙල්ට් එකක් දාලා ඌ ඒක ඇන්දා මට ඌව පෙනුනෙ හරියට ගලිවර්ලා ටිකක් මැද්දෙ හිටපු ලිලිපුට්ටෙක් වගේ. අද නිවාඩු දවසක් නිසා තාත්තා අපිව නුගේගොඩට ගිහින් බැස්සුව. ඒකෙන් අවුලක් නැතිව වෙලාවට අපි ක්ලාස් එකේ.

* * * * * * *





Scanned for
SL-Unlimited.com
by Sheree

# 09

කාලෙකට පස්සෙ අපි දහදෙනාම සෙන්ට්‍රල් භූමියට සම්ප්‍රාප්ත උනා. ප්‍රින්සිපල් පණිවිඩ දෙක තුනක්ම එවලා තිබුණා කලා උළෙල මේ සතියෙ නිසා. කලා උලෙළට දවස් ගානක් ඉතුරුවෙලා තියෙද්දිත් මේ දොලහ වසරෙ අපතයො ටික බුක්මාක් විකුණලා ඉවර කරලා නෑ. ප්‍රෙස් එකට ගිහින් ඒ වැඩ සේරම කරලා මුන්ගෙ අතටම බුක් මාක් ටික දීලත් දැන් මාසයක් විතර ඇති.

" මොකක්ද බං මේකෙ තේරුම ? අපි නැතුව මුන්ට මුකුත් කරගන්න බැහැනෙ"

ඔෆිස් එකේ තිබුණ බුක් මාර්ක් ටික දකලා සාරංග කෑ ගැහුවා.

"ගනිං බං ඔය ටික. අද හොඳින් හරි නරකින් හරි මේක විකුණමු."



WWW.EXPRESSLANKA.TK 113

මං සාරංගලා විහඟලා එක්ක ඒ ටික අරන් ඔෆිස් එකෙන් එළියට ආවා.

" මචං උඹ එක්ස්පීරියන්ස් පොරනෙ. තෙල බෙදන වැඩේ උඹ බාර ගනින්. අපි ෆුල් සප් එක දෙන්නම්."

අද තෙල නං රත් කරලා හරි බෙදන්න ඕන. නැතුව මේකෙන් බාගයක්වත් විකුණගන්න බැරි වෙනවා. අපි මුලින්ම ගියේ දොළහ කොමර්ස් ක්ලාස් වලට. පන්තියෙ හැමෝටම බලෙන් හරි එක ගානේ විකුණලා අපි පරණ උන්ට ටික ටික දුන්නා හෙට විකුණලා ගේන්න කියලා. උන් වැඩි අවුලක් නැතුව වැඩේ බාර ගත්තා.

ආර්ට් ක්ලාස් පැත්තෙ යන්න නං කට්ටිය එක පයින් කැමතියි. අපි අන්තිමට ගියේ නෙත්මිලගෙ පංතියට. ඒ යද්දි ෂෝටගෙ නංගියි, දූෂානි හෙවත් බැරල් භාගෙයි අපේ රාණියි බර ටෝකක්.

" සෙන්ට්‍රල් භූමියේ මහා කලා මංගල්ලය වෙනුවෙන් අපි මේ සුකුමාල ලඳ බොළඳ රුවැත්තියන්ගෙන් නොමසුරු පරිත්‍යාගය බලාපොරොත්තු වෙන්නෙමු....."

කෙල්ලො තුන්දෙනා ඉස්සරහ තිබුණ පුටුවකුත් ඇදලා ඉඳගන්න ගමන් මං කිව්වා.

" අපි බුක් මාක්ස් ගත්තනෙ අයියෙ"





ඒක කිව්වෙ ෂෝටගෙ ගම්මිරිස් ඇටේ පවිත්‍රා. නෙත්මි කතා පෙට්ටිය වහගෙන මගේ දිහා බලන් ඉන්නවා. ඒකි මං දිහා බලාගෙන පිළිකුල් භාවනාව කරනවද දන්නෑ.

" හේෂාන් අයියෙ මට ටිකක් දෙන්න. මං විකුණලා දෙන්නං."

දූෂානි මගෙන් බුක්මාක් පනහක් ඉල්ල ගත්තා. මේ ඉටිරූපෙ වගේ ඉන්න නැහැදිච්ච කෙල්ල මාව තුට්ටුවකට මායිම් කලේ නෑ. මං ඒකිගෙ ඉස්සරහට සීයේ බණ්ඩලයක් දාලා කතා නොකරම හැරිලා ආවා.

" උඹ ඕක බලෙන් දුන්නට කෙල්ල විකුණන්නෙ නෑ බං."

විහඟ කින්ඩි හිනාවක් දාලා කියද්දි මටත් හිතුනා ඒක එහෙම වෙයිද දන්නෑ කියලා. මං ගැන නෙමේ ඉස්කෝලෙ ගැන ආදරයක් තියෙනවනං කෙල්ල දහයක්වත් විකුණන්න ඕනෙ.

" බලපංකො හෙට වෙන දේ. ඕකි අර බස්වල බෙදන බෝධි පූජා පොත් වගේ හෙට උදේට ඔය මිටියම රිටන් කරයි."

" රයිට්! එහෙම වෙන්නෙ නෑ. මොනවද ඔට්ටු"

" කෙල්ල ඕක විකුණුවොත් මං උන්ගෙ පන්තිය මැද්දෙ කවියක් කියනවා."

මායි විහඟයි බුක් මාක් විකුණන එක නතර කලේ චැලෙන්ජ් එකකුත් දාලා.



WWW.EXPRESSLANKA.TK 114

මේ ටිකේ කලා උළෙල නිසා ඉස්කොලෙ හරියට වැඩක් කළෙත් නෑ. සමහරු නටනවා. සින්දු කියනවා. සරසනවා. ඇඳුම් ලෑස්ති කරනවා. වැඩ කෝටියයි. අපිත් විභාගෙ ටිකකට අමතක කරලා අපේ අන්තිම කලා උළෙල වෙනුවෙන් කරන්න පුළුවං හැමදේම කලා.

හවස ගෙදර ගිහිල්ලත් මං කල්පනා කලේ විහඟ කිව්වා වගේ නෙත්මි බුක් මාක් ටික රිටන් කරයිද කියලා. එහෙම උනොත් චාටර් ගෝනියයි. මං නිකමට වගේ ෂෝටට කෝල් කලා නංගිගෙන් විස්තරයක් දැන ගන්න පුළුවංද බලන්න.

" උඹ බය වෙන්න එපා බං. උඹ කියන්නත් කලින්ම මං නංගිගෙන් ඕක ගැන ඇහුවා."

" ඉතිං නෙත්මි මොනවද කියලා තියෙන්නෙ ?"

" ඒකි රත්නපුරේ මැණික් කාරයෙක්ගෙ දුවෙක්නෙ බං. කෙල්ල කිව්වලු ඕක විකුණගන්න පුළුවං උනත් නැතත් හෙට උඹට සල්ලි දෙනවා කියලා."

උෟ කියපු අන්තිම වචන ටික මගේ කණට මී පැණි වක්කලා වගේ. ඒ කියන්නෙ හෙට විහඟයට කවියක් කියන්නම වෙනවා. එළකිරි!

SL-UNLIMITED.COM





පහුවෙනිදා උදේ මං ඉස්කොලේ යද්දි අපේ පන්තියෙ කෙල්ලො ඔටෝ ග්‍රාෆ් දෙකතුනක් මාරු කරකර බලනවා. සචී එයාගෙ ඔටෝ එක මට දුන්නා යාළුවන්ට කියලා ලියලා දෙන්න කියලා. එක වසරෙ ඉඳලා දහතුන වසර වෙනකල් එකට හිටපු අපි සෙට් එක මතක් වෙන්න ඔය පොත්වල කුරුටු ගාන්නම ඕනායැ. මේ කෙල්ලන්ට මොලේ අමාරුව.

" දැන් ඕක දුන්නෙ අපිට ලියන්න කියලනෙ. මෙන්න මෙහෙ දියන් මං ලියන්නම්."

විහඟයා මටත් කලින්ම ඒක උදුරලා ගත්තා. උෟ පෑන අරන් එකෙ මොනවද ලියා මගේ අතට දුන්නම මං මුළු පන්තියටම ඇහෙන්න ඒක හයියෙන් කියෙව්වා.

" කවියක් කියන්නම් සචිනියො මරේ මරු
කලිසං කාරයෝ ඔක්කොම ලෝක හොරු
නැෂනල් කාරයෝ සේරම පොතේ ගුරු
විහඟ වගේ හැන්ඩි බුවෙක් උඹට මරු "

මං ඒක කියවලා ඉවරවෙද්දි කොල්ලො ටික විහඟට හූ කියලා කෑ ගැහුවා.

" අඩෝ උඹ කලිසං නැතුව අමුඩෙද අඳින්නෙ ?"

" මේ විහඟ උඹට මේ කවියෙන් ෂේප් වෙන්න බෑ. අද උඹට තව කවියක් කියන්න වෙනවා. යමං."



WWW.EXPRESSLANKA.TK 115

මං ඌව ඇදගෙන ආර්ට් ක්ලාස් පැත්තට යද්දි අපේ අනිත් කට්ටියත් සෙට් උනා.

" බලපං උඹට තමයි කවි කියන්න වෙන්නෙ. කෙල්ල සල්ලි දෙන්නෙ නැහැ."

මේකා බිරුවට මං සැලෙන්නෙ නෑ. නෙත්මි සල්ලි දෙනවා කියලා මට ෂුවර්නෙ. අපි පංතියට යද්දි නෙත්මිලා ප්‍රක්ටිස් වලට මේන් හෝල් එකට ගිහින්. පවිත්‍රා නංගිත් අපි එක්කම මේන් හෝල් එක පැත්තට යන ගමන් මට ඉඟියක් දුන්නා වැඩේ හරි කියලා.

" ආ..... අර ඉන්නෙ රාණි ස්ටේජ් එකේ. උඹ ගිහින් සල්ලි අහපංකො මුලින්ම."

මාව ඉස්සරහට දාලා මගේ පස්සෙන්ම විහඟත් නැග්ගා ස්ටේජ් එකට. අපිව දැක්කා විතරයි දුෂානියි නෙත්මියි උන් දෙන්නගෙ පර්ස් දෙකත් අරන් ඉස්සරහට ආවා.

" නංගි ඔයාලට බුක් මාක් කීයක් විතර විකුණන්න පුළුවන් උනාද?"

"අයියා මට දීපු ටිකේ සල්ලි මෙන්න"

දුෂානි පන්සීයේ කොලයක් මගේ අතට දෙද්දි විහඟගෙ රබර් ඇහැ කැරකුණේ නෙත්මි වටේ.





" මෙන්න අයියේ මට දීපු සීයේ සල්ලි"

විහඟගේ ඇස්ගෙඩි දෙක එළියට පනින්න ඔන්න මෙන්න තියෙද්දි නෙත්මි මගේ අතට කිරි කිරි මොණරෙක් පූජ කලා.

" මචං මේ ...... උඹට ජේනවා නේද ?"

මං දාහ ඌගේ මූණ ඉස්සරහා දෙපාරක් විතර එහෙට මෙහෙට ගෙනියද්දි කෙල්ලො දෙන්නා පුදුම වෙලා වගේ බැලුවා.

" එහෙනම් මල්ලි කියමු නේද ?"

ඌ මේන් හොල් එක වටේම හොඳට බැලුවෙ මෙතන කී දෙනෙක් විතර ඉන්නවද බලන්න. ඒ වෙද්දි එක එක පන්ති වල ළමයි පනහක් විතර තැන් තැන්වල ප්‍රැක්ටිස් කරනවා.

" මං ඔට්ටුව ඇල්ලුවෙ පන්තියෙදි කියන්නං කියලා"

මුලදි සද්දෙ දාපු ඌ දැන් නං ඇඹරෙනවා.

" මොකද මචං උඹට පුරුෂ ධෛර්‍යය අරන් එන්න අමතක උනාද ?"

සාරංග පල්ලෙහා ඉදලා කෑ ගහද්දි මූට තදවෙලා. 'මට උලත් එකයි පිලත් එකයි' එහෙම කියලා මූ ස්ටේජ් එක මැද්දට ගිහින් හයියෙන් සින්දුවක් කියන්න ගත්තා.



WWW.EXPRESSLANKA.TK 116

මං අපේ පස්දෙනාවත් කැන්දගෙන ගේට් එකෙන් එළියට ආවා. ඉස්කෝලෙට ටිකක් එහායින් පාළු පාරක් තියෙනවා. ඒ පැත්තෙ ගියානං කෙහෙල් කොට වැඩේ ගොඩ දාගන්න පුළුවං.

" බලපංකො මේ වගේ ජනාකීර්ණ පැත්තක මෙහෙම පාළු පාරක් තියෙනවා කියලා හිතාගන්නවත් බෑ."

මං කිව්වෙ වටේ පිරිලා තිබුණ කැලෑව දිහා බලාගෙන.

" මේ පාර වැටෙන්නෙ කනත්තට බං. හවස හයෙන් පස්සෙ මෙහෙන් වැඩිය සෙනඟ යන්නෙ නැලු."

විහඟ උං දන්න ජනප්‍රවාදෙ කිව්වා විතරයි සාරංගයා බකස් ගාලා නෝන්ඩි හිනාවක් දැම්මා.

" ඕවා මනස්ගාත බං. මැරුණ එවුන්ට මොකටද බයවෙන්නෙ ? උඹලත් ගැණු වගේ ඕවා විස්වාස කරනවනෙ."

"හරි හරි උඹ ඉතිං පොරනෙ. මේ වගේ පාරක මහ රෑ තනියම යන්න කිව්වොත් උඹට පුළුවන්ද ?"

සාරංගයි විහඟයි යුද්ධ ප්‍රකාශ කරන්න හදන්නෙ. එදා නාවල බස් ස්ටෑන්ඩ් එකේදි කාපු චාටරේ නිසා විහඟ කොහොමත් සාරංග එක්ක ටිකක් විතර ඔරොප්පුයි.

" මේ හරියෙන් කෙහෙල් කොට ටිකක් කපා ගමු බං. කනත්තෙ තියෙන ඒවා කපන්න එපා කියන්න කවුරුවත් නැහැනෙ"





අපි කැන්ටින් එකේ අන්කල් ගෙන් ඉල්ලන් ආපු මන්න දෙක අරගෙන කෙහෙල් කැන් තිබුණෙ නැති ගස් හතරක් පහක්ම කපා ගත්තා.

" මේ ටික කැපුවා වගේ නෙමෙයි කරේ තියන්ද ගෙනියන්නෙ?"

කෙහෙල් කොට ටික පාර කිට්ටුවට ඇදගෙන ඇවිත් අපි ටිකක් වෙලා බිම වාඩි උනා.

" බලපංකො කනත්ත දැක්කා විතරයි බං මහලොකු චණ්ඩියගෙ කට වැහිලා."

" ඇයි උඹලා හිතුවෙ මං චීත්ත අඳින ජාතියෙ එකෙක් කියලද ? මං බය නෑ ඩෝ "

සාරංග තදයා වගේ විහඟ ළඟට ළං උනා. මේ කතාවත් නතර වෙන්නෙ තව ජරමරයකින් කියලා මට නං ෂුවර්.

" හරි රෑ දොළහට ඕනෙ නැහැ. අද රෑ අටට විතර උඹට මේ පාර දිගේ තනියම ඇවිදගෙන යන්න පුළුවන්ද ?"

ඔන්න විහඟයා ලැජ්ජ නැතිව තවත් ඔට්ටුවක් දැම්මා අද කවි කියන්න ගිහින් චාටර් උනා මතක නෑ වගේ. විහඟගෙ අදහසට සාරංග කැමති උනේ දෙපාරක් හිතන්නෙ නැතිව. වැඩේ නිකම්ම නිකං ක්ලෝස් උනොත් මෙලෝ රහක් නැනෙ. මට පොඩි අයිඩියා පාරක් ආවා.



WWW.EXPRESSLANKA.TK 117

" අපෝ මට නං ඔය නයිට් රන් එකට එන්න බැරි වෙයි. අපේ තාත්තා මට වේලාසන එන්න කිව්වා."

මං කට්ටියට ඇහෙන්න දාර නයෙක් ඇරියෙ. මුං සේරම බර බරේ දැම්මට මගේ හිතට නං පොඩි ජොලියක් ගියා.

" අන්න බං ට්‍රැක්ටරයක් එනවා. ඔය මනුස්සයට කියලා මේ ටික ඉස්කොලෙට යවා ගන්න බලමු."

ඒ මනුස්සයාව දැක්කා විතරයි අපේ කතාව නතර වුනා. අපි ඒ අන්කල්ට පොඩි ෂේප් එකක් දාලා ඉස්කොලෙට යන්න කැමති කර ගත්තා.

" අන්කල් මේ හරියෙ ගොක් අතු කපා ගන්න තැනක් නැද්ද ?"

කෙහෙල් කොට ටික පටවලා ඉවර වෙලා මං ඇහුවෙ අපේ ඊළඟ අදියර ගැන.

" ගොක් අතු කොච්චර විතර ඕනෙද මහත්තයො ? මං හවහට ඉස්කෝලෙට ගෙනැත් දාන්නං"

අන්කල් අපිට වැඩේ ලේසි කරපු නිසා අපි කට්ටියත් ට්‍රැක්ටරේ පිටිපස්සට නැගගත්තා ඉස්කෝලෙට යන්න.

" මහත්තයලා ගොක් කොල හොයන්න කියලා හැන්දෑ කොරේ මේ පැත්තෙ එහෙම එනවා නෙමෙයි."





" ඒ මොකෝ අන්කල් ඒ ?"

" හවහට මේ පාර මහ පාළුයි මහත්තයො. වැඩිය සෙනඟ ගැවසෙන්නෙ නැහැ නොවැ."

මං හොරෙන් සාරංග දිහා බලද්දි ඌගේ මූණ ටිකක් වෙනස් වෙලා වගේ.

" ඇයි අන්කල් කනත්තෙ හොල්මන් තියෙනවද ?"

ෂෝටා ටක්ගලා ඇහුවෙ අපි හැමෝම දිහා බලලා.

" මිනිස්සුනං ඔය කියන්නෙ. හැබැයි මට නං තාම මුලිච්චි වෙලා නෑ. කොයිකටත් මහත්තයලා නේන තරමට හොඳා."

අන්කල් අපිව ඉස්කෝලෙට දැම්මට පස්සෙ අපි අන්කල්ට රුපියල් දෙසීයකුත් දීලා ගොක් කොල වැඩෙත් බාර දුන්නා.

" අනේ රන්දූ ඔයාලා කොහේද ගියේ ? මං ඔයාව හැමතැනම හෙව්වා."

සචී දුවගෙන ආවේ මූණත් බෙරිකරගෙන. මොකක්ද දන්නෑ කේස් එක.

" ඇයි සචී ?"

SLU

මිහ්. මේකිගෙන් උත්තරයක් නෑ.



WWW.EXPRESSLANKA.TK 118

"පියාටත් හොරා මම ඔබ
සොයා එමි ළඳේ......
නවාතැන මගේ ඔබෙ ඇඳ
යටයි සොඳුරියේ..........."

"මචං උඹ පොරොන්දු උනේ සින්දු නෙමෙයි කවියක් කියන්න. නව් ස්ටා....... ට්"

අපේ සද්දෙට සේරම ළමයි කර කර හිටපු වැඩ නවත්වලා මේ පැත්ත බලාගෙන. විහඟත් සින්දුව නතර කරලා කවියකට බැස්සා.

" මා වැනි බිලින්.........දා......
කොට කලිසමක් ඇන්දා...........
ඒකෙ හිලක් හන්.....දා.........."

" අඩෝ ඇති ඇති නවත්තපා.......ං"

අපි එක සැරේටම කෑ ගැහුවෙ මූගේ බ්‍රේක් නැති කටෙන් ඊගාවට පිටවෙන පදේ එච්චර හොඳ නැති නිසා. මූ කල්පනා කරලා ඒ කවියම ආපහු කිව්වා.

" මා වැනි බිලින්දා.......
කොට කලිසමක් ඇන්දා........
ඒකෙ හිලක් හන්දා............
උඩින් තව කලිසමක් ඇන්දා......"





මුළු හෝල්එකම එක සැරේට හූ කියලා කෑ ගහද්දි සංගීත සර් අපි ළඟට ආවා.

" ළමයි ඔයාලා කලා උළෙල දවසට ඕකත් කියනවද ?"

සර්ගෙ පුදුම වෙච්ච මූණ දකිද්දි අපි කට්ටියට හිනාව නවත්තගන්න බැරි උනා.

" නෑ නෑ සර්, ඒක පොඩි ඔට්ටුවක්"

අපි හිමීට එතනින් කැපිලා පන්තියට එද්දි විහඟ කලින් කියන්න දුන්නෙ නැති අන්තිම පදෙත් දලා කවිය සම්පූර්ණ කලා.

SL-UNLIMITED.COM

කලා උළෙලට දවස් දෙකක් තියෙද්දි අපේ ප්‍රින්ස් නැටුම් මිස්ගෙ උදව්වට කියලා හංසිවත් ගෙන්නගෙන. අපි ටිකක් හයියෙන් සද්දයක් දාපු ගමන් හංසිගෙ ඇස් දෙක මගේ ළඟ. මේ කෙල්ල වෙලාවකට අපේ අක්කට හපන්.

" මචං ප්‍රින්ස් කිව්වා ගොක් අතුයි කෙහෙල් කොටයි ටික හොයන වැඩේ බාර ගන්න කියලා. අපි යන්ද එළියට"

" මරුනෙ යමං යමං"



WWW.EXPRESSLANKA.TK 119

" අපි කෙහෙල් කොට කපන්න ගියා දූනුයි ආවේ."

" අපිට හවස නැටුම් ප්‍රැක්ටිස් ඉන්න කිව්වා. හවස රිවිෂන් එකට යන්න බැරිවෙයි. ඔයාලා යනවද ?"

" අපිටත් සින්දු වගයක් තියෙනවා ප්‍රැක්ටිස් වෙන්න. හවස මේන් ගේට් එක පැත්ත සරසන්නත් කිව්වා. ඉතිං මොන ක්ලාස්ද?"

සචී හිනාවෙලා හැරිලා ගියා. ඒ යන අතරෙත් හොරෙන් වගේ හැරිලා අමුතුම බැල්මක් දැම්මෙ. අනේ මන්දා මේ කෙල්ලො.......

ඉස්කෝලෙ ඇරුනා විතරයි අපි ගෙදර ගියේ ඇඳුම් මාරු කරලා ආයෙත් එන්න බලාගෙන. සාරංගයි දිනුකයි එක ළඟ නිසා උන් දෙන්නා ගියාට පස්සෙ විහඟයි ෂෝටයි, නිරෝධයි තුන්දෙනාම මගෙත් එක්ක අපේ ගෙදර ආවා. අපි ඇඳුම් මාරු කරලා කන ගමන් කතා කලේ රෑට තියෙන කනත්තෙ සීන් එක.

" දැන් උඹ මොකද රෑට එන්න බෑ කිව්වෙ"

" ඒක කියන්න තමයි මං අරූට හොරෙන් උඹලට මෙහෙ එන්න කිව්වෙ."

තුන් දෙනාම මගේ ළගට ඔළු දික් කරගෙන කුමන්ත්‍රණේට සෙට් වෙලා.





" මෙහෙමයි වෙන්න ඕනෙ. අපි හවස සරසලා ඉවර උනාම මං ෂෝටා එක්ක ගෙදර එනවා කියලා එතනින් කැපෙනවා."

" මේ මමත් "

SLU

ෂෝටා පුදුම වෙලා වගේ ඇහුවෙ.

" අහපංකො ඉස්සෙල්ලා කියන දේ. අපි දෙන්නා එතනින් කැපිලා බඩු ටිකත් අරගෙන කනත්ත ළඟට යනවා. අටට විතර උඹලා තුන්දෙනා සාරංගව එහා පැත්තෙන් පාර පටන් ගන්න හරියෙන් බස්සලා මෙහා පැත්තෙ පාරෙ කනත්ත පේන දුරින් හිටපං"

" දැං එතකොට උඹ වේලාසන එතනට ගිහින් මොකද කරන්නෙ?"

විහඟ එකපාරටම ඇහුවා. ඌනෙ මේ ඔට්ටුව දැම්මෙ. ඉතිං පොර මාර උනන්දුයි වැඩේ ගැන.

" මං තමයි බං මහසෝනා. මං යකා වගේ ඇඳලා එතන පාර අයිනෙම තියෙන කොස් ගහේ අත්තකට නැගලා ඉදලා සාරංග එතනින් යද්දිම ඌගේ ඇගට පනින්නං"

" එළකිරි මචං. උඹටත් මාර අයිඩියා තමයි පහල වෙන්නෙ."

විහඟ ඇවිත් මාව බදා ගත්තා.

" එතකොට උඹ මොකටද ෂෝටව එක්කං යන්නෙ ? උඹ අනුන්ව බය කරන්න ගියාට තනියම යන්න උඹත් බයයි නේද?"

"පිස්සුද මල්ලි, මං මූව එක්කං යන්නෙ වේශ නිරූපනය සඳහා"

SLU

පවයක් ගහලා මං යන්තං ෂේප් උනා. දවල් අර අන්කල් කියපු කතා මතක් වෙද්දි බය හිතෙන්නෙ නැද්ද ?

" උඹට දාගන්න වෙස් මූණක් වගේ මොකක් හරි තියෙනවද? අපේ අයියා බිග් මැච් වලට දාපු මැක්සා බඩුවක් තියෙනවා අපේ ගෙදර. මං ගෙනත් දෙන්නං."

විහඟ ඉක්මනට කාලා රබර් ඔලු බක්කව අරන් එන්නං කියලා බයිසිකලේම ගෙදර ගියා. මං කළු දිග කලිසමකුයි කළු අත්දිග ටී ෂර්ට් එකකුයි කළු සපත්තු දෙකකුයි ලෑස්ති කරගත්තා.

" මචං කළුපාට සායක් වගේ එකකුත් තිබ්බ නං මරු."

නිරෝධ ඒක කියද්දි මට මතක් උනේ අපේ අම්මා කාටහරි දෙන්න කියලා ඇඳුම් වගයක් අයින් කරපු එක. එතන නං කළු දිග සායක් තිබුණා. අපි ඒක අරගෙන දණහිස් හරියට විතර වෙනකල් තීරු වෙන්න ඉරුවා. දැන් යකාගෙ කිට හරි. විහඟ එනකල් අපි තුන්දෙනා හිමීට පාරට ආවා.





අපි ඉස්කෝලෙට යද්දි අර අන්කල් ගොක් අතු ගෙනත් දාලා. හවස පහමාර විතර වෙනකල් සින්දු ප්‍රැක්ටිස් කරලා හවස අපි සරසන්න කියලා නතර උනා.

" මල්ලි මං අද ඔයාලගෙ ගෙදර යන්නෙ. ඔයා රෑ වෙන්නෙ නැතුව එනවා නේද ?"

හංසි යන්න කලින් මං ළඟට ඇවිත් ඇහුවා.

" මං මේ වැඩ ඉවර වෙලා නමය විතර වෙද්දි ගෙදර එනවා."

මං කිව්වේ අපේ ෂෝ එකටත් වෙලාව වෙන්කරලයි. කොහොමටත් හංසි ගෙදර ගිහින් මං ඉස්කොලෙ ඉන්නවා කිව්වම අවුලක් නැනෙ. සචීලත් හංසි අක්කා යන වෙලාවෙම වගේ ගෙදර ගියා. සචී මේ ටිකේ ගොඩාක් අමුතුයි කියලා මට කෙල්ලගෙ ඇස් දෙක දකින හැම වෙලාවෙම හිතෙනවා. කොහොමහරි හත විතර වෙනකල් වැඩ කලේ අපි ටිකයි සර්ලා දෙන්නෙකුයි දොලහ වසරෙ මල්ලිලා සෙට් එකකුයි විතරයි.

" මචං මං දැන් යන්න ඕනෙ. උඹලා අර වැඩේට යනවා නේද?"

මං අපේ කට්ටියයි සාරංගයි සේරම ඉන්න තැන ඇහුවා. සාරංග විහඟගෙ මූණ බැලුවෙ අද වැඩේ කරනවද කියලා දැනගන්න.

" ඔව් ඔව් මූ අද රෑට රෙකෝඩ් එක තියනවලු"



WWW.EXPRESSLANKA.TK 121

සාරංගටත් කලින් විහඟ කිව්වා. ඔට්ටුවෙ හැටියට විහඟ පැරදුනොත් උෟ සාරංගට රුපියල් දාහක් දෙන්න ඕනෙ. සාරංගත් හා කිව්වෙ ගාණ ටිකක් බර නිසා. ඒ වගේම තමයි විහඟත් වැඩේ ඇරියෙ නෑ. උෟ අර යක් මූණත් ගෙනත් මට දුන්නා. සාරංගට හොරෙන් උන්ට බායි පාරක් දාලා මං ඇඳුම් බෑග් එකත් අරන් ෂෝටා එක්ක පාරට ආවා. අපි දෙන්නා කනත්ත පාරට හැරෙද්දි ඒ හරියෙ හිටපු මිනිස්සු පුදුම වෙලා වගේ අපි දිහා බැලුවෙ.

"මචං මේ හරියෙන් එහාට කට්ට කරුවලයි බං. ලයිට් කණුවක්වත් නැහැනෙ."

ෂෝටගෙ කටහඬත් ටිකක් විතර වෙව්ලනවා. උෟට නොපෙන්නුවාට මගේ හිතටත් නිකං කුච් කුච් හෝතාහේ වගේ.

" බය වෙන්න එපා අපි දෙන්නමනෙ යන්නෙ"

හතහමාර පහු වෙද්දි අපි කනත්ත හරියට ගියා. පාර එක පැත්තක දිගටම කනත්ත. අනිත් පැත්ත තනිකරම කැලෑව වගේ. ගෙවල් එකක්වත් නෑ. මං ඇඳගෙන හිටපු කිට් එක උඩින්ම අර කළු ටී ෂර්ට එකයි කලිසමයි දා ගත්තා. සායත් ඇඳලා අර බලි ඔළුවත් රිංග ගත්තම මගේ ඇස් දෙක විතරයි එළියට පෙනුනෙ. ෂෝටයි මමයි දෙන්නම ටෝච් දෙකක් අරන් ආව නිසා වැඩිය අවුලක් නෑ.

" මට උඹ දිහා බලන්නත් බයයි බං. උඹ දූන් ඇත්තටම යකෙක් වගේ."





එහෙම කියලා මූ මට කොස් ගහට නගින්න සපෝට් එක දුන්නා.

" මේ උඹ උඩ ඉඳලා හයියෙන් අල්ලන් හිටපං. බැරිවෙලාවත් මගේ ඇඟට එහෙම වැටෙන්න එපා."

ෂෝටාගෙ බය දූන් පිටාර ගලනවා. මට සේරටම වඩා මාර රස්නයක් දැනුනෙ. ඇයි දෙයියනේ ඇඳුම් තොගයක් ඇඳලා සපත්තු දාලා රබර් ඔළුවකුත් බස්සව ගත්තම කොහොම ඉන්නද?

" කෝ බං අටටත් කිට්ටු ඇති. මූං තාම නෑනෙ"

මං එහෙම කිව්වට මුගෙන් උත්තර නෑ. පොර ගහ යට නිදිද මන්දා.

" ෂෝටා උඹ ඉන්නව නේද ඔතන"

"ඉන්නවා බං ඉන්නවා. මට ඒත් උඩ බලන්න නං කියන්න එපා."

මූ ගම්මිරිස් ඇටේ වගේ ගහ මුල ගුලි වෙලා. එතකොටම පාර උඩහ ඉඳලා ත්‍රීවිල් එකක් ගිහින් කනත්ත ඉවර වෙන හරියෙ නතර කරා. ඒ ආවෙ විහඟයි නිරෝධයි දිනුකයි වෙන්න ඕනෙ. තව ටිකකින් උඩහ ඉඳලා සාරංගයා පාර දිගේ එයි. උන්ව බස්සලා ත්‍රීවිල් කාරයා යන්න ගියා. දූන්නං පස් දෙනාම ජේන හරියෙ ඉන්න නිසා වැඩි බයක් නෑ.



WWW.EXPRESSLANKA.TK 122

" මචං ඇත එකෙක් එනවා පේනවා. ඒ සාරංග වෙන්න ඇති."

මං ෂෝට්ට කියද්දි ඌ පේන්නෙ නැති වෙන්න ටක් ගාලා ගහට කවර් උනා. තව විනාඩි පහකින් විතර ඒ ආපු එකා අපි ඉන්න කිට්ටුවටම ආවා. ඌ හයියෙන් මොනවද කියව කියව ආවෙ. ළඟට එද්දි ඒ සාරංගගෙ කටහඬ කියලා මං අඳුර ගත්තා. ඌ හයියෙන් කියව කියව ආවෙ ඉතිපිසෝ ගාථාව. මහලොකු චන්ඩියා. පොර කොස් ගහ පහු කරද්දිම මං එක පාරට හයියෙන් හූවක් කියලා උගේ ඇඟට පැන්නා.

" බුදු අම්මෝ..............."

SLU

සාරංග බිම. කිසිම සද්දයක් නෑ. අපේ කට්ටිය සේරම ටෝච් පත්තු කරගෙන එතනට දුවන් ආවා. ඒත් පැනපු පාරට මගේ කකුල මොකක්ද වෙලා. නැගිටින්න බෑ වගේ.

" ඒයි මූට සිහිය නැති වෙලා බං. සාරංග....... සාරංග..."

විහඟ ටක් ගාලා වතුර බෝතලයක් ඌගෙ මූණට හැලුවා. එතකොටම ට්‍රැක්ටරයක සද්දෙ ඇහිලා බලද්දි අර අන්කලුත් එතනට ඇවිත්.

" මෙහේට ළමයි කට්ටියක් ගියා තාම ආවේ නෑ කියලා පාරෙ මිනිස්සු කියද්දි මට නිකමට හිතුනා මහත්තයලා වෙන්න ඇති කියලා. මොකට ආවද මේ අවේලාවෙ."





අන්කල් ආපු එක හොඳයි. නැත්තං අපිට යන්න වෙන්නෙ පයින් තමයි. මං කකුල ගසලා නැගිටිද්දියි අන්කල් මාව දැක්කෙ.

" කිරි අප්පච්චියේ....... මහත්තයා මේං මං ගියා."

අන්කල් අර මලකඩ හැලෙන ට්‍රැක්ටරෙන් විදගෙන ගියේ සුපර් ක්‍රොස් තරගෙකට එළවනවා වගේ.

" යකෝ දැන්වත් ඔය මගුල ගලවපං. අපරාදේ අර මනුස්සයත් බයවෙලා ගියානෙ."

නිරෝධ මගේ ඔළු බක්කා ඇදලා ගලවපුවම සාරංග හොඳට මගේ මූණ දිහා බැලුවා. හොඳට බලපං කියන්න වගේ ෂෝටා මගේ මූණටම ටෝච් එක අල්លුවා. මාව දැක්කම සාරංගට හිතුනෙ මොනවද කියලා දන්නෙ ඌම විතරයි. හැබැයි පොර තාම බයවෙලා වචනයක්වත් කතා කලේ නෑ. කට්ටිය සාරංගව අල්ලලා නැගිට්ටුවා.

" මාවත් නැගිට්ටපං බං. මගේ කකුල මොනවද වෙලා."

අරුන් මාව නැගිට්ටුවට පස්සෙ මං මහසෝනා කිට ගලවලා දැම්මා.

" ඌයි බං මගේ අතත් රිදෙනවා."

මං කෙඳිරි ගාද්දි ෂෝටා මගේ වැළමිටට ටෝච් එක ඇල්លුවා. වැලමිට හීරිලා ලේ ගලනවා.



WWW.EXPRESSLANKA.TK 123

" ඒයි මේ බලපන්කො බං. වැඩිපුර ඩැමේජ් මහසෝනටනෙ."

මුන්ට නං හිනා. මගේ කකුලත් උලුක් වෙලා. මං සාරංගගෙ කරට අත දාගත්තම මට දැනුනා ඌගෙ ඇඟ ගොඩක් රස්නෙයි කියලා.

" ඒයි සාරංග උඹ බය උනාද? උඹට හොඳටම උණනෙ බං."

මූත් ලාවට හිනා වෙලා මගේ අත අල්ලා ගත්තා. බයවෙච්ච පාරට ඌට වචනත් අමතක වෙලා. අපි මහපාරට ඇවිත් දෙපැත්තට බෙදිලා ත්‍රීවිල් වල ගියේ. සාරංගව ගෙදරට දාන්න දිනුක බාරගත්තා. විහඟලා මාව අපේ ගෙදරටම බස්සලා ගියේ. මං නොන්ඩි ගගහ ගෙට යද්දි අපේ අක්කයි හංසියි දෙන්නම බයවෙලා දුවන් ආවා.

" අම්මේ, අම්මේ, මෙහෙ එන්නකෝ "

" මොකද හලෝ බෙරිහන් දෙන්නෙ ? මට මුකුත් වෙලා නෑ."

අක්කා බොරුවට බයවෙලා ගේ ඇතුළට ගියාමයි දැක්කෙ මගේ වැලමිට විතරක් නෙවෙයි දණිස්සකුත් රතුවෙලා ඉදිමිලා ඇවිත්.

" මොකද මල්ලි උනේ ? ඔයා වැටුනද ?"





" ඔව් අර ගේට් එක ගාව වයර් එකක් අදින්න ගිහින් ඉනිමග පෙරලුනා."

මං අම්මයි තාත්තයි දකින්න කලින් ටක් ගලා බාත් රූම් එකට රිංග ගත්තා. අනිද්දා කලා උළෙලට ඉන්න වෙන්නේ තනි කකුලෙන් තමයි. අනුන්ව බය කරන්න ගියාට මේවා හොඳ පාඩං. මං තුවාය ඇඳගෙන කාමරේට එද්දි අක්කලා ඩබලම කාමරේ. වින්ටජිනෝ කතුරු, පුළුන්, ප්ලාස්ටර් , බැන්ඩේජ්. බුදු අම්මෝ මුන් දෙන්නා මාව ඔපරේෂන් කරන්න යනවද මන්දා.

" හලෝ මේ මාව ඔපරේෂන් කරන්නද යන්නෙ? මේ පොඩ්ඩක් හීරිලා විතරයි"

" ඔයා තුවාලෙට බේත් දාන්න හංසි. මං කකුල තවන්න උණු වතුර ටිකක් අරන් එන්නම්"

අක්කා එළියට ගියා විතරයි හංසි කාමරේ ඉද්දිම මං තුවාය උඩින් සරම දාගත්තා. අම්මත් මට තේකක් ගෙනත් දීලා මගේ වටේ කැරකි කැරකි ඉඳලා ගියා.

SLU

" මේ ඇඳෙන් ඉඳගන්න මල්ලි."

හංසිත් ඇවිත් ඇඳේ කොණක ඉඳගෙන අර බඩු සේරම ළඟට අරන් හෙමීට තුවාලෙ සුද්ද කරලා බෙහෙත් දැම්මා. සැරෙන් සැරේ මූණ දිහා බලද්දියි මං දැක්කෙ එයාගෙ ඇස්වල කඳුළු.

" හංසි අක්කෙ ඔයා අඬනවද?"



WWW.EXPRESSLANKA.TK 124

" නෑ මල්ලි මං මොකටද අඬන්නෙ."

එහෙම කියලා එයා දිගම දිග හුස්මක් පිට කලා. අක්කා උණු වතුර එකකුත් අරන් එතනට ආපු නිසා අපේ කතාව එතනින්ම නතර උනා.

" බෙහෙත් දාලා ඉවරනං කකුල මං තවන්නම්."

" එපා නිශා. දෙන්න මංම කරන්නං"

හංසි ඒකත් බලෙන්ම බාර ගත්තම අක්කා ගියා මට බත් බෙදාගෙන එන්න. මගේ මූණ දිහා බලලා එයා සරම දණහිස ළඟටම නැමුවා. ඊට පස්සෙ කකුල තවන්න සර්වියට් එක තිබ්බා විතරයි මට කෑ ගැහුණෙ ඉබේටම.

" සොරි මල්ලි ඔයාට රිදුනද ?"

" රිදුනෙ නෑ පිච්චුනා."

එයා තවලා වින්ටජිනෝ ගාලා රත්වෙන්න අතගාද්දි මාර සනීපයක් දැනුනේ.

" මල්ලි මේක උනේ ඔයා ඉනිමගකින් වැටිලා නෙමෙයි නේද ?"

මේකිට දිවැස් තියෙනවා. හැබැයි ඉතිං අපි මොන කතාව පටන් ගත්තත් අපේ අක්කා උදැල්ලක් උස්සං මැද්දට පනිනවා. ඒ





පාර තඩි බත් එකක් බෙදාගෙන එනවා. මේ දැන් තේ එක බීලා ඉවර උනා විතරයි.

" අපේ නර්ස් නෝනගෙ වැඩ ඉවරයි නේද ? එන්න මල්ලි මං ඔයාට බත් කවන්නං"

මට තිබුණෙ පුදුම සැපක්. අක්කා බත් කවලා වතුර එකත් අතට දීලා ගියාම තාත්තා කාමරේ. මට ඉක්මනට නිදාගන්න කියලා එයා ලයිට් ඕෆ් කරලම ගියා.

* * * * * * *

උදේ නැගිට්ටද්දි කකුල උලුක් වෙච්ච එක ටිකක් තිබුණට දණිස්ස නං හොඳ වෙලා. හංසිගෙ හෙදකමේ බලය තමයි ඉතිං.

" මල්ලි ඊයේ රෑ ඔයා නිදාගත්තම අර සචිනි නංගි කෝල් කලා."

SLU

" ඉතිං මොනවද කිව්වෙ ?"

" ඔයාට කොහොමද බලන්නලු කතා කලේ."

එහෙනං අපේ කෙල්ලො ටිකටත් වැඩේ ලීක් වෙලා. අද ඉස්කෝලෙ ගිහින් බේරෙන්න බැරි වෙයි.

මගේ කකුල අප්සට් නිසා තාත්තා උදේ මාවයි හංසිවයි අපේ ඉස්කෝලෙට දාලා ගියේ. මං හංසි එක්ක හෙමීට අපේ



WWW.EXPRESSLANKA.TK 125

පංතියට යද්දි පංතියෙ දොරේ ලොකු කොලයක් අලවලා. අපි දෙන්නම ළං වෙලා ඒක කියෙව්වා.

අසව් අසව් බොල අළුත් කතාවක්
කනත්ත පාරේ සිද්ධ වූනේ.
වටේම පාළුයි හරිම කරුවලයි
කියන්නවත් බෑ බයයි අනේ.

ආර්ට් එකේ අර හැඩි දැඩි කොලුවා
ගියාලු දවසක් රෑ පානේ.
කනත්ත අයිනේ කොස් ගහ මුදුනෙන්
මහසෝනා බිම පැන්නලුනේ.

කොලුවා බය වෙලා හූ හඬ තියලා
යටි ගිරියෙන් කෑ ගැහුවාලු
සිහිනැති වීලා වතුර පොවාලා
යංතං පණ නල ගත්තාලු.

ජරමර අස්සේ අඬු බඩු කැඩිලා
මහසෝනත් බිම වැටිලාලු.
කෙඳිරිය ඇහිලා ළං වී බැලුවම
මහසෝනව අඳුරනවාලු.

ඩබල නැගිටලා දූවිලි පිහලා
කරටත් අත දා ගත්තාලු
කොලුවට ෆීවර් යකා ඉන්ජර්ඩ්
කතාව උන් යට ගැහුවාලු





දැන් ඉතිං කාපංකො ටිං කිරි. ඔය තියෙන්නෙ තොරණෙ විස්තරේ අපූරුවට කවියට නගලා. මේකනං විහඟයගෙම වැඩක් වෙන්න ඕනෙ. හංසි කවි ටික සේරම කියවලා මං දිහාට හැරුණා.

" ඊයේ කාමරේ තිබුණ ඇඳුම් බෑග් එක දැක්කම ඔය ඉන්ජර්ඩ් වෙච්ච යකා මොකාද කියලා හිතාගන්න පුළුවං"

අන්තිමට මටත් උනේ අර ඇටිකෙහෙල් කාපු උගුඩුවට උන දේ. බඩුත් එක්ක හොරු අහුවෙලා ඉද්දි තවමොන කතාද ?

" සොරි අක්කෙ, ඕක අපි ඊයේ ඒකෙක්ව බය කරන්න ජොලියට කරපු වැඩක්."

" ජොලියට කරා වගේ නෙමෙයි දැන් විඳවන්න වෙලා තියෙන්නෙ මහසෝනටනෙ"

යකඩෝ ! ඒ පාර මේකිත් මට මහසෝනලු, හැබැයි ඉතිං වැඩිය සද්දෙ දැම්මොත් නිව්ස් එක ගෙදරටත් යයි. ඒක හින්දා මං ගෙදර සීනි බෝතලේට බැහැලා අම්මට මාට්ටු වෙච්ච පොඩි එකා වගේ ටිකිරි හිනාවක් දාලා ෂේප් උනා. තාත්තා ගෙනත් ඇරලපු නිසා අද කලින් ආවට රවුමක් දාන්න යන්න තරම් කකුල හිට් නෑ. ඒ නිසා හංසි ගියාට පස්සෙ මං පුටුවක් ඇදලා අරන් ඉදගත්තා.

" ආ....... මහසෝනා උඹ අද කලින් ආවද?"

කොහේද ඉදලා ආපු විහඟයා පල් එක දාද්දිනං මට තදඋනා.



WWW.EXPRESSLANKA.TK 126

" උඹට සපෝට් කරන්න තමයි යකෝ මං මහසෝනා උනේ. මං නැත්තං උඹේ රුපියල් දාහකටත් තට්ටුයි."

" හරි හරි මචං කූල් ඩවුන්"

ඔන්න එතකොටම සචිනි එනවා කොරිඩෝ එක දිගේ පැයට හැටයි ගැලුමට හත්තෑවයි වේගෙන්. ඒකි කෙලින්ම ආවේ මගේ ළඟට. පංතියේ තව ළමයි තුන් හතරදෙනෙක් ඉද්දිම කෙල්ල මගේ අතින් අල්ල ගත්තා. ඊට පස්සෙ වැලමිට පැත්ත හරවලා තුවාලේ දිහා බැලුවා. ඒත් හංසි බෙහෙත් දාලා නිසා එයාට තුවාලෙ පෙන්නෙ නෑ.

" මොකද උනේ කියලා මං අහන්නෙ නෑ රන්දූ. මට හැමදේම ආරංචියි."

SLU

" කවුද කිව්වේ ?"

" කවුරුහරි කිව්වනෙ. කතන්දරේ ඔය දොරෙත් ගහලා තියෙන්නෙ. අනික සාරංගටත් උණ හැදිලලුනෙ."

මං විහඟ දිහා බැලුවා. ඌත් කසාය බීපු ගොලුවා වගේ.

" තාම රිදෙනවද ?"

සචී ආයෙත් ඇහුවා.





" තුවාලෙ නං වැඩිය රිදෙන්නෙ නෑ. ඒත් කකුල උලුක් වෙලා ඒක ටිකක් රිදෙනවා."

" කකුල දෙන්න මං වින්ටෝජිනෝ ගාන්නං"

කොහොමත් නිවුන්නු අතගාපුවම ඉක්මනට හොඳවෙනවා කියලා කතාවකුත් තියෙනවනෙ. සචිනි අතගාද්දිනං නිකම්ම හොඳවෙයි. කෙල්ල බෑග් එක ඇරලා වින්ටෝජිනෝ ටියුබ් එකක් අතට ගත්තා.

" ඔයාගේ බෑග් එකෙත් වින්ටෝජිනෝ තියෙනවද ?"

" ගෙදර අල්මාරියෙත් තියෙනවා."

මගේ ප්‍රශ්නෙට උත්තර දුන්නෙ විහඟ. සපත්තුව ගලවලා සචී කකුලට වින්ටෝජිනෝ ගාද්දි නිරෝධ පන්තියට ආවා. අපි දෙන්නව දැක්කා විතරයි මේකා අනිත් අතට වාෂ්ප උනා. හේතුව ඉතිං අපි කවුරු කවුරුත් දන්නවනෙ.

" හේෂාන් අයියේ, සචිනි අක්කට කුමුදු මිස් එන්න කිව්වා."

පංතියට දුවගෙන ආපු පොඩි එකෙක් ඒක සචිනිට නොකියා මට කිව්වෙ ඇයි දන්නෑ. ඒත් සචී වැඩේ ඉවර කරලමයි නැගිට්ටේ.

" රන්දූ උඹට සචීගෙ වෙනසක් දැනෙන්නෙ නැද්ද ?"



WWW.EXPRESSLANKA.TK 127

කෙල්ල ගියා විතරයි විහඟ ඇහුවෙ හෙන සීරියස් මූඩ් එකකින්. මං හිතුවෙ සචීගෙ වෙනස දැනෙන්නෙ මට විතරයි කියලා.

" ඇයි උඹ එහෙම ඇහුවේ ?"

SLU

" නෑ ඉතිං අර කතාවක් තියෙනවනෙ ආදරෙයි කැස්සයි හංගන්න බෑ කියලා."

" ඇයි ඒකි කහිනවා උඹට ඇහුනද ?"

" නෑ මට හිතෙන්නෙ කෙල්ලට තියෙන්නෙ අනිත් ලෙඩේ."

ආදරේ විහිළුවක් කියලා හිතන විහඟට එහෙම කෙනෙක්ගෙ ආදරයක් ගැන දැනුන එකත් පුදුමයක්. එත් සචීගෙ හිත මට තාම තේරෙන්නෙ නැහැ.

" අපි ඕවා ගැන පස්සෙ කතා කරමු. යං අද වැඩ ගොඩාක් තියෙනවා."

අපි මුලින්ම ගියේ ආර්ට් ක්ලාස් පැත්තට. යද්දි සාරංග ඉන්නවා කොරිඩෝ එක දිහා බලාගෙන.

" ගුඩ් මෝනිං මචං....."

" ආ.... ගුඩ් මෝනිං. ඊයේ අවුලක් නැතුව නිදා ගත්තද ?"





මූ මොකද මන්දා උදේ පාන්දර මෙහෙම ප්‍රශ්නයක් ඇහුවෙ. මාව තුවාල වෙලා තියෙනවා දකිද්දි පොරට පොඩි ජොලියකුත් ඇති.

" උඹ තරහද බං."

" පිස්සුද ? කවුද ඕවා ගණන් ගන්නෙ"

ගණන් නොගත්තට තාම කොල්ලගෙ උණ බැහැලා නෑ. මේ වැඩෙන් අපි කට්ටියම මට්ටු උන නිසා කවුරුත් ඒ ගැන වැඩිය කතා කෙලේ නෑ. අපි මෙන් හෝල් පැත්තට යද්දි දැක්කා අපේ පංතියෙ දොරේ ගහලා තිබුණා කවියම නොටිස් බෝඩ් එක ළඟත් ගහලා තියෙනවා. සාරංග ඒ කොලේ ගලවලා අරන් ඉරලා දැම්මා.

අද නං ඉස්කොලේ කානිවල් එකක් වගේ. ළමයි පාට පාට ඇඳුම් ඇඳගෙන නටනවා. සින්දු කියනවා. කවුරුවත් විහිළුවටවත් පොතක් අතේ තියන් ඉන්නවා පේන්න නෑ.

" හේෂාන් මොකද පුතා ඔය අතට වෙලා තියෙන්නෙ ?"

මාව දැකපු ප්‍රින්සිපල් සර් පුදුම වෙලා වගේ ඇහුවෙ. ඉතිං ඊයේ හවසත් මං හොඳට හිටියනෙ.

" ඊයේ යද්දි වැටුනා සර්."

" හෙට ඔයාට කරන්න ලොකු වැඩ කොටසක් තියෙනවනෙ"



WWW.EXPRESSLANKA.TK 128

" එච්චර අමාරුවක් නෑ සර් මට පුළුවං"

සර් පොඩි හිනාවක් දාලා රූම් එකට යද්දි අපි මේන් හෝල් එකට ගියා. සචිනියි අචිනියි පණ දාගෙන හංසි එක්ක නටනවා. කුමුදු මිසුත් තව නංගිලා කට්ටියක් වට කරගෙන. අපි මුලින්ම කලේ ආර්ට් එකේ සර්ලා දෙන්නෙක් එක්ක හෙට තියෙන වැඩ සටහන් පෙළගස්වපු එක කලා උළෙල පටන් ගන්න තිබුණෙ අචිනිගෙ සරස්වතී නැටුමකින්. සමස්ත ලංකා පළවෙනි තැනට තේරුණ නිසා තමයි ඒක අචිනිට දුන්නෙ. ඒත් සැබෑ සරස්වතී දේවිය වෙන්න ඕනෙ අපේ සචිනි.

අමාරුම වැඩේ උනේ මේන් හෝල් එකේ ලයිට් සිස්ටම් එක හරියට හදන එක. ඒකට වෙනම අයියලා කට්ටියක් ගෙනැත් තිබුණ නිසා අපිට තිබුණෙ සයිඩ් සපෝට් එක දෙන එක විතරයි. දවල් වෙද්දි අපි දොලහ වසරේ මල්ලි එක්ක එකතුවෙලා ගොක් කොල තොරණ හදන්න පටන් ගත්තා. දෙපැත්තෙ ලොකු පුන්කලස් දෙකක් හදලා වටේ පොල් මල් දාලා පහන් වැටවල් තියලා ඉවර වෙද්දි ඉස්කොලේ ඇරෙන වෙලාවත් පහුවෙලා. පොඩි පන්තිවල ළමයි ගියාට ඒ লෙවල් ළමයි හැමෝම වගේ නතර වෙලා වැඩ.

" උඹලගෙ ලෙඩ සේරම හොඳයි වගේ නේද ? ඒත් මගේ ලෙඩේනං දූන් උත්සන්න වෙලා."

මමයි සාරංගයි දිහා බලලා විහඟ ඇහුවෙ අපි දිගට හරහට වැඩ නිසා. මට නං කකුලෙ අමාරුවක් තිබුනද කියලා මතකවත් නෑ.





" මොකක්ද උඹට තියෙන ලෙඩේ ?"

" වෙන මොකක්ද බං සාගතේ "

SLU

වැඩේ ඉවර කරලා අපි කට්ටියම සචීලයි හංසි අක්කයි එක්ක කැන්ටිමට ගිහින් කෑවා. කොයි තරම් එකට ගැවසුනත් අද උදේ ඉඳලා නිරෝධ මට මූණ දීලා කතා කලේ නෑ.

හවස කුමුදු මිස් බාරදුන්නෙ මාර වැඩක්. ඒ තමයි සරස්වතී දේවියගෙ ආසනේ, ඒ කිව්වෙ ලොකු ඕලු මලක් හදන එක. එකේ අචිනිට ඉඳගන්න පුළුවං වෙන්නත් ඕනෙ.

" දිනුක මල කොයි තරම් දිග පළල වෙන්න ඕනෙද ?"

ෂෝටා ඇහුවෙ වෙනමම තේරුමක් තියෙන ප්‍රශ්නයක්.

" මං කොහොමද දන්නෙ. ඇයි මිස් කිව්වෙ නැද්ද ?"

මූ නං කොස්සෙන් තට්ටු දෙකක් දැම්මත් පත්තු වෙන්නෙ නැති ටියුබ් ලයිට් එකක්.

" මිස් කොහොමද බං අචීට ඉඳගන්න යන ඉඩ ප්‍රමාණෙ දන්නෙ?"

ඔන්න එතකොටයි දිනුකයට ප්‍රශ්නෙ තේරුනේ.

" මූගේ ඔඩොක්කුවෙ සයිස් එකට හැදුවම ඇති."



WWW.EXPRESSLANKA.TK 129

මේ පොඩි එවුනුත් ඉන්න තැන විහඟයා ඔහේ කියලා දැම්මා. දොළහ වසරෙ කොල්ලෙක් ගිහින් වෙසක් කූඩු හදන්න පුරුදු කෙනෙක්ව එක්කං ආව නිසා මල හදන වැඩේ මල පනින්නෙ නැතුවම කරන්න පුළුවං උනා. තුනට විතර ගෙදර ගිය ප්‍රින්සිපල් සර් ආපහු හවස ටී ෂර්ට් එකකුත් දාගෙන ඇවිත් කරලියට බැස්සා.

ඉස්කෝලෙ සරසලා ඉවර වෙද්දි තනිකරම තිබුණෙ ගැමි පරිසරයක පෙනුමක්. ආරාධිත අමුත්තො පිළිගන්න තිබුණෙ රබන් ගහලා. ඒකට ඒකට ගෙනාපු මහා පත රබාන උඩ නැගගෙන නංගිලා වගයක් හමට තලනවා.

වෙලාව නොබලා කළුවර වැටෙනකල් වැඩ කරාට අපි දන්නෙම නැතුව අටත් පහුවෙලා. ප්‍රින්සිපල් සර් ළමයින්ට රෑට කන්න බනිස් බෑග් වගයක් එවලා තියෙනවා. කැන්ටිමෙන් අපිට නොමිලේ තේ. අනිත් ළමයි පාට ඇඳුම් ගෙනත් තිබුණට අපිනං හිටියෙ උදේ ඇඳන් ආපු යුනිෆෝම් පිටින්. රෑ වෙද්දි ළමයි ගොඩක් ගියාට අපේ කොල්ලො හයදෙනාම වැඩ.

" රන්දූ මාර තිබහයි බං. සෙට් වෙනවා නං බඩුවක් තියෙනවා"

ඒ ඇවිත් කිව්වෙ ෂෝටා. මූ නැටුම් තෙල් බෝතලයක්වත් ගෙනත්ද මන්දා.

" උඹ මේ වැඩ අස්සෙ සෙට් වෙන්න හදනවද ?"





" නෑ බං අර ඇග්‍රිකවල් ගාර්ඩන් එකේ හොඳ තැඹිලි වල්ලක් තිබුණා. පුංචි ලිඳේ වතුර රස ඇති යන්ද ?"

ඊයේ රෑ ගස් නගින්න ගිහින් වෙච්ච හරිය මදිවට මූ තැඹිලි කඩන්න යන්නත් කතා කරනවා. ඉස්කෝලෙ කෘෂිකර්මය කරන ළමයි පැළ හිටවපු වත්ත ඉස්කොලෙට අයිති උනාට ඒක තිබුණෙ ඉස්කෝලෙ තාප්පෙට එහා පැත්තෙ වෙනමම වට කරලා. ඒ පැත්තට යන්න යකඩ ගේට්ටුවක් දාලා තිබ්බට නිතරම ඒක වහලා ඉබ්බා දාලා තිබුණෙ. යතුර තියෙන්නෙ කෘෂිකර්මය සර් ගාව. ඒකෙ තැඹිලි ගස් දෙක තුනක් තිබුණට ඔය කියන තැඹිලි වල්ල මං නං දැක්කෙ නෑ.

"ඒ පැත්ත කට්ට කරුවල ඇති"

SLU

" ඇයි මහසෝන බයද ?"

ඒ ඇහුවෙ සාරංග. ඌ ඊයේ බය නෑ වගේ චන්ඩියා වෙන්න ගියාට පාර දිගේ ආවෙ බුදුගුණ සිහිකර කර.

ඉතුරු වෙලා හිටිය ළමයි ටිකයි සර්ලා මිස්ලා ටිකයි හැමෝම හිටියෙ මේන් හෝල් එක පැත්තෙ. ඔය වත්ත තිබුණෙ ඉස්කොලේ පිටිපස්සෙම නිසා වැඩේ කාටවත් අහුවෙන එකක් නෑ. අපි හයදෙනා හෙමීට කට්ටිය මග ඇරලා ඒ පැත්තට ගියා. ඒ පැත්ත කොයිතරම් කරුවල උනත් අපිට ඇස් වහගෙන හරි ඕන තැනට යන්න පුළුවං. මේ ආදරණීය සෙන්ට්‍රල් භූමිය අපි අවුරුදු දහතුනක්ම හිටපු තැනනෙ.



WWW.EXPRESSLANKA.TK 130

" මුකුත්ම පේන්නෙ නෑ බං. ගේට්ටුවත් ලොක් වගේ."

ෂෝටා ගේට්ටුව හයියෙන් හොලවලා බැලුවා. ඇරගන්න විදියක් නෑ. අපේ සෙට් එකේ කවුරුවත් මං තරම් උස නැති නිසා වෙනදට ඔය තාප්ප වලින් පනින වැඩ කරන්නෙ මං. ඒත් අදනං මට නගින්න කියලා කවුරුවත් කිව්වෙ නෑ.

" උඹලා මට සපෝට් එක දියං මං පනින්නං එහා පැත්තට"

ෂෝටා පෙරමුණ ගත්තා.

" එතකොට උඹ කොහොමද ආපහු මෙහාට පනින්නෙ උස නැතුව"

" එහා පැත්තෙ ලී බංකුවක් තියෙනවා මං දැකලා තියෙනවා. අවුලක් නෑ ඒකට නැගලා තාප්පෙට නගින්න පුළුවං"

මට මතක් උනේ එදා මූ මරදානෙ කඩේ ටොයිලට් එකෙන් පැනලා ආපු හැටි. ගස් නැගලා ඇඳුම ජරා උනොත් ගෙදර යන්න බෑ කියලා මූ ඇඳුම් ටික ගලවලා තියලා අන්ඩර්වෙයාර් එක පිටින් නැග්ගෙ. එහා පැත්තට පැන්නුව විතරයි මූ තත්පර දෙකෙන් තැඹිලි ගහේ.

" ඔන්න ඔය පැත්තට එවනවා අල්ල ගනිං. එකා.... යි, දෙකා....යි."





මූ තැඹිලි ගෙඩි එක එක දාද්දි අපි මේ පැත්තෙ ඉඳලා ඇල්ලුවා. දැන්නං කරුවලට ඇස් හුරුවෙලා. ෂෝටා පහා..... යි කියලා එවපු තැඹිලි ගෙඩිය මං අල්ලන්න හදද්දි මගේ පිටිපස්සෙන් ආපු කෙනෙක් ඒක ඇල්ලුවා. හැරිලා බලද්දි ඒ අපේ ප්‍රින්ස්. මල කෙළියයි. ෂෝටා ජංගිය පිටින් එහා පැත්තෙ. ඌට දැනුම් දෙන්න විදියක්වත් නෑ. සර් අපි කට්ටිය දිහා බලලා ෂ් ... කියලා කටට ඇඟිල්ල තියලා පෙන්නුවෙ සද්ද කරන්න එපා කියලා.

" හයා ...... යි"

SLU

අරූ අන්තිමට එවපු තැඹිලි ගෙඩිය අල්ලන්න අපි කවුරුවත් අත් දික්කලේ නෑ. ඒකත් ඇල්ලුවෙ ප්‍රින්සිපල්. සර්රුත් නිකං ජොන්ටි රෝඩ්ස් වගේ මාර කැචර්.

" මචං හරි නේද ? ඔන්න එහෙනං මං බැස්සා."

මූ බැහැලා මොකක්ද ඇඳන් එන සද්දෙකුත් ආවා.

" බලපං බං. ප්‍රින්ස් එහෙම මේ පැත්තට එනවද කියලා. මං පනින්න හදන්නෙ"

තවත් මොනවා බලන්නද ප්‍රින්ස් ඇවිත් ඉවරයි. ඒත් කටක් ඇරලා කියන්නෙ කොහොමද ?

" මොකද උඹලා කතා නැත්තෙ ?"



WWW.EXPRESSLANKA.TK 131

එහෙම කියලා ෂෝටා අර චුටි ජංගියත් ගහගෙන තාප්පෙ උඩින් මතු උනා. මූ තාප්පෙ උඩ ඉඳගෙන බොඩි බිල්ඩර් කෙනෙක් වගේ අත් දෙකත් උස්සගෙන වැඩ පෙන්නනවා. අපි කට්ටිය මීයට පිම්බා වගේ සද්ද නෑ. ෂෝටව දකිද්දි සර්ටත් බකස් ගලා හිනා ගියා. මූ හිතන් ඉන්නෙ 'ආර්නෝල්ඩ් ස්වසනේගර්' කියලා. හැබැයි සැබෑ ස්වරූපය නිකං නෙල්ලි කැලේ බූරියා වගේ.

" කොහොමද කොල්ලගෙ බොඩිය ?"

SLU

මූ බිමට බහින්නෙ නැතිව කියෝනවා.

" හොඳයි හොඳයි. ලොරි බොඩියක් වගේ තියෙනවා."

ප්‍රින්සිපල් සර් එහෙම කිව්වා විතරයි ෂෝටා ටිකක් අප්සට් ගියා.

" අඩෝ මහසෝනා බය කරන්න එපා බං."

බොලේ මූ හිතන් ඉන්නෙ කටහඬ වෙනස් කරලා කතා කලේ මං කියලා. හැබැයි මහසෝනා කිව්ව එකට සර්ට නං යකා නගින්න ඇති.

" තමුසෙ බිමට බහිනවද නැද්ද ?"

" අම්මට සිරි. බහිනවා සර් බහිනවා"

කටහඬ අඳුරගත්තා විතරයි මූ බැස්සෙ හිටපු පැත්තටමයි. සර්ටත් හිනා.





" මෙච්චර දේවල් කරපු එකේ තමුසෙලා මේ ටික නොකැඩුවනං තමයි මං පුදුම වෙන්නෙ. ඒත් අයිසෙ කියලා කැඩුවනං මීට වඩා හොඳ නැද්ද ?"

එහෙම කියලා සර් යන්න ගියේ බිම තිබුණ ෂෝටගෙ ඇඳුම් ටිකත් අරගෙන.හත්තිලව්වේ දන් කොහොමද අපේ පොඩි එකා ඔය ජංගිය පිටින් එළි බහින්නෙ. සර් ගිහින් ටික වෙලාවකින් අපි ෂෝටාට කතා කරලා මේ පැත්තට ගත්තා. ඒත් ඒ ඇඳුම පිටින් ලයිට් එළිය තියෙන හරියට යන්න බෑ. අපි කළුවරේම මේන් ගේට් එක පැත්තට බාගයක් යද්දි කැන්ටිමේ වයසක අන්කල් අපි ඉන්න පැත්තට එනවා. ෂෝටා පටස් ගාලා කවර් උනා.

" ආ..... ඔය පුතාලට මේක ලොකු මහත්තයා දෙන්න කිව්වා."

අන්කල් අරන් ආවේ තැඹිලි කපන්න පිහියකුයි, ෂෝටගෙ ඇඳුම් ටිකයි. අපේ ප්‍රින්සිපල් සර්රුත් වෙලාවකට අදහන්න වටින චරිතයක්.

" සර්ට පින් දෙන්න ඕන බං මේ කරපු කුසල කර්මෙට"

ෂෝටා දඩිබඩි ගාලා ඇඳුම් ඇඳගන්න ගමන් කිව්වා.

" එහෙනං මාමට වඳින ගාථාව කියලා පින් දිපං"

මං කිව්වෙ තැඹිලි ගෙඩියක් කපන ගමන්.



WWW.EXPRESSLANKA.TK 132

" මොකක්ද බං මාමට වදින ගාථාව ? මං එහෙම ගාථාවක් අහලා නැනෙ."

" ඇයි බං ඉමිනා පුඤ්ඤ කම්මේන මාමේ බාල සමාගමෝ"

කට්ටියම හිනා වෙවී තැඹිලි බීලා ආපහු ඉස්සරහ පැත්තට ආවා. දැන්නං ඇඟටත් අමාරුයි ගෙදර ගියොත් හොඳයි වගේ.

" කොහේද මල්ලි ගිහින් හිටියෙ ? අර තාත්තා වෑන් එකත් අරන් ඇවිත් දැන් ගොඩාක් වෙලා ඉදලා ඔයාව හොයනවා."

හංසි අක්කා දෝස්මුරේ දාද්දි තාත්තත් අපි ඉන්න පැත්තට ආවා.

" මං සර් එක්කත් කතා කලා පුතා. ඔයාට අමාරු නිසා දැන් යන්න කිව්වා."

සර් යන්න කිව්වෙ අපි වගේ වතු පාළුවො දැං හිටියා ඇති කියලා වෙන්න ඇති. අපේ පැත්තට යන නිසා විහඟත් ඇවිත් මමයි හංසි අක්කයි එක්ක වෑන් එකට නැග්ගා.

Scanned for
SL-Unlimited.com
by Sheree





# 10

කලා උළෙල පටන් ගන්න නැකත තිබුණෙ උදේ දහයයි විසි හතට. අපේ තාත්තයි අක්කයිත් අද නිවාඩු දාලා. එයාලට ටිකක් පරක්කු වෙලා එන්න කියලා මමයි හංසියි උදේම ගියා. මේන් හෝල් එක ඉස්සරහ අතුරන්න සුදු වැලි ගේන්න කියලා අපි ඊයේ ඕඩර් කලා. උදේම ලොරිය ඇවිත් තිබුණ නිසා ඒ වැඩේ ඉවර කරලා අපි මුළු ඉස්කෝලෙ වටේම පොල් කටු අඟුරු දාලා සුවඳ දුම් ඇල්ලුවා. වෙස් නැටුම් කණ්ඩායම හැදුවෙ අපේම ඉස්කොලෙ හිටපු වෙස් බැඳපු ළමයින්ගෙන්.

අද අපේ ප්‍රින්සිපල් සර් ටයිකෝට් දාලා එයි කියලා අපි බලාගෙන හිටියට එයා ආවේ ජාතික ඇඳුම ඇඳලා. අද ඉස්කෝලෙ හැමෝම සංවර වෙලා. ඒ වගේම තමයි හැම පැත්තෙන්ම ආවෙ අමුතුම ගැමි සුවඳක්. මේ අපේ ආදරණීය පාසල නේද කියලා පුංචි ආඩම්බරයක් එක්ක ලොකු සතුටක් දැනුනා.

වටේ ඉස්කෝලවල විදුහල්පතිවරු විශ්ව විද්‍යාල දේශකවරු වගේ ගොඩක් දෙනෙක්ට ආරාධනා කරලා තිබුණ නිසා එයාලව බුලත් හුරුළු දීලා පිළිගන්න රෙද්දයි හැට්ටෙයි අන්දවපු එක



WWW.EXPRESSLANKA.TK 133

වසරෙ පුංචි නංගිලා ටිකකට බාර දුන්නා. පුංචි එවුන් රෙදි පටලවගෙන අමාරුවෙන් ඇවිදිද්දි තිබුණෙ අමුතුම ලස්සනක්. වැඩ සේරම ලෑස්ති කරලා ඉවර වෙලා නිවේදන කටයුතු කරන්න මං ක්‍රීම් පාට ජාතික ඇඳුම ඇන්දා.

"උඹට ඇස්වහ වදියි කියලා මට ලෝභ හිතෙනවා රන්දූ. උඹ අද මාර පින් පාටයි."

ඇස් දෙකත් රතු කරගත්ත විහඟ ඇවිත් මාව බදාගන්න ගමන් කිව්වා. මොකක්දෝ මන්දා සහෝදරත්වයේ සුවඳකින් මගේ හිත පිරිලා ගියා. හංසි අක්කත් මෙරූන් පාට බතික් ඔසරියක් ඇඳලා ඈත ඉදලා මං දිහා බලන් හිටියා. අද දවස අපි හැමෝගෙම මහන්සියෙ ප්‍රතිඵල භුක්ති විඳින දවස.

හරියටම නැකතට බෙර ගහලා පහන් පත්තු කරලා ආරාධිත අමුත්තො පිරිවරාගෙන අපේ මහා කලා මංගල්ලය ආරම්භ උනා. මුළු ශාලාවම අඳුරුකරලා ස්ටේජ් එකේ විතරක් ඩිම් ලයිට් දාලා අචිනිගෙ සරස්වතී නැටුම පටන් ගත්තා විතරයි හෝල් එක අත්පුඩි සද්දෙකින් වැහැලා ගියා. ඒ ලා අඳුරෙ ඕලු මල මැද්දෙ වාඩිවෙලා සිතාරය අතින් අරන් හිටපු දෙවඟන අචිනිද කියලා හිතාගන්නවත් බෑ. ආපු අමුත්තෝ විතරක් නෙමෙයි, ඒක ඉවර වෙනකල් අපිත් බලාගෙන හිටියෙ ගල් ගැහිලා වගේ.

ඊට පස්සේ හෝල් එක එළිය වෙද්දී මං මයික් එකත් අරන් ඉස්සරහට ගියා. මම ගැඹුරු කටහඬින් කට්ටිය පිළිගනිද්දි මගේ ඇස් හෙව්වෙ අපේ අම්මව. එයා ඉඳගෙන හිටියේ තාත්තටයි





අක්කටයි මැදි වෙලා. කතාව අතරතුර අම්මා දෙතුන් සැරයක්ම සාරි පොට අරන් ඇස් පිහදාගන්නවා මං දැක්කා.

වෙනදා වගේ දඟලන්න විහිළුවක් කරන්න කාටවත් අදහසක් නෑ වගේ. කට්ටිය ස්ටේජ් එක පිටිපස්සේ බරටම වැඩ. උත්සවේ යන අතරෙම අපි අමුත්තන්ට සංග්‍රහය පිළිගැන්නුවා. කැවුම්,කිරිබත්, වැලිතලප වගේ කැවිලි පිඟානක් එක්ක බොන්න දුන්නේ බෙලිමල්. කැම්පස් වලින් ආපසු දේශකවරු ඒ සංග්‍රහය ගොඩක් අගය කලේ අපේ කමට මුල් තැන දීලා තිබුණ නිසා.

'' රන්දූ වරෙන් පොඩි බඩුවක් පෙන්නන්න''

ෂෝටා මගේ අතින් ඇදන් ස්ටේජ් එක එහා පැත්තට එක්කං ගියා. එතන ළමයි ගොඩේ නෙත්මි ඊළඟ සින්දුවට අඳින ඇඳුම ඇඳගෙන කවුද කළු පොරක් එක්ක කතාව. ඒක හැබැයි එසේ මෙසේ කතාවක් වෙන්න බෑ.

''අපේ නංගි කිව්ව මෑන් මූ තමයි''

SLU

'' ඒ කිව්වේ කෙල්ලගෙ මස්සිනාකාරයා''

''ම් ....... උඹ අප්සට්ද ?''

'' නෑ තාරක ඒකි මට මැච් වෙන්නේ නෑ කියලා මං දන්නවා. කෙල්ල ලස්සන උනාට හිත ලස්සන නැත්නං වැඩක් නෑ''



WWW.EXPRESSLANKA.TK 134

ෂෝටා පුදුමෙන් වගේ බලන් හිටියෙ මං කල්ප කාලෙකට පස්සෙ ඌගෙ නම කියලා කතා කරපු නිසා වෙන්න ඇති.

අපි කීප සැරයක් ඇඳුම් මාරුකර කර එක එක විශේෂාංග වලට හිටියා. ඇවිත් හිටපු හැම දෙනාගෙම ඇස් වැඩිපුරම පැහැර ගත්තෙ අචිනියි සචිනියි දෙන්නා එකම විදියට ඇඳලා මේ පාර සමස්ත ලංකා දිනපු නැටුම ඉදිරිපත් කරපු එක. ඩබල බෝනික්කෝ දෙන්නෙක් වගේ එහාට මෙහාට මාරුවෙවී නටද්දි කට්ටිය ෆුල් හොල්මන් වෙලා. මේ නැටුමට එදා නුවරදි ලංකාවේ පළවෙනි තැන ලැබුණ එක පුදුමයක් නෙමෙයි.

ගිණිකෙලි සංදර්ශණ, නාට්‍ය ගීත, ගැමි නැටුම්, කවි සින්දු වලින් පිරුණ කලා උලෙළ ඉවර උනේ හැමෝගෙම හිත් තෘප්තිමත් කරලා.

"විදුහල්පතිතුමා, අපි මේ තරම් ලස්සනට ගමේ කම දැනෙන උත්සවයක් විශ්ව විද්‍යාලේදීවත් දැකලා නෑ හරිම විශිෂ්ටයි"

ඒ කිව්වෙ රජරට විශ්ව විද්‍යාලයෙන් ආපු මහාචාර්යවරයෙක්.

" අපිට ඉතිං ඕන වැඩකට බය නැතුව අත ගහන්න පුළුවං ප්‍රොෆෙසර්,මේ ඉන්නෙ ගජබා රෙජිමේන්තුව වගේ කොල්ලො ටිකක්"

අපිව පෙන්නලා සර් කියද්දි ප්‍රොෆෙසර් මං ගාවට ආවා.





"මේ දරුවො ඉස්කෝලෙට සම්පතක්. මේ වගේ අය තමයි අපේ කැම්පස් වලටත් ඕනේ. මේ පාර විභාගේ ලියලා එමු ඒ පැත්තේ "

ප්‍රොෆෙසර් එහෙම කියද්දි මං ළඟ හිටපු අපේ තාත්තගෙ ඇස් දිලිසුනා. අපි කලා උළෙල ඉවර වෙලා අස් කරන වැඩ වලට නතර වෙද්දි අම්මලා ගෙදර ගියේ අදවත් ඉක්මනට එන්න කියලා. හවස අපේ ඒ ලෙවල් ළමයි වටකරගෙන ප්‍රින්සිපල් සර් විශේෂ ස්තුතියක් කලා. මේ ඉවර උනේ අපේ අන්තිම කලා උළෙල නේද කියලා මතක් වෙද්දි හිත ඇතුලෙ පුංචි දුකක් වගේ දෙයක් තැන්පත් උනා.

" මං විශේෂයෙන්ම අගය කරනවා හේෂාන්වයි එයාගෙ යාළුවො ටිකයි. ඒ අය නොහිටින්න අපිට මේ වැඩේ මේ තරම් හොඳට කරන්න බැරි වෙනවා. දැන් මේ ටිකේ මහන්සි උනා ඇති. ආපහු පාඩං වැඩ පටන් ගන්න. ඔයාලා හැමෝටම කැම්පස් යන්න පුළුවන් වෙයි"

සර් රූම් එක පැත්තට යන්න ගිහින් ආපහු අපි දිහාට හැරුනා.

" ඔය තිබහ තියන අය තැඹිලි ගෙඩි ටිකක් කඩා ගත්තට ප්‍රශ්නයක් නෑ "

හප්පොච්චියේ ! ඒක කිව්වේ අපට මිසක් වෙන කාටද ? ෂෝටා බෙල්ල කඩන් වැටිලා වගේ බිම බලාගෙන.



WWW.EXPRESSLANKA.TK 135

" අනේ බං උඹලට ඕනෙනං බීපං. මං නං ආයේ සල්ලි දීලාවත් තැඹිලි බොන්නෙ නෑ"

එදත් අපි ගොඩක් හවස් වෙනකල් ඉස්කොලේ හිටියේ දාලා යන්න දුකට වගේ. විභාගෙට තව ටික කාලයයි. ඒ කියන්නේ මේ හැමදේම දාලා යන්න කාලේ ළංවෙලා. ආයෙත් ලබන සතියේ ඉඳලා රිවිෂන් ක්ලාස් යන්න වෙන නිසා වැඩිය ඉස්කොලේ එන්නත් බැරි වෙනවා. අපි කරුවල වැටෙනකල්ම වගේ අරලිය ගස් යටට වෙලා කථා කර කර හිටියා.

* * * * * * *

විභාගෙට ඇඩ්මිෂන් ඇවිත් කියලා ආපු ආරංචියට අපි ඉස්කෝලෙට ගියේ ගොඩක් දවසකින්. හප්පා! ඉස්කොලේ දැක්කම හිත නිවන් ගියා වගේ. එදා දවල් යන්න කලින් සචිනි මගේ අතට කොලයක් ගෙනත් දුන්නා.

" රන්දූ මේක නෝටිස් බෝඩ් එකට දාන්නකෝ "

ඒකෙ තිබුනේ සචී ඉස්කොලෙ ගැන ලියපු කවි පංතියක්.

**සමුගන්න අවසරයි !**

සිනා මල් විල්තෙරේ කුසුම් මුකුලිත වෙලා
පාසලේ මාවතත් අප නැතිව හිස් වෙලා
සුදු පාට රැලි ගවුම ටයි පටිය තනි වෙලා
විදු බිමේ සුවඳ අද කඳුළක්ව වැගිරිලා





පුරා දහතුන් වසක් පාසලේ දැවටිලා
සිනා එන කෙළි කවට වදන් වැල් තෙපලලා
පංති කාමරය තුළ සොයුරන්ව ළංවෙලා
උන්නු කාලය නිමයි යා යුතුය වෙන්වෙලා

තුරුළු කල පොත් මිටිය දස අතේ විසිරිලා
ඩෙස් බංකු සියල්ලම ඉකි බිඳී තනිවෙලා
පුංචි දරුවන්ව සිටි හෝරාව නිමවෙලා
සමුගන්න අවසරයි නෙතේ කඳුළක් සලා

ඒක කියවලා ඉවර වෙද්දි හැමෝගෙම ඇස් රතුවෙලා. ඇත්තටම අපි මේ අවුරුදු දහතුන ඇතුලත මේ පංති කාමර ඇතුලේ කොයි තරම් දේවල් කරාද? ඒත් සචී ලියලා තියනවා වගේ දැන් සමුගන්න හෝරාව ළංවෙලා. අපි හැමෝම යන්න කලින් අරලියා ගස් හෙවනට ගිහින් අපේ හිත් කෑ ගහලා අඬද්දී හිනාවෙලා සින්දු කිව්වා.

" පියමං කෙරුවෙමු මහවෙල් මැද්දෙන්
පෙම්බස් දෙඩුවෙමු උයන් කොනක හිඳ
ශිල්ප උගත්තෙමු .......
නැණ ලැබ ගත්තෙමු......
දෙපා වාරු නැත ඔබ හැර යන්නට
දෙපා ... වාරු නැත.... ඔබ හැර යන්නට "

SL-UNLIMITED.COM



WWW.EXPRESSLANKA.TK 136

හවස මිදුලට වෙලා පාඩම් කර කර ඉද්දි හංසි ආවා. කලා උළෙලෙන් පස්සෙ එයා මගේ හිතට ගොඩක් ළංවෙලා. අපේ අක්කව දකිද්දි නොදැනෙන මොකක්දෝ දෙයක් හංසිව දකිද්දි මට දැනෙනවා.

" කෝ මල්ලි, නිශා ගෙදර ඉන්නවද ?"

" එයා මේ දැන් අම්මලා එක්ක පාටියකට ගියා. එද්දී රෑ වෙයි"

" ඒ කියන්නේ ඔයා විතරද දැන් ගෙදර ඉන්නේ ?"

" නෑ "

ඒ පාර කෙල්ල ඇස් දෙකත් ලොකු කරගෙන බලන් ඉන්නවා.

" තව කවුද ඉන්නේ ?"

" ඇයි ඔයා "

හංසි පැයකට විතර කලින් උඩට ගත්තු හුස්ම දැනුයි පහළ දැම්මෙ. මෙයා බයවෙලා තියෙන තරමක්.

" ඒක හොඳයි "





එයා අන්තිමට කිව්වේ මං හීනෙකින්වත් හිතපු නැති දෙයක්. අපි දෙන්නා විතරක් තනියම ඉන්න එක කොහොමද හොඳ වෙන්නෙ. එයා අරගෙන ආපු බෑග් එකත් උස්සගෙන ගෙට ගියා.

මං හිටපු තැනම ගල් හැහිලා බලන් හිටියෙ මේ මොනවද වෙන්න යන්නෙ කියලා හිතාගන්න බැරුව. පැය කාලකට විතර පස්සෙ හංසි මිදුලට ආවේ ඇඳුම් මාරු කරලා තේ දෙකකුත් හදාගෙන. දැන් මොන පාඩම්ද ? මං පොත වහලා පැත්තකින් තිබ්බා.

"මං ඔයා එක්ක කතා කරන්න ගොඩක් දවස් ඉඳලා බලන් හිටියෙ මල්ලි "

තේ එක මගේ අතට දීලා මගේ ඉස්සරහා පුටුවෙන් ඉඳගද්දි හංසි අතේ තව මොනවාහරි දෙයක් තියෙනවා දැක්කා.

" කියන්න අක්කෙ, මං අහගෙන ඉන්නේ "

" කොහොම කියන්නද මල්ලි, ඔයා මාව කොයි විදිහට තේරුම් ගනීද දන්නෑ "

එයා මගේ දිහා බැලුවේ එදා කැළණි පන්සලේදී මං එයාගේ අත අල්ලපු වෙලාවේ බලපු විදියටම තමයි. මට තේරුණ විදිහට ඒ ඇස් ඇතුලේ හැංගිලා තිබුණෙ ආදරේ.

" කරුවලත් වැටීගෙන එනවා හංසි අක්කෙ, එළිය සීතලයි. අපි ගෙට යං"



WWW.EXPRESSLANKA.TK 137

අත් දෙක ගුලි කරලා පපුවට තද කරන් එයා හිටපු විදියට මට දුක හිතුනා. හරියට සීතලේ හැඳුනු හා පැටියෙක් වගේ.

" ටිකක් මෙහෙම ඉමු "

කියලා හිටපු පුටුවෙන් නැගිටලා එයා මං ඉඳන් හිටපු තැනින්ම ඇවිත් ඉඳගත්තා. හංසි ළඟ ඉද්දි මගේ දඟ හිත මොනවාදෝ කියනවා.

" ඔයා දන්නේ නෑ මල්ලි, අපේ ගම නුවර. මං ඉස්කෝලේ ගියේ මහමයා එකට. ඕ ලෙවල් හොඳට පාස් උන මං හිතන් හිටියෙ කවදා හරි පේරාදෙණියෙ කැම්පස් යන්න"

මං කතා නොකර ඉද්දී හංසි එක පාරට එයාගෙ විස්තර කියන්න ගත්තා. එයා ගැන කිසිම දෙයක් නොදන හිටපු මං ඒ දේවල් අහන් හිටියේ ඕනෑකමින්.

" ඉතිං "

" ඒත් මට ඒ හීනේ හැබෑ කරගන්න බැරි උනා. මං හරියට විභාගෙ කලේ නෑ. මට ආපහු විභාගේ ලියන්න කියලා හැමෝම කියද්දි මම බෑ කියලා බාහිර උපාධිය කරන්න ගත්තා. මට නුවර එපා උනා මල්ලි. මගේ අප්පච්චි උඩරට පාරම්පරික නැටුම් පරපුරක කෙනෙක්. එයා එහෙ කලායතනයක් කළා. ඒත් මං නුවර ඉන්න බෑ කියලා අඬද්දි අප්පච්චී මං වෙනුවෙන් ඒ කලායතනය වහලා දාලා අපිව අරන් කොළඹ ආවා. "





" ඇති අක්කෙ ඇති "

" ඇයි මල්ලී ?"

SLU

" ඔයාට මාව විශ්වාස නැද්ද ? ඇයි මට කතාව බාගෙට කියන්නෙ? ඔයා මට කියන්න ඕන ලොකුම දේ හංගලා නේද කියන්නෙ හංසි ?

මං නම විතරක් කියලා අහපුවාම කෙල්ල ලොකු හුස්මක් පිට කලා.

" ඔයාගේ කතාව එකකට එකක් සම්බන්ධ නෑ. හොඳට ඕ ලෙවෙල් පාස් කරපු ඔයා ඇයි ඒ ලෙවෙල් හරියට නොකලේ ? ඇයි නුවර එපා උනේ ?"

" ඒ හැමදේකටම උත්තරේ ආදරේ. ආදරේ නිසා නුවර දාලා ආපු මං අප්පච්චි මෙහේ පටන්ගත්තු කලායතනෙ බාර ගත්තෙ මගේ හිත හදාගන්න. දවසක් ඔයාලගේ අක්කා ඇවිත් එයාගෙ ඉස්කෝලෙ නැටුම් කණ්ඩායමක් හදන්න මට කතා කලා. එයාලගෙ ඉස්කෝලෙට ගිය දවසේ ඉඳලා අපි දෙන්නා ගොඩාක් හොඳ යාළුවො උනා "

හංසි කරුවල දිහා බලාගෙන කිසි ගතියක් නැතුව දිගටම කියවන් යනවා. අහපු ප්‍රශ්නෙටත් අකුරු තුනකින් උත්තර දීලා ලිස්සලා ගියාට ඒ ආදරේ ඇතුලේ තියන කතාව මට කිව්වෙ නෑ.



WWW.EXPRESSLANKA.TK 138

'' දවසක් ඔයාගේ අක්කා මේ ඉන්නේ මගේ හුරතලේ කියලා ඔයාගේ ෆොටෝ එකක් පෙන්නපු දවසෙ මාව හරිවැටිලා ගියා වගේ උනා මල්ලී ''

ඇයි යකඩෝ ! මගේ ෆෝටෝ එක දැකලා මෙයා මොකටද හිරි වැටෙන්නේ ?

'' ඔයාගේ හිතේ තියන ප්‍රශ්නෙ මට තේරේනවා මල්ලී. මුලින්ම ඔයා මේ ෆොටෝ එක බලලා ඉන්න''

අතේ තිබුණු කවරෙකින් ෆොටෝ එකක් එළියට අරන් හංසි මගේ අතට දුන්නත් එතන තිබුණ කරුවලට ඒක පැහැදිලිව පෙනුනෙ නෑ. මං ඒකත් අරන් ගේ ඉස්සරහා දාලා තිබුණ ලයිට් එක ළඟට ගියා.

දෙයියනේ හංසි දීපු ඒ ෆොටෝ එකේ හිටියෙ මං. මංම තමයි. සුදු යුනිෆෝම් එක ඇඳලා කැප් එකත් දාලා ඔළුව පැත්තක් පාත් කරලා හිනාවෙවී හිටියේ මං උනාට කවදාවත් මම ඒ වගේ ෆොටෝ එකක් අරන් නෑ. එදා නුවර ගිය දවසේ උනත් අපි ඇඳගෙන ගියේ පාට ඇඳුම්. මගේ අත ලාවට වෙව්ලද්දී මං තවත් ළංකරලා බැලුවා. හංසි කිව්වා වගේ මාවත් නිකං හිරි වැටුනා වගේ. මං කියලා හිතුවට ඒ මං නෙමෙයි. එතකොට මගේ රූපෙම තියන මෙයා කවුද ?

'' ඔය තමයි මගේ පවන් ''

මං හංසි ළඟට යද්දී එයා අහන්නත් කලින් කිව්වා.





'' කෝ දැන් එයා ''

'' මේ ඉන්නේ ''

SLU

කියලා හංසි එක පාරටම අඬාගෙන ඇවිත් මට තුරුල් උනා. ඒකිව තල්ලු කරලා දාන්න හිතුනත් කෙල්ල අඬන්නෙ මං වගේම තවත් කොල්ලෙක් ගැන තියන ආදරේ වෙනුවෙන් නේද කියලා හිතෙද්දි මට දුක හිතුනා. මං එයාවත් මගේ ඇඟට හේත්තු කරගෙන ඇවිත් සාලෙන් ඉඳගත්තා.

'' මේ ටිකත් බලන්න ''

අතේ තියන් හිටපු කවරේ මගේ අතට දීලා හංසි මගේ මූණ දිහා බලන් ඉන්න අතරේ මං ෆොටෝ එක එක බැලුවා. පවන් මගේ පාටම මගේ උසම තියන ලස්සන කොල්ලෙක්. එක ෆොටෝ එකක් තිබුණා පවන් යුනිෆෝම් ඇඳලා, නුවර වැව් බැම්මට හේත්තු වෙලා හංසිව ළං කරගෙන ඉන්න එකක්. එකේ හංසි හිටියෙ සුදු යුනිෆෝම් එක ඇඳලා කොණ්ඩ කරල් දෙකක් ගොතලා හරියට පුංචි කෙල්ලෙක් වගේ. මං හංසි දිහා බලද්දි එයාගේ ඇස් දෙකේ කඳුළු බේරෙනවා.

'' පවන්ට මං අදටත් ගොඩක් ආදරෙයි මල්ලි. එයා තමයි මගේ ජීවිතේ ''

'' එහෙනං ඇයි එයාව දාලා කොළඹ ආවෙ? ''

'' මං එයාව දාලා ආවේ නෑ. එයයි මාව දාලා ගියේ''



WWW.EXPRESSLANKA.TK 139

" ඇයි ඒ ?"

" මං හැමදේම කියන්නං මල්ලි. ඒත් දැන් නෙමෙයි හෙට"

හෙට කොහෙ කියන්නද ? මං හෙට පන්ති යනවනෙ. අනික් හෙට රෑට අම්මත් ගෙදර ඉඳියි.

" ඇයි හෙට කියන්නේ ? අදම කියන්න මට හෙට පංති "

" මට සමාවෙන්න මල්ලී, හෙට විතරක් පන්ති නොගිහින් මං එක්ක පොඩි ගමනක් යන්න එන්න"

" ඒ කොහේද? "

" නුවර "

මේකිගේ ඔළුව හැප්පිලාද මන්දා මට ක්ලාස් කට් කරලා නුවර යන්න අඬගහන්නේ.

" බෑ කියන්න එපා මල්ලී. හෙට ඔයාටත් විශේෂ දවසක් වෙයි. හැබැයි අක්කට කියන්න එපා "

හැමදාම මම එයාට කියන දෙබස 'අක්කට කියන්න එපා ' කියන එක අද හංසි මට කිව්වා. එයා එක්ක නුවර යන එක කොහොමද විශේෂ වෙන්නේ. මමත් පවන් වගේ නිසා හංසි මට කැමතියි කියයිද දන්නේ නෑ. මූද හත් ගව්වක් තියා අමුඩ ගහන්න ඕනේ නැහැනෙ. දැන් නිකං හරි අම්මලා ආවොත් බඩුම තමයි.





උදේට නුවර යන්න පොරොන්දු වෙලා මං අර ෆෝටෝ ටිකත් අරන් කාමරේට ගියා.

එදා එයා මගේ ෆොටෝ ගොඩෙන් උස්සපු අපි දෙන්නා ඉන්න ෆොටෝ එකත් එතන තිබුනා. මං ආපහු අරන් බැලුවෙ පවන්ගෙ ෆොටෝ ටික. ඌත් මං වගේමයි. පවන්ගෙයි මගෙයි ෆොටෝ එකට තිබ්බම හරියට අව්නියි සව්නියි වගේ. හංසිගේ වයසක් එක්ක බලද්දී නං පවන් මට වඩා අවුරුදු ගානක් වැඩිමල් ඇති. අම්මලා ගෙදර ආවට පස්සේ පාඩම් කරන්න තරම් හිතක් තිබුණෙ නැති නිසා මං නිදාගන්න ගියා.

*******

උදේ පාන්දරම පංති ගෙනියන බෑග් එකත් කරේ දාගෙන මං හංසිටත් කලින් කොටුව ස්ටේෂන් එකට ගියේ ඔළුවෙ දාහක් ප්‍රශ්න තියාගෙන. මං එද්දිත් හංසි ගෙදර නිසා එයා එනකල් මං ටිකට් කවුන්ටරේ හරියෙ හිටියා.

හංසි මාව දැකපු පළවෙනි දවසෙ ඉඳලා මට විශේෂත්වයක් දැක්වුවෙ, මං දිහා නිතරම දුක හිතෙන විදියට බලන් හිටියෙ ඇයි කියලා මට දැන් තේරෙනවා. එයා මගේ පෙනුමට කැමති උනාට එයාගේ ආදරේ තවම අයිති පවන්ට. මට අද නුවර යන් කිව්වෙ සමහර විට පවන්ව පෙන්නන්නද දන්නෙ නැහැ. මං වගේම පෙනුමක් තිබුණ ඌව බලන්න මටත් පොඩි ආසාවක් දැනුනා.

ඔය හැමදෙයක්ම කල්පනා කරන අතරේ මට මතක් උනේ සව්නිව. හංසිගේ ආදරේ අයිති පවන්ට වගේම තමයි මගේ ආදරේ



WWW.EXPRESSLANKA.TK 140

අයිති සචිනිට. ඒක දැන් මගේ හිත පිළිඅරගෙන ඉවරයි. නිරෝධයත් දන්නවා දැන් සචී එයාට කැමති නෑ කියලා. ඒත් සචීට ආදරෙයි කියලා කියන්න විදියක් නෑ. කෙල්ල වෙන කෙනෙක්ට කැමති කියලා මට කටින්ම කිව්වනෙ. කමක් නෑ ඒ බෝනික්කි වෙනුවෙන් මං හැමදාම බලන් ඉන්නවා.

SLU

'' කොහෙද ගිහින් හිටියෙ ''

හංසි ළඟට එනකල්ම මං දැක්කෙ නෑ. ඇත්තටම මගේ හිත ගොඩක් දුර ගිහින් තිබුණෙ.

'' ගිහින් හිටියේ ආදරේ හොයාගෙන ''

'' මටත් ආදරේ හම්බ වුනේ නුවර අහස යට. සමහර විට ඔයාටත් හම්බවෙයි ''

ඒකි හෙන දඟ විදියට කිව්වේ. මේ අප්‍රබ්‍රංශ මටනං තේරුනේ නෑ. විහාගෙ කටේ තියාගෙන පන්ති කට් කරලා අක්කගෙ යාළුවෙක් එක්ක මං යන්නේ හරි ගමනක්ද මන්දා. අපි නුවර එක්ස්ප්‍රස් එකේ ටිකට් දෙකක් අරන් ගිහින් කෝච්චියට නැග්ගා.

'' ඉතිං කියන්න ''

හරි බරි ගැහිලා ඉඳගෙන මං බලන් හිටියේ මෙයා ඊයේ නොකියපු ටික කියනකල්.





'' අපෝ මොකද හදිස්සි. මේක පැය කාලෙන් යන්නෙ නෑ. මං හෙමීට කියන්නං ''

හෙමීට කිව්වම කෝච්චිය යන සද්දෙට ඇහෙයිද මන්දා.

'' ගොඩක් හෙමීට කියන්න එපා. මගේ කන් ඇහෙනවත් අඩුයි. ඒ නිසා ටිකක් හයියෙන් කියන්න''

'' පෙනුමෙන් විතරක් නෙමෙයි මල්ලී ඔයා කතාවෙනුත් පවන්ම තමයි. එයත් ඔයා වගේ දඟ කතාමයි කියන්නෙ ''

ඒ ඇස්වල ආදරේ පිටාර ගලනවා. මේ තරම් ආදරේ කරන කෙල්ලෙක්ව දාලා ගිය පවන් නං මහා මෝඩයෙක්. හංසි තාම අතීත මතකයන් එක්ක සැරිසරනවා.

'' ඔයා අක්කා එක්ක රණ්ඩු කරනවා වගේ තමයි එයා ඉස්සර මං එක්ක රණ්ඩු කරන්නේ. මහා පිස්සු කොල්ලෙක් ''

ඒ නං පිස්සු කොල්ලෙක් කියලා කිව්වෙ ආදරේ වැඩි කමට .

'' ඒ කිව්වෙ මමත් පිස්සු කොල්ලෙක් කියන එකද ?''

'' ඔයාට පවන්ට වඩා පිස්සු ''

බලපල්ලකො ඒ කතාව. පිස්සෙක්ව එක්කගෙන නුවර යන තමුසෙට මට වඩා පිස්සු කියන්න කටට ආවත් මං නිකං හිටියා.



WWW.EXPRESSLANKA.TK 141

කෝච්චියෙ වැඩිය සෙනඟත් හිටියෙ නැති නිසා අපිට නිදහසේ කතා කර කර යන්න පුළුවන්කම තිබුණා. ඊයේ හෙන සෝක මූඩ් එකේ හිටපු හංසි අදනං ඇවිත් තියෙන්නේ මංචි ජින්ජර් බිස්කට් එකක් කලා. අපේ එකවුන්ට්ස් සර් බැංකු සැසඳුම් වලට කියලා දුන්නා වගේ මේ වෙනසට හේතුව 'හරද' 'බැරද' දන්නෙ නෑ.

" ඉතිං පවන්ගේ ඉස්කෝලෙ මොකක්ද ?"

මං පටන් ගන්නකල් කෙල්ල මුකුත්ම කියන්නෙ නැති නිසා මංම ඇහුවා. දිග හුස්මක් පිට කරලා අතීතෙට ගිය හංසි කතා කලේ මෝහනය වෙලා වගේ.

" එයා නුවර ධර්මරාජේ. මට වඩා එක අවුරුද්දක් ඉහළ පංතියක පවන් හිටියේ. අපි අවුරුදු හතරක් විතර ගොඩාක් ළඟින් ආශ්‍රය කලා."

හංසි කතා කරන අතරෙ සැරෙන් සැරේ මගේ මූණ දිහා අමුතු විදිහට බලනවා.

" අක්කා ඔයාගෙ ෆොටෝ පෙන්නපු දවසෙ ඉඳලා මට ඔයාව දකින්න තිබුණේ පුදුම උනන්දුවක්. ඒත් ඔයාලාගෙ ගෙදර ගිය තුන්වෙනි දවසේ තමයි මං ඔයාව දැක්කෙ "

ඔන්න ඉතිං ආයෙත් ට්‍රැක් එක පැන්නා. මෙයාව මුලින්ම හම්බ උන දවස මටත් මතකයි. එදා අක්කයි මායි කොක්කක්





දාගත්ත වෙලාවෙ මෙයා කරුවලට වෙලා බයවෙලා වගේ බලාගෙන හිටියෙ.

" පවන්ගේ අම්මලා නිකං හරි ඔයාව දැක්කනං ඒ මිනිස්සුන්ට අදහන්න බැරිවෙයි. ඔව් මල්ලි, ඔයා පවන්ම තමයි "

" මට අද එයාව පෙන්නනවද ?"

ඔන්න ආයෙත් ටැප් එක අරින්නයි ලෑස්තිය. මෙයා අඬන්න ගත්තොත් මිනිස්සු මගේ දිහා බලන්න ගනියි.

" අනේ හංසි අක්කේ, ප්ලීස් අඬන්න නං එපා "

" මං කොහොමද මල්ලී එයාව පෙන්නන්නේ ?"

ඔව්, ඒ කතාවෙත් ඇත්තක් තියෙනවා. අවුරුදු ගානකට කලින් දාලා ගිය කොල්ලෙක්ව දැං එක පාරටම කොහෙන් හොයන්නද? ඔන්න ඒ පාර හංසි බෑග් එක ඇදලා කොලයක් අතට ගත්තා.

" මේ ඉන්නේ බලන්න " SLU

මේකිට සිංහල තේරෙන්නෙ නෑ. මං ෆොටෝ දැක්කනෙ. මට ඕනෙ හැබැහින් දකින්න. ඒත් ඒ කොලේ මං දිග ඇරලා බැලුවා. දෙවියනේ !



WWW.EXPRESSLANKA.TK 142

ඒක දැක්කා විතරයි මාව සීට් එකෙන් නැගිට්ටුනා. ඒ පවන්ගෙ මරණ දැන්වීම. ජීවිතේටම දකලා නැති ඒ කොල්ලා වෙනුවෙන් මගේ ඇහෙන් කඳුළක් එද්දී හංසි අතින් ඇදලා මාව ඉන්දෙව්වා. එයාගෙත් ඇස් රතු වෙලා.

"මේ මොන අපරාධයක්ද හංසි අක්කේ. මොකද පවන්ට උනේ?"

මට මුකුත්ම හිතා ගන්න බැරි උනා. එයා මැරිලා තියෙන්නෙ මීට අවුරුදු හතරකට කලින්. ඒකද හංසි කිව්වේ පවන් එයාව දාලා ගියා කියලා.

"කියන්න හංසි අක්කෙ කියන්න. පවන් අයියට මොකද උනේ ?"

මං ඒ අත්දෙකෙන්ම අල්ල ගත්තා. හංසි කතා කරන අතරේ මරණ දැන්වීමේ තිබුණ පවන්ගේ ෆොටෝ එක මගේ දිහා බලන් හිනාවෙනවා වගේ මට දැනුනෙ.

" මං කිව්වේ එයා ඔයා වගේම දඟයි කියලා. ඒ ලෙවල් ලියලා ප්‍රතිඵල එනකල් ඉන්න අතරේ මෙයා ගෙදරට හොරෙන් යාළුවෝ එක්ක ඔයේ නාන්න ගිහින්. පවන් ඔයට බරවෙලා තිබුණ ගහක අත්තකට නැගලා වතුරට පනින්න හිතාගෙන. ඒත් අත්ත කැඩිලා අත්තේ කෑල්ලක් එක්කම මෙයාව වතුරට වැටිලා. යාළුවො පැය බාගයක් විතර හෙව්වත් පවන්ව හම්බ වෙලා නෑ. ඊට පස්සේ ගමේ මිනිස්සු ඇවිත් කිමිදිලා තමයි මිනිය ගොඩ අරන් තියෙන්නෙ"





හංසි කියපු අන්තිම ටික මට හරියට ඇහුනෙ නෑ. එයාගෙ කටහඬ වෙව්ලනවා. තමන් ආදරේ කරපු කෙනා ගැන ඔය වගේ කතාවක් හිත හදාගෙන කොහොම කියන්නද ?

" මගේ පවන් අල්ලගෙන හිටපු ගහේ අත්ත ඔයේ පතුලේ ඇනිලා තිබුනලු. ඒත් එයාට ඒක අතඇරලා උඩට එන්න බැරි වෙලා මල්ලී. ඒකයි මඬේ එරිලා තිබුණ මිනියත් හොයාගන්න පරක්කු වෙලා තියෙන්නෙ. "

හංසි හෝ ගාලා අඬනවා. මං එයාගෙ ඔළුව මගේ උරහිසට හේත්තු කරගත්තා. පච් ! පවන් දාලා ගියා කිව්වට මං හිතුවේ නැහැ මෙහෙම දෙයක්.

" මං මාස ගාණක් නොකා නොබී ඇඬුවා මල්ලී. මගේ රත්තරං ඒ කඳුළු දැක්කේ නෑ වගේ ඇස් පියාගෙන එයාගෙ යාළුවන්ගෙ කර උඩින් යන්න ගියා. මාව මැරුනේ නැති ටික විතරයි දෙයියනේ, මැරුනේ නැති ටික විතරයි "

" අඬන්න එපා අක්කේ ඔයාගෙ දුක මට දැන් හොඳට තේරෙනවා"

මට තිබුණ ලොකුම ප්‍රශ්නෙ මෙයා මාව එක්කං නුවර යන්නෙ ඇයි කියන එක. මං මුලින්ම හිතුවේ පවන්ව පෙන්නන්න කියලා. ඒත් දැන්?

"පවන් කලේ සයන්ස්, එයාට පේරාදෙණියෙ මෙඩිකල් ෆැකල්ටි එකට යන්න ඕනෙ කියලා නිතරම කිව්වා. අපේ



WWW.EXPRESSLANKA.TK 143

පරම්පරාවම කලේ කලාව නිසා මමත් නැටුම් කරා, එයා එක්කම ඒ කැම්පස් එකට යන්න"

SLU

" ඉතිං "

" ප්‍රතිඵල එද්දී මගේ පවන් ඉහලින්ම විභාගේ පාස් වෙලා මල්ලී. එයා හැමදාම ආසාවෙන් යන්න බලන් හිටපු මෙඩිකල් ෆැකල්ටියට එයා තේරිලා "

හංසි ඒ ටික කියද්දී මට දැනුනේ මහා ලොකු දුකක්. පව්!මේ කෙල්ල තාම ජීවත් වෙනවා පුදුමයි.

" මං නොකා නොබී අඬ අඬ ඉදලා අසනීප උනා. සැහෙන්න කාලයක් පේරාදෙණියෙ ඉස්පිරිතාලෙත් හිටියා. අන්තිමට මං විභාගෙ ලිව්වෙ ඇවිදින මළ මිනියක් වගේ. මගේ පවන් නැතුව මට කැම්පස් යන්න කිසිම ඕනකමක් තිබුණේ නෑ. නුවර ඉන්නකල් මං හදවතින් මැරි මැරි ඉපදුනා. අන්තිමට අපේ අප්පච්චිලා නුවර අතෑරලා කොළඹ ආවා "

එයා මුළු කතාවම ඉවර කරද්දී ඒ මූණ ජම්බු ගෙඩියක් වගේ රතුවෙලා. හංසි මෙච්චර දවස් හිටියේ හිතේ මේ තරම් ලොකු දුකක් හිරකරගෙන කියලා කවුද දන්නේ.

බලන් යද්දී ෂෝටා දවසක් කියපු කතාව හරි. හංසි ඒ ලෙවෙල් කරලා තාම අවුරුදු හතරක් විතර ඇති කියන්නේ එයා අපේ අක්කට වඩා බාලයි.





එතන ඉදලා නුවරට යනකල්ම අපි වැඩිය කතා නැතුව කල්පනා කරපු එක තමයි කලේ. නුවරින් බහිද්දි අතපය විතරක් නෙමෙයි හිතත් හිරිවැටිලා වගේ. හිතට පාළුවක් දැනෙද්දි මට අපේ විහඟලව මතක් උනා.

" දැන් අපි කොහෙද යන්නෙ ?"

මං මෙලෝ දෙයක් නොදන ඇහුවා. මෙයාගෙ ප්ලෑන් මම දන්නේ නැහැනෙ.

" අපි මුලින්ම යං මාළිගාවට "

මං වෙලාව බලද්දි තාම දහයටවත් නෑ. හංසි නුවර පාරවල් දිගේ ඇවිදගෙන ගියේ හරිම හුරු පුරුදු විදියට. මමත් ගොනා තණකොල සේ එයා පස්සෙන් ඇවිද ගෙන ගියා.

" මං මේ පාරවල් දිගේ පවන් එක්ක කොයිතරම් ඇවිදලා ඇත්ද? අපි කී පාරක් මාළිගාවට ගිහින් තියෙනවද ? ඒත්...... දළදා හාමුදුරුවොත් අපි දිහා බැලුවේ නෑ මල්ලී "

හංසි කියන දේවල් වලට දෙන්න උත්තර මං ළඟ නෑ. එයා මාළිගාව කිට්ටුව තියන මල් කඩේකින් මට මල් ගන්න කියලා ෆෝන් එකත් අරන් අයිනට ගිහින් කාත් එක්කද කතා කලා. මං සුදු නෙළුම් මල් මිටියත් අරන් ගිහින් එයාගෙ අතට දුන්නා.

" කාටද කතා කලේ ?"



WWW.EXPRESSLANKA.TK 144

SLU

" අම්මට "

අම්මට මොකටද හොරෙන් කතා කලේ. මෙයා මොනවා කරන්න යනවද මන්දා. අපි දළදා මාළිගාව ඇතුළට ගියාම හංසි මගේ ළඟටම ඇවිත් හෙමිහිට කතා කලා.

"අපිට උදව් නොකලට දළදා හාමුදුරුවන්ගෙ හුඟක් පිහිට තියනවා මල්ලි. මං කිව්වෙ, මට ආදරේ හම්බඋනේ මේ නුවරදි. ඔයත් ප්‍රාර්ථනා කරන්න. ඔයාටත් හම්බවෙයි."

එයා සුදු නෙළුම් මලක නැට්ට කඩලා මගේ අතට දුන්නම හංසි කියපු දේ මතක් කරලා මං මල පූජ කලා. මට ඇත්තටම මතක් උනේ මගේ සචිනිව.

" දූන් ඇස් ඇරලා හැරිලා බලන්න පැටියො. ඔයාගේ ආදරේ ඔයා ළඟ "

මං ෆුල් හොල්මං වෙලා පිටිපස්ස හැරිලා බැලුවා. මං මේ දකින්නේ හීනයක්ද නැත්නං දළදා හාමුදුරුවන්ගෙ හාස්කමක්ද කියන්න දන්නෙ නෑ. ඒත් සචිනි මගේ පිටිපස්සෙ ඉදන් කඳුළු පුරෝගෙන මං දිහා බලන් හිටියා. මේක අදහන්න බැරුව මං පුදුම වෙලා හංසි දිහා බැලුවා.

" මට මගේ පවන්ගේ වගේම ඔයාගේ හිතත් කියවන්න පුළුවන් මල්ලි. ඔයා සචිනි නංගිට ආදරෙයි කියලා මං දන්නවා"





සචී හෙමීට මං දිහාට එද්දී හංසි අක්කා තවත් මලක් එයා අතට දුන්නා. අපි දෙන්නම ඒ මල අත් දෙකෙන්ම අල්ලලා පූජා කලා. අපි දෙන්නව වෙන් කරන්න එපා කියන පැතුම වගේම හංසි අක්කගේ ජීවිතේ සාර්ථක වෙන්න කියලත් මං පැතුවා. අපි වැඳලා පිටිපස්ස බලද්දී හංසි එතන නෑ. වටපිට වැඩිය සෙනඟ නැති නිසා මං හෙමිහිට සචිනිගේ නළල ඉම්බා. ඒක නරක වැඩක් කියලා මං හිතුවෙ නෑ. මේ මගේ පළවෙනි ආදරේ.

සචී මගේ අත තද කරලා අල්ලගෙන එළියට එද්දී මගේ ඔළුව යකාගේ කම්හල වගේ වෙලා. මේක තනිකර පැටළුණ නූල් බෝලයක් වගේනෙ. සචී කොහොමද මේ වෙලාවේ මෙතනට ආවේ ? කාත් එක්කද ආවේ? හංසි කොහොමද මේ දේවල් ප්ලෑන් කලේ? මොනවා උනත් එයාට ආදරේ ලැබුණු මේ නුවරදිම එයා මගේ ආදරෙත් මට ලබලා දුන්නා. අපි මාළිගාවෙන් එළියට එද්දි හංසි අක්කා පඩිපෙළ ළඟ ඉඳගෙන අචිනියි දිනුකයි එක්ක කතාව. මුන් දෙන්නා මෙහෙ මොනවා කරනවද? මගේ හතරැස් වෙච්ච මූණ දකිද්දි සචිනිට ලාවට හිනාවක් ගියා.

" හැමදේම කියන්නං. යන්කො එළියට "

සචිනි මගේ අතත් අල්ලගෙනම අචිනිලා හිටපු තැනට ගියා.

" අම්මෝ ඇති යාන්තං, අද නං රෑට මෙයා සැනසිල්ලෙ නිදා ගනී. නැත්නං මටනෙ කරදරේ"

අචිනි සචී දිහා බලලා කියද්දි කෙල්ල රතු උනා. ඒ කියන්නෙ සචිනි මෙච්චර දවසක් ආදරේ කලේ මටද ? ඇයි දෙයියනේ මට ඒක නොතේරුනේ.



WWW.EXPRESSLANKA.TK 145

" හංසි අක්කා දවසක් මගෙන් ඔයා ගැන ඇහැව්වා රන්දූ. මං ඔයාට ආදරේ කරනවා කියලා අක්කට තේරිලා. ඔයාට කියන්න එපා කියලා මං එයාට ඇත්තම කිව්වා. මගේ ආදරේ මට අරන් දෙන්නං කියලා එයා මට පොරොන්දු උනා. "

බලාගෙන ගියාම හංසි අක්කත් කරලා තියෙන්නේ මාර කුසල කර්මයක්. ආදරේ නිසා දෙපැත්තක ඉඳලා විඳවන අපි දෙන්නව එයා අපිටත් හොරෙන් එකතු කලා. එහෙම කරන්න ඇත්තෙ ලබන ආත්මේ හරි එයාගේ පවන්ව එයාට ලබලා දෙන්න කියලා වෙන්න ඇති.

" හංසි අක්කා මේක ප්ලෑන් කරලා මට කිව්වා අද ඔයාව නුවර එක්කං එනවා මටත් එන්න කියලා. මේ තරම් දුර තනියම එන්න බැරි නිසා මං අක්කිවත් අඬගහ ගත්තා. අපිත් ආවේ ඔයාලා ආපු ට්‍රේන් එකේමයි "

" උඹලා විතරක් නෙමෙයි, අපි ආවෙත් ඒකෙම තමයි "

හුටා මෙන්න විහඟයත් ඇවිත්. ඌගේ පිටිපස්සේ ෂෝටයි, නිරෝධයි , සාරංගයයි තුන්දෙනත් ඉන්නවා. බලන් යද්දි මේකත් මාර රහසක් තමයි.

" උඹලා වගේ අඬ අඬ ආවේ නෑ අපි. ට්‍රේන් එකේ පිටිපස්සට වෙලා අපි ෆුල් ආතල් එකක් ගත්තා. "

ෂෝටා දඟල දඟල කියද්දී මට ලැජ්ජාවට වචන හොයා ගන්නත් බැරි උනා.





" ඈ යකෝ, එහෙනං ඒකත් ජයසිරි මංගලම් කිව්වලු ආ......"

ඒ කතාවට සචිනි බිම බලාගෙන ඇඹරෙනවා.

" සොරි මචං "

SLU

මොකද බොලේ මේ දිනුක සොරි කියන්නේ? දන්න තරමින් ඌ මට වැරැද්දක් කරලා නෑ.

" ඊයේ අවී නුවර යං කියපු වේලාවෙ ඒක වැරදිලා මගේ කටින් සාරංගට කියවුනා. "

ආ...... ඔය පනින්නේ බළල්ලු මල්ලෙන් එළියට. මූත් වැරදිලා කියලා තියෙන්නේ මරු මිනිහට. වචනේ අහුලගත්තා විතරයි මූන් හතර දෙනත් මළගිය ප්‍රාණකාරයෝ වගේ අපේ පස්සෙන් ඇවිත්. කට්ටිය එකම ට්‍රේන් එකේ ආවට තුනට බෙදිලා ඇවිත් තියෙන්නෙ. මං පිස්සු හැදිලා වගේ වටපිට බලද්දී නිරෝධ හෙමිහිට මගේ ළඟට ආවා.

"මං මේක හිතලා කරපු දෙයක් නෙමේ නිරෝධ. මට සමාවෙයන්"

" මං හැමදේම දන්නවා බං. සමාව ඉල්ලන්න උඹ වැරැද්දක් කරලා නෑ. "

ඌ මගෙයි සචිගෙයි දෙන්නගෙම අත් අල්ලලා සුභ පැතුවා. හැමදේම කරලා හංසි ගොළුවෙලා වගේ පැත්තක් අල්ලගෙන ඉන්නවා.



WWW.EXPRESSLANKA.TK 146

" අපරාදෙ අපේ කට්ටියම ඉන්නවා. ජනාලියි මහේෂයි විතරයි අඩු. "

සචිනිට එකපාරටම කියවුනා.

" ඈ බං උඹ හිතුවෙ මං මගේ සුනඛ අසිපත දාලා ආවා කියලද? ඔය එන්නේ ඩබල බැබළි බැබළි "

විහඟ අපිට ඔළුවෙන් පාර පැත්ත පෙන්නුවා. අච්චාරු බෑග් එකකුත් අතේ තියාගෙන ජනාලියි, මහේෂයි හිනාවේවී එනවා. ඒ කියන්නෙ මුන් දෙන්නා ඇවිත් තියෙන්නේ සචිනිලටත් හොරෙන්. වැඩේ නං එළකිරි. රිචිෂන් සර්ව නුවරට ගෙන්න ගත්ත නං අද මෙහෙදී ක්ලාස් එක කරන්න තිබ්බා.

" රන්දු, ඔන්න මචං කිසි අවුලක් ආබාධයක් නැතුව හැමදේම හිතට ඉෂ්ඨ සිද්ධ උනා, දැන් කියපං සින්දුවක් "

මං එක අතක් සචිනිගේ කරටයි අනිත් අත හංසිගේ කරටයි දාගත්තා.

" ජීවිතේ සුන්දරද මෙතරම් ......"

- අවසානයි -

Scanned for SL-Unlimited.com by Sheree



දයාබර හංසි..........

ඔයා කිව්වා වගේම මේ සෙන්කඩගල පුරවරය මගේ හිතටත් සැනසීම ගෙනාවා. මගේ ජීවිතේ ලැබුණු සොඳුරුම වස්තුව මට ලැබුණෙ මේ නිල් අහස යටදී. ඒක සිද්ධ උනේ මමවත් හිතපු නැති වෙලාවක.

ඒ හැම ආශ්චර්යයක්ම කලේ ඔයයි හංසි. පවන් අහිමි වුන දුක අමතක කරන්න ඔයා කොළඹ ආවත් පවන් වගේම රූපයක් තිබුණ මාව ඔයාට කොළඹදී මුණ ගැහුණා. දෙවෙනි පාරටත් ඔයාගෙ පවන්ව ඔයාට අහිමි කරගෙන ඔයාම මාව සචිනිට බාරදුන්නා.

මට කියන්න හංසි..... මේ හැමදේම කරලා ඔයා දැන් ඉන්නෙ සතුටින්ද ?

මං රන්දු

******* ************************************

ආදරණීය රන්දු..........

ඔය දඟකාරකමට, ලස්සන ඇස් දෙකට, ගැඹුරු කටහඬට මං අවුරුදු කීයක් හිතෙන් ආදරේ කළාද ? ඒත් ඇයි රන්දු ඒක නොතේරුණා වගේ හිටියේ ? මං කොයිතරම් නං විදෙව්වද දෙයියනේ.

ඔයා නෙත්මිට ළං වෙද්දි මං බය උන තරමක්. මාව හරියටම තේරුම් ගත්තෙ හංසි අක්කා විතරයි. එයා නොහිටින්න අපි දෙන්නා තාමත් දෙතනක.

එදා නුවරදි මං සමස්ත ලංකා තරගෙ දින්නා. ඒත් අද......අද මං මුළු ජීවිතේම දින්නා රන්දු.

මං ඔයාගෙ සචිනි.

********************************************

රන්දූ මල්ලි ...............

හිතෙන් මැරිලා හිටපු මං ආපහු ඉපදුනේ ඔයාගේ ෆොටෝ එක දැකපු දවසෙ. මට හිතුනෙ මගේ නැති වුන ආදරේ ආපහු ලැබුණා කියලා. ඒත් .......... අපිට ළංවෙන්න බැරි සමාජ සම්මතයන් මහා පවුරක් වගේ අපේ හරහට හිටිනවා කියලා මම දැනගෙන හිටියා.

ඔයාට මතකද අපි කැළණි ගිය දවස ? එදා දවස මට තාමත් හීනයක් වගේ. ඔයා සචිනිට ආදරෙයි වගේම සචිනිත් ඔයාට ආදරෙයි කියලා ඔයාලගෙ ඇස් වලින් මට තේරුණා. ඒකයි මං ඔයාලව ළං කලේ.

ඒත් මල්ලි ... ඔයාට මගේ ඇස් දෙකෙන් කියපු කතාව තේරුනේ නැද්ද ? මං මගේ පවන්ට වඩා දහස් ගුණයකින් ඔයාට ආදරේ කලා. ඒ ආදරෙත් අරන් මං ඔයාලගෙන් ඈත්වෙලා යන්නම යන්නං.

මං හංසි.

SL-UNLIMITED.COM



''බලපංකො බං නුවර කෙල්ලන්ගේ ලස්සන''

විහගගෙ පැණි හැලිය ආයෙත් ඇරිලා. අපි වෑන් එකට යද්දි ඩෙනිමක් ගහපු ලෝකසුනා විතර හීන්දෑරි කෙල්ලෙක් අයිස් ක්‍රීම් එකක් කකා එනවා. ඒකි ළංවෙද්දී ෂෝටා සැළලිහිණි සංදේශයේ තිබුණ කවි පදයක් හයියෙන් කිව්වා.

''සිසිවන උවන....
ඉග සුග ගත හැක මිටින......''

කෙල්ල කණ්ඩුල හැරුණා වගේ ෂෝටා දිහාට හැරෙද්දි මූ උසේන් බෝල්ට්ටත් වඩා හයියෙන් දුවගෙන ගිහින් වෑන් එකට නැගලා දොරත් වහගත්තා. නිකංහරි ඒ කෙල්ල මූට දෙකතුනක් ඇන්නා නං ආප්ප හැන්දෙන් තමයි මුගෙ කෑලි එකතු කරන්න වෙන්නෙ. ඒක බුදු හුවර්.

Sarasavi Bookshop
9789555247207
SAMANALA WASANTHAYA
Rs. 250.00

අංක 891/F,
ගැමුණු මාවත,
හෙයියන්තුඩුව,
කැලණිය.

දුරකථන : 0114 - 920043 / 0717 - 514130

මිල රු 250/-

WWW.EXPRESSLANKA.TK 148

ISBN 978-955-52472-0-7